

# සංක්ෂිප්ත භික්ෂුශීලය.

සංක්ෂිප්ත

# භික්ෂුශීලය

(දෙහිවල සද්ධර්මගුප්ත පරිවෙණාචාර්ය ධුරන්ධර පූජ්‍යාචාර්ය උඩුගම්පල සුවණ්ණජෝතාභිධාන ස්වාමීන්වහන්සේ විසින් සම්පාදිත භික්ෂුශීලය නැමැති විනය ග්‍රන්ථය ආරණ්‍යක භික්ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස සංක්ෂිප්ත කරමින්, සංස්කරණයට පමුණුවන ලද්දේ වෙයි.)

සංස්කාරක

පූජ්‍ය නාඋයනේ අරියධම්ම

ස්වාමීන්වහන්සේ

ප්‍රකාශක

තඹබෝවේ ඩබ්ලිව්. ඇල්. දබරේ

නාත්තන්ඩිය

මුද්‍රණය

ශාසනෝදය මුද්‍රණාලය

කුලියාපටය

2521

1978

සංක්ෂිප්ත

# භික්ෂුශීලය

සංස්කාරක

පූජ්‍ය නාඋයනේ අරියධම්ම

ස්වාමීන්වහන්සේ

ප්‍රකාශක

තඹබෝවේ ඩබ්ලිව්. ඇල්. දබරේ

නාත්තන්ඩිය

1978 ජූලි 16 වැනි දිනට ශ්‍රී කල්‍යාණී
යෝගාශ්‍රමීය භික්ෂු සංස්ථාවේ විසිපස්වැනි
උපසම්පදා සංවත්සරය නිමිතිකොට
මෙම භික්ෂුශීලය පළකරවන ලදී.


මුද්‍රණය

ශාස්ත්‍රෝදය මුද්‍රණාලය

කුලියාපිටිය

2520

1978

# ප්‍රකාශකගෙන්

---

"භික්ෂු ශීලය" නමැති මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත්කිරීම පිළිබඳ අපගේ ප්‍රාර්ථනය වූයේ, අත්‍යන්තයටම පිරිහෙමින් පවතින භික්ෂු විනය මේ සම්බුද්ධ ශාසනයෙහි නගාසිටුවාලීම පිණිස උපස්තම්භක වීමයි. මේ හඳට ගමන්කරණ යුගයේ විනය ප්‍රතිපත්ති මේලෙසින්ම රැකීම අපහසුයයි හෝ අනවශ්‍යයයි සිතන කියන පුද්ගලයන් නොයෙකුත් සිටිය හැකි නමුත් "විනයො නාම බුද්ධසාසනස්ස ආයු" යන අටුවා වදන වැරදි යයි කියන්නන් එතරම් සුලභ නොවෙති යනු අපේ විශ්වාසය යි. මෙම විනය ග්‍රන්ථය ආරණ්‍යක භික්ෂූන්වහන්සේලාගේ ප්‍රයෝජනය පිණිස යයි පොතෙ මුලින්ම විශේෂයෙන් සඳහන් කරන්ට සිදුවූයේ ග්‍රාමාන්තවාසී භික්ෂූන්වහන්සේලා අතරින් ඉතාමත් මැසිදෙනා වහන්සේලාට මෙම පොත කෙරෙහි අමිහිරි අනවධානය පිළිබඳ සැකයෙනි. වර්තමානයෙහි භික්ෂු විනය එතරම්ම පිරිහී ඇති බව රහසක් නොවේ. ග්‍රාමාන්තවාසී භික්ෂූන් වහන්සේලා අතරද මෙම භික්ෂුශීලය නමැති ග්‍රන්ථය කෙරෙහි සැලකිලිමත් වන පින්වතුන් වහන්සේලාද තවමත් වැඩසිටින බව අපේ විශ්වාසය යි. උපසපන් භික්ෂුත්වයේ අති පරිශුද්ධතාවය පිහිටා ඇත්තේ මෙම භික්ෂුශීලයේ ප්‍රතිපදා මාර්ගයෙහි බව ශාසනානුලෝමික ආකල්පසම්පන්න පැවිදි පින්වතුන් වහන්සේලාගේ පමණක් නොව ගිහි බෞද්ධයින්ගේ ද ඒකාන්ත විශ්වාසය යි. එබැවින් මේ සම්බුද්ධ ශාසනයෙහි නැවතත් භික්ෂුවිනය දියුණු වී අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥාවන්ගෙන් ආලෝකවත් වේවායි අපගේ එකම ප්‍රාර්ථනාව යි.

භික්ෂුශීලය නමැති මෙම ග්‍රන්ථයට ශාසනානුලෝමික මනසිකාරයෙන් මාහැඟි ප්‍රස්තාවනා ලිවීමෙන් හා අප ධෛර්‍යවත් කිරීම් ආදියෙන් අනුග්‍රහකොට වදාළ අති පූජ්‍ය විද්‍යා විශාරද රාජකීය පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ නායක මාහිමිපාණන් වහන්සේට සහ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමීය භික්ෂු සංස්ථාවෙහි ගරු අනුශාසක අති පූජ්‍ය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේට ද, මෙම ග්‍රන්ථය යථායෝග්‍යාකාරයෙන් සංස්කරණය කරදීම ගැන පූජ්‍යපාද නාවිමනේ අභිධම්ම සද්ධිර සාමීන් වහන්සේට ද නන් අයුරින් උපස්තම්භක වූ වෙනත් පින්වතුන් වහන්සේලාට ද අපගේ කෘතඥතාපූර්වක ගෞරව සම්ප්‍රයුක්ත නමස්කාරයෙන් පූජා කරමු. තවද මෙම ග්‍රන්ථකරණයෙන් ජනිත වන ත්‍රිහේතුක මහා පුණ්‍යසම්පත්තිය හිමි කොට අනුමෝදන්ව අනන්ත අප්‍රමාණ සත්වයෝ සංසාර දුකින් මිදෙත්වායි ඥානපූර්වංගමව මෙත් සිතින් ප්‍රාර්ථනා කරමු.

තවද, මෙම භික්ෂුශීලය නමැති ග්‍රන්ථය හොඳින් මුද්‍රණය කරදීම ගැන කුලියාපිටියේ ශාස්ත්‍රෝදය මුද්‍රණාලය අයිතිකාර පින්වතුන්ට සහ එහි කළමනාකාර, ජේම්ස් ආදී සැම පින්වතුන්ටද අපගේ පුණ්‍යානුමෝදනා සහිත කෘතඥතාව මෙයින් ප්‍රකාශ කරමු.

මෙයට,

ඩබ්ලිව්. ආර්. දබරේ

"මහත්ත"
තඹිළෙගම,
හාත්තැක්කිය.

# පිළිගැන්වීම

—–

මෙම ''භික්ෂුශීලය'' නමැති ග්‍රන්ථය

මීත්‍රිගල නිශ්ශරණ වනයෙහි අතිගරු කම්ස්ථානාචාර්ය
අනුශාසකවූද, ශ්‍රී කල්‍යාණී යොගාශ්‍රමීය භික්ෂු සංස්ථාවෙහි
ප්‍රධාන අනුශාසකවූද

අති පූජ්‍ය මහොපාධ්‍යාය රාජකීය පණ්ඩිත

## මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන්
## වහන්සේ වෙත,

අතිමහත් භක්තිප්‍රසාදයෙන් හා නමස්කාර
පූජාවෙන් යුතු ව පිළිගන්වනු ලැබේ.

# ශුද්ධිපත්‍රය

| පිටුව | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 32 | හකි | හැකි |
| 2 | 14 | භික්ෂුවක | භික්ෂුවක් |
| 3 | 24 | සංඝාද - | සංඝාදි - |
| 8 | 6 | ආක්‍රොෂ | ආක්‍රොශ |
| 9 | 15 | ආදියත් | ආදියක් |
| 11 | 6 | අනහව | අනුහව |
| 12 | 32 | අප්‍රතිධාන | අපතිධාන |
| 13 | 27 | පැමැත - | පැමැත් - |
| 18 | 30 | ගත්කෙහි | හත්කෙහි |
| 19 | 12 | ප.ත්‍රය | පාත්‍රය |
| 19 | 30 | අහෝ | හෝ |
| 20 | 24 | උද්.දේසාගත | උද්දේසාගත |
| 22 | 19 | දුර්භ.ෂිතය | දුර්භාෂිතය |
| 23 | 11 | දුර්ගාෂිතය | දුර්භාෂිතය |
| 24 | 15 | භික්ෂුත් | භික්ෂූන් |
| 25 | 15 | vi | —— |
| 25 | 17 | vii | vi |
| 25 | 19 | viii | vii |
| 25 | 28 | මාර්ගය | මාර්ග- |
| 32 | 35 | එලිතං | පලිතං |
| 33 | 11 | - තබ්බ. | - තබ්බං |
| 34 | 28 | පලදනා | පලදනා |
| 38 | 7 | අසත්හි | අසුත්හි |
| 38 | 36 | පිළිග | පිළිගනු |
| 40 | 2 | ගත්ථකම්මං | සත්ථකම්මං |
| 41 | 33 | මයාවිත්වා, | මයාවිත්වා, |
| 42 | 3 | ඉලල | ඉල්ල |
| 42 | 13 | සෙං ය | සෙසෙ |
| 42 | 34 | සඝයා | සංඝයා |
| 42 | 35 | සා.ඝික | සාංඝික |
| 45 | 19 | යන | යනු |
| 47 | 4 | පාතිමෝක්ෂ | ප්‍රාතිමෝක්ෂ |
| 47 | 8 | සඟ.වසෙසට | සඟවෙසෙසට |
| 47 | 8 | තලසියට | තුලෑසියට |
| 48 | 16 | සවරග- | සවගී |
| 48 | 26 | හිඟණාජීවෙ, | හිතනාජීවෙ, |
| 48 | 26 | විමරිත්වා, | විවරිත්වා, |
| 48 | 27 | නබ්බ - | නිබ්බ - |

| පිටුව | පෙළ | අශුද්ධි | ශුද්ධි |
| --- | --- | --- | --- |
| 49 | 26 | – භාගිනාය | – භාගිනාය |
| 50 | 35 | ශීලගිරි | ශීල – ගිරි |
| 52 | 6 | යත්වාධිකරණමෙතං | යත්වාධිකරණමෙතං |
| 53 | 37 | සොතිඉන්ද්‍රිය | නොතීන්ද්‍රිය |
| 55 | 10 | නොහික්මවත් ලහුගේ | නොහික්මෙත් ලහුගේ |
| 59 | 17 | දුෂ්කාතවසතුවෙන් | දුෂ්කෘතවස්තුවෙන් |
| 61 | 13 | චෛත්‍යභේදක් | චෛත්‍යභේදනක් |
| 62 | 6 | පටිසංඛාණ – | පටිසංඛාන – |
| 63 | 19 | විර | විර |
| 64 | 29 | පටිච්ඡාදනත්වං | පටිච්ඡාදනත්ථං |
| 65 | 15 | අතිධොතචාරිතං | අතිධොනචාරිතං |
| 70 | 22 | සීල | සීලං |
| 72 | 2 | අනෙසනා | අනෙසනා |
| 72 | 17 | ප්‍රතිකකූල | ප්‍රතිකූල |
| 78 | 12 | මහසුත් | මහසුත් |
| 83 | 24 | සුපිණ | සුපින |
| 82 | 29 | කණ්ඩුල | තණ්ඩුල |
| 88 | 24 | දවසි | දමසි |
| 89 | 29 | පිත් | මිත් |
| 97 | 6 | මහර | මහර |
| 100 | 8 | ව | ච |
| 101 | 23 | ලෝකාවිදූ | ——— |
| 102 | 8 | චරිත්‍ර | චාරිත්‍ර |
| 102 | 36 | ගෙනා | ගෙන |
| 103 | 37 | මහාවග්ගයෙහි | චුල්ලවග්ගයෙහි |
| 104 | 10 | මහාවග්ගයෙහි | චුල්ලවග්ගයෙහි |
| 104 | 20 | පූරෙනතා | පූරෙය |
| 105 | 7 | – ඝෙනෙන | ඝගෙන |
| 107 | 16 | පරාපය | පරාජය |
| 111 | 27 | විනත් | විසිත් |
| 111 | 31 | අඩමසක් | අඩමසක |
| 112 | 14 | නෙතන | ගෙනෙන |
| 112 | 36 | දෙමස | දෙමත් |
| 114 | 14 | දුභීෂිත | දුභීෂිත |
| 116 | 2 | භක්‍ෂුව | භික්‍ෂුව |
| iv | 25 | ප්‍රාචි..ා | ප්‍රාචිනා |
| | | ප්‍රස්තාවනාවෙහි | |
| i | 11 | කා. – | කාය |
| i | 15 | මෙතෙසසාති | මෙතසසාති |
| xii | 12 | පූජ්‍යාවයී | පූජ්‍යාවායී |
| xiii | 2 | ගතුත් | ගතුත් |

# අපගේ සංස්කරණය.

---

**තථාගතප්පවෙදිතො ධම්මවිනයො විවටො විරොචති**
**(තථාගත දේශිත ධර්මවිනය විවෘතවූයේ බබළයි.)**

සූර්‍යාලෝකය විවෘතවූයේ ම ආලෝකයෙන් වැඩ ඇත්තවුනට ප්‍රයෝජනය වන්නේ ය. සම්බුද්ධදේශිත ධර්මවිනය ද විවෘත වූයේ ම ධර්මයෙන් විනයෙන් වැඩ ඇත්තවුනට ප්‍රයෝජන වන්නේ ය.

භික්ෂුශීලය නම් වූ මේ ග්‍රන්ථය ද තථාගත විනය විවෘත කරන්නකි. මෙම ග්‍රන්ථයේ කර්තෘ වහන්සේ ධර්මවිනය ධර සම්භාවනීය මහා ස්ථවිරයාණන් වහන්සේ නමකි. එතුමන් වහන්සේ විසින් විනය-පිටකය ප්‍රධාන ව ත්‍රිපිටකයේ අතිසාරවත් විනයකාරුණු එක්තැන් කොට මෙය සම්පාදනයෙන් බුද්ධවර්ෂ 2436 කාලයේ ක්‍රි: ව: 1893 දී ප්‍රසිද්ධ කර තිබේ.

ප්‍රතිවේධඥානය බැබළීමට ප්‍රතිපත්තිය අත්‍යාවශ්‍යක ය. ප්‍රතිපත්තිය බැබළීමට ප්‍රයෝජනීය මූල කාරණය යි. නිශ්ශරණාධ්‍යාශයෙන් ශාසනගත වන බුද්ධපුත්‍රයන් වහන්සේගේ පයෝජනී විනයඥානය විසද කරවාලීමේ ශාසන ගෞරවයෙන් භික්ෂුශීලය නමැති මේ විනය ග්‍රන්ථය සංස්කරණය කිරීමට ආරාධනා කෙළේ, ජීවිත පරිත්‍යාගයෙන් යුතු ම ශාසනාභිවෘද්ධියට ධෛර්‍යප්‍රදානය කරන තඹිබෝවේ ඩබ්ලිව්. ඇල්. දබරේ මහත්මයා විසිනි.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක තැන්පත් ආචාරෝපේත්තම රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ මහා ස්ථවිර ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රණීතාධ්‍යාශය සමග ලත් අනුඥාව පරිදි, අප හිතවත් පල්ලේගම මහින්ද ආයුෂ්මතුන් වහන්සේ සමග මෙය අමතාගය නොක් සංස්කරණය කරන ලද බව සතුටෙන් සඳහන් කරමු.

අති දීර්ඝ වාක්‍ය කෙටි කරමින් අර්ථාවබෝධයට පහසුවන පරිදි මෙය සකස් කිරීමට සිදුවිය. ප්‍රථමයෙන් ම භික්ෂුශීලය නම් ග්‍රන්ථය සම්පාදනය කරනලද දෙහිවෙල සද්ධර්මගුප්ත පිරිවෙන් පති සිරිපවර ධර්මකීර්ති ශ්‍රී උඩුගම්පොල සුවණ්ණජෝතාභිධාන මහාස්ථවිරපාදයන් වහන්සේට මෙහි සම්පූර්ණ ගෞරවය පිරිනමමින් ශ්‍රද්ධා ප්‍රව්‍රජිත බුද්ධපුත්‍රයන් වහන්සේට ශීලස්කන්ධපූරණයට මෙය මහෝපකාර සංස්කාර වස්තුවක් වේවායි ප්‍රාර්ථනය කරමු.

මේ හිසුසිල සංස්කරණය මුලසිට අගතෙක් සංශෝධනය කොට ශාසනහිතිය ද ඊට පෙරවදනක් සපයා අනුග්‍රහ කළ අතිගරු ආචාර්යෝත්තම පූජ්‍ය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ මහාස්ථවිර ස්වාමීන්ද්‍රයන් වහන්සේටද, හාරවත් ප්‍රස්තාවනාවක් සම්පාදනයෙන් ග්‍රන්ථගෞරවය හා උද්දේශය ප්‍රදානය කළ අතිගරු රාජකීය පණ්ඩිත විද්‍යාවිශාරද ඉඳුරුවේ උත්තරානන්ද අධිකරණ නායක මහාස්ථවිර ස්වාමීන්ද්‍රෝත්තමයන් වහන්සේටත් දීර්ඝායුඃශ්‍රී ප්‍රාර්ථනා කරමින් වැඳ නමස්කාර කරමු.

ධ්‍යාන විදර්ශනා මාර්ගඵල ලාභී ආර්ය බුද්ධ පුත්‍රයන්වහන්සේලා පහළවී සම්බුද්ධ ශාසනාම්බරය හිරු දහසක් සඳ දහසක් නැගියා සේ අතිශයින් ශෝභමානව බැබලීමට පත්වේවා.

මෙයට,
ශාසනසේවිකාමී,

නාඋයනේ අරියධම්ම ස්ථවිර

ගුණවර්ධන යෝගාශ්‍රමය
ගල්දූව - කහව.
2520/1977 අප්‍රේල් 10

# ශාසන නීතිය

---

නීතිය විවිධ යි. භාෂාවක් නිවැරදි ව පැවතීමට උපකාරවන උපදේශ මාර්ග ශබ්දනීති නමින් දක්නා ලැබේ. ඒ ව්‍යාකරණය යි. ශබ්දනීති සංඛ්‍යාත ව්‍යාකරණය භාෂා විනය වශයෙන්ද, භාෂාවක ආණ්ඩුව වශයෙන්ද සැලකීම සුදුසු ය. එයට පටහැණි මිනුමෝ භාෂා ද්‍රෝහකයෝ වෙති. ඔවුන්ගෙන් සිදුවනුයේ භාෂාවක් උම්මත්තක පතිබිම්බයක් (පිස්සිගෙ පලාමල්ලක්) බවට පත්වනු පමණක් නොවේ. භාෂාවක රසය, භාෂාවක ජීවය සිරිකී තැලී වනසට පත්වනු ද යෙදේ මැ යි.

භාෂාවක නිරාකුල පැවැත්මට ශබ්දනීති නමින් හැඳින්වෙන ව්‍යාකරණය වහල්වත්නාක් මෙන් ත්‍රිශික්ෂා (සීල - සමාධි පඤ්ඤා) සංඛ්‍යාත බුද්ධශාසනයාගේ නිරාකුල පැවැත්මට උපයෝගීවන ශික්ෂා ප්‍රඥප්ති සමූදය ශාසනනීතිය වශයෙන් තේරුම් ගතයුත්තේ ය. ශාසනවිනය වශයෙන්ද, ශාසනයේ ආණ්ඩුව වශයෙන්ද ගිණියයුත්තේ ශික්ෂා ප්‍රඥප්ති සංඛ්‍යාත මේ ශාසන නීතිය මැයි. මේ ශාසනනීතිය මැනැවින් රකිමිනාත් ශාසන පාලනයට තිල බලයෙන් පත්වන පාලකයෙක් - අමුතු ආණ්ඩුකාරයෙක් අවශ්‍ය නැත. ශාසන පාලනයට නායකයන් භාරකයන් අවශ්‍ය නැත. ශීල භාවනා ප්‍රතිපත්ති මාර්ග දක්වන කල්‍යාණශීලී අනුශාසකයන් - මාර්ගදේශකයන් මිස ශාසනයට නායක - භාරකයන් අවශ්‍ය දැයි සිතා බලනු මැනැවි.

බුදුරජාණන් වහන්සේ විසින් දෙශිතවූ ප්‍රඥප්තවූ ධර්මය ම විනය ම ශාසනය පාලනයවීමේ අභෙද්‍ය බලමහිමයෙන් යුක්ත ය. හැම බුදුවදනක් පාසා, හැම බුදුපැණවුමක් පාසා බුදුරජාණන් වහන්සේ ශාස්තෘත්වයෙන් ජීවමාන වනසැටි, "යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා" ආනන්දය! මාවිසින් දෙසනලද පණවනලද යම් ධර්මයක් විනයක් වේද ඒ ධර්මවිනය මගේ ඇවෑමෙන් ඔබට ශාස්තෘවන්නේ ය යන මේ අස්වැසිලි දේශනයෙන් වටහාගතහැකි ය. මේ අස්වැසිල්ල, මේ මෙහෙයවීම අනදහිමියන්ට පමණක් නො වේ, අප හැමට ය. නිරාමිස සංකල්පයෙන් නිශ්ශරණාර්පිව සසුන් පිළිවෙත් මගට බැසගත් බුදුපුත් සඟපිරිස ප්‍රාණපරිත්‍යාගයෙන් බුදු අණ රක්නා වගට බුදුරජාණන් වහන්සේ ම සහතික කළසේක. "යං පහාරාද මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතුපි නාතිවත්තන්ති. (පහාරාදසුත්ත) පහාරාදය! මාවිසින් මගේ ශ්‍රාවකයන්ට පණවනලද විනයශික්ෂා ජීවිතය නිසාවත් කඩනොකරන්-නාය යි සහතික කොට වදාළේ හැබෑ බුදුපුතුන්ගේ සසුන් පුරතලයෙන්

ලොව සැනසේවා, යන ඔහු කරුණා බැල්මෙති. මේ බුද්ධශාසනිකයෙන් පණගැසවී ඔද තෙද ගැන්වී ජීවිතය නොතකා සිල්ගුණ පිරූ බුද්ධශ්‍රාවක උතුමන්ගේ අසිරිමත් ජීවිත සටහන් ශාසන ඉතිහාසයේ දීප්තව පවත්නේ සඳහන් පෙරහැරව එක්වන අනුශාසනයන්ට එළිදෙන නොනිවෙන පහන් ලෙසිනි.

අම්බඛාදකතිස්ස හිමියන් මේ ජාතියේ උපන් සිංහල උපාසක තුමකුගේ කැටුළබදී ආත්ම සිල්ගුණ ප්‍රත්‍යවේක්ෂණයෙන් රහත්වූනැයි සිහිකළමැනැවි. අනුරාධපුරයෙහි සිට රුහුණු බලා වඩිනා තිස්සහිමියන් ආහාරනැති අහේතියෙන් කලාන්තව අතරමග අඹගසක් යට වාඩිවගත්තෝ පණයන තරම් අමාරුවෙති. බඩගිනි වේදනාව බලවත්ව පැවැති නමුත් ගසයට වැටීතුබූ ඉදුණු අඹ වැළඳීමට උන්වහන්සේ සිත යොදුවේ නැත. ශික්ෂා ගෞරවයෙන්, නොපිළිගෙන වැළඳීමෙන් සිල් කෙලෙසෙන හෙයිනි. දිවිරැකීමට වඩා සිල්රැකීම අගය කොට උතුම් කොට ඒ සුළු ඇවැතට පවා පත් නොවී තිස්ස හිමියන් එද පරම සුසිල්වත්භාවත් සංයතවූයේ ඉවසා මෙනම බලපෑම කටවත් යටත් නොවෙයි. මගේ වේදනාවෙන් පණගියත් සිකපද නොබිඳිනියි වදාළ ඒ බුද්ධ සසනිකය සිහිකිරීමෙති. ශාසන නිසංවූ විනය ශික්ෂාව නිතාමක ස්වරූපයෙන් ගෙන සිල්ගුණ සපුරා සසුන් මගට පහන්වූ ශාසන වීරයෙ ගරුවනට නමස්කාර වේවා.

විනයසංග්‍රහයවූ මේ භික්ෂුශීලය මෙයින් අවුරුදු සූමාසූමකට පෙර වැඩසිටි විනයවිශාරදවූ ශාසන හිතකාරී උත්තමයාණ කෙනෙකුන් විසින් ප්‍රතිපාදිත ව පළවූ අගනා ග්‍රන්ථයෙකි. මේ පිළිබඳ සියලු විස්තර මෙහිට එහි ඇති ප්‍රස්තාවනාවෙන් හෙළි පෙහෙළිවනු ඇත. ශාසන චරිතාතිය ගැන අතිශයින් දුක්විත, ශාසන පරමාර්ථයෙහි සාළු බුද්ධි ප්‍රභාවයක් ඇති, ශාසනය නගා සිටුවීමේ ජන්මාන්තරීය ප්‍රාර්ථනාබද්ධ තබ්බෝවේ පියන්වත් ඩබ්ලිවු. ඇල්. දබරේ මහත්මා මේ විනය ග්‍රන්ථය නවත් වරක් පළකිරීමට අදහස්කොට එය සුදුසු පරිදි සකසා දෙන ලෙස අපේ ආර්ය ධම්ම ස්ථවිර යට ආරාධිතවූයේ අපගේ ද අනුමතය ඇතිව ය. නිවීසෙන සඳුන් පහනට මෙය තෙල් එකතුවක් වේවා.

නිබ්බාණපච්චයො හොතු

මෙයට-ශාසනහිතකාමී,

කඩවැද්දුවේ ජිනවංශ ස්ථවිර

ගුණවර්ධන යෝගාශ්‍රමය
ගල්දූව - කහව.

# ප්‍රස්තාවනා

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස**

## විනයශබ්දාර්ථය

ශ්‍රීමත් සුගත තථාගතයන් වහන්සේ විසින් වදාළ ධම්ම - විනය දෙකින් විනය ශබ්දයාගේ අර්ථ ද බොහෝ විචිත්‍ර ය. විනය ශබ්දයෙහි ශික්ෂණාර්ථ ද ව්‍යවච්ඡේදක නයාර්ථ ද ව්‍යුත්පත්‍යර්ථ ද දක්නට ලැබෙයි. "විනෙති සික්ඛාපෙතීති = විනයො" යන නිරුක්ති විසින් ගත් කල්හි ශික්ෂණාර්ථය ලැබෙයි. "විනයනතො චෙව කායවාචානං" යන්නෙන් මේ අර්ථය දක්වන ලද බව සැලකිය යුතුයි. කාය - වචන දෙදෙනාගේ හික්මවීම ඇතිවන බැවින් විනය නම් වේ යන අර්ථය මෙයින් දෙයි. කායද්වාරයෙන් සිදුවන යම් තරම් වැරදි ඇත් නම් ඒ වැරදි සිදුවන්නට ඉඩ නොදී කයින් සංවර වීමත් වාග්ද්වාරයෙන් සිදුවන යම්තරම් වැරදි ඇත්නම් ඒ වැරදි සිදුවන්නට ඉඩ නොදී වචනයෙන් සංවර වීමත් හික්මීමත් ම වන බැවින් විනය නම් වන බව මෙයින් දත යුතු යි. "විවිධ නය විසෙසනය නෙතීති = විනයො" යන වාක්‍ය ගත් කල්හි විවිධක්‍රම - විශේෂක්‍රම මෙහි ඇති නුයින් විනය නම් වේ යනු සිද්ධ යි. මේ විනය ශබ්දයෙන් විවිධනය - විශේෂනයාර්ථය ලැබෙයි. විවිධනය නම්; ප්‍රාතිමෝක්ෂෝද්දෙශ - ආපත්තිස්කන්ධ - මාතෘකාවිභඞ්ගාදි ප්‍රභේදක්‍රම යි. විශේෂ නය නම් ශික්ෂාපද දැඩිකිරීම හෝ ලිහිල් කිරීම හෝ ප්‍රයෝජන කොට ඇති අනුප්‍රඥප්ති ක්‍රමය යි. "විවිධ විසෙස නයත්තා" යන්නෙන් මේ අර්ථය දක්වන ලද බව සැලකියයුතු යි. මෙසේ කාය - වචන දෙක හික්මවීම නම් වූ කායවිඥප්තියෙන් හා වාග්විඥප්තියෙන් සිදුවන අධ්‍යාචාරයන් වලක්වාලීමත් කෙරෙන කායවාචාවිනයනයත් ප්‍රාතිමෝක්ෂොද්දෙශාදි විවිධනයත් අනුප්‍රඥප්ති මාර්ගයෙන් කෙරෙන දැඩිකිරීම හෝ ලිහිල් කිරීම හෝ ප්‍රයෝජන කොට ඇති විශේෂ නයත් විනය නම් වන බව පවසන ලද්දේ මැ යි. මේ අර්ථය විනය මහ අටුවාහි මෙසේ දක්වන ලද මැයි

> "විවිධ විසෙස නයත්තා - විනයනතො චෙව කායවාචානං
> විනයත්ථවිදූහි අයං - විනයො විනයොති අක්ඛාතො[1]" යි

මෙහි මුලින් සංග්‍රහ කරන ලද්දේ මේ ගාථායෙහි අදහස යි. විනය ශබ්දයෙහි ව්‍යුත්පත්‍යර්ථය මෙසේ දතයුතු ය. "රාගවිනයො දොසවිනයො මොහවිනයො" යනාදි තන්හි පැනෙන විනය ශබ්දයෙන් මේ ව්‍යුත්පත්‍යර්ථය දක්වෙයි. මෙහි විනය නම් වැනැසීම යි.

---

1 සමන්තපාසාදිකා 10 පිටුව

“විනයතීති = විනයො, විනායෙතීති වුත්තං හොති” යන අට්ඨකථා වචනයෙන් ද පැහැදිලි වෙයි. රාගාදීන්ගේ විනාශය මෙයින් ප්‍රකාශිත යි. විනාශය නම් ව්‍යුපශමය යි. සන්සිඳීම යි. මෙසේ බලන කල්හි “විනෙති විනායෙතීති = විනයො” යනු විසින් නිරුක්ති ගත මැනැවි.

තවද විනය ශබ්දයාගේ අර්ථයෙක් වෙයි. යේ මනාහි “විනෙති සත්තෙ එත්ථ එතෙනාති වා විනයො” යනුය. මෙහිලා හෝ මේ කාරණකොට ගෙන හෝ සත්වයන් හික්මේනුයි විනය නම් වේ යන ඒ නිර්වචනයෙහි තේරුම යි. මේ අර්ථ කාය - වචන දෙක්හි හික්මීමට වඩා ලොභාදි කෙලශයන් බිඳලීමෙන් සත්වයාගේ විශුද්ධියට කාරණ හික්මීමක් වන බැවින් නෙත්තිනයානුගත වෙයි මෙසේ විනය ශබ්දාර්ථය දැන විනයපිටකය පිළිබඳ විනය ශබ්දයෙන් පැමැණෙන අදහස මුලින් ම සඳහන් කළ පරිද්දෙන් ගත යුතු ය.

## විනයපිටකය

ඒ මේ විනයපිටකය වනාහි ආඥා දෙශනා නමින් ද යථාපරාධ ශාසන නමින් ද සංවරාසංවරකථා නමින් ද හඳුන්වනු ලැබේ. ආණවීමට සුදුසු භාග්‍යවතුන් වහන්සේ විසින් ආඥාබාහුල්‍යයෙන් දෙසන ලද බැවින් විනයපිටකය ආඥා දෙශනා නම් වෙයි. බොහෝ වරද ඇති පුද්ගලයනට වරදට සුදුසු පරිදි අනුශාසන කරන බැවින් යථාපරාධශාසන නම් වෙයි. ව්‍යතික්‍රමයට හේතු වූ අසංවරය ද එයට පටහැණි වූ සංවරය ද මෙහි පවසන ලද බැවින් සංවරාසංවර-කථා නම් වෙයි. මෙසේ හඳුන්වන ලද ඒ මේ විනයපිටකය ශික්ෂා - ප්‍රහාණ - ගාම්භීර්‍ය්‍ය විසින් ද දතයුතු වෙයි. අධිශීල - අධිචිත්ත - අධිප්‍රඥ යැයි කියන ලද ශික්ෂාත්‍රය අතුරෙන් විනයපිටකයෙහි විශේෂ වශයෙන් අධිශීලශික්ෂාව ප්‍රකාශිත යි. ව්‍යතික්‍රම:- පර්‍ය්‍යුත්ථාන - අනුශය ප්‍රහාණත්‍රිකයෙන් විනය පිටකයෙහි ශීලය ව්‍යතික්‍රමයට පටහැණිවන බැවින් කෙලශයන්ගේ ව්‍යතික්‍රමප්‍රහාණය ප්‍රකාශිත යි. තදඞ්ග - විෂ්කම්භන - සමුච්ඡේද ප්‍රහාණයන් අතුරෙන් කෙලශයන්ගේ තදඞ්ගප්‍රහාණය විනයපිටකයෙහි ප්‍රකාශිත යි. එසේම දුශ්චරිත සංකෙලශයාගේ ප්‍රහාණය ද ප්‍රකාශිත යි. ගාම්භීර්‍ය්‍ය ධර්ම - අර්ථ - දෙශනා - ප්‍රතිවෙධ විසින් සතරවැදෑරුම් වේ. එහි ධර්ම නම් පාලිය යි. අර්ථ නම් පාලිය පිළිබඳ අර්ථය යි. දෙශනා නම් සිතින් ව්‍යවස්ථාපිත ඒ පාලිය පිළිබඳ දෙසීම යි. ප්‍රතිවෙධ නම් පාලියෙහි ද පාල්‍යර්ථයෙහි ද යථාභූතාවබෝධය යි එනම් වූ පරිද්දෙන් දැන ගැනීම යි. මෙසේ මේ විනයපිටකයෙහි චතුර්විධ ගම්භීරත්වය ද දතයුතු යි. තවද ක්‍රමයෙක් වෙයි. ධර්ම නම් හෙතුව යි. අර්ථ නම් හෙතුඵලය යි.

දෙශනාව නම් ප්‍රඥප්තිය යි. ප්‍රතිවෙධ නම් අභිසමය යි. හෙද වනාහි ලෞකික ලෝකෝත්තර වූයේ විෂය වසින් ද අසම්මොහ විසින් ද ධර්මයෙහි අර්ථානුරූප වූ ද අර්ථයෙහි ධර්මානුරූප වූ ද ප්‍රඥප්ති පථයෙහි ප්‍රඥප්තිමාර්ගයට අනුරූප වූ ද වත්නා වූ අවබෝධය යි. පිටකත්‍රයෙහි ම ලැබෙන මේ චතුර්විධ ගම්භීරභාවය විනයපිටකයට පමණක් විශෙෂවූවක් නො වෙයි. යම් හෙයකින් වනාහි මේ පිටකත්‍රයෙහි යම් යම් ධර්මජාතයෙක් හෝ අර්ථජාතයෙක් හෝ වේ ද, යම යම් පරිද්දෙකින් දතයුතු යම්බඳු මේ අර්ථයෙක් අසන්නන්ගේ නුවණට හසු වේ ද, ඒ ඒ පරිද්දෙන් ඒ අදහස හෙළිපෙහෙළි කරන දෙශනාවය මෙහි යම් නො වෙනස්වන සුලු දතීමෙක් වේ නම් ඒ ප්‍රතිවෙධයත් යන මේ සියල්ල පෙරළ අත්බැව්හි රැස් නො කළ පින් ඇති මන්දබුද්ධිකයන් විසින් ශශකාදීන් විසින් බැසගත නො හැකි පිහිට නො ලදහැකි මහසමුද්‍ර මෙන් දුකසේ බැසගතයුතු වූත් නො ලැබියහැකි පිහිට ඇතියක් වූත් ගම්භීරභාවය ඇත්තේ වැයි.

මෙසේ ම පිටකත්‍රයෙහි පරියත්තිභෙදය ද සම්පත්තිය ද විපත්තිය ද දතයුතු ම වෙයි. පරියත්ති නම් පරියාපුණනය යි. උගෙනීම යි. තථාගත දෙශිත ධර්මය උගන්නන්නන්ගේ ශ්‍රාවකයෝ තෙපරිද්දෙකින් උගනිත්. එනම් අලගද්දූපම පරියත්තිය - නිස්සරණත්ථපරියත්තිය - භණ්ඩාගාරික පරියත්තිය යනු වසිති. "දුග්ගහිතා උපාරම්භාදිහෙතුපරියාපුටා අලගද්දූපමා[1]" යනු අටුවාහි කී හෙයින් අනුන්ගේ වාදයෙහි දොස් දක්වීමාදිය ප්‍රයෝජන කොට ගෙන බුද්ධධර්මය උගෙනීම ද පුරුදු කොට උගෙනීමක් මෙන බැවින් නපුරු දරණුවලෙක් සේ නගුටෙන් හෝ අල්වා ගැනීම හා සමාව ම අහිත පිණිස පවත්නා බැවින් අලගද්දූපම පරියත්තිය යි. "යා පන සුග්ගහිතා සීලක්ඛන්ධාදිපාරිපූරිං යෙව ආකඞ්ඛමානෙන පරියාපුටා න උපාරම්භාදිහෙතු අයං නිස්සරණත්ථා[2]" යනු කී හෙයින් අනුන්ගේ වාදයෙහි දොස් දැක්වීමාදිය හෙතු කොට නො ගෙන තමාගේ ශීලස්කන්ධාදිය සපුරාලීම පිණිස ම ධර්මය පිරිවැහීම වන උගෙනීමක් වන බැවින් නිස්සරණත්ථ පරියත්තිය යි. "යං පන පරිඤ්ඤාතක්ඛන්ධො පහීනකිලෙසො භාවිතමග්ගො පටිවිද්ධාකුප්පො සච්ඡිකතනිරොධො ඛීණාසවො කෙවලං පවෙණිපාලනත්ථාය වංසානුරක්ඛණත්ථාය පරියාපුණාති අයං භණ්ඩාගාරිකපරියත්ති[3]" යනු අටුවාහි කී හෙයින් පරිඥාතස්කන්ධ ඇති ප්‍රහීණ ක්ලේශ ඇති භාවිතමාර්ග ඇති ප්‍රතිවිද්ධ අකුප්‍යඵලය ඇති ප්‍රත්‍යක්ෂ කළ නිරෝධය ඇති ක්ෂීණාශ්‍රව තෙමේ හුදෙක් ප්‍රවේණි පාලනය පිණිස වංශානුරක්ෂණය පිණිස බුද්ධධර්මය පිරිවැහීම භණ්ඩාගාරික පරියත්තිය යි. මේ පරියත්තිභෙදය විනයපිටකයට ද සාධාරණ යි. විනයෙහි සුප්‍රතිපන්න මහණතෙමේ ශීලසම්පත්තිය නිසා

1 පපඤ්චසූදනී [අලගද්දූපම සුත්තවණ්ණනා]
2, 3 ,, ,,

ත්‍රිවිද්‍යාවට පැමිණෙයි. එහි ඒ ත්‍රිවිද්‍යාවන්ගේ ම ප්‍රභේදමාත්‍රය ඇති හෙයින් මෙසේ කියති. සූත්‍රපිටකයෙහි සුපිළිපන් මහණතෙමේ සමාධි සම්පත්තිය නිසා ෂඩභිඥාවනට පැමිණෙයි. එහි ඒ ෂඩභිඥාවන්ගේ ම ප්‍රභේදමාත්‍ර ඇති බැවින් මෙසේ කියති. අභිධර්මයෙහි සුප්‍රතිපන් මහණතෙමේ ප්‍රඥාසම්පත්තිය නිසා සතර පිළිසැඹියාවනට පැමිණෙයි. එහි ඒ සිවුපිළිසැඹියාවන්ගේ ම ප්‍රභේදමාත්‍ර ඇති බැවින් මෙසේ කියති. මේ ත්‍රිපිටකයෙහි සම්පත්තිය යි.

විනයපිටකයෙහි දුපිළිපන් මහණතෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලද සැපපහස් ඇති ඇතිරිලි පොරෝනාදීන්ගේ ස්පර්ශයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතික්ෂෙප කළ ස්ත්‍රීස්පර්ශාදි උපාදින්නකස්පර්ශයන්ගේ පහස් ආදියෙහි නිවැරැදි ය යි සන හැඟීම ඇත්තේ වෙයි. එයින් දුසිල්බවට පැමිණෙයි. සූත්‍රපිටකයෙහි දුපිළිපන් මහණතෙමේ භාග්‍යවතුන් වහන්සේ "චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා" යනාදී තන්හි වදාළ පුද්ගලකථාව වැරැදි සේ ගෙන මිථ්‍යාදෘෂ්ටියට පැමිණෙයි. අභිධර්ම පිටකයෙහි දුෂ්ප්‍රතිපන්න භික්ෂුතෙමේ ධර්මචින්තායෙහි අතිධාවනය කරමින් නො සිතියයුතු දැය ද සිතන්නේ වේ ය. එයින් චිත්තක්ෂෙප- පැමිණෙයි. මේ පිටකත්‍රයෙහි දුෂ්ප්‍රතිපත්තිය නිසා පහළ විපත්තිය යි. විනයයෙහි දුපිළිපන් වීමෙන් දුසිල්බවට පැමිණෙන බව මූලදී ම කියන ලදී.

ඒ මේ විනයපිටකය වනාහි විනයාට්ඨකථායෙහි මෙසේ පැහැදිලි කළහ.

"තත්ථ පඨමසඞ්ගීතියං සඞ්ගීතඤ්ච අසඞ්ගීතඤ්ච සබ්බම්පි සමොධානෙත්වා උභයානි පාතිමොක්ඛානි ද්වෙ විභඞ්ගානි ද්වාවීසති ඛන්ධකානි සොළස පරිවාරාති ඉදං විනයපිටකං නාම[1]" යනු කත ප්‍රකාශිත අට්ඨකථා පාඨය යි. මගධේශ්වර අජාසත් මහරජ තුමාගේ සදුපකාරයෙන් රජගහනුවර සප්තපර්ණීගුහාද්වාරයෙහි තනවන ලද මණ්ඩපයෙහි දී අනුබුද්ධ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති පන්සියයක් මහරහතන් වහන්සේ විසින් පවත්වන ලද ප්‍රථම සඞ්ගීතියෙහි දී සඞ්ගීත වූ ද අසඞ්ගීත වූ ද සියලු විනය කැටි කොට උභයප්‍රාතිමෝක්ෂය උභයවිභඞ්ගය දෙවිසි ඛන්ධකය සොළොස් පරිවාරය යන මේ සියල්ල විනයපිටක නම් වන බව නිර්දිෂ්ට අට්ඨකථා පාඨයෙහි අදහසයි. මෙයින් පැවැසෙන උභය ප්‍රාතිමෝක්ෂය නම් භික්ෂුප්‍රාතිමෝක්ෂ - භික්ෂුණී ප්‍රාතිමෝක්ෂ යන දෙක යි. උභය විභඞ්ගය නම් භික්ෂුවිභඞ්ග - භික්ෂුණීවිභඞ්ග යන දෙක යි. දෙවිසි ඛන්ධක නම් මහාඛන්ධක - උපොසථ - වස්සූපනායික - පවාරණ - චම්ම-

1 සමන්තපාසාදිකා 10 පිටුව

භෛෂජ්‍ය - කඨින - චීවර - චම්පෙය්‍ය - කොසම්බකක්ඛන්ධක යන මහාවග්ග පාළියෙහි එන කඳු දහයත් කම්මක්ඛන්ධක - පාරිවාසික - සමුච්චය - සමථ - ඛුද්දකවත්ථු - සේනාසන - සඞ්ඝභේද - වත්ත - පාතිමොක්ඛට්ඨපන - භික්ඛුනී - පඤ්චසතික - සත්තසතිකක්ඛන්ධක යන චුල්ලවග්ගපාළියෙහි එන කඳු දොළොසත් ය. සොළොස් පරිවාර නම් පඤ්ඤත්තිවාර - ආපත්තිවාර - විපත්තිවාර - සඞ්ගහිතවාර - සමුට්ඨානවාර - අධිකරණවාර - සමථවාර - සමුච්චයවාර යන මහාවාර අට ද, පඤ්ඤත්තිවාරාදි වශයෙන් ම ප්‍රත්‍යයමාත්‍ර විශේෂයෙන් නැවත ප්‍රකාශිතවාර අට ද යන වාර සොළොස යි. මෙසේ ප්‍රභේදයට ගිය විනයපිටකය නිකාය වශයෙන් ඛුදුගොත් නිකායට අයත් වෙයි. ග්‍රන්ථ වශයෙන් පාරාජිකපාළි - පාචිත්තියපාළි - මහාවග්ගපාළි - චුල්ලවග්ගපාළි-පරිවාරපාළි යනු විසින් විනයපිටකය පඤ්චප්‍රකාර වේ.

## විනයානිසංසය

බුද්ධශාසනයාගේ ආයුෂය විනය බැවින් බුදුසසුන පැවැත්මට විනය පිරිවැහීම - විනය දැනීම මහෝපකාරී වෙයි. "විනයො නාම බුද්ධසාසනස්ස ආයු"[1] යනු එහෙයින් අටුවාහි කියන ලද මැයි. විනය පවත්නා කල්හි ම ශාසනයත් පවතී මැයි. "විනයෙ ඛො පන ඨිතෙ සාසනං ඨිතං හොති" යනු එහෙයින් වදාරන ලද මැයි. සංවරය මුල් කොට ඇති සියලු කුශලධර්මයනට විනය ධර්මය මුල් වෙයි. බුදුහු මෙසේ වදාරති.

"විනයො සංවරත්ථාය, සංවරො අවිප්පටිසාරත්ථාය, අවිප්පටිසාරො පාමොජ්ජත්ථාය, පාමොජ්ජං පීතත්ථාය, පීති පස්සද්ධත්ථාය, පස්සද්ධි, සුඛත්ථාය, සුඛං සමාධත්ථාය, සමාධි යථාභූතඤාණත්ථාය, යථාභූතඤාණං නිබ්බිදාය, නිබ්බිද විරාගත්ථාය, විරාගො විමුත්තත්ථාය, විමුත්ති විමුත්තිඤාණදස්සනත්ථාය, විමුත්තිඤාණදස්සනං අනුපාදපරිනිබ්බානත්ථාය" යනු භාග්‍යවතුන් වහන්සේ විසින් ම වදාළ බැවින් විනය පිළිබඳ අනුසස්හු මැනැවින් හෙළිපෙහෙළි වෙති.

විනය පර්‍යාප්තිය හෝ විනයප්‍රඥප්තිය හෝ කාය - වාක් සංවරය පිණිස වෙයි. සංවරය තෙමේ (කල නො කල යමක් නිසා පසුතැවිල්ලක් නො වන බැවින්) අවිප්‍රතිසාරය පිණිස වෙයි. අවිප්‍රතිසාරය තෙමේ තරුණ ප්‍රීති නම් වූ ප්‍රාමොද්‍යය පිණිස වෙයි. ප්‍රාමොද්‍යය තෙමේ බලවත් ප්‍රීති නම් වූ ප්‍රීතිය පිණිස වෙයි. ප්‍රීතිය වනාහි (කාය - චිත්ත දෙදෙනාගේ සන්සිඳීම ඇතිකරන බැවින් සන්සිඳීම යැයි කියූ) ප්‍රශ්‍රබ්ධිය පිණිස වෙයි. ප්‍රශ්‍රබ්ධිය වනාහි සුඛය පිණිස වෙයි. සුඛය තෙමේ

(ප්‍රත්‍යය සහිත නාම රූපයන්ගේ පරිග්‍රහය පෙරටු කොට ඇති ක්ෂණික සමාධිය ද අර්පණා සමාධිය ද ඇතිවන බැවින්) සමාධිය පිණිස වෙයි. සමාධිතෙමේ (ප්‍රත්‍යය සහිත නාමරූපදර්ශනය හෝ තදධිෂ්ඨාන තරුණ විදර්ශනාව හෝ සපයාගැනීමට ඉවහල් වන්නෙන්) යථාභූත ඥානදර්ශනය පිණිස වෙයි. යථාභූතඥානදර්ශනය තෙමේ (සසරට කලකිරීම බලවත් කරන බැවින් බලවත් විදර්ශනා නම් වූ) නිර්වේදඥානය පිණිස වෙයි. නිර්වේදඥානය තෙමේ (මාර්ගසංඛ්‍යාත) විරාගය පිණිස වෙයි. විරාගයතෙමේ (අග්‍රඵලවිමුක්ති යැයි කියූ) විමුක්තිය පිණිස වෙයි. විමුක්තිය වනාහි (ප්‍රත්‍යවේක්ෂාඥානදර්ශන යැයි කියන ලද) විමුක්තිඥානදර්ශනය පිණිස වෙයි. විමුක්තිඥානදර්ශනය තෙමේ අනුපාදාපරිනිර්වාණය පිණිස වේ. යතු "විනයො සංවරත්ථාය" යනාදි සම්බුද්ධවචනයෙහි අර්ථ යි.

මේ විනයකථාවත් අනුපාදවිත්තවිමොක්ෂය පිණිස ම වන බව මෙයින් මැනැවින් වැටහෙන හෙයින් විනය පිළිබඳ පුහුණුව ද ආවශ්‍යක වැයි. මෙසේ විනයානිසංසය හැකෙවින් දතයුතු යි.

## විනයප්‍රභෙදය

විනයතෙමේ "ද්විවිධවිනය - චතුර්විධ විනය" විසින් ප්‍රභෙදගත වෙයි. ද්විවිධ විනය නම්: සංවර විනය - ප්‍රහාන විනය විසින් දෙපරිදි වෙයි. සංවර විනය වනාහි සීලසංවර - සතිසංවර - ඤාණසංවර - ඛන්තිසංවර - විරියසංවර යි පඤ්චප්‍රකාර වෙයි. වත් පිළිවෙත් කිරීමෙන් පිරියයුතු චාරිත්‍රශීලයත් අකුශලධර්මයන් නො කිරීමෙන් පිරියයුතු වාරිත්‍ර ශිලයත් සීලසංවර නම් වෙයි එනම් ප්‍රාතිමොක්ෂ සංවරශීලය යි. චක්ෂුරාදි සදොරට හමුවන රූපාදි ආරම්මණයෙහි එළඹ උපදනා ලොභාදි පාපධර්මයන් කෙරෙන් දුරුවැ. ඒ චක්ෂුරාදි සදොර සිහියෙන් යුතු වැ අවුරාගැනීම සතිසංවර නම් වෙයි එනම් ඉන්ද්‍රිය සංවරශීලය යි මාර්ගප්‍රඥයෙන් තෘෂ්ණා - දෘෂ්ටි ආදි සංක්ලෙශ ධර්මයන්ගේ අවුරාලීම ඤාණසංවර නම් වේ.

ශීතොෂ්ණාදිය හා අප්‍රියවචනාදිය ඉවසීමෙන් අවුරාලීම ඛන්තිසංවර නම් වෙයි. උපන් කාමවිතර්කාදිය වැර වඩා දුරුකිරීමෙන් අවුරාලීම විරියසංවර නම වේ. මෙසේ සංවරවිනයතෙමේ පස්වැදෑරුම් වේ. වැළැක්විය යුතු කාය දුශ්චරිතාදිය සංවරණය කරන බැවින් සංවර වූයේත් විනයනය කළයුතු බැවින් විනය වූයේත් සංවරවිනය නම් වේ යැයි දතයුතු යි

ප්‍රහාණවිනය වනාහි තදඞ්ග - වික්ඛම්භන - සමුච්ඡෙද - පටිප්පස්සද්ධි - නිස්සරණප්පහාන විසින් පස්වැදෑරුම් වෙයි. යම්කිසි කුශලයෙක්හි ශක්තියෙන් යම්කිසි අකුශලයක් යටපත් කර දැමීමට

ඉවහල්වන ප්‍රහාණය තදඞ්ග නම් වේ. පහන් එළියෙන් අඳුර දුරුවන්නාක් මෙනි. ධ්‍යානසමාධි ශක්තියෙන් කාමච්ඡන්දාදි නීවරණයන්ගේ ඔබ්බාලීමට ඉවහල්වන ප්‍රහාණය වික්ඛම්භන නම් වේ. කළගෙඩියක් දියමත්තෙහි දැමූ විට එහි ඇති සෙවෙල් බැහැරවීමක් මෙනි. මාර්ගඥානයෙන් සමුදයපාක්ෂික කෙලෙසුන් සහමුලින් සිඳලීමෙන් කරන ප්‍රහාණය සමුච්ඡෙද නම් වේ. හෙණවැදුණු ගසක්හි නැවත ලියලීමේ ශක්තිය නැති කලාක් මෙනි. ඵලක්ෂණයෙහි කෙලෙසුන්ගේ සන්සිඳීමට ඉවහල්වන ප්‍රහාණය පටිප්පස්සද්ධි නම් වේ. නැසූ කෙලෙසුන්ගේ විබාගතිය සන්සිඳවීම මෙයින් අදහස් කරන ලදී. ගින්නක් ඇති තැනෙහි එගිනි නිවා දැමූවිටත් එහි උණුසුම පවත්නාක් මෙනි. සියලු සංඛතධර්මයන්ගෙන් බාහිර වූ අසංඛත සංඛ්‍යාත නිර්වාණය සසරින් නික්මීමට ඉවහල්වන ප්‍රහාණය බැවින් නිස්සරණ නම් වේ. දුරුකළයුතු නීවරණාදි කෙලෙසසමූහය ක්‍රමයෙන් ප්‍රහාණය කරන බැවින් පහාන වූයේත් විනයනය කරන බැවින් විනය වූයේත් පහානවිනය නම් වේ යැයි දතයුතුයි. මෙසේ ද්විවිධ විනය තෙමේ දශප්‍රකාරයකට බෙදී ගියේය.

චතුර්විධ විනය නම් 'සුත්ත - සුත්තානුලෝම - ආචරියවාද - අත්තනොමති' යන සතරාකාරය යි. එහි සුත්ත නම් සකලවිනය පිටක පාළිය යි. මුළු විනයපෙළ සුත්ත යන වචනයෙන් ගතයුතු බව "තත්ථ සුත්තං නාම සකලවිනයපිටකෙ පාළි" යන අට්ඨකථා වචනයෙන් හෙළිවෙයි. මෙයට ආහච්චපද යනුත් නමෙකි. බොටුව - තල්ල ආදී අකුරු උපදනා තැන්හි හැපී තමන්වහන්සේගේ වාක් විඥප්තියෙන් වදාළ සර්වඥවචනය ආහච්චපද යන නමින් හඳුන්වනු ලබන බැවිනි.

සුත්තානුලෝම නම් සතරමහාපදේශධර්මය යි. භාග්‍යවතුන් වහන්සේ විසින් 'මේ දෑය කැප යැ, මේ දෑය අකැප යැ' යි නොවදාළ යමක් ගැන කැප - අකැප විසින් තීරණයකට බැසගැනීමට හැකිවන සේ භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා මේ සූත්‍රානුලෝමය වදාරන ලද බව සැලකියයුතු යි. මෙහි නෛත්‍රානතිකනය - මෛමනෙයිකනය විසින් දතයුතු විවරණය ප්‍රපංචයට කරුණුවන බැවින් මෙහි විවරණය නො කරනු ලැබේ. මෙසේ කප්පියාකප්පිය විචාරය සූත්‍රසංඛ්‍යාත විනයපාළියට අනුලෝම වන බැවින් සූත්‍රානුලෝම නම් වේ. "රසොති සුත්තානුලොමං" යනු කී හෙයින් සූත්‍රානුලෝමයට රස යනුත් නමෙකි.

ආචරියවාද නම් ප්‍රථමධර්මසංගීතිකාරක පන්සියයක් මහරහතන් වහන්සේ විසින් තබන ලද පාළියෙන් මිදුණු තථාගතයන් වහන්සේගේ ප්‍රකීර්ණක දේශනා නම් වූ අට්ඨකථා තන්තිය යි. ධර්මසංගීතිකාරකයන්

විසින් පාළිවර්ණනාක්‍රමයෙන් සංග්‍රහ කොට තබන ලද බැවින් අට්ඨකථා, පාළිය ආචරියවාද යැයි කියනු ලැබේ. මෙයට ආචරියවංශ යනුත් නමෙකි.

අත්තනොමති නම් සූත්‍ර - සූත්‍රානුලෝම - ආචරියවාදයන් ඇසිරි කොට උපන් නුවණින් මිශ්‍ර වූ තමන්ගේ අනුමාන බුද්ධියෙන් මටහා ගත් ලෙස පැවැසීම යි. සූත්‍ර - අභිධර්ම - විනය යන පිටකත්‍රයට ලියූ අට්ඨකථාවන්හි ආ සියලු ස්ථවිරවාදය අත්තනොමති යැයි කියනු ලැබේ. තමාගේ නැණ පමණින් කියන්නහු විසින් එය දැඩි කොට නො කියයුතු යි කරුණු සලකා බලා අර්ථයට පෙලත් පෙලට අර්ථයත් ගැලපෙන සේ කියයුතු යි. මේ අත්තනොමතියට අධිප්‍රාය යනුත් නමෙකි.

මේ චතුර්විධ විනය අතුරෙන් අත්තනොමතිය හැමට ම වඩා දුර්වල ය. අත්තනොමතියට වඩා ආචරියවාදය බලවත් ය. ආචරියවාදයට වඩා සුත්තානුලෝමය බලවත් ය. සුත්තානුලෝමයට වඩා සුත්තය බලවත්ය. අත්තනොමතිය ආචාර්‍යවාදයෙහි ලා සලකා බැලිය යුතුය. ඉදින් එය ආචාර්‍යවාදයට බැස ගනී නම් එය හා ගැලපේ නම් ගතයුතු ය. ඉදින් එහි බැස නො ගනී නම් එය හා නො ගැලපේ නම් නො ගත යුතුය. අත්තනොමතිය සර්වදුර්වල බැවිනි. ආචාර්‍යවාදය වනාහි සූත්‍රානුලෝමයෙහි බහාලිය යුතු ය. එහි බැස ගනී නම් ගතයුතු ය. නො බැස ගනී නම් නො ගතයුතු ය. ආචාර්‍යවාදයට වඩා සූත්‍රානුලෝමය අතිශයින් බලවත් වන බැවිනි. සූත්‍රානුලෝමය සූත්‍රයෙහි බහාලිය යුතුය. ඉදින් එහි බැස ගනී නම් එය හා ගැලපේ නම් ගතයුතු ය. නො ගැලපේ නම් නො ගතයුතු ය. සූත්‍රානුලෝමයට වඩා සූත්‍රය ම අතිශයින් බලවත් වන බැවින්. සූත්‍රය වනාහි මැඩ පැවැත්විය නො හැකි වෙයි. කාරක සංඝයා හා සමාන වෙයි. දිවමන් බුදුන් වැඩසිටි කල් මෙනි. මෙ සිවු වැදෑරුම් විනය පිළිබඳ දැනීම ශික්ෂාපදයෙහිද ශික්ෂාපද විභඞ්ගයෙහිද සියලු විනය විනිශ්චයෙහිද සාමීච්‍යය පතන්නහු විසින් සාදරයෙන් නිපදවා ගත යුත්තේ මැයි.

නවත් ක්‍රමයෙකින් චතුර්විධ විනයෙක් වෙයි. එනම් සංවරවිනය - පහානවිනය - සමථවිනය - පඤ්ඤත්තිවිනය යනු විසිනි. මෙහි සංවර - පහාන දෙවිනය මුලින් දක්වූ පරිදි උගතයුතු යි. සමථ විනය නම් සප්ත අධිකරණ ශමථය යි. පඤ්ඤත්ති විනය නම් නම් බුදුපියාණන් වහන්සේ විසින් වදාළ මෛථුනසංවරාදි සිඛපද මැයි. මෙසේ ද චතුර්විධ විනය දතයුතු යි.

# ශික්ෂාපදප්‍රභවය

භාග්‍යවත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදාළ ධර්මවිනය සංඛ්‍යාත බුද්ධවචනය ත්‍රිපිටකය නමින් හඳුන්වනු ලැබේ. "සම්මා-සම්බුද්ධප්පභවං සුත්තං" යන නෙත්තිරත්නාකර සූත්‍රයෙන් ත්‍රිපිටකය සම්‍යක්සම්බුද්ධයන් ප්‍රභව කොට ඇති බව හෙළි වෙයි. එහෙයින් විනයපිටකයට අයත් පාරාජිකාදී සකල ශික්ෂාපදයක් ම භාග්‍යවතුන් ගෙන් පහළ වූ බව අමුතුවෙන් කියයුතු නොවේ. ගිහි සමාජයෙහි පහළ වූ දුරාචාර විෂමාචාරයන් පැවිදි සමාජයෙහි පැතිරෙන්නට පටන් ගත් කල්හි භික්ෂූන් පිණිස සිකපද පනවන්නට සිදු වූ බව අපි දනුම්හ. එසේ සිකපද පැනවීමෙහි දී කරුණු දශයක් පිණිස සිකපද පනවන බව බුදුහු වදාළහ. ඒ කරුණු දශය නම්:

1 'යහපත ස්වාමීනි!' යි මගේ බස සඟුන්ගේ මනා පිළිගැනුම පිණිස පනවමි.
2 සඟුන්ගේ සතර ඉරියවු සැපසේ පවත්වනු පිණිස පනවමි.
3 දුශ්ශීලපුද්ගලයන්ගේ නිග්‍රහ පිණිස පනවමි.
4 ශික්ෂාකාමී භික්ෂූන්ගේ ඵාසුවිහරණය පිණිස පනවමි.
5 මේ අත්බැව්හි ම පැනෙන පාණිප්‍රහාරාදි දුඃඛ විශේෂයන්ගේ වැළැක්වීම පිණිස පනවමි.
6 පරලොව නරකාදි සතර අපායෙහි තමා කෙරෙහි පැමිණිය යුතු දුඃඛවිශේෂයන්ගේ නැසීම පිණිස පනවමි.
7 බුදුසස්නෙහි නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස පනවමි.
8 බුදුසස්නෙහි පහන් වූ කුලදරුවන්ගේ වැඩියක් පැහැදීම පිණිස පනවමි.
9 ත්‍රිවිධ සද්ධර්මයාගේ බොහෝකලක් පැවැත්ම පිණිස පනවමි.
10 චතුර්විධ විනයට රුකුල් දෙනු පිණිස පනවමි.

මෙසේ දසකරුණක් පිණිස සිකපද පනවන බව වදාළහ. ඉන් පළමු කරුණ ගෙන විමසා බැලීම මැනැවි.

1. 'යහපත ස්වාමීනි' යි මගේ බස සඟුන්ගේ මනා පිළිගැනුම පිණිස පනවමි, යන මේ පළමු කරුණ යි. භාග්‍යවතුන් වහන්සේ විසින් පනවන හැම සිකපදයක් ම සඟුන්ගේ මනා පිළිගැනීම සඳහා ම පනවා ඇතිබව පිළිගත හැකි ය. නො පිළිගත්තත් මහණ වෙස් දරා සිටියත් සඞ්ඝයාට ඇතුළත් නොවන බව මෙයින් සූචිත යි.

2. සඟුන්ගේ සතර ඉරියවු සැපසේ පවත්වනු පිණිස පනවමි, යන මේ දෙවන කරුණ යි. බුදුන් විසින් හැම සිකපදයක්ම සඞ්ඝයාගේ පහසු විහරණය පිණිස ම පනවනු ලබන බව මෙයින් ප්‍රකාශිත යි. බුදුන් පැන වූ කිසියම් සිකපදයක් තමනට ගැහැට

පිණිස පනවා ඇතැයි සඟයා නො පිළිගනී. යම් භික්ෂු නමක් ගැහැට පිණිස පවතී යැයි පිළිගනී නම් හේ සඟුන් මැද සිටියත් සඟයාට ඇතුළත් නො වෙයි.

3. දුශ්ශීල පුද්ගලයන්ගේ නිග්‍රහ පිණිස පනවමි, යන මේ තෙවන කාරණය යි. බුදුන් විසින් පනවා වදාළ සිකපද අශුද්ධයන් කෙරෙත් ශුද්ධයන් මෙන් කොට ගැනීමට ඉවහල් වන බැවින් දුසිල් මහණුන්ට නිග්‍රහ පිණිස ද පවත්නා බව පැනෙයි. සිකපදය ඇති කල්හි දුසිල් මහණුන්හට සඟුන් වෙහෙසවීමට අවසරයක් නො ලැබෙයි.

4. ශික්ෂාකාමී භික්ෂූන්ගේ ඵාසුවිහරණය පිණිස පනවමි, යන මේ සතරවන කාරණය යි. උතුම් ජීවිතයක් මෙන් ශීලය ප්‍රිය කොට වසන ශික්ෂාකාමී මහණුන්ගේ යැපපහසුව සිකපදයෙන් සිද්ධ වෙයි. එහෙයින් ම සිකපද පනවන බව මෙයින් ප්‍රකාශිත යි.

5 මෙ අත්බැව්හි ම පැමෙනන පාණිප්‍රහාරාදි දුඃඛ විශෙෂයන්ගේ වැළැක්වීම පිණිස පනවමි, යන මේ පස්වන කාරණය යි. කායින් කරන නො කටයුතු ද වචනයෙන් කරන නො කටයුතු ද අසංවරයෙහි සිටි මහණහු විසින් මේ ආත්මභාවයෙහිදී ම ලැබිය යුතු අතුල් පහර, දඬුපහර අත් පා කැපීම, හමුවෙහි ගැරහීම නො හමුවෙහි ගැරහීම, විපිළිසර දුක් ආදී වූ නොයෙක් දුඃඛ විශෙෂයන්ගේ වැළැක්වීම පිණිස සිකපද පනවන බව මෙයින් ප්‍රකාශිත යි.

6. පරලොව නරකාදි සතර අපායෙහි තමා කෙරෙහි පැමිණිය යුතු දුඃඛ විශෙෂයන්ගේ නැසීම පිණිස පනවමි, යන මේ සවන කාරණය යි.

දුසිල්කම් කරමින් අසංවරයෙහි සිටි මහණහු විසින් පරලොව්හි නරකාදියෙහි දී ලැබිය හැකි නොයෙක් වධබන්ධනාදි දුක් රැස වැනසීම–යන් සිදුවීම පිණිස සිකපද පනවන බව මෙයින් ප්‍රකාශිත යි.

7. බුදුසස්නෙහි නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස පනවමි, යන මේ සත්වන කාරණය යි. සමහර කෙනෙක් නුවණ ඇතියාහු නමුත් බුද්ධශාසනයට ප්‍රසන්නාකාරයක් නො දක්වති. සිකපද පැනවීම දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ එසේ නො පහන් වූවන්ගෙන් ඇතැම් කෙනෙක් පහදිත්. බුදුන් පැනවූ සිකපද මැනැවින් පිළිපදින්නා වූ මහණුන් දැක ද සමහරු සස්නෙහි පහදිති. එහෙයින් අප්‍රසන්නයන්ගේ පැහැදීම පිණිස සිකපද පැනවීම මෙයින් ප්‍රකාශිත යි.

8. බුදුසස්නෙහි පහන් වූ කුලදරුවන්ගේ වැඩියක් පැහැදීම පිණිස පනවමි, යන මේ අටවන කාරණය යි. ශාසනයෙහි ප්‍රකෘතියෙන් ම ප්‍රසන්න වූ කුලදරුවන්ගේ වැඩියක් පැහැදීම පිණිස සිකපද පනවන බව මෙයින් සූචිත යි.

9. ත්‍රිවිධ සද්ධර්මයාගේ බොහෝ කලක් පැවැත්ම පිණිස පනවමි. යන මේ නවවන කාරණය යි. පරියත්ති - පටිපත්ති - අධිගම සංඛ්‍යාත වූ ත්‍රිවිධ සද්ධර්මයාගේ බොහෝ කලක් පැවැත්මට සිකපද පැනවීම අත්‍යාවශ්‍යක බව භාග්‍යවතුන් වහන්සේගේ පිළිගැනීම බැවින් ඒ ශාසන චිරස්ථිතිය සඳහා සිකපද පනවන බව මෙයින් ප්‍රකාශිත යි.

10 චතුර්විධ විනයට රුකුල් දෙනු පිණිස පනවමි. යන මේ දසවන කාරණය යි. සංවර - පහාන - සමථ - පඤ්ඤත්ති සංඛ්‍යාත සතර වැදෑරුම් විනය සම්පාදනය කරනු පිණිස සිකපද පනවන බව මෙයින් සූචිත යි.

මෙසේ සිකපද පැනවීමෙන් දශ ආනිසංසයක් - වෘද්ධි විශෙෂ දශයක් ලැබෙන බව පැහැදිලි කළ බුදුහු ශික්ෂාපදප්‍රඥප්තිය තමන් වහන්සේගෙන් ම පහළ වූ සැටි වදාළහ. එක් එක් සිකපදයකට ආවේණික වූ නිදානයක් ඇතත් ශික්ෂාපදයන්ගේ ප්‍රභවයට මේ කරුණු දශය අවිශෙෂයෙන් තුඩු දී පවත්නා බව මෙහෙහි කළ මැනැවි.

# භික්ෂුශීල සම්පාදනය.

භික්ෂුවිභඞ්ග පදභාජනීයෙහි භික්ෂු ශබ්දාර්ථය නොයෙක් ලෙසින් විවරණය කොට ඇතත් ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍ර ශාසනයෙහි භික්ෂු නමින් හඳුන්වන පුද්ගලයා ඥප්තිචතුර්ථකර්මයෙන් උපසම්පදාව ලත් පැවිද්දා බව අපි දනිමු. ඒ භික්ෂුනම ප්‍රාතිමොක්ෂසංවර ශීලය ප්‍රධාන කොට ඇති සිවුපිරිසිදු සිල් මැනැවින් රැකීමට උපසම්පත්තියෙන් ම බැඳී සිටින්නෙකි. එවැනි භික්ෂුවගේ ආභූෂණය මේ ශීලය ම වන බැවින් එසිල් නැතියහු ශාසනික භික්ෂුගණයට ඇතුළත් නොවන බව සැලකිය යුතු වෙයි. එහෙයින් භික්ෂුශීලය ජීවිතය මෙන් ඉතා උතුම් කොට රැකිය යුතු මැයි. එය මැනැවින් රැකීමට භික්ෂූන්වහන්සේ විසින් එහි සතු සපුරා දතයුතුය. මේ අර්ථය මැනැවින් හෙළිපෙහෙළි කරනු පිණිස පූජ්‍යාචාර්ය උඩුගම්පල සිරිපවර ධම්මකිත්තිසසිරි සුවර්ණ-ජෝත්‍යානන්ද යතිවරයාන් වහන්සේ විසින් ශාසනභක්තියෙන් පරිපූර්ණව සම්පාදනය කරනලද ඒ මේ භික්ෂුශීලය නමැති විනයග්‍රන්ථය අමූල්‍යග්‍රන්ථරත්නයක් බව අපගේ පිළිගැනීම යි.

උන්වහන්සේ වනාහි පිටකත්‍රය විෂයෙහි සුතීක්ෂ්ණ බුද්ධිප්‍රභාවයක් ඇති බහුශ්‍රැත ධර්මවිනයධර මහ තෙරනමක්ව, දෙශ දෙශාන්තරයෙහි සුපතල කීර්තිඝොෂය ඇතිව, වැඩමනමින් මෙරටේ ශාසනශුද්ධියට - භික්ෂුප්‍රතිපත්ති විශොධනයට මහත් සේවයක් කරනලදබව බොහෝ දෙනා දනිත් මැයි. ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාගේ දඹදිව බුද්ධධර්මප්‍රචාරයට නොයෙක් ලෙසින් රුකුල් දුන් උන්වහන්සේ විසින් මේ භික්ෂුශීලය නමැති විනය ග්‍රන්ථය පරිච්ඡෙද දශයෙකින් ප්‍රතිමණ්ඩිත කොට සපයන ලද්දේ වෙයි.

එනම්:
1 පාතිමොක්ඛ සංවර නිර්දේශය
2 ප්‍රාතිමොක්ෂ සංවර පරිශිෂ්ට සංග්‍රහ නිර්දේශය
3 පාතිමොක්ඛ සංවර සීල විපත්තිදෙශන නිර්දේශය.
4 ඉන්ද්‍රියසංවර සීලනිර්දේශය
5 ආජීවපාරිශුද්ධිසීල නිර්දේශය
6 පච්චයසන්නිස්සිත සීලනිර්දේශය
7 මිස්සකසංගහ නිර්දේශය
8 චූලසීලාදි නිර්දේශය
9 දුස්සීලාදීනව නිර්දේශය
10 සාමණේරසීල නිර්දේශය

යනුයි. මෙසේ පරිච්ඡෙද දශයෙකින් යුක්ත කොට ගොතන ලද මේ ග්‍රන්ථය සකලවිනයපිටකයත් සූත්‍රපිටකයට අයත් දීඝනිකායයෙහි බ්‍රහ්මජාල - සාමඤ්ඤඵල සූත්‍ර දෙකත් සම්පිණ්ඩනය කරමින් සැපයුණෙකි. එසේම සූත්‍රපිටකයට අයත් අඞ්ගුත්තරනිකායේ

ඇතැම් සූත්‍රයන්ද, ඛුද්දකනිකායට අයත් ඛුද්දකපාඨ - ධම්මපද - ථෙරගාථා - සුත්තනිපාත වැනි පෙළ ගතුත් ද, මජ්ඣිමනිකායට අයත් නිවාප සූත්‍රාදිය ද, සංයුත්තනිකායට අයත් ආදිත්තපරියාය සූත්‍රය ද ඇසිරිකරමින් පොෂණය කළබව පැනෙයි.

තවද සමන්තපාසාදිකා නම් විනය අටුවාව ද, සුමඞ්ගලවිලාසිනී නම් දික්සඟිඅටුවාව ද, කඞ්ඛාවිතරණී නම් මාතිකාට්ඨකථාව ද, මනොරථපූරණී නම් අඞ්ගුත්තරනිකායට්ඨකථාව ද, සාරත්ථප්පකාසිනී නම් සංයුත්තනිකායට්ඨකථාව ද, පරමත්ථජෝතිකා නම් සුත්තනිපාතට්ඨකථාව ද, සම්මොහවිනොදනී නම් විභඞ්ගප්‍රකරණාට්ඨකථාව ද, පුද්ගලප්‍රඥප්තිප්‍රකරණාට්ඨකථාව ද, පපඤ්චසූදනී නම් මැදුම්සඟි අටුවාව ද පරිශීලනය කරමින් භූෂණය කළබවද පැනෙයි.

තවද සාරත්ථදීපනී - විමතිවිනොදනී - වජිරබුද්ධි - විනයත්ථමඤ්ජූසා - සුමඞ්ගලප්පසාදනී නම් විනයටීකාවන් ද, විසුද්ධිමග්ග - සද්ධම්මොපායන - විනයවිනිච්ඡය - ඛුද්දසික්ඛා - පාළිමුත්තකවිනය විනිච්ඡය - සාරසඞ්ගහ ආදි ප්‍රකරණග්‍රන්ථයන් ද විමසමින් ඒ ඒ කරුණු සමර්ථනය කළබවද පැනෙයි.

මෙසේ මේ භික්ෂුශීලය සම්පාදනය කිරීමෙන් භික්ෂුශාසනයේ චිරස්ථිතියට උන්වහන්සේ විසින් කළ උදාර සේවාව අතිවිචිත්‍ර මැයි. ශ්‍රද්ධාබුද්ධි සම්පන්න ශාසනාවචර කුල පුත්‍රයන්ගේ අධිශීල සංඛ්‍යාත ආයුෂය රැකදීමට මේ ග්‍රන්ථය අතිශයින්ම රුකුල් දෙන බැවිනි.

## සංක්ෂිප්ත භික්ෂුශීලය

මෙයට අවුරුදු අසූසතරකට පෙර මුද්‍රණයෙන් ප්‍රකාශනයට පත්කළ ඒ මේ භික්ෂුශීල නම් ග්‍රන්ථයෙහි පිටපතක් තබ්බෝවේ වසන්ත මැදුරෙහි නිවැසි මනොපාසක ඩබ්ලිවු ඇල් දබරේ මහත්මයාට ලැබී ගල්දූවේ ගුණවර්ධන යොගාශ්‍රමාධිපති කල්‍යාණී යොගාශ්‍රම සංස්ථාව පිහිටුවන ලද රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මහා ස්ථවිරපාදයන් වහන්සේට ඒ පිටපත පිරිනමා ආරණ්‍යක භික්ෂූන් වහන්සේගේ පරිශීලනය සඳහා මෙය තරමක් ලුහුඬු කොට සකස්කර දෙනලෙස ආරාධනය කළබව දනිමි. ඒ ශාසනමාමක පින්වතාගේ ආරාධනය පිළිගත් උන්වහන්සේ ස්වකීය ශිෂ්‍ය නමක් වන නාඋයනේ අරියධම්ම ස්ථවිර නමට දබරේ මහතාගේ අදහස සපුරා දෙන ලෙස පැවරූ බවද දනිමි. ඒ මේ නාඋයනේ අරියධම්ම ස්ථවිර නම් ශ්‍රී ලඞ්කා රාමඤ්ඤ මහා නිකායට අයත් ශ්‍රී කල්‍යාණී යොගාශ්‍රම සංස්ථාවෙහි පැවිදිවැ පැවිද්දට සීහෙන ශාන්ත ආකල්පයෙන් යුතුවැ ධර්මවිනය ඥානයෙන් උසස් දැනුමක් ලබාඇති ත්‍රිපිටකයෙන් වැඩි ප්‍රමාණයක්

වනපොත් කොට ඇති ස්වකීය ජීවිතය මෙන් මහණුවම අගය කොට සලකන භාවනානුයෝගී ප්‍රියශීලී භික්ෂුනමෙකි. කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවෙහි ගණපාමොක්ඛාචරිය අතිපූජ්‍ය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඤාණාරාම මහා ස්ථවිර පණ්ඩිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙතින් ශබ්ද ශාස්ත්‍රය සහිත ධර්මවිනය මැනැවින් උගත් පූර්වෝක්ත කඩවැද්දුවේ පණ්ඩිත ජිනවංශ මහාස්ථවිර හිමියන්ගේ ගුරූපදේශයෙන් භූෂණ-ප්‍රාප්ත වූ ගල්දූවේ ගුණවඩන යෝගාශ්‍රමයෙහි නිවැසි යෝගාවචර භික්ෂූන්හට ධර්මවිනය පුහුණුකරවන ආචාර්යවරයෙකි. එහෙයින් මූලික සම්පාදකයන් වහන්සේගේ අදහසට ගැලපෙන පරිද්දෙන් මේ භික්ෂුසීලය නම් ග්‍රන්ථය සංක්ෂිප්ත කොට සකස් කිරීමට අරියධම්ම ස්ථවිරයනට සම්පූර්ණ ශක්තිය ඇතිබවද දනිමි මේ කාර්යයෙහි ලා ලෙඛනයෙහි වතුර පල්ලේගම මිහිඳු නම් භික්ෂුවරයන්ගේ සම්පූර්ණ සහයෝගය ලැබී තිබෙන බවද අරියධම්ම ස්ථවිරයන්ගේ සටහනෙහි සඳහන් වෙයි. කරුණු මෙසේ හෙයින් මේ සියලු පැවිදි පින්වතුනටද, මේ ග්‍රන්ථය මුද්‍රණයට නොමසුරු වූ ධනපරිත්‍යාගය කළ මහෝපාසක ඩබ්ලිව්. ඇල්. දබරේ මහතුන්ට ද, පූජ්‍යාචාර්ය උඩුගම්පල සුවණ්ණජෝතාභිධාන ධම්මකිත්තිපාදයන් වහන්සේගේ හකනිම්ත් ශිෂ්‍යයකු වූ සිට මහළුවියෙහි පැවිද්ව, කොග්ගල ත්‍රිපිටකධර්මායතනයෙහි භාවනානුයෝගීව, දැනට දෙඅනුවියෙහි වසන මෙහිලා දබරේ මහතුන් මෙහෙයවූ දෙඩන්දූවේ ශාසනශෝභන යති වීරයන්ටද, මුද්‍රණකාර්යය මැනැවින් සිදුකළ කුලියාපිටියේ ශාස්ත්‍රෝදය මුද්‍රණාලයාධිකාරීනට හා එහි සේවකයනටද පින් දෙමින් දිගාසිරි පතමිහ.

මෙයට,

ශාසනස්ථිතිකාමී

ඉඳුරුවේ උත්තරානන්ද ස්ථවිර

ශ්‍රී ධර්මකීර්ත්‍යාරාමය
පොල්වත්ත,
කොල්ලුපිටිය.
2520/1977 අප්‍රියෙල් 20

# සංක්ෂිප්ත භික්ෂුශීලය

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස**

**"සීලං චතුබ්බිධං පාතිමොක්ඛං ඉන්ද්‍රිය සංවරො,**
**ආජීව පාරිසුද්ධි ච සීලං පච්චය නිස්සිතං"**

(සද්ධම්මොපායනය)

**ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීවපාරිශුද්ධි ශීලය, ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලයැයි භික්ෂු ශීලය සතර ආකාර වෙයි.**

**"ඉධ භික්ඛවෙ, භික්ඛු පාතිමොක්ඛ සංවරසංවුතො විහරති ආචාර ගොචර සම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසූති. එවං වුත්තමිදං පාතිමොක්ඛසංවරසීලං නාම."**

(විසුද්ධිමග්ග)

**මේ එහි ප්‍රාතිමොක්ෂ සංවර ශීලයේ විස්තරය යි.**

**තේරුම:-**

**මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශික්ෂාපද ශීලයෙන් සංවර වී වාසය කරයි. ආචාරයෙන් ද, ගොචරයෙන් ද යුක්තව කුඩා වූ ද වරදෙහි භය දක්නා සුලුවූයේ. ශික්ෂාපදයන් සමාදන් ව හික්මෙයි. යනුවෙන් මෙසේ වදාරන ලද්දේ ප්‍රාතිමොක්ෂ සංවර ශීලය නම් වේ.**

**ප්‍රාතිමොක්ෂ සංවරය නම්; කය වචන දෙක සම්බන්ධ ව පනවන ලද ශික්ෂාපද නො කැඩීම යි. ආචාරය නම්; කයින් වැරදි නො කිරීම, වචනයෙන් වැරදි නො කිරීම, කයින් හා වචනයෙන් වැරදි නො කිරීම යි. ගොචරය නම්; ආරක්ඛ ගොචරය, උපනිස්සය ගොචරය, උපනිබන්ධ ගොචර යයි තුන් ආකාර වෙයි.**

**එහි ආරක්ඛ ගොචරය නම්; කුසල් සිහිය රැක ගැනීම සඳහා උපකාර වන පැවැත්ම යි. උපනිශ්‍රය ගොචරය නම්; ශීලාදි ගුණයනට උපනිශ්‍රය වූ කල්‍යාණ මිත්‍රයන්ගේ ආශ්‍රය යි. උපනිබන්ධ ගොචරය නම්, භාවනා චිත්තය පිහිටුවා ගැනීමට සුදුසු අරමුණු සේවනය යි.**

**අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී යනු කුඩා වූද වරදෙහි භය දක්නා සුලු බව යි. කුඩා වැරදි නම් දුෂ්කෘත දුර්භාෂිත ආපත්තිහු යි. ඒවා සිත ඇතිව ද සිත නැතිව ද පැමිණිය හැකි යි. එබඳු සිත නැතිවත් පැමිණිය හැකි දුර්භාෂිත තරම් සුළු ඇවැතක් ද පාරාජිකා නම් වූ මහ ඇවතක් ලෙස සලකායි. අබැටක් තරම් සුළුදෙය මහමෙර සේ විශාල දෙයක් ලෙස සැලකීම මෙහි භයදක්නා සුලු බව යි. ආපත්තිසඞ්ඛ**

සතට ඇතුළත්වන යම්තාක් ශික්ෂාපදයෝ වෙත් නම්, ඒ සියල්ල මනාකොට රක්නාවූ භික්ෂුතෙම සීලසම්පන්න නම් වේ. මෙසේ වදාරනලද ශීලය ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය යි. කොටියෙන් කියහොත් ඇවැත් කඳු සතට අයිති සියලු සිකපද කාය වචය දෙකින් නොබිඳ සංවර වීම යි.

සත ආපත්තිස්කන්ධය නම්:-

1 පාරාජිකාපත්තිස්කන්ධය
2 සංඝාදිසේසාපත්තිස්කන්ධය
3 ථුල්ලච්චයාපත්තිස්කන්ධය
4 පාචිත්තියාපත්තිස්කන්ධය
5 පාටිදෙසනීයාපත්තිස්කන්ධය
6 දුක්කටාපත්තිස්කන්ධය
7 දුබ්භාසිතාපත්තිස්කන්ධය

යන මේ ඇවැත් කඳු සත ය.

## 1. පාරාජිකාපත්තිස්කන්ධය

1. උපසපන් භික්ෂුවක වීම, මෛථුන රාගය පහළවීම, මනුෂ්‍ය හෝ අමනුෂ්‍ය හෝ තිරශ්චීන හෝ ස්ත්‍රියක් වීම, ඒ ස්ත්‍රියගේ වර්චස්මාර්ගී - මූත්‍රමාර්ගී - මුඛමාර්ගී යන තුන් මගින් එක් මගක් වීම, මනුෂ්‍ය - අමනුෂ්‍ය - තිරශ්චීන යන උභතොබ්‍යඤ්ජනකයන්ගේ හෝ කියනලද මාර්ග අතුරෙන් එකක්වීම, මනුෂ්‍ය - අමනුෂ්‍ය තිරශ්චීන පුරුෂයන්ගේ වර්චස්මාර්ගී - මුඛමාර්ගී අතුරෙන් එකක්වීම, මනුෂ්‍ය - අමනුෂ්‍ය - තිරශ්චීන පණ්ඩකයන්ගේ වර්චස්මාර්ගී - මුඛමාර්ගී අතුරෙන් එකක්වීම, මනුෂ්‍ය අමනුෂ්‍ය - තිරශ්චීන යන වශයෙන් ප්‍රභේදගත වූ මේ තිස්මගින්*[1] එක් මගක තම නිමිත්ත ප්‍රවේශ කිරීමෙන් හෝ අනුන් විසින් ප්‍රවේශ කරවන කල්හි ඉවසීමෙන් හෝ මෛථුනධම්ම නම්වූ ප්‍රථම පාරාජිකාපත්තිය සිද්ධ වෙයි. ප්‍රවේශන - ප්‍රවිෂ්ට - ස්ථිති - උද්ධරණ, යන අවස්ථා සතරෙන් එක් තැනකදී හෝ ඉවසීම මෙහි පාරාජිකාපත්තියට ප්‍රමාණවත් වේ.

2. පාදයක්*[2] හෝ පාදයක් අගනා භාණ්ඩයක් හෝ ඊට වැඩි වටිනා දෙයක්වීම, මනුෂ්‍යයකු සතුවීම, හිමියන් විසින් නොපවරන ලද්දක්වීම, පස්විසි අවහාරයන්*[3] අතුරෙන් යම්කිසි අවහාරයකින් ගැනීම, යන මේය අදින්නාදාන නම් වූ දෙවන පාරාජිකාපත්තිය යි.

3 මනුෂ්‍ය ප්‍රාණයක් වීම, මරණචිත්තය, දිවි තොරකිරීම, මේය මනුස්සවිග්ගහ නම්වූ තෙවන පාරාජිකාපත්තිය යි. මනුෂ්‍යප්‍රාණය ප්‍රතිසන්ධිචිත්තය සහිතවූ කලල රූපයත් සමග ගැනේ. තමන් විසින්ම හෝ අනුන් ලවා හෝ දිවි තොරකිරීම මීට ප්‍රමාණවත් වේ.

4 තමා තුළ නැති උත්තරි මනුෂ්‍ය ධර්මයක්*[4] වීම පාපේච්ඡතා අදහස, තේරෙන කෙනකුට තේරෙන වචනයෙන් තමා තුළ ඇතිබව කීම හෝ ඇඟවීම මේය උත්තරිමනුස්සධම්ම නම් වූ සතරවැනි පාරාජිකාපත්තිය යි.

තවද, පරිජිවූවන් වැනි භික්ෂුභාවයට අභව්‍ය වූ පුද්ගලයෝ එකොළොස් දෙනෙකි. ඔහු නම්:- i පණ්ඩක ii ථෙය්‍යසංවාසක iii තිත්ථියපක්කන්තක iv තිරච්ඡානගත v මාතුඝාතක vi පිතුඝාතක vii අරහන්තඝාතක viii ලොහිතුප්පාදක ix සංඝභෙදක x භික්ඛුණීදූසක xi උභතොබ්‍යඤ්ජනක යන මොහු යි.

තවද, අනුලොම පාරාජිකා සතරෙකි.

i තමාගේම අංගජාතය සමකින් වනා හෝ නොවනා හෝ තමාගේම වර්චස් මාර්ගයේ හෝ මුඛමාර්ගයේ ප්‍රවේශකර ගැනීම ii එබඳුවූ තම අංගජාතය අනුන් ලවා ප්‍රවේශකරවා ගැනීම iii එබඳුවූ අනුන්ගේ අංගජාතය තමා මුඛයෙන් ගැනීම iv එහි තමා වර්චස් මගට ප්‍රවේශවන අයුරු දමට ඉඳීම. යන මොහු යි. මෙ කියන ලද අනුලොමපරිජි සතරද, පෙරකී එකොළොසදයි පසළොස් පාරාජිකාවෝද, පාරාජිකාපත්ති*5 ස්කන්ධයෙහි ම සංග්‍රහ වෙති. මේ හෙයින් පාරාජිකාපත්තිස්කන්ධය නම් වේ.

2. සංඝාදිසේසාපත්තිස්කන්ධය:

1. ශුක්‍රමෝචන ආස්වාදය*6 උපක්‍රමය, මෝචනය වීම, මෙය ශුක්‍රවිස්සට්ඨි නම් වූ ප්‍රථම සංඝාදිසේසය යි.

2 කාය පිරිමැදීමෙහි ආශාව, මනුෂ්‍ය ස්ත්‍රියක වීම, කේශ හස්තපාදි ශරීරාවයවයක් ඇල්ලීම, මෙය කායසංසග්ග නම්වූ දෙවන සංඝාදිසේසය යි.

3. කාමයන් පිළිබඳ කථාකිරීමෙහි අදහස, මිනිස් ස්ත්‍රියක්වීම, වර්චස් මාර්ග මූත්‍ර මාර්ග පිළිබඳ ගුණ දොස් කීම, තේරුම් ගැනීම, මෙය දුට්ඨුල්ලවාචා නම් වූ තෙවන සංඝාදිසේසය යි.

4. මෛථුන රාගයෙන් යුක්තවීම, මිනිස් ස්ත්‍රියක් වීම, "මට මෛථුනයෙන් සලකව" යනාදිය කීම, තේරුම් ගැනීම, මෙය අත්තකාම පාරිචරිය නම්වූ සිවුවන සංඝාදිසේසය යි.

5. කාමය පිළිබඳ ස්ත්‍රියකගේ හසුන් පුරුෂයකුටත් පුරුෂයකුගේ හසුන් ස්ත්‍රියකටත් දීම, මෙය සංචරිත්ත නම් වූ පස්වන සංඝාදිසේසය යි

6. තමන් උදෙසා කුටියක් හැදීම, කාරදෙන දායකයකු නොවීම, කුටිවස්තුව නොදෙසීම, දිගින් සුගත වියත්*7 දොළොසකට හා පළලින් වියත් සතකට වැඩිවීම, මෙය කුටිකාර නම් වූ සවන සංඝාදිසේසය යි.

7. කුටිය කාරදෙන දායකයකු සිටීම, ප්‍රමාණයට වඩා විශාල වුවත් කුටි බිම නොදෙසා (හැදීමට සංඝයා වෙතින් සම්මුතිය නොගෙන) තමා උදෙසා කරවීම, මෙය විහාරකාර (මහල්ලක විහාරකාරාපන) නම් වූ සත්වන සංඝාදිසේසය යි.

8 ක්‍රොධ සිතින් සිල්වත් භික්ෂුවක් හට අමූලික පාරාජිකා ඇවැතකින් සම්මුඛයේදී චෝදනා කිරීම, මෙය පඨමදුට්ඨදෝස (අමූලික චෝදනා) නම් වූ අටවන සංඝාදිසේසය යි.

9. එළු බැටළු ආදි අනෙකකු ගේ මෛථුන සංසර්ගයක් දැක ඒ ලේශයෙන් භික්ෂුවකට දෝෂාරෝපණය කොට පාරාජිකාපත්තියෙන් චෝදනා කිරම. මෙය දුතියදුට්ඨදෝස (කිඤ්චිදෙසලෙස) නම් වූ නවවන සංඝාදසේසය යි.[8]

10. සමගි සංඝයාගේ භේදයට උත්සාහ කිරීම තුන් යල තෙක් අවවාදකොටත් අත් නොහරින්නේ නම් ඥප්තිය සහා තුන්වනාවක් සමනුභාෂණ[9] කර්ම සංඝයා විසින් කලයුතු. එම විනය කර්ම කොට අවසන් වනතුරු අත් නොහැර සිටීමෙන් සිදුවන මේ ඇවත පඨම සංඝභෙද[10] නම් වූ දසවන සංඝාදිසෙසය යි.

11. සංඝ භේදයට තැත්කරන්නා වූ භික්ෂුවගේ පැත්ත ගන්නා සෙසු භික්ෂුගණයාට එසේම සංඝයාවිසින් අවවාද කොට සමනුභාෂණ කර්මය කල යුතුයි. එය කරනතුරු අත් නො හැරීමෙන් සිදුවන මේ ඇවත දුතියසඞ්ඝභෙද (භේදනුවත්තක) නම් වූ එකොළොස්වන සංඝාදිසේසය යි.

12 භික්ෂූන්විසින් උද්දෙශගත වූ[11] ශික්ෂාපදයකින් අවවාදකරන කල්හි ඇවතට පැමිණි භික්ෂුව එය ප්‍රතික්ෂෙප කරයි. ඒ අකීකරු භික්ෂුවට තුන්යලක් අවවාද කලයුතු වේ. එත් නො පිළිගනී නම් තුන්යලක් සමනුභාෂණ කර්මය කලයුතු. එම විනය කර්මය අවසන් වනතුරු ද අත් නො හරින ඒ භික්ෂුවට වන මේ ඇවත දුබ්බච නම් වූ දොළොස්වන සංඝාදිසේසය යි.

13. භික්ෂුවක් මල් දීමාදියෙන් දායකකුලයනට උදව්කරයි. පව්ටු අදහස් ද ඇත්තේ වෙයි. අනෙක් භික්ෂූන්විසින් විහාරයෙන් බැහැර වියයුතු යයි ඒ භික්ෂුවට කරුණු කියයුතුයි. එවිට මොවුහු ඡන්දයෙන් අගතියට යන්නෝය යනාදීන් සංඝයාට දොස් කියන්නේ නම් ඒ වැරැද්දෙන් මුදවනු පිණිස තුන්යල තෙක් අවවාද කල යුතු එත් අත් නො හරින්නේනම් සමනුභාෂණ කර්ම කලයුතු. තුන්යලත් සමනුභාෂණය කරනතුරු දැඩිව සිටින එම භික්ෂුවට සිදුවන මේ ඇවත කුලදූසක නම් වූ තෙළෙස්වන සංඝාදිසෙසය යි [12]

මේ ඇපත්ති තෙළෙස සංඝාදිසෙසාපත්තිස්කන්ධය නම් වේ.

## 3. ථුල්ලච්චයාපත්තිස්කන්ධය

පාරාජිකා හා සංඝාදිසෙස යන සෑම ආපත්තියක්ම අංග විෂයෙන් සම්පූර්ණ වීමට පෙර ථුල්ලච්චයාපත්ති (ථුලැසි ඇවැත්) වේ.

ථුලැසි ඇවැත් මත ම ගරුකාපත්ති සිද්ධවන හෙයින් ගරු ඇවැත් (සංඝාදිසෙස - පාරාජික) වලට සාමන්තව (ලඟින්ම) ද ථුලැසි ඇවැත් වේ.

සඟ සතු කොට දෙනලද දේ ද, සඟසතු බිම් නිපැදෙන භාණ්ඩ ද බෙදුගැනීමෙන් *[13] ථුලැසි වේ. අනුන්ට දීමෙන්ද ථුලැසි වේ.

මිනීමස් අනුභව කිරීමෙන් ථුලැසි වේ. ලිංගච්ඡේදනයෙන් ථුලැසි වේ.

ඊතණ - තියද වැහැරි වලින් ගොතාකල සිවුරු ද, පුවරු ගොතා කල සිවුරු ද, මිනිස් කෙස් - අස්ලොම් වලින් කල සිවුරු ද, බකමූහුණු පිහාටු - අඳුන් දිවිසම් වලින් කල සිවුරු ද, ඇඳීමෙන් හා පෙරවීමෙන් ථුලැසි වේ.

එක් සීමාවක් තුල සංඝයා භෙදකරන අදහසින් වෙන වෙන ම පෝය පවාරණාදිය කිරීමෙන් ද ථුලැසි වේ.

මේ සියල්ල ම ථුල්ලච්චයා*[14]පත්තිස්කන්ධය යි.

## 4. පාචිත්තිය ආපත්තිස්කන්ධය

1. කඨිනයේ ආනිසංස නැති කාලයෙහි කොළුපිළී පටපිළී*[15] ආදියෙන් වියන ලද සිවුරු - රෙදි අධිෂ්ඨාන හෝ විකල්පනය හෝ නො කොට (විනයකර්මයෙන් තාවකාලික ව හෝ පවරා) දස දවසකට වඩා කල් තබාගැනීමෙන් පඨමකඨින (අතිරේක චීවර ධාරණ) නිසගි පචිත්තිය වෙයි.

2. කඨිනානිසංස නැති කල්හි තුන් සිවුරෙන් එකරුයකුදු වෙන්ව විසීමෙන් දුතියකඨින (චීවර විප්පවාස) නිසගි පචිත්තිය වෙයි.

3 කඨිනානිසංසය නැති සත් මාසය තුල*[16] සිවුරු ලැබෙන්නේ නම් පිළිගෙන සිවුරකට අඩුකොටස ලැබෙන තුරු හෝ අදිටන් නොකොට හෝ මාසකට වඩා කල් තබා ගැනීමෙන් තතියකඨින (අකාල චීවර පටිග්ගහණ) නිසගි පචිත්තිය වෙයි.

4 පරිභෝග කරනලද සිවුරක් නො නෑ භික්ෂුණියක් ලවා සේදීම් ඇපිල්ලීම් පඬු පෙවීම් කරවීමෙන් පුරාණ චීවර (පොරාණ ධොවන) නිසගි පචිත්තිය වෙයි.

5 නො නෑ භික්ෂුණියක ගෙන් හුවමාරුවට කිසිවක් නොදී අධිෂ්ඨානයට ප්‍රමාණවත්*[17] සිවුරක් පිළිගැනීමෙන් චීවරපටිග්ගහණ (පාරිවට්ටක) නිසගි පචිත්තිය වෙයි.

6. පැහැරගැනීම දැවීම ආදී අවස්ථාවක දී හැර අන් කාලයක නො නෑ නො පැවරූවන් ගෙන් සිවුරු ඉල්වීමෙන් විඤ්ඤත්තක-විඤ්ඤත්ති (චීවරවිඤ්ඤත්ති) නිසගි පචිත්තිය වෙයි.

7 සිවුරු විනාශවූ එබඳු අවස්ථාවක බොහෝ දෙනු ලබන කල අඳනය හා තනිපට සිවුරට වැඩියෙන් ගැනීමෙන් තතුත්තරි (තතුත්තරි යාදියක) නිසගි පචිතිය වෙයි.

8 නොනෑ නොපැවරූ දායකයකු තමන්ට දීමට සූදානම් කෙරෙන සිවුරෙහි සුන්දරකම හා වටිනාකම සලකා "මෙයේ මෙයේ කළයුතුය" යනාදී වශයෙන් විධාන කිරීමෙන් පසු එය ලැබීමෙන් පඨමඋපක්ඛට (අපවාරිත) නිසගිපචිතිය වෙයි.

9 දායක දායිකා දෙදෙනකුන් විසින් තමන් උදෙසා එයේ සිවුරක් සූදානම් කරන බව දැන මෙසේ කරදෙවයි විධාන කිරීමකින් ලදහොත් දුතියඋපක්ඛට (දුතිය අපවාරිත) නිසගි පචිතිය වෙයි.

10 රජ - ඇමැති පටන් කිසියම් දායක කෙනකුන් විසින් භික්ෂුවකට යවන ලද සිවුරු මිල උපස්ථායකයකුට පැවරුවිය යුතු. සිවුර අවශ්‍යවූ විටක තුන්වරට වඩා ඉල්වන්නේ නම් හෝ සයවරට වඩා උදෙසා සිට හෝ ලැබීමෙන් රාජ (චීවර චේතාපන්න) නිසගි පචිතිය වෙයි

11 කෞශෙය්‍ය (පට) නූල් මිශ්‍රකොට ඇතිරිල්ලක් කරවීමෙන් සන්ථත නිසගි පචිතිය වෙයි.

12 තනිකර කළු එළලොමින් ඇතිරියක් කරවීමෙන් සුද්ධ සන්ථත නිසගි පචිතිය වෙයි.

13. කළු එළලොම් දෙභාගයකට වඩා ගෙන සුදු හා කිඹුල්වන් එළලොම් දෙභාගයක් නොගෙන අලුත් ඇතිරියක් කැරවීමෙන් නවසන්ථත නිසගි පචිතිය වෙයි.

14. අලුත් ඇත්තරණයක් වසා සය වසක් ඇතුළත භික්ෂූන්ගේ අවසරයක් නැතිව අනෙක් ඇතිරියක් කරවීමෙන් අනුවස්සක සන්ථත නිසගිපචිතිය වෙයි.

15 පරිභෝගකළ ඇතිරිල්ලෙන් සුගත් වියතක්වත් අලුත් ඇතිරිල්ලට නොඅල්ලා කිරීමෙන් පුරාණසන්ථත නිසගිපචිතිය වෙයි.

16 තුන් යොදුනකට වඩා දුර රැගෙන යාමට කෙනකු නැතිව තමන් ම එළලොම් ගෙනයාමෙන් ලොමහරණ නිසගි පචිතිය වෙයි.

17 නොනෑ (ඥාති නො වන) භික්ෂුණියක් ලවා එළලොම් සේද-වීමෙන් පඬුගැන්වීමෙන් හා අවුල්හැරවීමෙන් ධොවන නිසගි පචිතිය වෙයි.

18. රන් රිදී මසු කහවණු මිලමුදල් පිළිගැනීමෙන් ද ගැන්වීමෙන් ද තමා වෙනුවෙන් තබන ලද්ද ඉවසීමෙන් ද රූපිය පටිග්ගහණ නිසගි පචිතිය වෙයි.

19 නානාප්‍රකාර වූ රන් රිදී මසු කහවණු මිලමුදල් ගනු දෙනු කිරීමෙන් රූපිය සංවොහාරක නිසගි පචිතිය වෙයි.

20 චීවරාදී කැප දේද මෙය රැගෙන මෙය දෙව යනාදීන් ගනුදෙනු කිරීමෙන් කයවික්කය නිසගි පචිතිය වෙයි.

21. වැඩිපුර පාත්‍රයක් දස දවසකට වඩා කල්තබාගැනීමෙන් පත්තනිද්දෙසන නිසගි පචිතිය වෙයි.

22. පිළිරුම් පසකට අඩු පාත්‍රයක් තිබියදී අලුත් පාත්‍රයක් ඉල්වා ගැනීමෙන් ඌනපඤ්චබන්ධන නිසගිපචිතිය වෙයි.

23. පඤ්ච භෙසජ්ජ (ගිතෙල්, වෙඬරු, තලතෙල්, මී උක්සකුරු) පිළිගෙන සත් දිනකට වඩා කල් තබාගැනීමෙන් භෙසජ්ජ නිද්දෙසන නිසගි පචිතිය වෙයි.

24. ග්‍රීෂ්ම ඍතුවෙහි අවසාන මාසයෙන් මෙහා වැසිසළු සෙවීමෙන් ද අඩමසකින් මෙහා පරිභෝග කිරීමෙන් ද වස්සික සාටික නිසගි පචිතිය වෙයි.

25. භික්ෂුවකට සිවුරක් දී කිපීමක් නිසා ආපසු පැහැරගැනීමෙන් අච්ඡින්දන නිසගි පචිතිය වෙයි.

26. නූල් ඉල්වා පෙහෙරුන් (පේෂකාරයන්) ලවා සිවුරු වියවා ගැනීමෙන් සුත්තවිඤ්ඤත්ති නිසගි පචිතිය වෙයි.

27. ඤාති නොවන දායකයකු විසින් සිවුරක් වියවන විට මෙසේ මෙසේ කරව අපිත් යමක් දෙමුයි කියා නූල් වැඩිකොට කරවා ගැනීමෙන් තන්තවාය නම් නිසගි පචිති වේ.

28 පෙරවස් වැස පවාරණයට දසදිනක් තිබියදී පූජාකළ අච්චෙක[18] චීවරය පිළිගෙන අධිෂ්ඨාන - විකල්පන නො කොට චීවරකාලය ඉක්මවීමෙන් අච්චෙක චීවර නිසගි පචිතිය වේ

29. පෙරවස් වැස පවාරණය කොට සොරුන්ගෙන් බිය සැක සහිත වන සෙනසුනක වසන භික්ෂුයම ඉල්මසතුල තුන් සිවුරෙන් එකක් ඇතුළුගමෙහි තබා සංඝ සම්මුතියෙන් තොරව සදනක් ඉක්මවීමෙන් සාසඞ්කවිප්පවාස නම් නිසගි පචිතිය වේ.

30. සංඝයාට පූජාකරන්නෙමුයි නියමකරන ලද සංඝලාභය දැන දැන තමන්ට පූජාකරවා ගැනීමෙන් අත්තපරිණාමන නම් නිසගි පචිතිය වේ.

මෙසේ දක්වූ පචිති ආපත්ති සමයින නිස්සග්ගිය විනයකම් සහිත බැවින් නිසගි[19] පචිති නම් වේ.

# සුද්ධපාචිත්තිය (92)

1 දැන දැන බොරුකීමෙන් උපසම්පන්න භික්ෂුවට සම්පජාන මුසාවාද සුද්ධ පාචිත්තිය වේ

2. හීන වූද උත්කෘෂ්ට වූද ජාති, නාම, ගොත්‍ර, කර්ම, ශිල්ප, ව්‍යාධි, ලක්ෂණ, ක්ලෙශ, ආපත්ති, ආක්‍රෝශ යන දස කාරණා අතුරෙන් යමකින් අන්‍ය උපසම්පන්න භික්ෂුවකට ඉදිරිපිට ගටා බිණීමෙන් ඕමසවාද නම් සුද්ධ පාචිත්තිය වේ.

3 යථෝක්ත දස ආක්‍රෝශ වස්තුවෙන් යමකින් උපසපන් භික්ෂුවකට උපසපන් භික්ෂුනමක් විසින් නොහැඟුවෙහි කියන ලද්දක් ඔවුනොවුන් බිඳුවන අදහසින් කීමෙන් පෙසුඤ්ඤහරණ නම් සුද්ධ පාචිත්තිය වේ.

4 ත්‍රිපිටක ධර්මයෙහි එන බුද්ධභාසිත, සාවකභාසිත, දෙවභාසිත, ඉසිභාසිත වූ එක පදයක්ද අනුපසම්පන්නයන් සමග කීමෙන් පදසොධම්ම නම් සුද්ධ පාචිත්තිය වේ

5 සහසෙය්‍යාර්[20] සැහෙන සෙවණක අනුපසම්පන්නයන් සමග පිළිවෙළින් තුන් දිනක් අරුණ නැගෙන තුරු සයනය කොට සතරවැනි දින පටන් සයනය කිරීමෙන් සහසෙය්‍ය නම් සුද්ධ පාචිත්තිය වේ

6 යථෝක්ත සහසෙය්‍යට සැහෙන සෙවණක එදවස් උපන්නාවූද මාගමක් සමග හිරු බැස ගිය තැන් පටන් සයනය කිරීමෙන් මාතුගාම සහසෙය්‍ය නම් සුද්ධ පාචිත්තිය වේ.[21]

7. සභ්‍ය-අසභ්‍ය වචන දන්නා පුරුෂයෙකු නොමැතිව මාගමකට දහම්පද සයකට වැඩි දහමක් දෙසීමෙන් උත්තරිඡප්පඤ්චවාචා නම් සුද්ධ පාචිත්තිය වේ.

8. තමා කෙරෙහි සත්‍යවශයෙන් ඇත්තාවූ ධ්‍යානාදී උත්තරීමනුෂ්‍ය ධර්මයක් අනුපසම්පන්නයෙකුට කීමෙන් භූතාරොචන නම් සුද්ධ පාචිත්තිය වේ.

9 උපසම්පන්න භික්ෂුවකගේ සංඝාදිසෙස ආපත්තියක් සංඝ සම්මුතියෙන් තොරව අනුපසම්පන්නයෙකුට කීමෙන් දුට්ඨුල්ලාරොචන නම් සුද්ධ පාචිත්තිය වේ.

10. ජාතපඨවිය[22] විකොපනය[23] කිරීමෙන් ද අනුන් ලවා විකොපනය කරවීමෙන් ද පඨවිඛණන නම් සුද්ධ පාචිත්තිය වේ.

11. දියෙහිවූද ගොඩවූද හැදෙන වැඩෙන අමු තෘණ වෘක්ෂලතා යන භූතගාම[24] විකොපනය කිරීමෙන් හා අනුන් ලවා සිඳුවීම් බිඳුවීමාදි විකෝපනය කරවීමෙන් භූතගාම සුද්ධපාචිත්තිය වේ.

12 ඇවැත්නි! ඔබවහන්සේ මෙනම් ඇවතකට පැමිණියෙහි දැයි විචාළ කල කියයුතු නිවරැදි පිළිතුර හැර අනිකක් කීමෙහි ද, කිසිවක් නොකියා සංඝයා වෙහෙසීමෙහි ද, සංඝයා විසින් අඤ්ඤවාද විහෙසක කර්මය කළ කල්හි නැවතත් එසේම පැවතීමෙන් අඤ්ඤවාදක විහෙසක සුද්ධ පාචිත්තිය වේ.

13 සංඝසම්මුති නොලෙසින්[25] සම්මුති ලද උපසම්පන්න භික්ෂු නම්හට අයශ අකීර්තිය පිණිස අන්‍ය උපසම්පන්න භික්ෂූන් වහන්සේ හමුවෙහි හෙළාදැකීමෙන් හා දොස් පැවරීමෙන් උජ්ඣාපනක ඛියනක සුද්ධ පාචිත්තිය වේ.

14 සඟ සතු ඇඳ පුටු ආදියක් තමා හෝ අනුන් හෝ සදහා එළිමහනෙහි පනවා, නැවත තැන්පත් නො කොට හෝ නො කරවා හෝ නො පිළිවිස හෝ යාමෙන් අජ්ඣොකාසසන්ථරණක ශුද්ධ පචිත්තිය වේ.

15 සඟ සතු කොට්ට මෙට්ට ආදියක් තමා හෝ අනුන් හෝ සදහා අතුරා හෝ අතුරවා හෝ තබා, නැවත තැන්පත් නො කොට හෝ නො කරවා හෝ නො පිළිවිස හෝ විහාර උපචාරය ඉක්මවීමෙන් විහාරසන්ථරණක ශුද්ධ පචිත්තිය වේ.

16 සඟ සතු වෙහෙරකට පළමු ව පිවිසි භික්ෂුවක් බව දැන දැනම ඒ භික්ෂුවට පීඩා කරනු රිසින් එහි වැද හිඳීම සැතපීම කිරීමෙන් අනුපඛජ්ජනියජ ශුද්ධ පචිත්තිය වේ.

17 උපසම්පන්න භික්ෂුවක් සඟ සතු වෙහෙරකින් නෙරපීමෙන් හෝ නෙරපවීමෙන් හෝ නික්කඩ්ඪනක ශුද්ධ පචිත්තිය වේ

18 සඟ සතු කුටියක උඩුමහලෙහි තලාද පිට ඔබන ලද ආහච්චපාදය යි කියන ලද පා විද විගල් යනා ඇණ නොගැසූ ඇඳ පුටුවක හදිසියේ හිඳීම සැතපීම කිරීමෙන් වෙහාසකුටි ශුද්ධ පචිත්තිය වේ

19 ලොකු අරමක් කරවන භික්ෂුව විසින් උළුවස්ස ශක්තිමත් වීම සඳහාත් ආලෝක සිදුරු වැසීම සඳහාත් මැටි ආලේප කළ යුතු ය. වහල ද තණකැරලි එක පිට එක සිටින පරිදි දෙතුන් වරක් සෙවිලි කළ යුතු ය. තණ නැති බිමක පිහිටා එය විධාන කළ යුතු ය. දෙතුන් වරකට වඩා මැටි ගැසීම, වහල සෙවිලි කිරීම හා තණ මත සිට විධාන කිරීම ඇති භික්ෂුවට කුටිලෙපන ශුද්ධ පචිත්තිය වේ.

20 දැන දැන ප්‍රාණීන් සහිත ජලය තණ හා මැටි මත ඉසී ද ඉසවා ද, උදකසිඤ්චනක ශුද්ධ පචිත්තිය වේ.

21 අෂ්ටවාචික උපසම්පදාව[26] ලත් භික්ෂුණීන්ට, සම්මුතිය නො ලබා අෂ්ට ගරුධර්මයෙන[27] අවවාද කිරීමෙන් අසම්මතොවාදක ශුද්ධ පචිත්තිය වේ.

22 සම්මුති ය ලදත් හිරු බට කල භික්ෂුණීන්ට අවවාද කිරීමෙන් අත්ථඞ්ගත ශුද්ධ පචිත්තිය වේ.

23 මෙහෙණවරකට ගොස් නොගිලන් භික්ෂුණීන්ට අවවාද කිරීමෙන් උපස්සය ශුද්ධ පචිත්තිය වේ.

24 සම්මුති ය ලද භික්ෂූහට 'ආමිෂ ආශාවෙන් භික්ෂුණීන්ට අවවාද කරත්' යයි කීමෙන් ආමිසහෙතු ශුද්ධ පචිත්තිය වේ.

25 පුළු දෙයකින් හෝ මාරු කර ගැනීමක් හැර ම නොනෑ භික්ෂුණීනට සිවුරක් දීමෙන් චීවරදාන ශුද්ධ පචිත්තිය වේ.

26 නොනෑ භික්ෂුණියකගේ සිවුරු මැසීමෙන් හෝ මැස්වීමෙන් හෝ සිබ්බන ශුද්ධ පචිත්තිය වේ.

27 වෙළඳ සමූහයක් සමග එක් ව යා යුතු තරම් සැක බිය කාලයක මිස නොකාලයක භික්ෂුණියක හා දිග් මගකට පැමිණියේ යටත් පිරිසෙයින් තමා හුන් ගමින් අන් ගමකට හෝ යෑ ද, සංවිධාන ගමන ශුද්ධ පචිත්තිය වේ.

28 එතෙර වනු පිණිස ගඟ තරණ යාමක දී හැර උඩුගං හෝ යටිගං හෝ බලා යන නැවක භික්ෂුණියක හා එක් ව නැගේ නම්, නාවාභිරූහණ ශුද්ධ පචිත්තිය වේ.

29 පළමු ව හෝ ගෘහස්ථයන්ගේ පිළියෙල කිරීමක් නැති ව හුදෙක් භික්ෂුණියක විසින් පිහන ලද පිණ්ඩපාතය අනුභව කිරීමෙන් භික්ඛුනීපරිපාචිත ශුද්ධ පචිත්තිය වේ.

30 හුදෙකලා භික්ෂුණියක සමග රහසිගත ව හිඳීමෙන් රහොනිසීදන ශුද්ධ පචිත්තිය වේ.

31 නොගිලන් භික්ෂුව විසින් ආගන්තුකාදීන් සඳහා ශාලාවක එළවූ පිණ්ඩපාතය එක් දිනක් ම අනුභව කළ යුතු ය. ඉන් මත්තෙහි අනුභව කිරීමෙන් ආවසථපිණ්ඩ ශුද්ධ පචිත්තිය වේ.

32 ගිලාන සමය ආදී සත් වැදෑරුම් සමය[28] හැර නිමන්ත්‍රණයෙන් හෝ විඤ්ඤත්තියෙන් හෝ නිපන් පංචවිධ භෝජනය[29] යටත් පිරිසෙයින් සිව් නමක් ව එකට ගෙන අනුභව කිරීමෙන් ගණභෝජන ශුද්ධ පචිත්තිය වේ.

33 ආරාධිත ක්‍රමය ඉක්මවා වැළඳීමෙන් පරම්පරභොජන ශුද්ධ පචිත්තිය වේ.

34 ගෙයකට පැමිණි භික්ෂුවට කැවුම් හෝ අග්ගලාවලින් හෝ පවරන ලද නම් දෙ තුන් පාත්‍රයක් පුරා පිළිගත හැකි ය. ඉන් මත්තෙහි පිළිගත්තාට කාණමාතුපටිග්ගහණ ශුද්ධ පචිත්තිය වේ

35 වළඳන කල බෙදනු පිණිස අත්පසට[30] ගෙනෙන ලද පංචවිධ භෝජනයෙන් යමක් ප්‍රතික්ෂේප කොට, නැගිට නැවත අනතිරිත්ත ආමිෂයක් අනුභව කිරීමෙන් පවාරණ ශුද්ධ පචිත්තිය වේ.

36 පවාරණයට[31] පැමිණි භික්ෂුවකට අනතිරිත්ත භෝජනය පවරා ද, 'මේ අනුභව කරන' යි කියා ද, ඒ ඇදහූ භික්ෂුවගේ වැළඳීමෙන් දුතිය පවාරණ ශුද්ධ පචිත්තිය වේ.

37 කෑ යුතු බිදිය යුතු දෑයක් විකාලයෙහි අනුභවයෙන් විකාල භෝජන ශුද්ධ පචිත්තිය වේ.

38 යාවකාලික හෝ යාමකාලික හෝ යමක් පිළිගෙන[32] දිනක් තැන්පත් කොට තබා වැළඳීමෙන් සන්නිධිකාර ශුද්ධ පචිත්තිය වේ.

39 නොගිලන් භික්ෂුවක් ගිතෙල්, මී, වෙඬරු, උක්සකුරු, තලතෙල්, දිය ගොඩ මස්, කිරි, දිකිරි යන මෙයින් මිශ්‍ර කළ හැල්, වී, යව, තණ අමු, තිරිඟු, හෝදළු යන සප්තවිධ ධාන්‍යයෙන් කරන ලද ප්‍රණීත භෝජනයක් තමා සඳහා ඉල්ලා වළඳා නම්, පණීතභෝජන විඤ්ඤත්ති ශුද්ධ පචිත්තිය වේ.

40 දැහැටි පැන් හැර නොපිළිගැන්වූ ආහාරයක් වළඳා නම්, අප්පටිග්ගහණ ශුද්ධ පචිත්තිය වේ.

41. නග්නයකුට හෝ පිරිවැජියකුට හෝ පිරිවැජියකට හෝ කෑ යුතු බිදිය යුතු දෑයක් සියතින් දේ නම්, අචේලකදාන ශුද්ධ පචිත්තිය වේ

42 භික්ෂුවක් සමග කතා කොට ගෙන පිඬු පිණිස ගමට වැද, යම් පිණ්ඩාහාරයක් දෙවා හෝ නො දෙවා හෝ කිසියම් අනාචාරයක් පිණිස ඒ භික්ෂුව පලවා හරී නම්, උය්‍යෝජන ශුද්ධ පචිත්තිය වේ.

43. මෛථුන් දම් රාගයෙන් යුත් අඹු සැමියන් දෙදෙනකු සහිත කාමරයට ඇතුළු ව හිඳී නම්, සභෝජනකුල ශුද්ධ පචිත්තිය වේ.

44. ස්ත්‍රියක සමග පිළිසත් අප්‍රකට රහසිගතව හිඳී නම්, රහෝනිසජ්ජ ශුද්ධ පචිත්තිය වේ.

45 එකලා මාගමක සමග ඇසට කනට රහස් තන්හි හිඳී නම්, දුතියරහෝනිසජ්ජ ශුද්ධ පචිත්තිය වේ.

46 පංචවිධ භෝජනයන්ගෙන් කිසිවකින් නිමන්ත්‍රණය කරන ලදුව ආරාමසථ භික්ෂුවකට නො දන්වා සිවුරු දෙන කාලයෙහි හෝ සිවුරු කරන කාලයෙහි හැර අන් කල උදේ සවස ගමට වැද ගෙවල ඇවිදී නම්, චාරිත්ත ශුද්ධ පචිත්තිය වේ.

47. නොගිලන් භික්ෂුව විසින් සිවු මසකින් කරනු ලබන නැවත පවාරණයත්, ගිලන් බව පිණිස කරනු ලබන නිත්‍ය පවාරණයත් හැර සිවු මසකට කරන පවාරණය පිළිගත යුතු ය. ඉන් වඩා පිළිගත හොත් භෙසජ්ජ විඤ්ඤාපන ශුද්ධ පචිත්තිය වේ.

48 නගරයෙන් නික්මුණු යුදසෙන් බලනු පිණිස සුදුසු කරුණක් නැති ව යේ නම්, උය්‍යුත්තසෙනාදස්සන ශුද්ධ පචිතිය වේ.

49 යුද සෙන් තුළ කිසි යම් කටයුත්තක් ඇත් නම් දෙ තුන් රැයකට වඩා කඳවුර සමඟ විසිය නො හැකි ය. ඉන් මත්තෙහි වසන්නහුට සෙනාවාස ශුද්ධ පචිතිය වේ.

50 දෙ තුන් රැයක් මුළුල්ලෙහි වසන මහණ, හැගි හැගී යුද කරන තැනට හෝ යුද සෙන් ගණන් ගන්නා තැනට හෝ බල සෙන් බන්නා තැනට හෝ සිවුරඟ සෙන [33] දකිනු පිණිස හෝ යේ නම්, උය්‍යොධික ශුද්ධ පචිතිය වේ

51. රහමෙර පීමෙන් සුරාපාන ශුද්ධ පචිතිය වේ.

52. ඇඟිල්ලෙන් කිති කැවීමෙන් අඞ්ගුලිපතොදක ශුද්ධ පචිතිය වේ.

53. ජලයෙහි ක්‍රීඩා කිරීමෙන් උදකහසසධම්ම ශුද්ධ පචිතිය වේ.

54 සික්පදයෙන් අවවාද කළහුට හෝ ධර්මයට හෝ ගැරහීමෙන් අනාදර ශුද්ධ පචිතිය වේ

55. උපසම්පන්න භික්ෂුවක් බියගන්වා නම්, භිංසාපනක ශුද්ධ පචිතිය වේ.

56. නො ගිලන් ව ගිනිතපිනු කැමැති ව පහන් දැල්වීමාදි හේතුවක් නැති ව ගිනි දල්වා ද දල්වවා ද, ජොතිසමාදහන ශුද්ධ පචිතිය වේ.

57. නාන කාලය [34] හැර අඩමසක් තුළ නහා නම්, නහාන ශුද්ධ පචිතිය වේ.

58. අලුත් සිවුරක් ලැබ, නිල් - මඩ - කළු යන වර්ණ තුනෙන් එක ද වර්ණයක් හෝ නො ගන්වා පරිභෝග කිරීමෙන් දුබ්බණ්ණ-අනාදන ශුද්ධ පචිතිය වේ.

59. භික්ෂු, භික්ෂුණී, ශික්ෂමානා, සාමණේර, සාමණේරී යන මොවුන්ගෙන් කෙනකුට සිවුරක් විකල්පනය කොට [35] නැවත පචාරණය [36] නො කොට, ගෙන පරිභෝග කෙරේ නම්, විකප්පන ශුද්ධ පචිතිය වේ.

60 අන් භික්ෂුවකගේ පාත්‍රයක්, සිවුරක්, නිසීදනයක්, ඉඳිකටු ගුලාවක් හෝ පටියක් ගවත පිරනෙයින් සිනා පිණිස වුව ද සඟවා නම් සඟවවා නම්, අප්‍රතිධාන ශුද්ධ පචිතිය වේ.

61 දැන දැන තිරිසන් සතකු දිවි තොර කෙරේ නම්, පාණජීවිතා වොරොපන ශුද්ධ පචිතිය වේ.

62. දැන දැන ප්‍රාණීන් සහිත ජලය පරිභෝග කෙරේ නම්, සප්පාණක ශුද්ධ පචිතිය වේ.

63. විනයානුකූලව සන්සිඳුවන ලද අධිකරණයක් ඒ බව දැන දැන නැවත විභාගවනු පිණිස උගුළුවා නම්, උක්කොටනක ශුද්ධ පචිත්තිය වේ.

64. භික්‍ෂුවකගේ සඟවෙසෙස් ඇවැතක් දැන දැන සඟවා නම්, දුට්ඨුල්ලපටිච්ඡාදන ශුද්ධ පචිත්තිය වේ.

65 අඩු විසිවස් සාමණේර නමක් උපසපන් කිරීමෙන් උපාධ්‍යායයන් වහන්සේට ඌනවීසති[37] ශුද්ධ පචිත්තිය වේ.

66 දැන දැන සොර වෙළෙඳමුලක් සමඟ කතා කොට දික් මඟකට පිවිසියේ ගවුත්පිරිසෙයින් ගමකින් ගමකට හෝ යේ ද, ථෙය්‍යසත්ථ ශුද්ධ පචිත්තිය වේ.

67 මාගමක සමඟ කතා කොට ගෙන අදත්මඟකට පිළිපන්නේ ගවුත්පිරිසෙයින් ගමකින් ගමකට හෝ යේ ද, සංවිධානගමන ශුද්ධ පචිත්තිය වේ.

68. 'භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද අන්තරායකර ධර්මයෝ ඒ සේවනය කරන්නාට අන්තරායකර නො වෙති යි උන් වහන්සේ ම දෙසූ ධර්මය මම දනිමි' යි යම් භික්‍ෂුවක් කියා නම් සෙසු භික්‍ෂූන් විසින් මෙසේ කියයුතු යි "ඇවැත්නි, එසේ නො කියනු මැනැවි භාග්‍යවතුන් වහන්සේට ගැරහීම නුසුදුසු ය නොයෙක් ලෙසින් අන්තරායික ධර්ම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලදී. ඒ සේවනය කරන්නාට අන්තරාය නියත ම යි" මෙසේ කියද්දීත් ඒ භික්‍ෂුව යට අදහස ම දැඩි ව ගෙන සිටී නම්, ඒ දුරලනු පිණිස තුන්වර දක්වා සමනුභාෂණය කළ යුතු යි. තුන් වැනි වර ඒ දෘෂ්ටිය හළේ නම් මැනැවි නො හළොත් දිට්ඨිඅප්පටිනිස්සජ්ජන ශුද්ධ පචිත්තිය වේ.

69. උක්ඛිත්තක භික්‍ෂුවක් බව දැන දැන එ බඳු මිථ්‍යාවාද ඇති, ඇවැතට පිළියම් නොකළ, දෘෂ්ටිය අත් නොහළ මහණ සමඟ ධර්ම - ආමිෂ සම්භෝගය පැවැත්වීමෙන්, විනය කර්ම කිරීමෙන්, එක ගෙයක විසීමෙන්, උක්ඛිත්තානුවත්තක ශුද්ධ පචිත්තිය වේ.

70 දණ්ඩකර්ම නාශනයෙන් නැසූ සාමණේර නමකට සංග්‍රහ කෙරේ නම්, උවටැන් කරවා ගනී නම්, එක ගෙයක හෝ සයනය කෙරේ නම්, උපලාලන ශුද්ධ පචිත්තිය වේ.

71 පැනවූ සිකපදයකින් අවවාද කරනු ලබන භික්‍ෂුව 'ඇවැත්නි, ව්‍යක්ත විනයධර භික්‍ෂූන් වහන්සේ නමක් විචාරන තෙක් මේ සිකපදයෙහි මම නො හික්මෙන්නෙමි' යි කියා නම්, සහධම්ම ශුද්ධ පචිත්තිය වේ.

72 පාමොක් උදෙසන කල 'මේ කුඩා අනුකුඩා සිකපදයන් උදෙසීමෙන් කවර වැඩක් ද? හුදෙක් කුකුස් පිණිස පවණක් වෙතී'ය යි සිකපදයන්ට නිගරු කිරීමෙන් සික්ඛාපදවිවණ්ණනක ශුද්ධ පචිත්තිය වේ.

73 අධර්මයක් පාතා පාමොක් උදෙසනු ලබන කල්හිත්, ඇවැත්ති, මේ විනය කොටස් පෙළෙහි ආයේ ලු. අධර්මයකට වරක් උදෙසාලූ 'මා දත්තේ දැන් ය' යි කියා නම්, එබඳු භික්ෂුව සිමසර භික්ෂූන් විසින් දෙතුන් වරක දක්නා ලැබ ඇත් නම්, නොදනීම පමණින් ඒ මහණහුට ඇවැත්තින් මිදීමක් නැත. එම වරදෙහි ලා ඒ භික්ෂුව යම් ඇවැතකට පැමිණියේ නම් ඊට දඬුවම් කටයුතු යි මත්තෙහි තුමූලාම පිණිස මෝහාරෝපණ කර්මය කරවියයුතු යි. නැවතත් මූලාවෙන් දෙඩන භික්ෂුවට මෝහනක ශුද්ධ පචිත්තිය වේ.

74 කුපිත ව නොසතුටු සිතින් අන් භික්ෂුවකට පහර දේ නම්, පහාරදාන ශුද්ධ පචිත්තිය වේ.

75 කුපිත ව නොසතුටු ව අන් භික්ෂුවකට පහර දෙන සිතින් අත් පා ඔසවා ද, තලසත්තික ශුද්ධ පචිත්තිය වේ.

76 මුල් රහිත සඟවෙසෙස් ඇවැතකින් අන් භික්ෂුවකට චෝදනා කෙරේ නම්, අමූලක ශුද්ධ පචිත්තිය වේ.

77 'මොහොතකට හෝ කරදරයක් කරමි' යි සිතා කරුණක් නැති ව භික්ෂුවකට කුකුස උපදවා නම්, කුක්කුච්චුප්පාදන ශුද්ධ පචිත්තිය වේ.

78 දබර කරන, කලහ කරන, විවාදයට බැස ගත් භික්ෂූන්ගේ කතාබස් අසන රිසින් ඇසෙන දුරින් අන් කරුණක් නැති ව සිටී නම්, උපස්සුති ශුද්ධ පචිත්තිය වේ

79 අපලෝකනාදි විනය කර්මයන්ට ඡන්දය දී පසු ව දොස් කියා නම්, කම්මපටිබාහන ශුද්ධ පචිත්තිය වේ.

80 සංඝයා අතර විනිශ්චයක් පවත්නා කල ඡන්දය නොදී හුනස්නෙන් නැගිට යේ නම්, ඡන්දඅදාන ශුද්ධ පචිත්තිය වේ.

81 සංඝයා හා එක් ම භික්ෂුකට සිවුරක් දී, පසු ව 'විශ්වාසීන්ට සාංඝික ලාභය පිරිනමති'යි අගුණ පවසා නම්, ඛීයනක ශුද්ධ පචිත්තිය වේ.

82 සඟ සතු දූන දූන දූන පුද්ගලයකුට පමරා නම්, ලාභපරිණාම ශුද්ධ පචිත්තිය වේ.

83 අභිෂිකත ක්ෂත්‍රිය රජකුගේ යහන් ගැබට වදිනු නැමැතිව රජු හා දේවිය පිටතට නොනික්මිකල්හි කලින් කල දැන්වීමක් ද නොමැති ව එළිපත්ත ඉක්මවා නම්, අන්තෙපුරප්පවේසන ශුද්ධ පචිත්තිය වේ.

84 රත්නයක් හෝ රත්න ය යි සම්මත වස්තුවක් හෝ ආරාමයේ හෝ වාසය ගෙහි හෝ අනෙක් තැනක තිබී අවුලා ගනී ද අනුන් ලවා ගන්වා ද, පජිනාවන ශුද්ධ පචිත්තිය වේ.[38]

85 අවශ්‍ය ඉක්මන් කටයුත්තක දී හැර ආරාමස්ථ භික්ෂුවකට නොදන්වා නොකල්හි ගම වදී නම්, විකාලගාමප්පවේසන ශුද්ධ පචිත්තිය වේ.

86 ඇට ආදී ඇටයෙකින් හෝ ඇත් ආදී දළයකින් හෝ මුව ආදී අඟකින් හෝ ඉඳිකටු ගුලාවක් කරවා නම්, සූචිඝර ශුද්ධ පචිත්තිය වේ.

87 අලුත් ඇඳක් හෝ පුටුවක් හෝ කරවන භික්ෂුව විසින් සුගත් අඟලෙන් [39] අට ඟුලක් උස ඇති ව කරවිය යුතු යි. එය ඉක්මවීමෙන් මඤ්චකාරාපන ශුද්ධ පචිත්තිය වේ.

88 ඇඳක් හෝ පුටුවක් හෝ පුළුන් ගවසා කරවයි නම්, තූලෝනද්ධමඤ්ච උද්දාලනක (පුළුන් ගලවා දමා ඇවැත් දෙසිය යුතු) ශුද්ධ පචිත්තිය වේ.

89 නිසීදනයක් කරවන භික්ෂුව විසින් දිගින් සුගත් වියතින් දෙ වියතක් ද පළලින් වියත් එක හමාරක් ද වන ලෙස කරවිය යුතු යි. එය ඉක්මවීමෙන් නිසීදනකාරාපන නම් ඡේදනක (සිඳ බිඳ දමීමෙන් පසු ඇවැත් දෙසිය යුතු) ශුද්ධ පචිත්තිය වේ.

90 කුෂ්ට රෝගාදියක් වසා අඳින සිවුරක් කරවන භික්ෂුව විසින් දිගින් සුගත් වියතින් වියත් සතරක් හා පළලින් වියත් දෙකක් ද ඇති ව කරවිය යුතු යි. මෙය ඉක්මවීමෙන් කණ්ඩුප්පටිච්ඡාදන නම් ඡේදනක (ඉරා දමීමෙන් පසු ඇවැත් දෙසිය යුතු) ශුද්ධ පචිත්තිය වේ.

91 වැසිසළුවක් කරවන භික්ෂුව විසින් දිගින් සුගත් වියතින් වියත් සයක් ද, පළලින් දෙවියත් හමාරක් ද වෙන සේ කරවිය යුතු යි මෙය ඉක්මවීමෙන් වස්සිකසාටික නම් ඡේදනක ශුද්ධ පචිත්තිය වේ

92 යම් භික්ෂුවක් සුගත් සිවුර [40] පමණ වූ හෝ ඊට වැඩි වූ හෝ සිවුරක් කරවා නම්, සුගතචීවර නම් ඡේදනක ශුද්ධ පචිත්තිය වේ.

මේ ශුද්ධ පචිති දෙයානූව ද පළමු කී නිසගි පචිති සමතිස ද පාචිත්තිය[41] ආපත්ති සකන්ධය නම් වෙයි.

## සතර පාටිදේසනීය ආපත්ති:-

1 යම් භික්ෂුවක් ඇතුළුගමට පිවිස නොනෑ මෙහෙණක අතින් කෑ යුතු බිදිය යුතු දෙයක් සියතින් පිළිගෙන වැළඳීමෙන් අඤ්ඤාතිකා පටිග්ගහණ පාටිදේසනීය ආපත්තිය වේ.

2 දායක කුලයෙහි ආරාධිත භික්ෂූන් වළඳන තැන, 'මෙහි බත් බෙදව, මෙහි හොද්ද බෙදව' යි විධාන කරමින් සිටි මෙහෙණක, 'නැඟණිය, භික්ෂූන් වළඳා අවසන් වන තුරු මෙයින් ඉවත් ව යව' යි ඉවත් කිරීමට නොහැකි වුණි නම්, වොසාසමාන පාටිදේසනීය ආපත්තිය වේ.

3 නොගිලන් භික්ෂුවක් සේඛ සම්මත කුලයකට[42] කලින් නො පවරන ලද්දේ ම එළඹ, කෑ යුතු බිදිය යුතු දෑයක් සියතින් ගෙන වැළඳීමෙන් සේඛසම්මත පාටිදේසනීය ආපත්තිය වේ

4 යම් භික්ෂුවක් සැක බිය සහිත අරණ්‍ය සේනාසනයක වසමින් කලින් නොහඟවන ලද කෙනෙකුගෙන් කෑ යුතු බිදිය යුතු දෑයක් සියතින් පිළිගෙන වළඳා නම්, ආරඤ්ඤක පාටිදේසනීය ආපත්තිය වේ.

මේ සතර, පාටිදේසනීය ආපත්ති[43] සකන්ධය නම් වෙයි.

## පන්සැත්තෑ සේඛියා:-

1 හාත්පසින් වට කොට අඳනය නො හැඳීමෙන් අපරිමණ්ඩල නිවාසන දුකුළාව වේ.

2 හාත්පසින් වට කොට සිවුරු නො පෙරවීමෙන් අපරිමණ්ඩල පාරුපන දුකුළාව වේ.

3 සුපිළියන් ව කය වසා ඇතුළුගමෙහි නො යාමෙන් සුපටිච්ඡන්න අගමන දුකුළාව වේ

4 සුපිළියන් ව කය වසා ඇතුළුගමෙහි නො හිඳීමෙන් සුපටිච්ඡන්න අනිසීදන දුකුළාව වේ.

5 සංවර ඇති ව ඇතුළුගමෙහි නො යාමෙන් සුසංවුතඅගමන දුකුළාව වේ.

6 සංවර ඇති ව ඇතුළුගමෙහි නො හිඳීමෙන් සුසංවුතඅනිසීදන දුකුළාව වේ.

7 යට හෙළූ ඇස් ඇති ව ඇතුළුගමෙහි නො යාමෙන් ඔක්ඛිත්තචක්ඛු අගමන දුකුළාව වේ.

8 යට හෙළූ ඇස් ඇතිව ඇතුළුගමෙහි නො හිඳීමෙන් ඔක්ඛිත්තචක්ඛු අනිසීදන දුකුළාව වේ.

9 සිවුර ඔසවා ගෙන ඇතුළුගමෙහි යාමෙන් උක්ඛිත්තකායගමන දුකුළාව වේ.

10 සිවුර ඔසවා ගෙන ඇතුළුගමෙහි හිඳීමෙන් උක්ඛිත්තකාය නිසීදන දුකුළාව වේ.

11 මහ හඬින් සිනාසෙමින් ඇතුළුගමෙහි යාමෙන් උජ්ජග්ඝිකාගමන දුකුළාව වේ.

12 මහ හඬින් සිනාසෙමින් ඇතුළුගමෙහි හිඳීමෙන් උජ්ජග්ඝිකානිසීදන දුකුළාව වේ.

13 දෙලොස් රියනකින් දුර ඇසෙන සේ හඬ නගමින් ඇතුළුගමෙහි යාමෙන් මහාසද්දගමන දුකුළාව වේ.

14 දෙලොව් පියනකින් දුර ඇසෙන ලෙස හඬ නගමින් ඇතුළු ගම්හි හිඳීමෙන් මහාසද්ද නිසීදන දුකුළාව වේ.

15 කය සොලොවමින් ඇතුළුගම්හි යාමෙන් කායප්පචාලක ගමන දුකුළාව වේ.

16 කය සොලොවමින් ඇතුළුගම්හි හිඳීමෙන් කායප්පචාලක නිසීදන දුකුළාව වේ

17 අත් සොලොවමින් ඇතුළුගම්හි යාමෙන් බාහුප්පචාලක ගමන දුකුළාව වේ.

18 අත් සොලොවමින් ඇතුළුගම්හි හිඳීමෙන් බාහුප්පචාලක නිසීදන දුකුළාව වේ.

19 හිස සොලොවමින් ඇතුළුගම්හි යාමෙන් සීසප්පචාලකගමන දුකුළාව වේ.

20 හිස සොලොවමින් ඇතුළුගම්හි හිඳීමෙන් සීසප්පචාලක නිසීදන දුකුළාව වේ.

21 උකුලෙහි අත තබා ඇතුළුගම්හි යාමෙන් ඛම්භකතගමන දුකුළාව වේ.

22 උකුලෙහි අත තබා ඇතුළුගම්හි හිඳීමෙන් ඛම්භකත නිසීදන දුකුළාව වේ.

23 හිස් වැසුම් ඇති ව ඇතුළුගම්හි යාමෙන් ඔගුණ්ඨිතගමන දුකුළාව වේ

24 හිස් වැසුම් ඇති ව ඇතුළුගම්හි හිඳීමෙන් ඔගුණ්ඨිත නිසීදන දුකුළාව වේ.

25 විළුඹෙන් හෝ ඇඟිලි අගින් හෝ ඇතුළුගම්හි යාමෙන් උක්කුටිකගමන දුකුළාව වේ.

26 දෑතින් හෝ සිවුරෙන් හෝ දෙ දණ වට කොට ඇතුළුගම්හි හිඳීමෙන් පල්ලත්ථික නිසීදන දුකුළාව වේ

27 සිහි ඇති ව පිඬු නො පිළිගැනීමෙන් සක්කච්ච අපටිග්ගහණ දුකුළාව වේ.

28 පාත්‍ර සංඥාවෙන් තොර ව පිඬු පිළිගැනීමෙන් පත්තසඤ්ඤී අපටිග්ගහණ දුකුළාව වේ.

29 බතින් සතරෙන් කොටසකට වැඩි සූප ඇති ව පිඬු පිළිගැනීමෙන් සමසූපක අපටිග්ගහණ දුකුළාව වේ.

30 පාත්‍රයේ ඇතුළු මුවවිට ඉක්මවා පිඬු පිළිගැනීමෙන් සමතිත්තික අපටිග්ගහණ දුකුළාව වේ.

31 සිහියෙන් තොර ව වැළඳීමෙන් අසක්කච්ච භුඤ්ජන දුකුළාව වේ.

32 පාත්‍රසංඥාවෙන් තොර ව වැළඳීමෙන් පත්තසඤ්ඤී අභුඤ්ජන දුකුළාව වේ.

33 පාත්‍රයෙහි තමාගේ ඉදිරිපස පටන් නො වැළඳීමෙන් සපදාන අභුඤ්ජන දුකුළාව වේ

34 බතින් සතරෙන් කොටසකට වැඩි සූප ඇති ව පිඬු වැළඳීමෙන් සමසූපක අභුඤ්ජන දුකුළාව වේ.

35 බතේ මුදුනෙන් තලා පිඬු වැළඳීමෙන් ථූපතොමද්දන දුකුළාව වේ.

36 බොහෝ ලබා ගනු කැමැති ව සූපයක් හෝ ව්‍යංජනයක් හෝ බතින් වැසීමෙන් ඔදන පටිච්ඡාදන දුකුළාව වේ.

37 නො ගිලන් ව සූපයක් හෝ බතක් හෝ තමා සඳහා ඉල්ලා වැළඳීමෙන් සූපොදන විඤ්ඤත්ති දුකුළාව වේ.

38 ගරහන සිතින් අනුන්ගේ පාත්‍රය බැලීමෙන් උජ්ඣානසඤ්ඤී දුකුළාව වේ.

39 ඉතා මහත් බත්පිඬු කිරීමෙන් අතිමහන්තකබලකරණ දුකුළාව වේ.

40 හාත්පසින් වට කොට බත් පිඬු නො කිරීමෙන් පරිමණ්ඩල ආලොපඅකරණ දුකුළාව වේ.

41 බත් පිඩ මුවට ලං වීමට පෙර මුව හැරීමෙන් මුඛද්වාර විවරණ දුකුළාව වේ.

42 වළඳන අතර සියලු අත හෝ ඇඟිල්ලක් හෝ මුව තුළට ගැනීමෙන් හත්ථමුඛපක්ඛෙපන දුකුළාව වේ.

43 මුවතුළ අහර ඇති ව කථා කිරීමෙන් බ්‍යාහරණ දුකුළාව වේ

44 බත්පිඬු මුවතුළට විසි කරමින් වැළඳීමෙන් පිණ්ඩුක්ඛෙපක දුකුළාව වේ.

45 බත්පිඬු කඩ කඩා වැළඳීමෙන් කබලාවච්ඡෙදක දුකුළාව වේ

46 වඳුරන් මෙන් මුවෙහි (ගත්තෙහි) බත්පිඬු පුරවා වැළඳීමෙන් අවගණ්ඩකාරක දුකුළාව වේ.

47 අත ගසා දමමින් වැළඳීමෙන් හත්ථනිද්ධූනක දුකුළාව වේ.

48 බත්තුළු විසුරුවමින් වැළඳීමෙන් සිත්ථාවකාරක දුකුළාව වේ

49 (තොලෙන් පිටතට) දිව හෙරවමින් වැළඳීමෙන් ජිව්හා-නිච්ඡාරක දුකුළාව වේ.

50 කලු ගසමින් මැලදීමෙන් චපුචපුකාර දුකුලාව වේ.

51 සුරු සුරු යන හඬ ඇතිව මැලදීමෙන් සුරුසුරුකාර දුකුලාව වේ.

52 අත ලෙවමින් මැලදීමෙන් හත්ථනිල්ලෙහක දුකුලාව වේ.

53 (ඇඟිල්ලෙන්) පාත්‍රය ලෙවමින් මැලදීමෙන් පත්තනිල්ලෙහක දුකුලාව වේ.

54 දිවෙන් තොල් ලෙවමින් මැලදීමෙන් ඔට්ඨනිල්ලෙහක දුකුලාව වේ

55 ඉඳුල් අතින් පැන් තළිය පිළිගැනීමෙන් ථාලකපටිග්ගහණ දුකුලාව වේ

56 බත්හුළු සහිත පාත්‍රා සේදූ ජලය ඇතුළුගමෙහි හෝ ඇතුළු ගෙහි හෝ දැමීමෙන් සසිත්ථකඩ්ඩක දුකුලාව වේ.

57 කුඩයක් දරා සිටි නො ගිලනකුට දහම් දෙසීමෙන් ඡත්තපාණී ධම්මදෙසනා දුකුලාව වේ.

58 දණ්ඩක් (සැරයටියක්) ගත් නො ගිලනකුට දහම් දෙසීමෙන් දණ්ඩපාණී ධම්මදෙසනා දුකුලාව වේ.

59 (කඩු ආදී) ශස්ත්‍රයක් ගත් නො ගිලනකුට දහම් දෙසීමෙන් සත්ථපාණී ධම්මදෙසනා දුකුලාව වේ.

60 (දුනු ආදී) ආයුධ ගත් නො ගිලනකුට දහම් දෙසීමෙන් ආයුධපාණී ධම්මදෙසනා දුකුලාව වේ.

61 ලී සෙරෙප්පු පය ලූ නො ගිලනකුට දහම් දෙසීමෙන් පාදුකාරූළ්හ ධම්මදෙසනා දුකුලාව වේ.

62 මහන් (සෙරෙප්පු) පය ලූ නො ගිලනකුට දහම් දෙසීමෙන් උපාහනාරූළ්හ ධම්මදෙසනා දුකුලාව වේ.

63 රියක නැගි නො ගිලනකුට දහම් දෙසීමෙන් යානගත ධම්මදෙසනා දුකුලාව වේ

64 ඇඳක නිදන නො ගිලනකුට දහම් දෙසීමෙන් සයනගත ධම්මදෙසනා දුකුලාව වේ.

65 වතින් අහෝ අතින් හෝ අකාමිට්ටු බැඳ ගෙන හිඳින නො ගිලනකුට දහම් දෙසීමෙන් පල්ලත්ථික ධම්මදෙසනා දුකුලාව වේ.

66 හිස් වෙළුම් සහිත නො ගිලනකුට දහම් දෙසීමෙන් වෙඨිතසීස ධම්මදෙසනා දුකුලාව වේ.

67 හිස වසා පෙරවූ නො ගිලනකුට දහම් දෙසීමෙන් ඔගුණ්ඨිතසීස ධම්මදෙසනා දුකුලාව වේ.

68 අසුන්හි හුන් නො ගිලනකුට බිම හිඳ දහම් දෙසීමෙන් ඡමාය ධම්මදෙසනා දුකුලාව වේ.

69 උසසුන්හි හුන් නො ගිලනකුට මිටි අසුන්හි හිඳ දහම් දෙසීමෙන් නීචාසන ධම්මදෙසනා දුකුලාව වේ.

70 හුන් නො ගිලනකුට සිට ගෙන දහම් දෙසීමෙන් ඨාන ධම්මදෙසනා දුකුලාව වේ.

71 පෙරටු ව යන නො ගිලනකුට පසු ව යමින් දහම් දෙසීමෙන් පච්ඡතො ධම්මදෙසනා දුකුලාව වේ.

72 නියම මගින් යන නො ගිලනකුට නො මගින් යමින් දහම් දෙසීමෙන් උප්පථ ධම්මදෙසනා දුකුලාව වේ.

73 නො ගිලන් ව මල මූ බැහැර කිරීම් සිට ගෙන කිරීමෙන් ඨිතක දුකුලාව වේ.

74 නො ගිලන් ව නිල් තණ මත කෙළ හා මල මූ බැහැර කිරීමෙන් හරිත දුකුලාව වේ.

75 නො ගිලන් ව දියෙහි කෙළ හා මල මූ බැහැර කිරීමෙන් උදක දුකුලාව වේ.

මේ පන්සැත්තෑවක් වූ සේඛියා අතුරින් සාරුප්‍යය පිණිස පැනවුණු ස විස්සකි. සම තිසක් භෝජන ප්‍රතිසංයුක්ත යි.

සාමාන්‍යයෙන් විනය පාළියෙහි තබ්බාදී ප්‍රත්‍යයකින් නියම කොට වදල දෙය නොකිරීමෙන් වන දුකුලා කොටසක් ඇත. නකාරාදී ප්‍රතිෂේධයකින් නොකල යුතු කොට වදල දෙය කිරීමෙන් වන උද්දේසමුක්තක දුෂ්කෘත කොටසක් ද ඇත. යට සඳහන් උද්දේසාගත පන්සැත්තෑ දුකුලාවන් ද සමඟ මේ සියල්ල දුෂ්කෘත [44] ආපත්ති ස්කන්ධය නම් වෙයි.

මේ දුෂ්කෘතාපත්තිස්කන්ධය, පුබ්බපයොග - සහපයොග - අනාමාස - දුරුපචිණ්ණ - විනය - ඤාත - ඤත්ති - පටිස්සව යනුවෙන් අට වැදෑරුම් වෙයි.

i පුබ්බපයොග:- පාරාජිකාදී ඒ ඒ ආපත්ති සාධක අංගයන්ට පූර්ව භාගයේ කාය වාක් ප්‍රයෝගයන්හි සිදු වන ආපත්තිය පුබ්බපයොග නම් දුෂ්කෘතය යි.

ii සහපයොග:- ඒ ඒ ආපත්ති සාධක අංග සහිත කාය වාක් ප්‍රයෝගයන්හි සිදුවන ආපත්තිය සහපයොග නම් දුෂ්කෘතය යි

iii අනාමාස:- දශවිධ රත්න, සප්තවිධ ධාන්‍ය, ආයුධ, තූර්ය භාණ්ඩ, ස්ත්‍රී රූප, ස්ත්‍රී ආභරණ, ඵල සහිත වෘක්ෂ පරාමර්ශනයෙහි සිදු වන ආපත්තිය අනාමාස නම් දුෂ්කෘතය යි.

iv දුරුපචිණ්ණ:- 'මේ නොකළ යුතු ය' යි පනවන ලද්දක් කිරීමෙන් සිදු වන ආපත්තිය දුරුපචිණ්ණ නම් දුෂ්කෘතය යි.

v විනය:- සෙසු සත් වැදෑරුම් දුකුලාවෙන් ඉතිරි වූ විනයෙහි පනවන ලද දුෂ්කෘතාපත්තිය විනය නම් දුෂ්කෘතය යි.

vi ඤත:- සංඝභේදය පිණිස දරන උත්සාහයක් ගැන දැන ඒ වළකනු වස් අවවාද නොකරන භික්ෂුවට සිදුවන ආපත්තිය ඤත නම් දුෂ්කෘතය යි.

vii ඤත්ති:- එකොළොස් සමනුභාෂණ කර්මයන්හි[45] යමක් ඤත්තියෙහි දුකුළාය යි වදළේද, ඒ, ඤත්ති නම් දුෂ්කෘතය යි.

viii පටිස්සව:- වස් විසීම ආදිය ගැන දෙන ලද ප්‍රතිඥාව කඩ කිරීමෙන් සිදු වන ආපත්තිය පටිස්සව නම් දුෂ්කෘතය යි.

## දුර්භාෂිත ආපත්තිස්කන්ධය:-

1. හීන ජාතික භික්ෂුවකට ක්‍රීඩා අදහසින් සෘජු ව හෝ පර්යාය වචනයෙන් හෝ හීන ජාතියෙන් ගටා බිණීමෙන් හීනහීනජාත්‍යාමසවාද දුර්භාෂිතය වේ.

2. හීන ජාතික භික්ෂුවකට ක්‍රීඩා අදහසින් සෘජු ව හෝ පර්යාය වචනයෙන් හෝ උසස් කුලයෙන් ගටා බිණීමෙන් හීනපණීතජාත්‍යාමසවාද දුර්භාෂිතය වේ.

3 කුලීන භික්ෂුවකට හීන කුලයෙන් ගටා බිණීමෙන් පණීතහීනජාත්‍යාමසවාද දුර්භාෂිතය වේ.

4 කුලීන භික්ෂුවකට උසස් කුලයෙන් ගටා බිණීමෙන් පණීතපණීතජාත්‍යාමසවාද දුර්භාෂිතය වේ.

5 හීනනාමික භික්ෂුවකට හීනනාමයෙන් ගටා බිණීමෙන් හීනහීනනාම දුර්භාෂිතය වේ.

6 හීනනාමික භික්ෂුවකට උසස් නාමයෙන් ගටා බිණීමෙන් හීනපණීතනාම දුර්භාෂිතය වේ.

7 උත්කෘෂ්ට නාමික භික්ෂුවකට හීන නාමයෙන් ගටා බිණීමෙන් පණීතහීනනාම දුර්භාෂිතය වේ.

8 උත්කෘෂ්ට නාමික භික්ෂුවකට උසස් නාමයෙන් ගටා බිණීමෙන් පණීතපණීතනාම දුර්භාෂිතය වේ.

9 හීනගෝත්‍රික භික්ෂුවකට හීනගෝත්‍රයෙන් ගටා බිණීමෙන් හීනහීනගොත්ත දුර්භාෂිතය වේ.

10 හීන ගෝත්‍රික භික්ෂුවකට උසස් ගෝත්‍රයෙන් ගටා බිණීමෙන් හීනපණීතගොත්ත දුර්භාෂිතය වේ.

11 උත්කෘෂ්ට ගෝත්‍රික භික්ෂුවකට හීන ගෝත්‍රයෙන් ගටා බිණීමෙන් පණීතහීනගොත්ත දුර්භාෂිතය වේ.

12 උත්කෘෂ්ට ගෝත්‍රික භික්ෂුවකට උසස් ගෝත්‍රයෙන් ගටා බිණීමෙන් පණීතපණීතගොත්ත දුර්භාෂිතය වේ.

13 හීන කාර්මික භික්ෂුවකට හීන කර්මයෙන් ගටා බිණීමෙන් හීනහීනකම්ම දුර්භාෂිතය වේ.

14 හීන කාර්මික භික්ෂුවකට උසස් කර්මයෙන් ගටා බිණීමෙන් හීනපණීතකම්ම දුර්භාෂිතය වේ.

15 උත්කෘෂ්ට කාර්මික භික්ෂුවකට හීන කර්මයෙන් ගටා බිණීමෙන් පණීතහීනකම්ම දුර්භාෂිතය වේ.

16 උත්කෘෂ්ට කාර්මික භික්ෂුවකට උසස් කර්මයෙන් ගටා බිණීමෙන් පණීතපණීතකම්ම දුර්භාෂිතය වේ.

17 හීන ශිල්පික භික්ෂුවකට හීන ශිල්පයෙන් ගටා බිණීමෙන් හීනහීනසිප්ප දුර්භාෂිතය වේ.

18 හීන ශිල්පික භික්ෂුවකට උසස් ශිල්පයෙන් ගටා බිණීමෙන් හීනපණීතසිප්ප දුර්භාෂිතය වේ.

19 උසස් ශිල්පික භික්ෂුවකට හීන ශිල්පයෙන් ගටා බිණීමෙන් පණීතහීනසිප්ප දුර්භාෂිතය වේ.

20 උසස් ශිල්පික භික්ෂුවකට උසස් ශිල්පයෙන් ගටා බිණීමෙන් පණීතපණීතසිප්ප දුර්භාෂිතය වේ.

21 හීනාබාධික භික්ෂුවකට හීනාබාධයෙන් ගටා බිණීමෙන් හීනහීනාබාධ දුර්භාෂිතය වේ.

22 හීනාබාධික භික්ෂුවකට උත්කෘෂ්ටාබාධයෙන් ගටා බිණීමෙන් හීනපණීතාබාධ දුර්භාෂිතය වේ.

23 උත්කෘෂ්ටාබාධික භික්ෂුවකට හීනාබාධයෙන් ගටා බිණීමෙන් පණීතහීනාබාධ දුර්භාෂිතය වේ.

24 උත්කෘෂ්ටාබාධික භික්ෂුවකට උත්කෘෂ්ටාබාධයෙන් ගටා බිණීමෙන් පණීතපණීතාබාධ දුර්භාෂිතය වේ.

25 හීන සණ්ඨානික භික්ෂුවකට හීන සණ්ඨානයෙන් ගටා බිණීමෙන් හීනහීනසණ්ඨාන දුර්භාෂිතය වේ.

26 හීන සණ්ඨානික භික්ෂුවකට උත්කෘෂ්ට සණ්ඨානයෙන් ගටා බිණීමෙන් හීනපණීතසණ්ඨාන දුර්භාෂිතය වේ.

27 උත්කෘෂ්ට සණ්ඨානික භික්ෂුවකට හීන සණ්ඨානයෙන් ගටා බිණීමෙන් පණීතහීනසණ්ඨාන දුර්භාෂිතය වේ.

28 උත්කෘෂ්ට සණ්ඨානික භික්ෂුවකට උත්කෘෂ්ට සණ්ඨානයෙන් ගටා බිණීමෙන් පණීතපණීතසණ්ඨාන දුර්භාෂිතය වේ.

29 සංක්ලේශික භික්ෂුවකට සංක්ලේශිකත්වයෙන් ගටා බිණීමෙන් හීනහීනකිලෙස දුර්භාෂිතය වේ.

30 සංක්ලේශික භික්ෂුවකට නිෂ්ක්ලේශිකත්වයෙන් ගටා බිණීමෙන් හීනපණීතකිලෙස දුර්භාෂිතය වේ.

31 නිෂ්ක්ලේශික භික්ෂුවකට සංක්ලේශිකත්වයෙන් ගටා බිණීමෙන් පණීතහීනකිලෙස දුර්භාෂිතය වේ.

32 නිෂ්ක්ලේශික භික්ෂුවකට නිෂ්ක්ලේශිකත්වයෙන් ගටා බිණීමෙන් පණීතපණීතකිලෙස දුර්භාෂිතය වේ.

33 හීනාපත්තික භික්ෂුවකට හීනාපත්තියෙන් ගටා බිණීමෙන් හීනහීනාපත්ති දුර්භාෂිතය වේ.

34 හීනාපත්තික භික්ෂුවකට උත්කෘෂ්ටාපත්තියෙන් ගටා බිණීමෙන් හීනපණීතාපත්ති දුර්භාෂිතය වේ.

35 උත්කෘෂ්ටාපත්තික භික්ෂුවකට හීනාපත්තියෙන් ගටා බිණීමෙන් පණීතහීනාපත්ති දුර්භාෂිතය වේ.

36 උත්කෘෂ්ටාපත්තික භික්ෂුවකට උත්කෘෂ්ටාපත්තියෙන් ගටා බිණීමෙන් පණීතපණීතාපත්ති දුර්භාෂිතය වේ.

37 හීන ආක්‍රෝශික භික්ෂුවකට හීන ආක්‍රෝශයෙන් ගටා බිණීමෙන් හීනහීනක්කොස දුර්භාෂිතය වේ.

38 හීන ආක්‍රෝශික භික්ෂුවකට උත්කෘෂ්ට ආක්‍රෝශයෙන් ගටා බිණීමෙන් හීනපණීතක්කොස දුර්භාෂිතය වේ.

39 උත්කෘෂ්ට ආක්‍රෝශික භික්ෂුවකට හීන ආක්‍රෝශයෙන් ගටා බිණීමෙන් පණීතහීනක්කොස දුර්භාෂිතය වේ.

40 උත්කෘෂ්ට ආක්‍රෝශික භික්ෂුවකට උත්කෘෂ්ට ආක්‍රෝශයෙන් ගටා බිණීමෙන් පණීතපණීතක්කොස දුර්භාෂිතය වේ.

මේ සම සතළිස් දුර්භාෂිත[46] ආපත්ති ස්කන්ධයට ඇතුලත් වෙයි.

(පාචිත්තිය පාළියෙහි ඔමසවාද සික පදය ඇසුරිනි.)

එවං සබ්බෙපෙතෙ’වාක්ඛ්‍යාතමෙතං
නිද්දෙසං ජානාති යො භික්ඛුසීලෙ
සත්ත’පත්තික්ඛන්ධභෙදෙ සපෙක්ඛු
අච්චන්තං සො පාපුණාති පට්ඨානං

ප්‍රථම පරිච්ඡේදය නිමියේ යි.

එහි එකසමුට්ඨාන තුනක් ද, ද්විසමුට්ඨාන පසක් ද, තිසමුට්ඨාන දෙකක් ද, චතුසමුට්ඨාන දෙකක් ද, ඡසමුට්ඨාන එකක් ද යි වශයෙන් පඨමපාරාජික සමුට්ඨානාදී නාමයෙන් තෙළෙසක් දක්වා ඇත. එ හෙයින් කී හ.

"තිධා එකසමුට්ඨානා - පඤ්චධා ද්විසමුට්ඨිතා
ද්විධා තිචතුරුට්ඨානා - එකධා ඡසමුට්ඨිතා"

11. කිරියා:- සියලු ම ආපත්ති ක්‍රියා වශයෙන් පස් වැදෑරුම් වේ. ඒ මෙසේ යි:-

(i) කාය - වචන දෙකින් කටයුතු කිරීමෙන් සිදු වන ඇවැත.

(ii) නොකිරීමෙන් සිදු වන ඇවැත.

(iii) කිරීමෙන් නොකිරීමෙන් සිදු වන ඇවැත.

(iv) කිසි කලෙක කිරීමෙන් කිසි කලෙක නොකිරීමෙන් සිදු වන ඇවැත

(v) කිසි කලෙක කිරීමෙන් කිසි කලෙක නොකිරීමෙන් කිසි කලෙක කිරීම් නොකිරීම් දෙකින් සිදු වන ඇවැත යනුයි.

12. සඤ්ඤා:- සියලු ම ආපත්ති, සඤ්ඤාවිමොක්ඛ හා නොසඤ්ඤාවිමොක්ඛ වශයෙන් දෙවැදෑරුම් වෙයි. ඇවැතට පැමිණෙන සංඥාව නැතිකමින් යම් ඇවැතකින් මිදේ නම්, ඒ සඤ්ඤාවිමොක්ඛ යි. ඇවැතට පැමිණෙන සංඥාව නැතත් ඇවැතින් මිදීමක් නැත් නම්, ඒ නොසඤ්ඤාවිමොක්ඛ යි

13. චිත්ත:- සියලු ආපත්ති, සචිත්තක හා අචිත්තක වශයෙන් දෙ වැදෑරුම් වෙයි. යම් ඇවැතක් සචිත්තක සමුට්ඨාන තුනෙන් නැගී නම්, ඒ සචිත්තක යි. යම් ඇවැතක් අචිත්තක සමුට්ඨානයෙන් හෝ අචිත්තක මිශ්‍ර සමුට්ඨානයෙන් හෝ නැගී නම්, ඒ අචිත්තක යි.

14. වජ්ජ - සියලු ම ආපත්ති, ලෝකාවද්‍ය - ප්‍රඥප්ත්‍යවද්‍ය වශයෙන් දෙවැදෑරුම් වේ. යම් ඇවැතක් වීමේ දී සිත සචිත්තක සමුට්ඨාන පක්ෂයෙහි අකුසල් ම වේ නම්, ඒ ලෝකාවද්‍ය යි. යම් ඇවැතක් වීමේ දී සිත සචිත්තක පක්ෂයෙහි කුසල් හෝ අකුසල් හෝ අව්‍යාකෘත හෝ වේ නම්, ඒ ප්‍රඥප්ත්‍යවද්‍ය යි.

15. කම්ම:- සියලු ම ආපත්ති, කාය කම්ම, වාචා කම්ම, උභය කම්ම වශයෙන් ත්‍රිවිධ යි. එහි කාය, කාය චිත්ත යන සමුට්ඨාන දෙකින් නැගිය ආපත්ති කාය කම්ම නමි. වාචා, වාචා චිත්ත යන සමුට්ඨාන දෙකින් නැගින ආපත්ති වාචා කම්ම නමි. කාය වාචා, කාය වාචා චිත්ත යන සමුට්ඨාන දෙකින් නැගින ආපත්ති උභය කම්ම නමි.

'මනොද්වාරෙ ආපත්ති නාම නත්ථි' යනුවෙන් 'මනෝද්වාරයෙහි ඇවැතක් නැත' යි කියැවේ. තමා වෙනුවෙන් තබන ලද රන්, රිදී, මිල මුදල් ඉවසීමෙන් රූපියපටිග්ගහණය සිද්ධ වෙයි.. මෙරමා විසින් කරනු ලබන ප්‍රයෝගයක දී ප්‍රවේශ, ප්‍රවිෂ්ට, සවිනී, උද්ධරණ යන සතර ක්ෂණයෙහි ඉවසීමෙන් මෙවුන්දම් පරිජි ඇවැත සිද්ධ වෙයි.

16. කුසලත්තික – ඇවැතට පැමිණෙන භික්ෂුව අකුසල් සිතින් හෝ පැමිණෙයි කුසල් සිතින් හෝ අව්‍යාකෘත සිතින් හෝ පැමිණෙයි

17. වෙදනත්තික – දුක්ඛ වේදනාවෙන් හෝ ඇවැතට පැමිණෙයි. සුඛ වේදනාවෙන් හෝ ඇවැතට පැමිණෙයි. උපේක්ෂා වේදනාවෙන් හෝ ඇවැතට පැමිණෙයි.

නැතපි නිරෝධ සමාපත්තියට සමවත් භික්ෂුව, සිත් නැතත් චේතනා නැතත් සඟසෙයියාපත්තියට පැමිණෙන බව කියනු ලැබේ.

මෙසේ දක්වන ලද මේ සතළොස් සාධාරණ ලක්ෂණය ඒ ඒ ශික්ෂාපදයෙහි යොදා දක්නා ප්‍රාඥ භික්ෂුව සියලු ප්‍රඥප්තියෙහි ප්‍රවීණ වන්නේ ය එහෙයින් කී හ.

"තරුං තිමූලං නවපත්තමෙතං – ද්වයඞ්කුරං සත්තඵලං ඡපුප්ඵං
ජානාති යො ද්විප්පභවං ද්විසාඛං – ජානාති පඤ්ඤත්තිමසෙසතො සො"

(විනය විනිශ්චය)

භාවය:-

නිදාන, පුග්ගල, වත්ථු යැයි කියන ලද මුල් තුනක් ඇති, නව වැදෑරුම් ප්‍රඥප්ති යැයි කියන ලද පත්‍ර නවයක් ඇති, ලෝකවද්‍ය – ප්‍රඥප්තිවද්‍ය යැයි කියන ලද අංකුර දෙකක් ඇති, ආණත්ති – ආපත්ති – අනාපත්ති – විපත්ති – සඤ්ඤා – වේදනත්තික – කුසලත්තික යැයි කියන ලද ඵල සතක් ඇති, ඡසමුට්ඨාන ය යි කියන ලද මල් සයක් ඇති, චිත්ත – කම්ම ය යි කියන ලද ප්‍රභව දෙකක් ඇති, ක්‍රියා – අඞ්ග යැ යි කියන ලද අතු දෙකක් ඇති, සාධාරණ සතළොස් ලක්ෂණ විනිශ්චය සංඛ්‍යාත මේ වෘක්ෂය යමෙක් දනියි ද, ඒ භික්ෂුව ප්‍රඥප්ති යැ යි කියන ලද විනය පිටකය සර්ව ප්‍රකාරයෙන් දනී.

**උද්දේශ මුක්තක දුෂ්කෘත ආපත්ති අතුරෙන් සමහරක්:-**

(1) "අනුජානාමි භික්ඛවෙ, ද්වෙ පත්තෙ අයොපත්තං මත්තිකාපත්තං" (චුල්ලවග්ග)

'මහණෙනි, යකඩපාත්‍ර හා මැටිපාත්‍රය යන පාත්‍ර දෙක අනුදනිමි'යි වදාළ හෙයින් යුතු වත් කුලපුත්‍රයාගේ නියම බඳුන එය යි. භික්ෂුව විසින් උපසපන් දින සිට දස දිනක් තුළ පාත්‍ර අධිෂ්ඨාන

කොට පිළියම් පසක් එන තුරු පරිභෝග කළ යුතු යි. රත්මය ආදී වූ පාත්‍ර එකොළොසක් අකැප ගණයට වැටේ. වළඳන තැනක දී අගර බඟ පිළිගත්විත රත් බඳුන් ආදිය ඇල්ලීමට ද නො වටී. ඇල්ලීමෙන් දුකුලා වෙයි. පලිගු කදම්බැරි කස්ලොහො ආදියෙන් කළ භාජන පෞද්ගලික පරිභෝගයෙන් පරිහරණය කිරීමෙන් දුකුලා යි. සංඝ සන්තක – ගිහි සන්තක – තාවකාලික වශයෙන් නම් මැනවි.

'න භික්ඛවෙ, පත්තො ලග්ගෙතබ්බො, යො ලග්ගෙය්‍ය ආපත්ති දුක්කටස්ස' යි වදාළ හෙයින් බිත්ති ඇණ ආදියක පාත්‍රය එල්ලා තැබීමෙන් දුකුලා වේ. ඇඳ, පුටු, ඇත, ඡත්‍ර, දූලි බිම, පා පිට යන තන්හි තැබීමෙන් ද දුකුලා වේ. 'අනුජානාමි භික්ඛවෙ, චොලකං' යි වදාළ හෙයින් රෙදිකඩක ද තැන්පත් කොට තබන්නට වටී. පැදුරු, කලාල්, ලෑලි, පිරිබඩ බිම ආදී දූවිලි රහිත තැනක ද තැන්පත් කොට තබන්නට වටී. පාත්‍රය ගත් අත් ඇති ව දොර කවුළු නො හැරිය යුතු ය. එසේ ඇරීමෙන් දුකුලා වේ. ථවිකයෙහි බහා කරෙහි එල්ලා සිටිය දී දොර ජනෙල් ඇරීමෙන් වරදක් නැත

සුප, මස් මාළු ඇට ආදිය, ඉඳුල් වතුර, මුව දෙවූ ජලය පාත්‍රයෙන් ගෙන දැමීමෙන් දුකුලා වෙයි. නැවත නො වළඳනු කැමැති ව ඉඳුල් ඇට ආදිය පාත්‍රයෙහි තැබීමෙන් දුකුලා වෙයි. ඉඳුල් අතින් පාත්‍රය නො ඇල්ලියයුතු ය. එසේ ඇල්ලීමෙන් දුකුලා වෙයි පාත්‍රය සේදීමේ දී පහත් කොට ඒ කළයුතු යි. සේදීමෙන් පසු රෙදිකඩින් පිස දමා, මොහොතක් උණුසුම් කොට, පෙර කී ලෙසින් කැප තැනක තැබිය යුතු යි. අධිකව උණුසුම් කිරීමට පාත්‍රය අව්වෙහි හෝ ගින්නෙහි හෝ තැබීමෙන් දුකුලා වේ. අත පිට තබා එය උණුසුම් කිරීම වඩා සුදුසු ය.

'න ච උපජ්ඣායං අනාපුච්ඡා එකච්චස්ස පත්තො දාතබ්බො' යි වදාළ හෙයින් උපාධ්‍යාය ආචාර්යයන් නො විචාරා, භික්ෂු සාමණේර ආදී අන් කෙනෙකුට පා සිවුරු ඈ කිසිවක් නො දියයුතු යි එසේ ම නො ගතයුතු යි. එසේ ගැනීමෙන් දීමෙන් දෙ පසට ම දුකුලා වෙයි. "උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස පත්තො දාතබ්බො" යි වදාළ හෙයින් උපාධ්‍යාය ආචාර්යයන් විසින් සද්ධිවිහාරිකයනට පාත්‍ර දියයුතු යි. දීමට වැඩිපුර පාත්‍රයක් නැත් නම්, සොයා දීමට උත්සාහ හෝ කළ යුතු යි. එසේ නො කිරීමෙන් ආචාර්ය උපාධ්‍යායයන්ට ද දුකුලා වෙයි.

"ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො" යි භක්තාග්‍ර වත වදාළ හෙයින් පාත්‍රය රහිත ව දන් වැළඳීමට යාමෙන් දුකුලා නො වේ ද යි විමසිය යුතු. "තත්ථ ගන්ත්වා එකමන්තං පත්තො නික්ඛිපිතබ්බො .. "පච්ඡාගන්ත්වා පත්තචීවරං

පටිග්ගහෙතබ්බං" යි ආගන්තුක හා ගෝචාසික වත්හි සඳහන් වෙයි. පාත්‍රය රහිත ව හැසිරීමෙහි මේ දෙ වතින් ම පිරිහෙන බව දතයුතු. පක්ෂියකු මෙන් හැසිරෙන සිල්වත් බුද්ධශ්‍රාවක තෙමේ, පිඬු පිණිස වඩිනා ස්ථල තැන පාත්‍රය අතැති ව ශික්ෂාවත් පුරමින් ප්‍රතිපත්තියෙහි අප්‍රමාද වන්නේ ය.

(2) "අනුජානාමි භික්ඛවෙ, තිචීවරං ද්විගුණං සංඝාටිං ඒකච්චියං උත්තරාසඞ්ගං ඒකච්චියං අන්තරවාසකං"

'මහණෙනි, දෙපොට සිවුර, තනිපොට සිවුර, තනිපොට අඳනය යන තුන් සිවුර අනුදනිමි' යි තුන් සිවුරක් අනුදැන වදාළහ. එ කල්හි සවග භික්ෂූහු එක් තුන් සිවුරකින් ගම් වදින්නාවත්, අන් තුන් සිවුරකින් වෙහෙර සිටින්නාවත්, තවත් තුන් සිවුරකින් නෑමට යන්නාවත් වූහ. බුදුරජාණන් වහන්සේ මේ දැන 'න භික්ඛවෙ, අතිරෙකචීවරං ධාරෙතබ්බං' යි එය වැළකූහ. ඉක්බිති අතිරේක චීවරය දසාහපරම - මාසපරම වශයෙන් වදරා, 'අනුජානාමි භික්ඛවෙ අතිරෙක චීවරං විකප්පෙතුං' යි විකල්පනය කිරීමට අවසර දුන් සේක. වැසිසළුව, නිසීදනය, පච්චත්ථරණය, කණ්ඩුපටිච්ඡාදනය (කස්පිළියන - කුෂට රෝගියකුට අනුදත් සිවුර) මුඛපුඤ්ඡනය (මුවපිස්නාව) හා පෙරහන්ආදිය පිණිස පරික්ඛාරචෝලය අනුදැන වදාළේ ඉන් පසු ව ය. අනතුරු ව 'අනුජානාමි භික්ඛවෙ, තිචීවරං අධිට්ඨාතුං න විකප්පෙතුං' යි තුන් සිවුර එනමින් ඉටන්නාවත්, එ නමින් නො විකපන්නාවත් වදාළහ. වැසිසළුව වැසිකාරමස ඉටා, ඉන් මතු විකපිය යුතු යි. නිසීදනය ඉටිය යුතු යි; නො විකපිය යුතු යි. පසතුරණ ඉටියයුතු යි; නො විකපියයුතු යි. කස්පිළියන (කණ්ඩුපටිච්ඡාදනය) ආබාධය ඇති තෙක් ඉටියයුතු යි ඉන්පසු විකපියයුතු යි මුවපිස්න ඉටියයුතු යි; නො විකපියයුතු යි පරික්ඛාරචෝලය ඉටිය යුතු යි; විකල්පනය නො කටයුතු යි. අනුදැන වදාළ සවැදෑරුම් කැප පඬුවලින් යම් කිසිවක් පොවා, කප්බින්දු තබා, අධිෂ්ඨාන කොට, මේ සිවුරු පරිභෝග කළයුතු වෙයි පසතුරණ, පරික්ඛාරචෝලය හා මුවපිස්න පඬු පෙවීමට, කප්බින්දු තැබීමට අවශ්‍ය නැත

චීවර පරිහරණ විධි වශයෙන් සූත්‍ර තේචීවරික, විනය තේචීවරික හා පරික්ඛාරචෝලික ය යි භික්ෂූහු තුන් දෙනෙක් වෙති. සූත්‍ර තේචීවරික තෙමේ ඉටා ගත් තුන් සිවුරෙන් පමණක් සතුටු වෙයි. අන් කිසි සිවුරක් ඉටා පරිභෝග නො කරයි. විනය තේචීවරික තෙමේ, මේ නව චීවරය එ නමින් ම ඉටා, විධි පරිද්දෙන් පරිභෝග කරයි. නව චීවරය ම 'ඉමං පරික්ඛාරචොලං අධිට්ඨාමි' යි වෙන වෙන ම හෝ 'ඉමානි පරික්ඛාරචොලානි අධිට්ඨාමි' යි එකට හෝ

පරිෂ්කාරලෝල මිනිසුන් මෙන් පරිහරණය කරන්නේ පරිෂ්කාර-ලෝලිකයා යි. මොවුහු කිසිදක පිළිවෙළින් උත්සාහව බැඳුම මාදුහ ඵුණ ඇල්ම්‍යාත් වෙත්. ශික්ෂාකාමී විනයධරයෝ මුල් දෙදෙන හරු
* මකරෙසේ පිලගත් අනුදන වදාළ පාත්‍ර හා සිවුර ශික්ෂාගෞරවයෙන් පරිහරණය කරන භික්ෂුවගේ ම මහණකම සඵල වන්නේ ය. එ හෙයින්:

> භික්ඛුස්ස පාසාදිකං හොති – පත්තචීවරධාරණං,
> පබ්බජ්ජා සඵලා තස්ස – යස්ස සීලං සුනිම්මලං" යි

විශුද්ධි මාර්ගයෙහි කී හ.

'යම් භික්ෂුවකගේ ශීලය අතිශයින් නිර්මල ද, උන්වහන්සේගේ පා සිවුරු දරීම දුටුවන් පහදන්නේ වේ යි. උන්වහන්සේගේ පැවිද්ද ද සඵල වේ යි' යනු එහි භාවය යි

රියට රෝද දෙක මෙන් මහණකමට පා සිවුරු අවශ්‍ය ම වේ යි තනි රෝදයෙන් රියෙහි පැවැත්මක් නැතිවාක් මෙන් පාත්‍රය නැති ව සිවුර දරීමෙන් හෝ සිවුර නැති ව පාත්‍ර දරීමෙන් හෝ කරන මහණකමක් මේ ශාසනයෙහි නැත විරාගය පිණිස පවත්නා මහණ රුව, සරාගය පිණිස පෙරලා සිවුරෙන් පමණක් අලංකාර ව වසන භික්ෂූන්ගේ ශීලය දූෂිත ය. ඒ පැවිද්ද ද සඵල නො වේ මේ ගාථාවෙන් ද පැහැදිලි වන්නේ එය යි

අභිෂේක වනු කැමැති රජකුමරකුට පංචරාජකකුධභාණ්ඩය අවශ්‍ය ම ය. එමෙන් ම සසුන් වන් කුල දරුවකුට පාත්‍රය හා තුන් සිවුර වුවමනා ම ය උපසම්පදාමාලකයෙහි දී 'පත්තචීවරං ආචික්ඛිතබ්බං, අයං තෙ පත්තො, අයං සංඝාටි, අයං උත්තරාසඞ්ගො අයං අන්තරවාසකො ගච්ඡ, අමුම්හි ඔකාසෙ තිට්ඨාහි' යනුවෙන් පා සිවුරු විචාරා ම උපසම්පදා කිරීමට වදාළහ අනුන්ගෙන් ඉල්ලා ගත් පාත්‍ර ඇත්තෝ උපසම්පදා නො කළයුතු ය. 'සෙය්‍යථාපි මහාරාජ, පක්ඛීසකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති. එවමෙව ඛො මහාරාජ, භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති' යනුවෙන් ද බුදුරජාණන් වහන්සේ වදාළ සේක 'මහරජ පක්ෂියා පියාපත් බරින් යුතු ව ම යම් යම් තැනක ඉගිලී යයි. එමෙන් ම භික්ෂු තෙමේ කයින් දරන සිවුරෙන් ද කුසින් දරන පිඬුවෙන් ද සතුටු ව යම් යම් තැනක අටපිරිකර[47] ගෙන ම යයි. මේ එහි තේරුම යි. රජවරු කඩුවෙන් වැඩ ඇති කල ඒ රැගෙන යත්. ශික්ෂාකාමී බුද්ධපුත්‍රයෝ පිඬු සිඟීමටත් මැලදීමටත් අනුදන ඇති පාත්‍ර ඇති ව ම යත්. පාත්‍ර

සොරා ගැනීම් ආදී ආපදා අවස්ථාවක තාවකාලිකව අනෙක් කැප බඳුනක වැළඳීමට අවකාශ ඇත. මේ ලේඛනයෙන් නියමිත පාත්‍ර හැර නිත්‍ය ගිහි පරිභෝගය වන පිඟන් ආදියෙහි වැළඳීමෙන් දිනපතා පිළිය යුතු බොහෝ සිකපදයන් නො සැලකෙන බව පලකත් වේ.

(3) "අනුජානාමි භික්ඛවෙ, ඡත්තං"

බුදු රජාණන් වහන්සේ මුලින් ම 'මහණෙනි, කුඩය අනුදනිමි' යි ඒ අනුමත කළ සේක. භික්ෂූහු කුඩ දරා ගම් නගරවල හැසුරුණහ. මේ අතර කෙනෙකුන්ගේ දෙස් කීමක් වස්තු කොට, 'න භික්ඛවෙ, ඡත්තං ධාරෙතබ්බං, යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස' යි කුඩ දැරීම වැළැක්වූ සේක. පසු ව ගිලන් භික්ෂු නමක් නිසා 'අනුජානාමි භික්ඛවෙ, ගිලානස්ස ඡත්තං' යි ගිලනාට කුඩ දැරීමට අවසර දුන්හ. කුඩ දැරීම මෙසේ ගිලනාට ම අනුදැන වදාළ නිසා භික්ෂූහු ආරාම තුළත් ආරාම උපචාරයන්හිත් අව්වට වැස්සට පවා කුඩ ඉහලීමට ඈත් කළහ. මේ දත් භාග්‍යවතුන් වහන්සේ, "අනුජානාමි භික්ඛවෙ, අගිලානෙන භික්ඛුනා ආරාමෙ ආරාමූපචාරෙ ඡත්තං ධාරෙතුං" යි ආරාම හා ආරාම උපචාර දෙක්හි නො ගිලන් භික්ෂූනට ද කුඩ දැරීමට අවකාශ දුන් සේක

"සෙතච්ඡත්තං කිලඤ්ජච්ඡත්තං පණ්ණච්ඡත්තන්ති තීණි ඡත්තානි අනුඤ්ඤාතානි" යනු අට්ඨකථා යි. එහෙයින් සුදු රෙදි කුඩය, හුණපතුරු කුඩය හා තල්කොළ ආදියෙන් තැනූ කොළ කුඩයත් කැප කුඩ ගණයට වැටේ ඒ කුඩ තුන ම හැකිළිය හැකි ලෙස සාදා ගත හැකි ය ශරීරදාහයක් හෝ පිත්කෝපයක් හෝ ඇස්රෝගයක් හෝ වී නම්, කුඩය ඉස නො ලැමෙන් අන් කිසි යම් නිදන්ගත රෝගයක් හෝ උත්පන්න වේ නම්, ඒ භික්ෂුවට මේ කුඩ තුනෙන් කවරක් හෝ හිස ලන්නට වටී වැසි සමයෙහි සිවුරු රක්නා පිණිස හිස ලීමටත්, අරණ්‍යාදියෙහි ආරක්ෂාව පිණිස අතින් ගෙන යන්නටත් සුදුසු ය. "අගිලානො සචෙ ඡත්තං ධාරෙය්‍ය දුක්කටං" යි කී හෙයින් අව් වැසි ආදී ලෝකස්වභාවයන් ගිලන්කම නො වන නිසා නගර ගම්හි කුඩ හිස ලීමෙන් දුකුළා වන බව සැලකිය යුතු ය. "එකපණ්ණච්ඡත්තං පන න වට්ටති" යන අටුවා පාඨය, "එකපණ්ණච්ඡත්තන්ති තාලපණ්ණාදිනා එකෙන පණ්ණෙන කතච්ඡත්තං" යි විමතිවිනෝදනීටීකාවෙහි විස්තර කොට ඇත එක් තල්පතකින් තැනූවක් බව ඉන් කියැවෙයි 'එකපණ්ණච්ඡත්තං නාම තාලපණ්ණං' යනු විනයගණ්ඨිපද යි ඒ නිසා එක තල්කොළයෙන් තැනූ කුඩය ගිලන් නො ගිලන් සියලු භික්ෂූන්ට නගර ගම් සියලු තැන හිස ලීමට මැනැවි. මෙය මේ කල 'ගොටුඅත්ත' ය යි ව්‍යවහාරයට පැමිණ ඇත.

(4) "න භික්ඛවේ, සඋපාහනේන ගාමෝ පවිසිතබ්බෝ"

මහණෙනි, වහන් පය ලා ගමට නො පිවිසියයුතු යැ යි වදාළෙන් එසේ ගම් වදින භික්ෂුවට දුකුළා වන බව දතයුතු ය. 'අනුජානාමි භික්ඛවේ, ගිලානේන භික්ඛුනා සඋපාහනේන ගාමං පවිසිතුං' යි නැවත වදාළහ. පාදයක්හි ආබාධයක් ඇති කල වහන් පය ලා ගම් වදින්නට මින් අවසර ලැබේ. 'අනුජානාමි භික්ඛවේ, අජ්ඣාරාමේ උපාහනං ධාරේතුං' යි අනුදැන වදාළ හෙයින් අරම තුළ නො ගිලනාට වුව ද වහන් පය ලන්නට අවකාශ ඇත. ඒ පෙගදුන් සිළුටි වීම වළක්වනු පිණිස යි.

'අනුජානාමි භික්ඛවේ, එකපලාසිකං උපාහනං,' යි එක් සම් පටින් කළ වහන පිළිගෙන ඇත. 'එකපටලං පන පටිමුක්කා වා හොතු අපටිමුක්කා වා සබ්බත්ථ වට්ටති' යනු අටුවා යි. එක් සම් පටින් තැනූ වහන ගැම තැනට ම සුදුසු ය. ආබාධයක් නැති තැන එහියත් මෙන වහන් පය ලා නගර ගම්හි හැසිරීම නුසුදුසු බව ද සැලකිය යුතු ය

(5) "න භික්ඛවේ, යානේන යායිතබ්බං"

යානයෙන් නොයන ලෙස මුලින් අනුදැන වදාළත් 'අනුජානාමි භික්ඛවේ, ගිලානස්ස යානං' යි ගිලනාට එහි අවකාශ තැබූහ. නො ගිලන් ව යානයෙන් යෑමෙන් දුකුළා වන බව දත යුතු යි. කැප යානාව පිළිබඳ උපත් කථාවේ දී 'අනුජානාමි භික්ඛවේ, පුරිසයුත්තං හත්ථවට්ටකං, අනුජානාමි භික්ඛවේ, සිවිකං පාටංකිං' ය යි වදාළ සේක. ගොනුන් යෙදූ යානා ද, පුරුෂයන් ඇද ගෙන යන යානා ද, එසේ ම උසුලා ගෙන යන සිවිකාව ද, පල්ලැක්කිය ද කැප බව මින් පෙනේ. මෙහි ආබාධය ලෙස හැඟෙන්නේ පයින් යා නොහැකි තරම් වන බලවත් රෝගයකි. මහ තෙමේ ම මෙහි ගිලනා යි.

(6) "න භික්ඛවේ, දීඝා නඛා ධාරේතබ්බා"

මේ අනුව දික් නිය දැරීමෙන් දුකුළා වෙයි. 'න භික්ඛවේ, වීසතිමට්ඨං කාරාපේතබ්බං' යි වදාළෙන් නිය කුරට්ටු ගෑම් නියමල් ඇඳීම් ආදියෙන් අලංකාර කරන භික්ෂුවට දුකුළා වෙයි. 'අනුජානාමි භික්ඛවේ, මලමත්තං අපකඩ්ඪිතුං' යි වදාළෙන් නිය අතර කුණු පමණක් පහකළයුතු යි. නිය කැපීමේදී රළු ගතිය නැති වන ලෙස සකස් කළ හැකි ය.

(7) "න භික්ඛවේ, පලිතං ගාහාපේතබ්බං"

පැසුණු හිසකෙස් නො ඉගිල්වියයුතු ය. ඉගිල්වීමෙන් දුකුළා වෙයි. එහෙත් බැම නාසිකා ආදී තන්හි උස් ව නැගි රෝමාදිය ඉගිල්ලීමට වටී.

(8) "න භික්ඛවෙ, සම්බාධෙ ලොමං සංහරාපෙතබ්බං"

කොඛ, ඉකිලි, කිසිළි ආදී සම්බාධස්ථානයන්හි රෝම පහ කිරීමෙන් දුකුළා වෙයි. ආබාධයක් පිණිස නම් මැනැවි

(9) "න භික්ඛවෙ, දීඝං දන්තකට්ඨං ඛාදිතබ්බං."

ඉතා දිගු දැහැටි දඬු පරිභෝගයට නො ගතයුතු ය. අටඟුලකට වඩා දික් වූත් සතරඟුලකට වඩා කොට වූත් දැහැටි අකැප ය. ඒ මැලදීමෙන් දුකුළා වෙයි. අරුණට පෙරත් දවල් දනෙන් පසුත් දැහැටි නො මලදන භික්ෂුවට මුඛගන්ධි වශයෙන් පචිති ඈ ඇවැත් සිදු වන බව දතයුතු ය.

(10) "න භික්ඛවෙ, ලෝකායතං පරියාපුණිතබ්බං."

තීර්ථකශාස්ත්‍ර හා තිරශ්චීන විද්‍යා ඉගෙනීමෙන් දුකුළා වන බව කියැවෙයි. එබඳු දේ ඉගැන්වීමෙන් ද දුකුළා වෙයි.

(11) "න භික්ඛවෙ, ලසුණං ඛාදිතබ්බං"

ලූනු කෑමෙන් භික්ෂුවට දුකුළා වන බව මින් පෙනේ. ආබාධයක් පිණිසත්, ව්‍යංජන හා මිශ්‍ර වූ කල්හිත් වැලඳීම මැනැවි.

(12) "න භික්ඛවෙ, අධොතෙහි පාදෙහි සෙනාසනං අක්කමිතබ්බං."

මෙම අනුව පිරියම් කළ බිම ද, ඇඳ පුටු ආදිය ද, දූවිලි සහිත පයින් හෝ දිය සහිත පයින් හෝ මඩ සහිත පයින් හෝ පෑගීමෙන් දුකුළා වෙයි

(13) "න භික්ඛවෙ, පරිකම්මකතාය භූමියා නිට්ඨුභිතබ්බං"

පිරියම් කළ බිම කෙළ ගැසීමෙන් දුකුළා වන බව මින් පෙනේ.

(14) "න භික්ඛවෙ, පරිකම්මකතා භිත්ති අපස්සෙනබ්බං"

පිරියම් කළ බිත්තිය, එසේ ම දොර, කවුළු, ගල්වැම්, රුක්වැම් ආදිය අනාවරණ කයින් ස්පර්ශ කිරීමෙහි දී දුකුළා වන බව මින් කියැවේ. මේ දුකුළාව සඟ සතු සෙනසුන් පිළිබඳ ව පමණි. අල්ලත් පවි පතුලත් හැර සිරුරේ සෙසු අනාවරණ කොටස් මෙසේ ස්පර්ශ වීමෙන් මේ දුකුළාව වෙයි. රෝමයක් ගැවීම වුව ද ඇවැතට ප්‍රමාණවත් ය. මෙහි දී සිහි ඇතත් නැතත් ඇවැත සිදු වෙයි

(15) "අනුජානාමි භික්ඛවෙ, පච්චත්ථරිත්වා නිපජ්ජිතුං."

සඟ සතු ඇඳ පුටු ආදිය පසතුරණක් එලා ම පරිභෝග කට යුතු යි. අනාවරණ සිරුර තැවරේ නම්, රෝම ගණනින් දුකුළා ඇවැත් වෙයි. අල්ලත් පවිපතුලත් ස්පර්ශයෙන් ඇවැත් නො වේ. එහෙත් අතුල් පතුල් දූවිලි සහිත නම් ඉන් ඇවැත් විය හැකි ය.

(16) "දස ඉමෙ භික්ඛවෙ, අවන්දියා"

නො වැඳිය යුත්තන් දස දෙනකුත් බව මින් පෙනේ. මේ ඒ දස දෙනා යි:

i බාල උපසම්පන්න
ii අනුපසම්පන්න
iii නානාසංවාසක වුඩ්ඪ අධම්මවාදී
iv මාතුගාම
v පණ්ඩක
vi පාරිවාසික
vii මූලායපටිකස්සනාරහ
viii මානත්තාරහ
ix මානත්තචාරික
x අබ්භානාරහ

එසේ ම නග්නයාත් මාතුඝාතකාදී එකොළොස් අභව්‍ය පුද්ගලයෝත් මේ ගණයට ඇතුළත් වෙත්.

වැඩිමහලු උපසම්පන්න භික්ෂුවත්, නානාසංවාසක ධම්මවාදී වෘද්ධ භික්ෂුවත්, තථාගතයන් වහන්සේත් වැඳිය යුත්තෝ වෙත්. භත්තග්ග - යාගුපාන ආදී තෙළෙස් තැනක වැඳිය යුත්තාට ද වැඳීම නුසුදුසු බව දක්වා ඇත. මෙ අනුව නො වැඳිය යුත්තාට වැඳීමෙන් ද, වැඳිය යුත්තාට නො වැඳීමෙන් ද, නො වැඳිය යුතු තැන වැඳිය යුත්තාට වුව ද වැඳීමෙන් ද දුකුලා වන බව සැලකිය යුතු ය.

(17) "න භික්ඛවෙ, නහායමානෙන රුක්ඛෙ කායො උග්ඝංසෙතබ්බො"

ස්නානයේ දී ගස්, වැටි ආදියෙහි කය නො ඉලියයුතු බව මින් කියැවෙයි. එකිනෙකා විසින් කයින් කය ද නො ඉලිය යුතු ය. ගල්, කංබාල් ආදී යමකින් කය ඉලීම ද නුසුදුසු ය. මේ සියල්ලෙහි දුකුලා ඇවැත් වන [බව සැලකියයුතු. උඩුකය වසන දියකළ කොණෙන් හෝ රෙදි කඩකින් හෝ අතින් හෝ කය ඉලීම මැනැවි.

(18) "න භික්ඛවෙ, වල්ලිකා ධාරෙතබ්බා, න පාමඞ්ගො ධාරෙතබ්බො, න කණ්ඨසුත්තකං ධාරෙතබ්බං, න කටිසුත්තකං ධාරෙතබ්බං, න ඔවට්ටිකං ධාරෙතබ්බං"

කර්ණාභරණ, හවඩි, ග්‍රීවාභරණ, කටි පලඳනා, හස්තාභරණ, පාදාභරණ, ඇඟිලි පලඳනා ආදිය දැරීමෙන් දුකුලා ඇවැත් වෙයි.

(19) "න භික්ඛවෙ, දීඝා කෙසා ධාරෙතබ්බා"

දෙඟුලකට වඩා දිගු කෙස් නො දැරියයුතු ය. ආබාධයක් නොමැති ව කතුරෙන් කෙස් නො කැපිය යුතු ය. මේ නො සැලකීමෙන් දුකුලා ම යි. අලංකාරය පිණිස කොස්සෙන්, පනාවෙන්, ඉටිතෙලින්, වතුරෙන් මොළොක් කොට කෙස් සම කරනු නො හැකි. උඩට නැගුණු කෙස් ඇති විටත්, උෂ්ණයෙන් තැවුණු බාදිය දුවිලි සහිත කෙස් ඇති විටත් තෙත් අතින් සම කිරීම සුදුසු ය.

(20) "න භික්ඛවෙ, ආදාසෙ වා උදකපත්තෙ වා මුඛනිමිත්තං ඔලොකෙතබ්බං."

ආබාධයක දී හැර කැඩපතෙක හෝ දියබඳුනෙක හෝ මුහුණ බැලීමෙන් දුකුළා වෙයි. තමන් වයස්ගත වීම පිළිබඳ ව කැඩපතින් බැලීම වරදක් නැත.

එදවස උපන් මාගමගේ වුව ද ස්ත්‍රීසණ්ඨානය (නිමිත්ත) බැලීමෙන් දුකුළා යි. පිණ්ඩපාතය දෙන්නාගේ මුහුණ බැලීමෙන් ද දුකුළා වේ යි.

(21) "න භික්ඛවෙ, මුඛං ආලිම්පිතබ්බං, න මුඛං මද්දිතබ්බං, න මුඛං චුණ්ණෙතබ්බං."

අලංකාරය පිණිස මුහුණ ආලේපය, මුව මැදීම, මුහුණ සුණු ගැල්වීම නුසුදුසු ය. අත් පා ආදී ශරීර අවයවයන් ද අලංකාරය සලකා මැදුම් ආලේප කිරීම් නො කළයුතු ය. ඒ සියල්ලෙහි දුකුළා වෙයි.

(22) "න භික්ඛවෙ, උච්චාසයනමහාසයනානි ධාරෙතබ්බානි"

මේ අනුව උස’සුන් මහ’සුන් දැරීමෙන් දුකුළා වෙයි. පුළුන් කොට්ට මෙට්ට දැරීම ද නුසුදුසු ය.

(23) "න භික්ඛවෙ, නච්චං වා ගීතං වා වාදිතං වා දස්සනාය ගන්තබ්බං."

නැටුම් ගැයුම් වැයුම් දක්නට නො යායුතුබව මින් කියැවෙයි. මිනිස්, ඇත්, අස්, ගව, මහිෂ, සුනඛ වැනි නැටුම් දක්නට යන භික්ෂුවට දුකුළා වෙයි. යටත්පිරිසෙයින් පිලා - මොණර නැටුමක් වුව ද බලනු පිණිස පියවරකුදු තැබීමේ දී දුකුළා ම වෙයි. නැටීමෙන් නැටවීමෙන් දුකුළා වෙයි.

නාට්‍යගීතය ද, අනිත්‍යතා ප්‍රතිසංයුක්ත සාධුගීතය ද, දහම් දෙසීමේ දී සාධුකාර දීම සංඛ්‍යාත ධර්මගීතය ද, යටත්පිරිසෙයින් දන්තගීතය ද කරන කරවන භික්ෂුවට දුකුළා වෙයි. ගීතස්වරයෙන් ධර්මය කියන්නට ද නො වටී. තෙරුවන් උදෙසා නැටුම් ගැයුම් කිරීමට කරවීමට විචාල කල ඒ පිළිගැනීමට ද නො හොබී. ගීත-ස්වරයෙන් සාධුකාර දෙවීමට පවා නුසුදුසු ය. එසේ විචාලොත් රත්නත්‍රය පූජා ලැබියයුත්තක් බව පමණක් කීම මැනැවි.

බෙර, වීණා වැනි වාදනයන්, දියෙන් නගන ගීතරාවයන් නො මැනැවි. වාදනය කිරීමෙන් කරවීමෙන් දුකුළා වෙයි.

නැටුම් ගැයුම් වැයුම් සියල්ල ආරාමයෙහි හුන් තැන සිට ශබ්ද කාමාශාවෙන් තොර ව දැකීමෙන් ඇවැත් නො වේ. ඒ පිණිස පියවරකුදු තැබීම නුසුදුසු ය. බෙල්ල හරවා නමා පසුපස ඇති නැටුම් බැලීමෙන් ද ඇවැත් වෙයි.

(24) “න භික්ඛවෙ, අප්පච්චවෙක්ඛිත්වා මංසං පරිභුඤ්ජිතබ්බං, න උද්දිස්සකතං.”

පිරික්සා නොබලා, උදෙසා කළ මස් වැළඳීමෙන් දුකුලා වෙයි. “අනුජානාමි භික්ඛවෙ, තිකොටිපරිසුද්ධං මංසං” යැයි වදාළෙන්, තමන් උදෙසා කරන ලද්දකැයි නුදුටු, නොඇසූ, නොසැක මස් වැළඳීමට කැප ය.[48]

(25) “න භික්ඛවෙ, අන්තොවුත්ථං අන්තොපක්කං සාමංපක්කං උග්ගහිතපටිග්ගහිතකං පරිභුඤ්ජිතබ්බං, යො පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස”

මේ අනුව අන්තොවුත්ථ - අන්තොපක්ක - සාමංපක්ක - උග්ගහිත පටිග්ගහිතය වැළඳීමෙන් දුකුලා ඇවැත් වෙයි.

(26) “න භික්ඛවෙ, එකභාජනෙ භුඤ්ජිතබ්බං.”

මෙසේ හෙයින් එක් බඳුනක (දෙදෙනෙකු එකට) වැළඳීමෙන් දුකුලා ඇවැත් වෙයි.

(27) “න භික්ඛවෙ, එකමඤ්චෙ තුවට්ටිතබ්බං.”

එක් ඇඳක එක් වර භික්ෂූන් දෙනමකට සැතපීම නො හොබී. එක් ඇත්තරණය එක් පොරෝනය ඇති ව දෙනමක් එකට සැතපීම ද නුසුදුසු ය. මේ සියල්ලෙහි දුකුලා වෙයි. සිවුරුපටියක් වැනි යමකින් ඇතිරිල්ල දෙකට බෙදා සැතපීමෙන් ඇවැත් නො වේ.

(28) “න භික්ඛවෙ, නහාපිතපුබ්බෙන ඛුරභණ්ඩං පරිහරිතබ්බං.”

කරනැවැමි කුලයෙන් පැවිදි වූවකුට දැලිපිහිය, කරගල, කර කොපුව, ඒ දවටනය යන සියලු කුරබඩු දැරීම නුසුදුසු ය. එසේ දැරීමෙන් දුකුලා ඇවැත් වෙයි අන්‍යතු දැලිපිහි ආදියෙන් කෙස් රැවුල් බහවා ගැනීම එබඳු භික්ෂුවගේ පිළිවෙත යි.

(29) “න භික්ඛවෙ, රුක්ඛො අභිරූහිතබ්බො”

මේ අනුව ගස් නැගීමෙන් දුකුලා වෙයි. චණ්ඩ සුනඛ ආදීන් ගෙන් බේරීම පිණිස පුරුෂප්‍රමාණයක් නැගීම වටී. මං මුළා වීම් ආදී ආපදවක් ඇති තැන රිස් සේ නගිනු හොබී.

(30) “න භික්ඛවෙ, බුද්ධවචනං ඡන්දසො ආරොපෙතබ්බං.”

මේ අනුව බුද්ධවචනය වේදය මෙන් සංස්කෘත භාෂාවෙන් වාචනා මාර්ගයට නැගීම නුසුදුසු ය. එත් දුකුලා ඇවැත් වෙයි.

(31) “න භික්ඛවෙ, පටිභානචිත්තකං කාරෙතබ්බං.”

ස්ත්‍රී - පුරුෂ - තිරිසන් රූප සිතුවමට නැගීම නුසුදුසු ය. යටත් පිරිසෙයින් ගැඩවිලි රූප කුදු සිතුවමට නගන භික්ෂුවට දුකුලා වෙයි.

ලී ආදියකින් රූප කැපීමෙන් ද, 'දෙරවුපාල රූපයක් කරව' යි කීමෙන් ද දුකුලා වෙයි. රත්නත්‍රයෙහි ප්‍රසාදජනක සිතුවම් හා මාලාකර්මාදී ධර්මමය සිතුවම් කරවීම සුදුසු ය.

(32) "න භික්ඛවෙ, විප්පකතෙ භොජනෙ භික්ඛු වුට්ඨාපෙතබ්බො."

මේ අනුව වැළඳීමට පටන් ගත් භික්ෂූන් ඉන් නැගිටවීමෙන් දුකුලා ඇවැත් වන බව දතයුතු ය.

(33) "අනුජානාමි භික්ඛවෙ, තිවස්සන්තරෙන සහ නිසීදිතුං."

මේ අනුව වස් දෙකක පරතරය ඇති භික්ෂුව සමග එක ඇඳක පුටුවක හිඳිය හැකි ය. එක ඇඳක පුටුවක එක් ඉරියව්වෙන් හිඳින දෙනමට වඩා මැඩී වන කල සියල්ලනට දුකුලා ඇවැත් වෙයි. දික් අසුනෙහි තිදෙනකු පටන් හිඳිය හැකි ය. එහෙත් මාගමුන් පණ්ඩකයන් උභතොබ්‍යඤ්ජනකයන් සමග දික් අසුනෙහි වුවත් හිඳිය නො හැකි ය.

(34) "න භික්ඛවෙ, අත්තානං පාතෙතබ්බං."

කිසි යම් උපක්‍රමයකින් සිය දිවි නසා ගැනීමෙන් දුකුලා වෙයි. ශරීර අවයව සිඳ ගැනීමෙන් දුකුලා වෙයි. උපන් සංවේගයෙන් 'අහර නොවුවත් ප්‍රමාද ය' යි සලකා අහර සිඳීමෙන් අනාපත්ති යි.

(35) "න භික්ඛවෙ, දවාය සිලා පවිජ්ඣිතබ්බා."

මේ අනුව ක්‍රීඩා අදහසින් ගල්, ලීදඬු ආදිය පෙරළීමෙන් දුකුලා වෙයි. චෛත්‍ය කර්මාදිය පිණිස නම් වරදක් නැත.

(36) "න භික්ඛවෙ, දායො ආලිම්පෙතබ්බො."

කෙල්ලම් පිණිස වනයෙහි ගිනි ලෑමෙන් දුකුලා වෙයි. සතුන් නසන රිසින් ගිනි ලන්නාට පරිජි, තුලසි, පචිති වියහැකි ය. ලී දවන රිසින් ගිනි ලන්නාට අගය අනුව පාරාජිකාදිය වියහැකි ය.

(37) "අනුජානාමි භික්ඛවෙ, දිවා පටිසල්ලීයන්තෙන ද්වාරං සංවරිත්වා පටිසල්ලීයිතුං."

දවල් නිදන්නේ නම්, දොර වසා නිදියයුතු ය. නැතහොත් දුකුලා වෙයි. දොර බලා ගැනීමට උපාසකාදී අන් කිසිවකු ඇතොත් වරද නැත.

(38) "න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා අභික්ඛුකො ආවාසො ගන්තබ්බො."

එදවස පොහෝ දින සංඝයා නොමැති ව අන්තරාය රහිත ව ආරාමය ඉක්මවා යන භික්ෂුවට දුකුලා ඇවැත් වෙයි. එක්කෝ පොහොය කොට හෝ යායුතු යි නැත් නම් අතරමග දී සුදුසු තැනක පොහොය කරන බලාපොරොත්තුවෙන් යායුතු යි. සංඝයා වෙත එදවස පැමිණිය හැකි නම් වරද නැත. කෙසේ හෝ පොහොය නො කිරීමෙන් දුකුලා ඇවැත් වන බව දතයුතු.

(39) "න භික්ඛවෙ, වස්සං න උපගන්තබ්බං"
වස් නො එළඹෙන භික්ෂුවට දුකුළා වෙයි.

(40) "න භික්ඛවෙ, ථෙරෙසු භික්ඛූසු උක්කුටිකං නිසින්නෙසු පවාරයමානෙසු ආසනෙ අච්ඡිතබ්බං"
ස්ථවිර භික්ෂූන් පවාරණය කරමින් උක්කුටිකයෙන් හුන් කල, එසේ නො සිද අසුන්හි හිඳින නවක භික්ෂුනට දුකුළා වෙයි.

(41) "අනුජානාමි භික්ඛවෙ, චතස්සො කප්පියභූමියො උස්සාවනන්තිකං, ගොනිසාදිකං, ගහපතිං සම්මුතින්ති"
මේ අනුව අකැප කිලියෙහි තබන ලද එහි පිසන ලද, යාවකාලික යාමකාලික දෙයක් වැළඳීමෙන් දුකුළා වෙයි.

(42) "න භික්ඛවෙ, පබ්බජිතෙන අකප්පියෙ සමාදපෙතබ්බං"
මේ අනුව සාමණේරාදීන් අකැප දෙයෙහි යොදවන භික්ෂුවට දුකුළා වේය.

(43) "න භික්ඛවෙ, අනෙහජ්ජ කායෙ පංසුකූලං ගහෙතබ්බං"
නොබිඳුණු මළසිරුරෙහි පාංශුකූලය ගැනීමෙන් දුකුළා වෙයි.

(44) "අනුජානාමි භික්ඛවෙ, පඤ්චඞ්ගසමන්නාගතස්ස විස්සාසං ගහෙතුං"
(i) සංදිට්ඨ (ii) සංභත්ත (iii) ආලපිත (iv) ජීවතිච (v) ජානක යන පංච අංගයෙන් යුතු වූවන්ගේ විශ්වාස ග්‍රහණය මැනැවි අස්ථිර විශ්වාසයෙන් ගැනීමෙන් දුකුළා ඇවැත් වනබව සැලකියයුතු.

(45) "න භික්ඛවෙ, සද්ධාදෙය්‍යං විනිපාතෙතබ්බං"
දායකාදීන් සැදැහැයෙන් දුන් දෙය මවුපියන් හැර සෙසු නෑයන්ට දීමෙන් දුකුළා වෙයි. සැදැහැයෙන් දුන් දෙය නො සැලකිල්ලෙන් පරිභරණය ආපත්තිකර බව ද සැලකියයුතු.

(46) "සචෙ උපජ්ඣායො හොති උපජ්ඣායෙන යාවජීවං උපට්ඨාතබ්බො"
භික්ෂුවක් ගිලන් වූ විට ඉදින් උපාධ්‍යාය ආචාර්යාදීන් විසින් උවටැන් කටයුතු යි. එසේ ආචාර්ය උපාධ්‍යායාදීන් නැති කල සංඝයා හෝ සංඝසම්මත භික්ෂු කෙනකුන් විසින් හෝ උවටැන් කටයුතු යි. උවටැන් නො කරන සංඝ ගණ පුද්ගලයා දුකුළා ඇවැත් අවදිනබව දතයුතු.

(47) "ඉධ පන භික්ඛවෙ, වස්සංවුත්ථො භික්ඛු අනුප්පන්නෙ චීවරෙ පක්කමති සන්තෙ පතිරූපෙ ගාහකෙ දාතබ්බං"
වස් වැස බැහැර ගිය භික්ෂුවගේ ද, උමතු වැනි විකාරයකට පත් වූ භික්ෂුවගේ ද වස්සාවාසික චීවරය, (ඒ භික්ෂුවට දෙනු පිණිස,) පිළිග කැමැති සුදුස්සකුට දියයුතු ය. ඒ භික්ෂුව භික්ෂුභාවයෙන් ඉවත් ව ගිය කල එය සඟසතු වේ.

(48) "අනුජානාමි භික්ඛවෙ, ගිලානස්ස ගුළං අගිලානස්ස ගුළොදකං"

මේ අනුව විකාලයෙහි පානයක් නොමැති ව හකුරු වළඳන නොගිලනාට දුකුලා වෙයි. පිපාසාදිය සඳහා දිය මුසු කොට පානයට සුදුසු ය.

(49) "න භික්ඛවෙ, නග්ගියං තිත්ථියසමාදානං සමාදිතබ්බං, යො සමාදියෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස"

මේ අනුව තීර්ථක ව්‍රතසමාදානයෙන් ථුලසී ඇවැත් වන බව දතයුතු

(50) "පාදෙ ධොවන්තෙන එකෙන හත්ථෙන උදකං ආසිඤ්චිතබ්බං, එකෙන හත්ථෙන පාදෙ ධොවිතබ්බා"

පයින් පය ගටා පා සෝදන භික්ෂුවට දුකුලා වෙයි. එක් අතකින් දිය ගෙන අනෙක් අතින් පා දෙවියයුතු ය. ලී කඩක් වැනි යමක පා ගටා සෝදනු සුදුසු ය.

(51) "න භික්ඛවෙ, වච්චං කත්වා සති උදකෙ න ආචමෙතබ්බ."

වැසිකිළි කියේ දී දිය ඇති කල නොසෝදන භික්ෂුවට දුකුලා ඇවැත් වෙයි.

(52) "න දන්තකට්ඨං ඛාදන්තෙන වච්චං කාතබ්බං"

වැසිකිළි කියේ දී දැහැටි වළඳන භික්ෂුවට දුකුලා ඇවැත් වෙයි.

(53) "ආචරියෙන භික්ඛවෙ, අන්තෙවාසිකො සඞ්ගහෙතබ්බො"

මේ අනුව අතවැස්සාට හිතුමතේ හැසිරීමට ඉඩ තබා කටයුතු කරන ආචාර්යයෝ වරදට හසු වෙත්.

(54 "න ආචරියස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා"

ආචාර්යයන් කථා කරන කල ඊට බාධා වන ලෙසින් අතරතුර කථා කරන ශිෂ්‍ය භික්ෂූනට දුකුලා ඇවැත් වෙයි.

(55) "අනුජානාමි භික්ඛවෙ, භත්තග්ගෙ අනුමොදිතුං"

දානයෙන් අනතුරු ව දායකයාට අනුමෙවෙති බණ කීම සම්ප්‍රදායකි. භික්ෂු සම්මතයෙන් හෝ දායකයන්ගේ ආරාධනයෙන් හෝ අනුමෝදනාවට නතර වුණු භික්ෂුවට පෙර පසු සතර පස් නමක් නැවතීම සිරිත ය. අනුමෝදනා භික්ෂුවට නොදන්වා, එ තැන නැවතිය යුතු භික්ෂූන් අතුරෙන් නැගිට යන භික්ෂූන්ට දුකුලා ඇවැත් වෙයි.

(56) "න භික්ඛවෙ සම්බාධස්ස සාමන්තා ද්වඞ්ගුලං සත්ථකම්මං වා වත්ථිකම්මං වා කාරාපෙතබ්බං."

මල මූත්‍ර මාර්ගයන්හි දෝ ඒ හාත්පස දඟුලක් තැන හෝ ශස්ත්‍ර කර්ම, වස්ති කර්ම කරවන භික්ෂුවට තුලශි ඇවැත් වෙයි.

(57) "න භික්ඛවෙ, රත්තචිත්තෙන අඞ්ගජාතං ඡුපිතබ්බං."

සරාගී සිතින් අංගජාතය ස්පර්ශ කිරීමෙන් තුලශි ඇවැත් වෙයි. සරාගී සිතින් අනුපසම්පන්නයන් ස්පර්ශ කිරීමෙන් දුකුළා ඇවැත් වෙයි

(58) "විතාධානං වජන්තස්ස – දුක්කටං පරිකිත්තිතං
යාචමානස්සපධානෙ – අදදන්තස්ස දුක්කටං"

මෙම අතුම පෙරහන නැති ව දෙගව්වු පමණ දුර යන භික්ෂුවට ද, දික්මගක දී පෙරහන ඉල්ලූ විට නොදෙන භික්ෂුවට ද දුකුළා ඇවැත් වෙයි. පෙරහනක් නැති කල ඒ වෙනුවට සඟල සිවුරු කොන හෝ ඉවා ගෙන යායුතු.

(59) "බුද්ධං ධම්මං ච සංඝං ච – ආරබ්භ කරණෙ දවං
දුක්කටං පරිකංවාපි – අඤ්ඤස්ස උපලාලනෙ"

රත්නත්‍රයවිෂයයෙහි ක්‍රීඩා කිරීමෙන් ද, අන් භික්ෂුවකගේ ශිෂ්‍ය සාමණේරාදීන්ට පාත්‍රාදිය දීමෙන් ද දුකුළා ඇවැත් වෙයි

(60) "වඩ්ඪිං පයොජයෙ යාචෙ – සො ඤාතික පවාරිතෙ
අත්තනො පරිභොගත්ථං – දින්නමඤ්ඤස්ස සො දදෙ"

පොලී කරන්නාවත්, නො නෑ නො පැවරූවන්ගෙන් චීවරාදිය ඉල්ලන්නාවත්, තමාට නියම කොට දුන් දෙය පරිභෝග නො කොට අන් කෙනෙකුට දෙන්නාවත් දුකුළා ඇවැත් වෙයි.

(61) "උද්දිස්ස යාචනෙ රක්ඛං – ඤාතා ඤාතාව දණ්ඩනං
ගීවාස්ස දණ්ඩිතෙ දණ්ඩං – තයං දණ්ඩාපනෙ පන
දණ්ඩස්ස අග්ඝභෙදෙන – ඤෙය්‍යා පාරාජිකාදිකා"

පාසිවුරු ආදිය සොරා ගැනීම පිළිබඳ ව නඩු කට යුතු පුද්ගලයන් ආරක්ෂක නිලධරයනට පෙන්වා දීමේ දී ඉතා කල්පනාකාරී විය යුතු ය. භික්ෂුවගේ වචනය උඩ ඒ සොරුනට දඩ නියම වුවහොත්, ඒ භික්ෂුව විසින් දඩ මුදල ගෙවිය යුතු ය. ආරක්ෂක නිලධරයන් සොරුන් පිළිබඳ විචාල කල, එසේ කීම නුසුදුසු බවත්, එය ඔවුන් විසින් ම දතයුතු බවත් කියයුතු ය. හුදෙක් ආරක්ෂාව පමණක් ඉල්ලන බවත්, සොර ගිය බඩු නැවත ගෙන්වා දෙන ලෙසත් කිවයුතු ය. භික්ෂුව විසින් දඩ ගස්වනු ලැබුව හොත්, මුදලේ හැටියට පරිජි ඇවැත් ආදිය දතයුතු ය. කෙත්වතු, ගව, මහිෂාදීන් පිළිබඳ නඩු කීම තබා ආරක්ෂාව ඉල්ලීම ද නුසුදුසු ය.

(62) "හරන්තස්ස පරික්ඛාරං - චෝරෝ චෝරෝති භාසිතෙ
අලාභෝ යෙන ගණ්හන්තෙ - දණ්ඩං හිංසාය තත්තකං"

කවරකු හෝ පිරිකර සොරා ගෙන යද්දී 'සොරෙක සොරෙකැ' යි භික්ෂුව විසින් නො කියයුතු ය. එසේ කියන්නක් අසා, අධිකරණයට පමුණුවා දඬ නියම කරවුවහොත්, ඒ දඬ මුදල භික්ෂුව විසින් ගෙවිය යුතු ය. ඉදින් නො ගෙවත මුදල් ප්‍රමාණයෙන් පරිජි ඈ ඇවැත් දතයුතු ය.

(63) "විසාසුච්චාරසංඛාර - මුත්තං ජඩ්ඩස්ස දුක්කටං
බහිපාකාර කුඩ්ඩානං - වලඤ්ජනාවලොකනං
හරිතෙවාපි වීහාදි - නාළිකෙරාදි රොපිතෙ"

භිත්ති පවුරුවලින් පිටත නොබලා නොසලකිලි ව ඉඳුල්, මල, මුත්‍ර, කැලි කසල ආදිය දැමීමෙන් දුකුළා වෙයි. වපුල හැල් වී ආදියෙහි ද, පොල් කොස් අඹ ආදී රුක් මුල්හි ද ඉඳුල් ආදිය දැමීමෙන් දුකුළා වෙයි.

(64) "රාජාගාරං පොක්ඛරණිං - උය්‍යානං චිත්තාගාරකං
කීළත්ථං ගච්ඡතො දට්ඨුං - ආරාමං දුක්කටං කතං."

මේ අනුව රාජ යුවරාජාදීන්ගේ ක්‍රීඩා පිණිස කළ රාජාගාරය ද, පොකුණ ද, උයන ද, චිත්‍රාගාරය ද දක්නට යන භික්ෂුවට පියවරක් පාසා දුකුළා ඇවැත් වෙයි.

(65) "අනොකාසකතෙ පරම්මුඛා - ආපත්තීහි ච සත්තහි
භික්ඛුමුපාසකං වාපි - අක්කොසනෙව ච දුක්කටං."

භික්ෂුවකට අසම්මුඛයෙහි සප්ත ආපත්ති ස්කන්ධයෙන් ආක්‍රෝශ කිරීමෙන් ද, උපාසකයකුට ජාත්‍යාදී අන් කරුණකින් ආක්‍රෝශ කිරීමෙන් ද දුකුළා ඇවැත් වෙයි.

(66) "ආපත්තියා අනොකාසං - කතං චොදෙය්‍ය දුක්කටං
සුද්ධස්ස ච අවත්ථුස්මිං - කත්වා ඔකාසකාරණෙ"

මේ අනුව 'කරොතු මේ ආයස්මා අහං තං වත්තු කාමො' යි අවසර නො ගෙන භික්ෂුවකට චෝදනා කිරීමෙන් දුකුළා ඇවැත් වෙයි. කාරුණ්‍ය රහිත ව චෝදනා කරනු පිණිස අවසර ගැනීමෙන් ද දුකුළා ඇවැත් වෙයි.

(67) "යං කිඤ්චි යාචිතුං හත්ථෙ - කම්මං තදනුසාරතො
ලද්ධං ගහෙතුං ගිහිකම්ම - මයාචිත්වාපි කප්පති
කාරෙතුමාහරාපෙතුං - යං කිඤ්චි පරසන්තකං."

ධීවරිකාදී ප්‍රාණවධ කරන්නවුන්ගෙන් ප්‍රාණඝාතාදී අකාප්‍ය දේ ඉල්ලිය නො හැකි ය. ඔවුන්ගෙන් අත් උදවු ඉල්ලනු කැප ය. ගෘහස්ථ කර්මාන්තයෙහි යෙදී සිටින්නවුන් ලවා යම් යම් දේ කරවා ගැනීමෙන්

දුකුලා ඇවැත් වන බව දතයුතු ය. සංඝයා ඇසුරෙන් ජීවත් වන්නවුන්ගෙන් අත් කම් නොඉල්ලා යම් යම් දේ කරවා ගත හැකි ය. අන්සතු ආරක්ෂා නො කළ දර තණ ආදී දේ අරණින් ගෙන්වා ගැනීමට ද හැකි ය.

(68) “ගිහීනං ගොපකෙ දෙන්තෙ - සහෙතුං දෙති යත්තකං
ලබ්භං යථා පරිච්ඡෙදං - සංඝෙ චෙතියසන්තකෙ”

ගිහිසතු දෙසින්, රජදරුන් විසින් දෙන ලද පමණ ගනු වේ. සාංඝිකයට චෛත්‍යසන්තකයට සංඝයාගේ නියමය පරිදි ගත වරද නැත. එය ගෝපක දානයෙන් ගන්නාට වස්තු ප්‍රමාණයෙන් ඇවැත් වෙයි.

(69) “පරිකථොභාස විඤ්ඤත්ති - න ලබ්භා පච්චයද්වයෙ
විඤ්ඤත්තියෙව තතියෙ - සෙසෙ සබ්බම්පි ලබ්භති”

චීවර - පිණ්ඩපාත දෙක්හි පරියායකථාවත්, නිමිත්ත කර්මයත්, විඤ්ඤත්තියත් නුසුදුසු ය. සේනාසනයෙහි විඤ්ඤත්තිය ම නුසුදුසු ය. ගිලානපාන පිළිබඳ පරියායකථා ආදී සියල්ල සුදුසු ය. එහෙත් එසේ ලබන ගිලන්පස රෝගය සුව වූ කල ගැනීමෙන් වන ඇවැතක් නැතත්, සන්තුෂ්ටි භාවයට නො නොබනාබව කිවයුතු ය.

(70) “න රූහනච්චයෙ දානං - පඤ්චන්නං සහධම්මිනං
සංඝස්සෙව ච තං හොති - ගිහීනං පන රූහති”

සිය ඇවෑමෙන් තමසතු දෙය අන්සතු කිරීමටත්, අනුන් ඇවෑමෙන් ඒ දේ තමාසතු කොට ගැනීමටත් පස්සහදම්මිකයනට[49] ම නො හැකි ය. ඇවෑමෙන් එය සංඝයාට ම අයත් වෙයි. එබඳු දේ ගැනීමෙන් ඇතැම්විට පරිජි වැනි ඇවැත් විය හැකි බැවින් පරෙස්සම් විය යුතු ය. තමාසතු දෙය කවරකුට හෝ දියයුතු නම්, ඒ ජීවත් ව සිටිය දී ම දියයුතු ය. අච්චයදානය ගිහි ධර්මයකි

(71) “භික්ඛු වා සාමණෙරො වා - කාලං කයිරාථුපස්සයෙ
භික්ඛුසංඝොව දායජ්ජං - තත්ථ සෙසෙසපායං නයො”

භික්ෂු නමක් හෝ සාමණේර නමක් හෝ මෙහෙණවරක අපවත් වූ කල, ඔවුන් සතු පාසිවුරු ආදියෙහි සංඝයා ම අධිපති වේ. භික්ෂුණී සාමණේර සහ ශික්ෂමාණාවන් පිළිබඳ ව ද මෙසේ ම ය. අපවත් වූ භික්ෂු සාමණේරාදීන්ගේ පාසිවුරු පමණක් සංඝයා විසින් විනය පරිද්දෙන් ගිලන් උපස්ථායකයනට දියයුතු යි. සෙසු සියලු ලුහුබඩු සම්මුඛීභූත සඟා විසින් බෙදා ගතයුතු යි. ගරු බඩු නො බෙදා, අනුනට නො දී, සාංඝික පන්සලක තබා සාංඝික පරිභෝගයෙන් පරිභෝග කළයුතු යි.

(72) "පාරිවාසිකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි උපසම්පාදෙතබ්බං, න ඡමාය චඞ්කමන්තෙ චඞ්කමෙ චඞ්කමිතබ්බං."

මෙසේ පාරිවාසික භික්ෂූන් විසින් ප්‍රකෘති භික්ෂූන් කෙරෙහි හැසිරියයුතු සැටි වත් ඛන්ධකයෙහි වදළහ. "න භික්ඛවෙ, පාරිවාසිකෙන භික්ඛුනා පාරිවාසිකවුඩ්ඪතරෙන භික්ඛුනා සද්ධිං මූලායපටිකස්සනාරහෙන මානත්තාරහෙන මානත්තචාරිකෙන අබ්භානාරහෙන භික්ඛුනා සද්ධිං එකච්ඡන්නෙ ආවාසෙ වත්ථබ්බං" යනාදීන් දක්වූ ප්‍රකෘති භික්ෂුව කෙරෙහි හැසිරියයුතු වූ ම වත් කොටසක් වෙයි. ඒවා වෙන වෙන ම නො ගෙන, පාරිවාසික වුඩ්ඪාදී පුද්ගලයන් කෙරෙහි හැසිරියයුතු බැවින් ඔවුන් පස් දෙනාගේ වශයෙන් එක් කොට (ඒ සියලු වත්) එකක් එකක් කොට ගැනීමෙන් වත් පහක් ලැබේ. "න පකතත්තස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං පිට්ඨිපරිකම්මං සාදිතබ්බං" යන උක්ඛිත්තක භික්ෂුව පනවන ලද තවත් වතකි "න පකතත්තො භික්ඛු සීලවිපත්තියා අනුද්ධංසෙතබ්බො" යනාදීන් කී වත් දහයක් ඇත මෙසේ දක්වන ලද දෙඅසූ වත් ඉක්මවීමෙන් එකක්පාසා දුකුලා ඇවැත් වශයෙන් සැලකියයුතු ය.

(73) "ආගන්තුකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි"

මේ අනුව, වදාළ තුදුස් මහ වත්හි[50] ඇතුළත් සිය ගණන් සිකපද අනාදරයෙන් ඉක්මවන්නාට එකක් පාසා දුකුලා ඇවැත් වෙයි.

"යො ගවං න විජානාති – න සො රක්ඛති ගොගණං
එවං සීලං අජානන්තො – කිං සො රක්ඛෙය්‍ය සංවරං"

'ගවයන් ගණන නොදත් ගොපල්‍ලු තෙමේ ගවරැළ නො රකියි. සිල් නොදත් මහණ තෙමේ කවර නම් ශීලයක් රක්නේ ද?'

"වත්තං න පරිපූරෙන්තො – න සීලං පරිපූරති
අසුද්ධසීලො දුප්පඤ්ඤො – දුක්ඛා න පරිමුච්චති"

'වත් නොපුරන්නේ සිල් නො පුරයි. දුසිල් අනුවණයා සසර දුකින් නො මිදෙයි'

"යං පහාරාද, මයා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතු'පි නාතික්කමන්ති"

'පහාරාද! මා විසින් භික්ෂූන්ට යම් ශික්ෂාපදයක් පනවන ලද ද, එය මාගේ ශ්‍රාවකයෝ ජීවිතය නිසා ද නො ඉක්මවත්'

මේ සියල්ල නුවණින් සලකා, කුඩා අනුකුඩා ශික්ෂාපදයන්හි ද තියුණු ගෞරවයෙන් ශික්ෂාවන් පූරණය කිරීමෙන් ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙහි පිහිටියයුතු.

එවං හි සඞ්ඛෙපතො වුත්තං - නිද්දිසි'මං යො මනසිකරෙය්‍ය, සො දුක්ඛවාංසකත්විසාරදතං - සම්පාපුණෙ තස්ස පවිණතාසුව

දෙවැනි පරිච්ඡේදය නිමි.

# හත වැනි පරිච්ඡේදය

ඉහත දැක්වුණු ප්‍රාතිමෝක්ෂ සංවරශීලය පිළිබඳ විපත්ති හා විපත්තිදෝෂ දැන් සලකා බලමු.

(1) "යොධ සෙවති දුස්සීලෙ - සීලවන්තෙ න සෙවති
වත්ථුවීතික්කමෙ දොසං - න පස්සති අවිද්දසු
මිච්ඡාසඞ්කප්පබහුලො - ඉන්ද්‍රියානි න රක්ඛති
එවරූපස්ස වෙ සීලං - ජායතෙ හානභාගියං"

'මේ ශාසනයෙහි යමෙක් දුශ්ශීලයන් සේවනය කරයි නම්, සිල්වතුන් ඇසුරු නො කරයි නම්, සිකපද කඩවීමෙහි දොස් නො දකියි නම්,

විතර්ක බහුල වූයේ ඉඳුරන් නො රකියි නම්, එබන්දහුගේ ශීලය පිරිහෙන සුලු වන්නේ ය. මේ මෙහි භාවය යි.

මින් දැක්වූයේ දුසිලුන් ඇසුරෙන් සිල් අපිරිසිදු වන බව යි. ත්‍රිවිධ අනාචාරයෙන්, මිථ්‍යාජීවයෙන්, ෂට් අගෝචරයෙන් යුත්, ත්‍රිවිධ ගෝචර රහිත භික්ෂූණගේ ප්‍රාතිමෝක්ෂ සංවරය අස්ථිර ය. "ආචාර ගොචරසම්පන්නොති ආදි පන සබ්බං යථාපටිපන්නස්ස තං සීලං සම්පජ්ජති තං පටිපත්තිං දස්සෙතුං වුත්තන්ති වෙදිතබ්බං" යන එහෙයින් කියන ලදී.

(2) කෙලෙසීම් වශයෙන් ඛණ්ඩ, ඡිද්‍ර, සබල, කල්මාෂ යැයි ශීලය සිවුවැදෑරුම් වෙයි. මුලින් හෝ අගින් හෝ සිකපදයක් බිඳුණේ නම්, කෙළවර ඉරුණු වස්ත්‍රයක් මෙන් ඒ ශීලය 'ඛණ්ඩ' වෙයි. මැද සිකපදයක් බිඳුණේ නම්, මැදින් ඉරුණු වස්ත්‍රයක් මෙන් ඒ ශීලය 'ඡිද්‍ර' වෙයි. පිළිවෙළින් දෙතුන් සිකපදයක් බිඳුනේ නම්, පොහොර දෙනක මෙන් ඒ ශීලය 'සබල' වෙයි. අතරතුර සිකපද බිඳී ගියේ නම්, තිත් දෙනක මෙන් ඒ ශීලය 'කල්මාෂ' වෙයි.

ශීලය පිළිබඳ මේ-කෙලෙසීම් ලාභ, කීර්ති, ඥාති, ශරීර, ජීවිතයන්ගේ වශයෙන් ද සිදුවියහැකි ය. සප්ත මෛථුනයන්ගේ වශයෙන් ද සිදුවියහැකි ය.

"ඉත්ථියාලිඞ්ගනාසෙවනං - තාය සද්ධිං හසනං තථා
දිට්ඨියා දිට්ඨිකන්නං - සද්දස්ස සවණම්පි ච
පුබ්බෙ සිමන්තිති සද්ධිං - කතඛිඩ්ඩාදිකං සරං
කාමානුභොන්තං ගහපතිං - දිස්වා තත්ථ පනාලයං
දෙවත්තියො ච තිස්සාය - බ්‍රහ්මචාරසුරක්ඛණං
ඉච්චෙතෙ ඊරිතා සත්ත - මෙථුනානි පවුච්චති"

මේ දක්වූයේ සප්තවිධ මෛථුනය යි. ඒ පිළිවෙළින් මෙසේ ය:

(i) ස්ත්‍රිය වැළඳ ගැනීම
(ii) ඇය සමඟ සිනාසීම
(iii) ඇගෙන් ඇස හෙළා බැලීම
(iv) ඇගේ කට හඬ ඇසීම
(v) පෙර ස්ත්‍රීන් සමඟ කළ කෙළිසිනාදිය සිහි කිරීම
(vi) පස්කම් සැප විඳින ගෘහපතියකු දැක එහි ආලය කිරීම
(vii) දෙවඟනන් ලබනු පිණිස මහා ව බඹසර රැකීම, යනුයි.

(3) කුඩා අනුකුඩා සිකපද දැන දැන මඩින භික්ෂුවගේ පරිජ මැති මහසිකපද ද නෑසා පසකාට යයි. "ආභිසමාචාරිකං ධම්මං අපූරෙත්වා, ආදිබ්‍රහ්මචරියකං ධම්මං පූරෙස්සතීති නෙතං ඨානං විජ්ජති" යැ යි එහෙයින් වදාළහ 'ආභිසමාචාරික යැ යි කියන ලද කුඩා අනුකුඩා සිකපද නො රැක, ආදිබ්‍රහ්මචරියක යැ යි කියන ලද මහසිකපද පුරන්නේ ය' යන මේ කරුණ සිදු නොවන බව එයින් කියැවෙයි.

(4) අභිජ්ඣා, විසමලෝභ, කෝධ, උපනාහ, මක්ඛ, පලාස, ඉස්සා, මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, පමාද, නමින් හැඳින්වෙන උපක්ලේශ ධර්ම රැසක් වෙයි. මේ උපක්ලේශ ධර්මයන් විසින් ද ශීලය කෙලෙසනු ලැබේ

අන්සතු දෙය තමාට වේවා යි සිතීම අභිධ්‍යාව යි. තමාසතු දෙයෙහි දැඩි ඇල්ම විසමලෝභය යි. කිපෙන ලක්ෂණය ක්‍රෝධ නම් වෙයි. දැඩි ව පවත්නා ක්‍රෝධය උපනාහ නමින් දැක්වෙයි. අනුන්ගුණ මකන බව මක්ඛ නමින් එයි. අනුන් ගුණයෙන් තමන් හා සම වනු නොඉවසීම පලාසය යි. මෙරමා සම්පත් නොඉවසන බව ඉස්සාව යි. තම සම්පත් සඟවන බව මච්ඡරිය යි. කළපව් වසන බව මායාව යි. නැති ගුණ දැක්වීම සාඨෙය්‍ය නම් වෙයි. චිත්ත විකාරයෙන් ගුණයට නොනැමෙන මානය ථම්භය යි. කරණුත්තරිය හෙවත් එකට එක කිරීම සාරම්භය යි. ජාති ආදියෙන් තමා උසස් කොට තැකීම මානය යි. සියලු කරුණෙන් අතිශයින් තමා උසස් කොට තැකීම අතිමානය යි. ජාත්‍යාදියෙන් මත් වීම මද නම් වෙයි. කුශල ක්‍රියාවන් අමතක කිරීම හා පස්කම්ගුණයෙහි සිත බැහැලීම ප්‍රමාදය යි.

මේ හැම උපක්ලේශයකින් ම ප්‍රකෘති ශුද්ධචිත්තය කෙලෙසෙයි. මේ අකුශලචෛතසිකයන්ගෙන් කිලුටු භික්ෂුව, දෙ කොන් ගිනි ගත් මැද අශුචි තැවරුණු සතරඟුල් සොහොන් පෙනෙල්ලට සම කොට පිණ්ඩෝල්‍ය සූත්‍රය කියයි.

(5) ශීලය නම් විශේෂයෙන් ප්‍රාතිමෝක්ෂ සංවරය ම ය. ඉන්ද්‍රිය සංවරය, ආජීව පාරිශුද්ධිය හා ප්‍රත්‍යය සන්නිශ්‍රිතය ප්‍රාතිමෝක්ෂ සංවරයෙහි ම සමෘද්ධිය පිණිස වදාළහ. එහෙයින් ඉන්ද්‍රිය අසංවරයෙන්

මිථ්‍යා ආජීවයෙන්, ප්‍රත්‍යවේක්ෂා නොකිරීමෙන් වන්නා භික්ෂුවගේ ප්‍රාතිමෝක්ෂ සංවරය ද භාජනයට යයි.

(6) පාතිමොක්ඛසංවරශීලය පිළිබඳ ශීල, දිට්ඨි, ආජීව හා ආචාර යයි විපත්ති සතරක් වෙයි. සිවු පරජයටත් තෙළෙස් සඟවෙසෙසටත් පැමිණීමෙන් ශීලවිපත්තිය වෙයි. දිට්ඨිඅප්පටිනිස්සජ්ජන පවිතියට පැමිණීම දිට්ඨිවිපත්තිය යි. උතුරු මිනිස්දම් පරිජියව, සංචරිත්ත සඟවෙසෙසව, පරියායෙන් උතුරු මිනිස් දම් පල කිරීමෙන් ථුලසියව, පණීත භෝජන විඤ්ඤත්තියෙන් පචිතියව, සූපෝදන විඤ්ඤත්තියෙන් දුකුලාට පැමිණීමෙන් ආජීවවිපත්තිය සිදු වෙයි ශීල, දිට්ඨි, ආජීව, යන ත්‍රිවිධ විපත්තියෙන් ඉතිරි ආපත්ති ස්කන්ධයන්ට පැමිණීම ආචාරවිපත්තිය යි.

පාරාජික සහ සංඝාදිසේස ආපත්ති ස්කන්ධයන්ට පැමිණීමෙන් ශීල, ආජීවවිපත්ති දෙක ම වෙයි ථුල්ලච්චය ආපත්ති ස්කන්ධයට පැමිණීමෙන් ආජීව, ආචාරවිපත්ති දෙක ම වෙයි. පාචිත්තිය ආපත්ති ස්කන්ධයට පැමිණීමෙන් දිට්ඨි ආජීව - ආචාර යන විපත්ති තුන ම වෙයි පාටිදේසනීය, දුෂ්කෘත හා දුර්භාෂිත ආපත්ති ස්කන්ධයන්ට පැමිණීමෙන් ආජීව, ආචාරවිපත්ති දෙක ම වෙයි.

(7) ශීලය පිළිබඳ විපත්තිදෝෂ ගැන ද සලකා බැලිය යුතු ය.

ස්වර්ගමෝක්ෂය වළකන අන්තරායකර ධර්ම පසකි. "සග්ගමොක්ඛානං අන්තරායං කරොන්තීති අන්තරායිකා" යි දැක්වූ පරිදි 'ස්වර්ග - මෝක්ෂයන්ට අන්තරාය කරත්තු' යි අන්තරායික නම් වෙයි "තෙ කම්ම කිලෙස විපාක උපවාද ආණාවීතික්කම-වසෙන පඤ්චවිධා" යි ඒ අන්තරායකර ධර්ම පස දක්වා ඇත කර්ම, ක්ලේශ, විපාක, උපවාද - ආඥාව්‍යතික්‍රමණ යි යට සඳහන් සිවු වැදෑරුම් විපත්තිය මින් ආඥාව්‍යතික්‍රමණ දෝෂය යි.

"තත්ථ පඤ්චානන්තරියධම්මා කම්මන්තරායිකා නාම. තථා භික්ඛුනිදූසකකම්මං තං පන මොක්ඛස්සෙ'ව අන්තරායං කරොති න සග්ගස්ස නියතමිච්ඡාදිට්ඨිධම්මා කිලෙසන්තරායිකා නාම පණ්ඩකඋභතොබ්‍යඤ්ජනකානං පටිසන්ධිධම්මා විපාකන්තරායිකා නාම. අරියූපවාදධම්මා උපවාද අන්තරායිකා නාම තෙ පන යාව අරියෙ න ඛමාපෙන්ති තාවදෙව, න තතොපරං. සඤ්චිච්ච වීතික්කන්තා සත්ත ආපත්තික්ඛන්ධා ආණාවීතික්කමන්තරායිකා නාම. තෙපි යාව භික්ඛුභාවං පටිජානාති න වුට්ඨාති වා න දෙසෙති වා තාවදෙව, න තතොපරං"

'පංචානන්තරිය කර්ම, කර්මාන්තරාය යි. භික්ෂුණී දූෂණය ද එසේ ම ය. එය මෝක්ෂ අන්තරාය පිණිස ම පවතියි. ස්වර්ගයට අන්තරායකර නො වෙයි. නාස්තික, අහේතුක, අකිරිය යන මිථ්‍යා දෘෂ්ටිය ක්ලේශාන්තරාය යි. පණ්ඩක උභතෝව්‍යඤ්ජනක තිරශ්චීනයන්ගේ අහේතුක ද්විහේතුක ප්‍රතිසන්ධි, විපාකාන්තරාය යි. සෝවාන් ආදී ආර්ය ගණයාට දෝෂාරෝපණය කිරීම උපවාද අන්තරාය යි. මෙය ඒ ආර්යයන් කමා කොට ගන්නා තෙක් ම පවතියි. ඉන් මිදු නො වෙයි. දැන දැන සත්ත ආපත්තිස්කන්ධය ඉක්මවීම ආඥාව්‍යතික්‍රමණාන්තරාය යි. භික්ෂුත්වය ප්‍රතිඥා කරන තාක් මේ ඇවැත් නැගී සිටී ද නොහොත්, දේශනා උට්ඨාන වශයෙන් ශුද්ධියට පත් වන තාක් නැගී සිටියි. ඉන් මිදු අන්තරායකර නො වෙයි. මේ ඉහත කී පාළියෙහි සාමාන්‍ය අදහස යි.

මින් විපාකාන්තරාය ස්වර්ගමාර්ගය නො වසයි. "අන්තමසො දුබ්භාසිතම්පි අන්තරායකරමෙව" යි කී හෙයින් යටත් පිරිසෙයින් දුර්භාෂිතය ද ස්වර්ගමෝක්ෂයන්ට අන්තරායකර ම වෙයි. "සාපත්තිකස්ස භික්ඛවෙ, නිරයං වා වදාමි තිරච්ඡානයොනිං වා" යනුවෙන් 'මහණෙනි, සාපත්තික භික්ෂුවට නිරයගතිය හෝ තිරිසන්යෝනිය හෝ කියමි' යි (සාරත්ථදීපනී ටීකා.හි) දක්වෙයි. එහෙයින් දැන දැන ඇවැතට පත් වීම ඉතා බැරෑරුම් ය. සාපත්තික මරණයෙන් මතු ඒකාන්තයෙන් සතර අපා දුකට ම පත් වනබව සිහිපත් කළයුතු ම ය.

(8) කාශ්‍යප බුද්ධශාසනයෙහි පැවිදි ව, සික පද නො සලකා හැසිර, මිය ගිය භික්ෂු නමක් පිළිබඳ ව ලක්ඛණ සංයුත්ත අටුවාවෙ කියයි. "පාපභික්ඛූති ලාමකභික්ඛු සො කිර ලොකාමිස සද්ධාදෙය්‍යානි චත්තාරො පච්චයෙ පරිභුඤ්ජිත්වා කායවචීද්වාරෙ අසංවුතො භින්නාජීවො චිත්තකීලං කීළන්තො විචරිත්වා කස්සප බුද්ධන්තරං නිරයෙ පච්චිත්වා පෙතලොකෙ නිබ්බත්තන්තො භික්ඛුසදිසෙනෙව අත්තභාවෙන නිබ්බත්ති" යි එහි දක්වෙයි. පාපභික්ෂුව යනු ලාමකභික්ෂුව යි. ඒ භික්ෂුව ලෝකයාගේ සද්ධාදෙය්‍ය වන චීවරාදී සිව්පසය අනුභව කොට, කය වචී යන දෙකට පසවා මදල සික පද නො රැක, ආජීව බිඳ ගෙන, චිත්තක්‍රීඩාවෙන් හැසිර, ඉන් හැම බුද්ධාන්තරයක්[51] මුළුල්ලෙහි නිරයෙහි පැසී, ගිනි ගෙන දිලෙන පාසිවුරු සහිත ව භික්ෂු සමාන ආත්මභාවයකින් ප්‍රේත ව උපන්නේය' මේ එහි සාමාන්‍ය තේරුම යි.

එහි ම මෙසේ ද දක්වෙයි: "පාපභික්ඛූති අඤ්ඤෙසු ඨානෙසු මූලච්ඡෙජ්ජෙන පාරාජිකපත්තා පාපභික්ඛූති වුච්චන්ති. ඉධ පන පාරාජිකං අනාපන්නො ඉච්ඡාචාරෙ ඨිතො ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි මද්දිත්වා විචරන්තො පාපභික්ඛූති අධිප්පෙතො." මුල් සුත්

පරිජි අවත් මහණ ම පාපභික්ෂු ය යි අත් තන්හි එයි. පරිජි නො වූ කුඩා අනුකුඩා සිකපද මතිමින් හැසිරෙන මහණ ද පාපභික්ෂු වශයෙන් මෙහි කියයි.

(9) "යස්ස අච්චන්ත දුස්සීල්‍යං - මාලුවා සාලමිවොත්ථතං
කරොති සො තථත්තානං - යථා නං ඉච්ඡතී දිසො"

– ධම්මපද

සල් ගසේ එතුණු මාලුවා වැල එය මුළුමනින් ම යට කරයි. යමකුගේ තද දුසිල්කම ඔහු යට කරන්නේත් ඒ නියායෙනි. දුසිල්වතා, දුසිල්බව නිසා තමාට විපත් කර ගන්නේ සතුරකු තම 'සතුරාට විපත් සලසන්නාක් මෙනි' මේ එහි සාමාන්‍ය අදහස යි

(10) "අපිච දුස්සීලො පුග්ගලො දුස්සීල්‍යහෙතු අමනාපො හොති දෙවමනුස්සානං, අනනුසාසනීයො බ්‍රහ්මචාරීනං, දුක්ඛිතො දුස්සීල්‍යගරහාසු, විප්පටිසාරී සීලවතං පසංසාසු, තාය ච පන දුස්සීල්‍යතාය සාණසාටකො විය දුබ්බණ්ණො හොති, යෙ ඛො පනස්ස දිට්ඨානුගතිං ආපජ්ජන්ති තෙසං දීඝරත්තං අපායදුක්ඛාවහනතො දුක්ඛසම්ඵස්සො, යෙසං දෙය්‍යධම්මං පතිග්ගණ්හාති තෙසං න මහප්ඵලකරණතො අප්පග්ඝො, අනෙකවස්සගණික-ගූථකූපො විය දුබ්බිසොධො, ඡවාලාතමිව උභතොපරිබාහිරො, භික්ඛුභාවං පටිජානන්තොපි අභික්ඛුයෙව, ගොගණං අනුබද්ධ-ගද්‍රභො විය, සතතුබ්බිග්ගො සබ්බවෙරිපුරිසො විය, අසංවාසාරහො මතකළෙබරං විය, සුතාදිගුණයුත්තොපි සබ්‍රහ්මචාරීනං අපූජාරහො සුසානග්ගි විය බ්‍රාහ්මණානං, අභබ්බො විසෙසාධිගමෙ අන්ධොව රූපදස්සනෙ, නිරාසො සද්ධම්මෙ චණ්ඩාලකුමාරකො විය රජ්ජෙ, සුඛිතොස්මීති මඤ්ඤමානොපි දුක්ඛිතොව අග්ගික්ඛන්ධපරියායෙ වුත්තදුක්ඛභාගිතාය."

දුශ්ශීල පුද්ගලයා ඒ හේතුවෙන් දෙවිමිනිසුනට අප්‍රිය වෙයි; සබ්‍රහ්මචාරීන් විසින් අනුශාසනය නොකළ යුත්තෙක් වෙයි; දුශ්ශීලයනට ගරහන කල දුක්ඛිතයෙක් වෙයි; සිල්වතුනට පසසන කල පසුතැවෙන්නෙක් වෙයි; දුසිල් බැවින් හණ වස්ත්‍රයක් මෙන් දුර්වර්ණ වෙයි; ගතානුගතික වන්නවුනට [52] දිගුකලක් අපා දුක් දෙන දුක්ඛ ස්පර්ශ ඇත්තෙක් වෙයි; දානය මහත්ඵල නොකරන බැවින් මඳ අගය ඇත්තෙක් වෙයි; පැරණි අශුචි වළක් මෙන් සෝදිය නොහැකි වෙයි; සොහොන් පෙනෙල්ලක් මෙන් ගිහි – පැවිදි දෙකින් ම බැහැර වූවෙක් වෙයි; භික්ෂුත්වය ප්‍රතිඥා කරනත්, ගවරැළ ලුහුබැඳ යන කොටළුවකු මෙන් අභික්ෂුවක් ම වෙයි; සියල්ලන්ගේ සතුරකු මෙන් නිතර බියෙන් යුතු වෙයි; මළකුණක් මෙන් සංවාසයට නුසුදුසුය; බහුශ්‍රැත වුව ද බමුණනට සොහොන් ගින්න මෙන් සබ්‍රම්සරුන්ගේ

පූජාවට නුසුදුස්ස ය; රූප දක්මෙහි අන්ධයකු මෙන් අධිගමයෙහි අභව්‍යයෙකි; රජයට සැඩොල් කොලුවකු මෙන් දහමට අනාගැත්තෙකි; අග්ගික්ඛන්ධ සූත්‍රයෙහි කී දුකට හිමි ව සිටි හෙයින් 'සැපෙමි' යි සිතතුදු දුක්ඛිතයෙකි.

(11) "සඞ්කස්සරසමාචාරො කසම්බුජාතො අවස්සුතො පාපො
අන්තොපූතිතිචයං නින්දන්තො ආහ ලොකගුරු"

සැක කටයුතු පැවැතුම් ඇතැයි ද, සිල්වතුන් විසින් දුරු කළයුතු බැවින් කසලගති ඇතැයි ද, සදොරින් වැගෙන රාගාදියෙන් තෙත් ව ඇතැයි ද, පව්ගති ඇතැයි ද, ඇතුළත කුණු ව ඇතැයි ද ලෝකගුරු බුදුරජාණන් වහන්සේ වදාළසේක.

"කිඤ්ජීවිතං අබඤ්ඤස්ස තස්ස සමණජනවෙසධාරිස්ස
අස්සමණස්ස උපහතං ඛතමත්තානං වහන්තස්ස"

කාලකණ්ණි වූ, ශ්‍රමණ වේශධාරී අශ්‍රමණ වූ හාරා දමන ලද කුසල් මුල් ඇති ගුණ ශරීරය උසුලන්නා වූ ඒ ශ්‍රමණ දුශ්ශීලයාගේ ජීවිතයට කිත් ද වේ වා!

"ගූථං විය කුණපං විය මණ්ඩනකාමා විවජ්ජයන්තිධ
යං නාම සීලවන්තො සන්තො කිං ජීවිතං තස්ස"

ආභරණයෙන් සැරසෙනු කැමැති පුරුෂයෝ අශුචි කුණප දුරු කරත් එසේ මේ ශාසනයෙහි සීලවන්ත සත්පුරුෂයෝ දුශ්ශීලයා සේවනයෙන් දුරු කරත්. එබඳු ශ්‍රමණදුශ්ශීලයාගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජන ද?

"සබ්බභයෙහි අමුත්තො මුත්තො සබ්බෙහි අධිගමසුඛෙහි
සුපිහිතසග්ගද්වාරො අපායමග්ගං සමාරූළ්හො,
කරුණායවත්ථුභූතො කාරුණිකජනස්ස නාම කො
අඤ්ඤො දුස්සීලසමො දුස්සීලතාය ඉති බහුවිධදොසා"

ආත්මානුවාදදී සියලු භයින් නොමිදුණු, උපචාරාදී සියලු අධිගම සුවයෙන් මිදුණු, මනා ව වැසූ ස්වර්ගද්වාරය ඇති, අපාය මගට නැගුණු,

කාරුණික ජනයාගේ කරුණාවට භාජන වූ ශ්‍රමණ දුශ්ශීලයා හා සම වූ අනෙක් කෙනෙක් නම් කවුරු ද?

මෙසේ දුසිල්බවෙහි දොස් නොයෙක් ලෙසින් දක්වා ඇත.

(12) "පබ්බජිතො දුස්සීලො පමාදකාරණසීලතො බුද්ධවචනතො ඣානතො සත්තඅරියධනතො ච ජානිං නිගච්ඡති."

පැවිද්ද දුසිල් වූයේ, ප්‍රමාද කාරණයෙන් සතර සංවර ශීලයෙන් ද, බුද්ධවචනයෙන් ද, ධ්‍යානයෙන් ද, ශ්‍රද්ධා - ශීලහිරි - ඔත්තප්ප — ශ්‍රැත - ත්‍යාග - ප්‍රඥා යන සප්ත ආර්ය ධනයෙන් ද පිරිහීමට යයි[53]

“පබ්බජිතස්ස අසුකො නාම නාසක්ඛි සීලං රක්ඛිතුං, න බුද්ධවචනං ගණ්හිතුං, වෙජ්ජකම්මාදීහි ජීවති, ඡහි අගාරවෙහි සමන්නාගතොති එවං අබ්භුග්ගච්ඡති”

අසවල් පැවිද්දට සිල් රැකිය නො හැකි ය; බුද්ධ වචනය ඉගෙනිය නො හැකි ය; වෙදකම් ආදියෙන් ජීවත් වෙයි; බුද්ධ, ධර්ම, සංඝ, ශික්ෂා, ප්‍රතිපත්ති, අප්‍රමාද යන මේ සතැන්හි අගෞරවයෙන් යුක්ත ය යි[54] මෙසේ අකීර්තියක් උස් ව නගී.

‘පබ්බජිතොපි බහුභික්ඛූ සන්නිපතිතා අවස්සං කොචි මම කම්මං ජානිස්සති, අථ මෙ උපොසථම්පි පවාරණම්පි ඨපෙත්වා සාමඤ්ඤතො චාවෙත්වා නික්කඩ්ඪිස්සන්තීති සහසා උපසංකමිස්සති. විසාරදො හුත්වා කථෙතුං න සක්කොති. එකච්චො පන දුස්සීලොපි දප්පිතො විය චරති, සොපි අජ්ඣාසයෙන මංකු හොති යෙව.’

දැන් බොහෝ භික්ෂූහු රැස් වූහ. මාගේ දුසිල් බව දන්නෝ නම්, පොහොය කිරීමත් පවාරණයත් තබා මහණකමින් ද මා බැහැර කරන්නාහ යි බියෙන් ම එළඹෙන්නේ ය. නො බියව කරුණු කීමට නො හැකි ය. ඇතැම් දුසිල් යමෙක් දැඩි ව නොබිය ව මෙන් හැසිරුණත් හෙ තෙමේ ද අදහසින් මකු වේ මැ ය.’

“සම්මූළ්හො කාලං කරොතීති තස්ස හි මරණමඤ්චෙ නිපන්නස්ස දුස්සීලකම්මෙ සමාදාය වත්තිතං ඨානං ආපාථං ගච්ඡති. සො උම්මීලෙත්වා ඉධ ලොකං පස්සති. නිම්මීලෙත්වා පරලොකං. තස්ස චත්තාරො අපායා උපට්ඨහන්ති. සත්තිසතෙන සීසෙ පහරියමානො විය හොති. සො වාරෙථ වාරෙථා’ති විරවන්තො මරති.”

සිහි මුළා ව කළුරිය කරයි යනු – මරණ මංචකයෙහි හොත් ඔහුට දුසිල්කම්හි සමාදන් ව කළ දෙය මනෝද්වාරයට එළඹෙයි. හේ ඇස හැර මෙලොව දකියි; ඇස පියා පරලොව දකියි. ඔහුට සතර අපාය එළඹ සිටියි. අඩයටි සියයකින් හිස පහරනු ලබන්නකු මෙන් වළකුව වළකුව’ යි හඬ දෙමින් මැරෙයි

මේ සංක්ෂෙපයෙන් දක්වන ලද්දේ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය පිළිබඳ විපත්ති හා විපත්තිදෝෂ යි.

ඉමං තතියනිද්දෙසං – උග්ගණ්හ තො විචක්ඛණො,
විපත්තිසීලෙ තද්දොසෙ – ඤාතභෙදො භවෙය්‍ය සො

තෙවන පරිච්ඡේදය නිමි.

# සවුවැනි පරිච්ඡේදය

ඉන්ද්‍රියසංවරශීලය දක්වන ලද්දේ ප්‍රාතිමෝක්ෂ සංවරශීලයෙහි චිරස්ථිතිය පිණිස ය. දැන් ඉන්ද්‍රියසංවරශීලය පිළිබඳ සලකා බලමු.

(1) "යං පන සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා – පෙ – ඝානෙන ගන්ධං ඝායිත්වා, ජිව්හාය රසං සායිත්වා, කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා, මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී – පෙ – මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජතීති වුත්තමිදං ඉන්ද්‍රියසංවරසීලං."

මේ ඉන්ද්‍රියසංවරශීලය දක්වූ හැටි යි. ඒ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙහි පිහිටි භික්ෂු තෙමේ චක්ෂුර්විඥානයෙන් රූපයක් දැක කෙලෙස් ඉපදීමට හේතු වන ස්ත්‍රී පුරුෂාදී නිමිති නො ගනියි. අත් පා සිනා ආදී අනුනිමිති නො ගනියි. ඇස අසංවරව විසීමෙන් කාමච්ඡන්ද ව්‍යාපාදාදී අකුසල ධර්මයන් ලුහුබැඳ එන නිසා සිහි එළවා චක්ෂුරින්ද්‍රිය ආරක්ෂා කරයි; සංවර කරයි. ශ්‍රෝත්‍රවිඥානයෙන් ශබ්දයන් අසා, ඝ්‍රාණවිඥානයෙන් ගන්ධයන් දැන, ජිව්හාවිඥානයෙන් රසාස්වාදය කොට, කායවිඥානයෙන් ස්ප්‍රෂ්ටව්‍යය ලබා, මනෝවිඥානයෙන් ධර්මාරම්මණයන් දැන ලෝභාදී කෙලෙස් ඉපදීමට හේතු වන නිමිති නො ගනියි; අනුනිමිති නො ගනියි. – පෙ – මෙසේ මනින්ද්‍රිය ආරක්ෂා කරයි; සංවර කරයි.

මේ යට සඳහන් පාළියෙහි සාමාන්‍ය අදහස යි. මෙසේ සදෙර සිහියෙන් රැක ගනිමින් ඒ භික්ෂුව ඉන්ද්‍රිය සංවරශීලය පුරයි.

(2) "චක්ඛුසොතාදි භෙදෙසු – රූපසද්දාදිගොචරෙ,
අභිජ්ඣාදොමනස්සාදි – පවත්ති විනිවාරණෙ.

නිග්ගණ්හෙය්‍ය සකං චිත්තං – කිට්ඨාදිං විය දුප්පසුං,
සතිමා සම්පජානොව – චරෙ සබ්බිරියාපථෙ."

ඇස, කන, නැහැය, දිව, කය, මනස යන සදොරින් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය, ධර්ම යන ඉෂ්ටානිෂ්ට ආරම්මණයන්හි උපදින අභිධ්‍යා දෞමනස්‍ය ආදී ක්ලේශයන් ඇති වීම වළක්වන්නේ ය.

නොයෙක් තැනින් කුඹුරට වැද ගොයම කන කුළු ගොනකු වැනි නානා රූපාදී අරමුණු බලා දිවෙන තම සිත වලක්වන්නේ ය. ශෙදර පිළිබඳ එලවූ සිහි නුවණ ඇති ව ම සියලු ඉරියව්හි හැසිරෙන්නේ ය.

මේ මෙහි සාම්‍යාත්‍ය අදහස ය. මෙයින් ද ඉන්ද්‍රිය සංවරශීලය ම දක්වන ලදී. එසේ ම මේ ඉන්ද්‍රිය සංවරශීලය පිළිබඳ විපත්ති හා විපත්තියේ ද ආදිත්තපරියාය සූත්‍රය අනුව දතයුතු ය.

(3) "ආදිත්තපරියායං වො භික්ඛවෙ, ධම්මපරියායං දෙසිස්සාමි තං සුණාථ. කතමො ච භික්ඛවෙ, ආදිත්තපරියායො ධම්මපරියායො, වරං භික්ඛවෙ, තත්තාය අයොසලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං, නත්වෙව චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො නිමිත්තස්සාදගථිතං වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය අනුබ්‍යඤ්ජනස්සාදගථිතං වා, තස්මිං සමයෙ කාලං කරෙය්‍ය ඨානමෙතං විජ්ජති යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය නිරයං වා තිරච්ඡාන යොනිං වා ඉමං ඛ්වාහං භික්ඛවෙ, ආදීනවං දිස්වා එවං වදාමි."

මහණෙනි, ඔබට ආදිත්තපරියාය නම් ධර්මයක් දෙසන්නෙමි. එය අසන්න. මහණෙනි, ඒ ආදිත්තපරියාය නම් ධර්මය කවරේ ද? මහණෙනි, ගින්නෙන් වැලඳ ගත්, හාත්පසින් ගිනි ගෙන දිලිසෙන, ආලෝක සහිත රත් වූ යගුලකින් චක්ෂුරින්ද්‍රිය සාරා උපුටා හෙළීම උතුම්. ඇසින් දතයුතු රූපයන්හි 'අත්පා ආදිය හොබනේ ය' යි අනුව්‍යඤ්ජන වශයෙන් ගැනීම නො මැනැවි. එසේ අනුනිමිති ලෙසින් ගෙන රස විඳින වේලාවක කලුරිය කළේ නම්, නරකය හෝ තිරිසන් අපාය යන දෙගතියෙන් එක්තරා ගතියකට උත්පත්ති වශයෙන් යන්නේ ය. මේ යට කී පාළියෙහි සාම්‍යාත්‍ය තේරුම යි.

(4) "වරං භික්ඛවෙ, තිණ්හෙන අයොසංකුනා - පෙ - සොතින්ද්‍රියං සම්පලිමට්ඨං - පෙ - තිණ්හෙන නඛච්ඡෙදනෙන - පෙ - ඝානින්ද්‍රියං සම්පලිමට්ඨං - පෙ - තිණ්හෙන ඛුරෙන - පෙ - ජිව්හින්ද්‍රියං සම්පලිමට්ඨං - පෙ - තිණ්හාය සත්තියා - පෙ - කායින්ද්‍රියං සම්පලිමට්ඨං නත්වෙව කායවිඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො නිමිත්තස්සාද ගථිතං වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය අනුබ්‍යඤ්ජනස්සාද ගථිතං වා, තස්මිං සමයෙ කාලං කරෙය්‍ය ඨානමෙතං විජ්ජති යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය නිරයං වා තිරච්ඡාන-යොනිං වා ඉමං ඛ්වාහං භික්ඛවෙ, ආදීනවං දිස්වා එවං වදාමි."

මහණෙනි, තියුණු යගුලකින් සොතින්ද්‍රිය උපුටා දැමීම, තියුණු නියකින් ඝාණෙන්ද්‍රිය උපුටා දැමීම, තියුණු කඩකැත්තකින් ජිව්හා ඉන්ද්‍රිය ඇද කපා දැමීම, තියුණු ශස්ත්‍රයකින් කායප්‍රසාදය උගුළුවා දැමීම

උතුම් වන්නේ ය. කායවිඥානයෙන් දතයුතු ස්ප්‍රෂ්ටව්‍යයන්හි අනුව්‍යඤ්ජන වශයෙන් ආස්වාදනය නො මැනැවි. නිමිති අනුනිමිති වශයෙන් ගෙන කායවිඥානයෙන් ආස්වාදනය කරන කලක කලුරිය කෙළේ නම්, නරකය තිරිසන් අපාය යන දෙගතියෙන් එක්තරා ගතියකට පත් වන්නේ ය.

(5) "වරං භික්ඛවෙ, සුත්තං. සුත්තං ඛො පනාහං භික්ඛවෙ, ජීවිතානං වඤ්ඣං වදාමි. අඵලං ජීවිතානං වදාමි. නත්වෙව තථාරූපෙ විතක්කෙ විතක්කෙය්‍ය, යථාරූපානං විතක්කානං වසංගතො සංඝං භින්දෙය්‍ය, ඉමං ඛ්වාහං භික්ඛවෙ, ආදීනවං දිස්වා එවං වදාමි."

මහණෙනි, නෙව ශයනය කිරීම උතුම්. මහණෙනි, නෙව ශයනය කිරීම ජීවිතයන්ගේ වඳකම යැයි කියමි. (ජීවිතයන්ගේ නිෂ්ඵලකම යැයි කියමි.) සංඝභේදාදියට හේතු වන පාපවිතර්කයන්ට වශය නො විය යුතු ය. (කවර හෙයින් ද? කාමවිතර්කාදී පාපමහා-විතර්කයන්ට (55) වශග ව සිටින පුද්ගලයා සංඝභේද ආනන්තරීය පාපය සිදු කොට මරණින් මතු පුරා කපක් මුළුල්ලෙහි අවීචි මහා නරකයෙහි දුක් විඳින බැවිනි.) මහණෙනි, මේ දෝෂය දැක මෙසේ සෙම ශයනය කිරීම උතුමැ යි කියමි.

(6) ශ්‍රද්ධාවත් කුලපුත්‍රයෝ ආදිත්තපරියාය සූත්‍ර සයින් ඉන්ද්‍රිය අසංවරයෙහි දෝෂ දකිත් වා. ඇස පිනවන පලහැටියා දිලෙන පහන් දැල්ලෙන් නැසෙයි. කන පිනවන තරුණ මුවා මුව වැද්දගේ මිණි හඬින් මුලා ව ගී සහරට ගොදුරු වෙයි. නැහැය සනසන මීමැස්සා මද වැගිරෙන ඇතු කන්තල පැහැරීමෙන් විනාශ වෙයි. දිව පිනවන මාළුවා බිලියෙහි ඇමි ගිල නැසෙයි. කය සනසන තරුණ ඇතු ඇතින්නන් කෙරෙහි බැඳීමෙන් විනාශ වෙයි. ශ්‍රද්ධාවත් කුලපුත්‍රයන් විසින් මෙසේ ඉන්ද්‍රිය සංවරය පිළිබඳ විපත්ති හා විපත්ති දෝෂ සැලකියයුතු ය. ඉන්ද්‍රිය අසංවරයෙන් ම ජාති ආදී සියලු සංසාර දුකට ද, අට මහනරක ආදී සියලු අපාදුකට ද වැටෙන බව සැලකිය යුතු ය. අනාදිමත් සංසාරයෙහි ඉෂ්ටානිෂ්ට රූපාදී ආරම්මණයෙහි ගිජු ව දිවෙමින් හැසිරෙමින් ආ කුළු නොහැකි වැනි මේ සිත, සති රැහැනින් කායගතාසති භාවනා නමැති ටැඹෙහි බැඳ, සියලු ඉරියව්වෙහි සම්පජානකාරී ව විසීම මැනැවි. කිසියම් ඉරියව්වක ලෝභාදී කෙලෙස් පහළ වෙයි නම්, ඒ ඉරියව්ව පෙරළීමෙන් පටිසංඛ්‍යාන ප්‍රහාණාදියෙන් ඒ කෙලෙස් ප්‍රහීණ කරමින් විසියයුතු ය.

යො මතිමා අවබුජ්ඣති එතං ඉන්ද්‍රියසංවරසීලවිභාගං,
ඉන්ද්‍රිය'සංවරභීරුකො දක්ඛො භාවිතඉන්ද්‍රියකො සභවෙය්‍ය.

සිවුවැනි පරිච්ඡේදය නිමි.

# සත්වැනි පරිච්ඡේදය

ඉන්ද්‍රිය සංවර ශීලසම්පාදනයෙන් යම් ශීලයක් රක්ෂා කටයුතු වේ ද, දැන් ඒ ආජීවපාරිශුද්ධි ශීලය දක්වනු ලැබේ.

(1) "යං ආජීවහෙතු පඤ්ඤත්තානං ඡන්නං සික්ඛාපදානං අවීතික්කමස්ස කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතාති එවමාදීනඤ්ච පාපධම්මානං වසෙන පවත්තා මිච්ඡාජීවා විරති, ඉදං ආජීවපාරිසුද්ධිසීලං" යනුවෙන් එය දක්වන ලදී.

ආජීවය හේතු කොට පනවන ලද ශික්ෂාපද ෂට්කය නොඉක්ම-වන්නහුගේ කුහනා, ලපනා, නෙමිත්තිකතා, නිප්පෙසිකතා, ලාභෙන ලාභං නිජිගිංසනතා යන මේ ආදී වූ ලාමක ස්වභාව වශයෙන් පැමිණි මිථ්‍යා ආජීවයෙන් යම් වැලැක්මක් වේ ද, මේ විරති චෛතසිකය ම ආජීවපාරිශුද්ධි ශීලය යි.

(2) එහි ආජීවය හේතු පනවන ලද ශික්ෂාපද සය කවරේ ද? ආජීවය හේතු කොට ගෙන මැඩුණු තෘෂ්ණාවෙන් යුතු ව, නැති ගුණ ප්‍රකාශ කරන භික්ෂුවට වන උතුරු මිනිස් දම් පරිජි ඇවැත එකකි. සංචරිත්ත සංඝාදිසේසය තව එකකි. පරියායයෙන් උතුරු මිනිස් දම් ඇඟවීමෙන් වන තුලසිය තවත් එකකි. පණීත භෝජන විඤ්ඤත්ති පචිත්තිය ද, සූපෝදන විඤ්ඤත්ති දුක්කටය[56] ද තව දෙකකි. විඤ්ඤත්තියෙන් ප්‍රණීත භෝජනයන් ලැබ අනුභව කිරීමෙන් භික්ෂුණීන්ට වන පාටිදේසනීය ආපත්තිය අනෙක ය.

(3) එහි කුහනාව කවරී ද?

ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ඇසුරු කළ, පවිටු අදහස් ඇති, ඉච්ඡාවෙන් මඩනා ලද්දහුගේ, ලැබෙන සිවුපසය වැළැක්වීම සංඛ්‍යාත 'පච්චයපටිසෙධන' නම් කොහොත් වතක් ඇත. තමගුණ ලෝකෝත්තර ගුණයට ආසන්න කොට කීම 'සාමන්තජප්පන' නම් කොහොත් වත යි. ගරුකාර කැමැති පවිටු අදහසින් ම 'මං ආර්යයකු බව දනීවා' යි ඉරියාපථපන ආදී වශයෙන් දක්වන තවත් එකකි. මෙයින් ලෝකයා විස්මිත කිරීම කුහනාව යි.

(4) එහි ලපනාව කවරී ද?

මොහුට ද ලාභාදිය ඇසුරු කළ පවිටු අදහස් ඇති ඉච්ඡාවෙන් මැඩුණු පාපී සිත ඇත. එසේ සිටිමින් වෙහෙරට පැමිණි මිනිසුන් දැක, 'පින්වත්නි, කුමක් පිණිස පැමිණියෝ ද? ඉදින් දන් පිණිස

ආරාධනය කළයුතු නම, මම භික්ෂූන් රැගෙන එන්නෙමි' යනාදී වචනයෙන් පළමුව ම කථාවට බසියි. මෙසේ ආලපන ලපන සමුල්ලපනාදිය කිරීම ලපනාව යි.

(5) එහි නෙමිත්තිකතා නම කවරී ද?

භික්ෂුව යට සඳහන් පරිදි පවිටු අදහසින් යුක්ත ය. හෙතෙමේ දායකයන් ඉදිරියෙහි දී කුසගිනි දක්වනු පිණිස කුස පිරිමැදීම ආදිය කරයි. බත මඳ වුව හොත්, එය හඟවනු පිණිස 'අද මෙහෙර බත් වැගිර ගියේ ය' යනාදිය කියයි. මෙසේ කාය වාක් වශයෙන් නිමිත්ත කර්ම ඔභාසාදිය කිරීම නෙමිත්තිකතා නම වෙයි.

(6) එහි නිප්පෙසිකතා කවරී ද?

භික්ෂුව පෙර කී ලෙසින් ම පවිටු අදහසින් යුක්ත ය. සිවුපසය නොදෙන්නවුන් 'බිය ගන්වා පසය ලබමි' යි යන පාපී අදහස ද ඇත. මෙසේ සිතීමෙන් දශවිධ ආක්‍රෝශයෙන් ආක්‍රෝශ කිරීම හා ඔම්හන ගරහන ඛිපනාදිය කිරීම නිප්පෙසිකතා නම වෙයි.

(7) එහි ලාභෙන ලාභං නිජිගිංසනතා නම කවරී ද?

පෙර කී ලෙසින් ම භික්ෂුව පවිටු අදහසින් යුක්ත ය. එසේ ම සුළු ලාභයෙන් වැඩි ලාභයක් වංචාවෙන් ගැනීමේ කැමැත්ත ද ඇත. මේ නිසා එක ගෙයකින් ලද පසය තවත් කුලයකට ගෙන ගොස් එහි අයය ද කියා එහි දරුවනට දෙයි. එයින් ලද පසය තවත් කුලයකට ගෙන ගොස් එසේ ම දෙයි. මෙසේ පසයෙන් පසය වැඩී කොට සොයයි. මේ ලාභෙන ලාභං නිජිගිංසනතා නම් පාපධර්මය යි [57]

(8) ඒ මේ මිථ්‍යාජීවය "එවමාදීනඤ්ච පාපධම්මානං වසෙන පවත්තා" ආදී වශයෙන් යට දක්වන ලදී. මෙහි ආදී ග්‍රහණයෙන් සැලැකෙන තවත් ධර්ම කොටසක් ඇත. හස්තපාදාදී අවයවයන් නිසා පැවැතෙන අංගවිද්‍යාව එකකි. නක්ෂත්‍රාදී නිමිත්තෙන් ප්‍රවෘත්ත, නිමිත්ත ශාස්ත්‍රය තවෙකකි. උල්කාපාත දිග්දාහ භූමි චලනාදියෙන් ප්‍රවෘත්ත, උත්පාතවිද්‍යාව තවත් එකකි. සිහිනයන්ගේ ගුණාගුණ දක්වන ස්වප්න ශාස්ත්‍රය, ස්ත්‍රීපුරුෂයන්ගේ ලක්ෂණ දක්වන ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් විසින් කන ලද වස්ත්‍රාදියෙහි ගුණාගුණ දක්වන මූෂික ශාස්ත්‍රය, අග්නිහෝමයෙහි ගිනි වශයෙන් ගුණාගුණ දක්වන අග්නිහෝම ශාස්ත්‍රය හා යාග සැන්දෙහි ගුණාගුණ දක්වන දබ්බිහෝම ශාස්ත්‍රය ද මීට ඇතුලත් ය. මේ නාන, ප්‍රකාර තිරශ්චීන විද්‍යාවන් පමණක් නොව, එක් විසි අනේසන, අෂ්ටකුලදූෂණ, විඤ්ඤත්ති, රූපිය සංවෝහාර හා කයවික්කය ද මීට ම ඇතුලත් ය.

එක්විසි අනේසනය කවරේ ද යි දත් යොයා බලමු. “වෙළුදානං පුප්ඵදානං පණ්ණදානං ඵලදානං දන්තකට්ඨදානං මුඛොදකදානං සිනානදානං චුණ්ණදානං මත්තිකාදානං චාටුකම්‍යතා මුග්ගසූප්‍යතා පාරිභට්ටකතා ජඞ්ඝපෙසනිකං වෙජ්ජකම්මං දූතකම්මං පහිණගමනං පිණ්ඩපටිපිණ්ඩං දානානුප්පදානං වත්ථුවිජ්ජා නක්ඛත්තවිජ්ජා අඞ්ගවිජ්ජා” යි එහි දක්වා ඇත. මේ ගොපනත්කම් කිරීම මෙයින් අදහස් කරනු ලැබේ.

උපස්ථායකාදීන් සතුටු කොට පසය ලබන රිසින් වෙහෙර උපන්, අරණින් ගෙනෙන ලද, සැත් නම්, සංඝ - ගණ - පුද්ගලසන්තක උණ්දඬු දීම වේළුදානය යි. තමන් සතු උණ්දඬු දීම වුව ද මීට ඇතුලත් ය. පුවගු, සපු ආදී මල් දීම පුප්ඵදානය යි. බුලත්, තල් පත් ආදිය දීම පණ්ණදානය යි. තල්, පොල්, කොස්, දෙල් ආදී ඵල වර්ග දීම ඵලදානය යි. දැහැටි දඬු දීම, මුව දෝනා පැන් දීම, නහන පැන් දීම, මහර සුණු කෙළිඳ සුණු ආදී සුණු දීම, (සබන් දීම ද මීට ඇතුළත්) ප්‍රකෘති මැටි පංච වර්ණ මැටි ආදී මැටි දීම ඒ ලහට පිළිවෙළින් සැලකියයුතු උපස්ථායකයන් පිණයෙහි තමන් දායකු මෙන් පවත්වන නීච වෘත්තිකාව චාටුකම්‍යතාව යි. අනුන් සිත් ගනු පිණිස, පිසූ මුං ගේ සැබෑ ඔද ව බොරු බොහෝ කොට කියන කථාව මුග්ගසූප්‍යතාව යි. කුලදරුවනට වස්ත්‍ර ආදිය දී අලංකාර කිරීමෙන්, කැවුම් කෙසෙල් දෙමින්, හිස පිරිමදමින්, සැලවමින් සතුටු කිරීම පාරිභට්ඨකතාව යි. ග්‍රාමාන්තර දේශාන්තරාදීන්හි ඒ ඒ ගෘහස්ථයන්ගේ හසුන් පිළිහසුන් ගෙන යෑම් ජංඝපෙසනිය යි. පැමිණි නොපැමිණි සියල්ලනට වෙදකම් කිරීම, ගිහියන්ගේ පණිවුඩ කීම වන දූතකර්මය, කෙත් වතු අරණ ආදියට මෙහෙවර පිණිස යන පෙහෙණ ගමන, තමා ලද මනා පසය කුලයන්ට දී එයින් ලද දෙය ගැනීම වන පිණ්ඩප්‍රතිපිණ්ඩය, ලාභාශාවෙන් අල්ලස් දීම, ශ්‍රීං බිම් ගෙබිම් ආදිය දක්වන වාස්තුවිද්‍යාව, නක්ෂත්‍රවිද්‍යාව හා අංගවිද්‍යාව පිළිවෙළින් දතයුතු. මෙසේ දක්වුණු එක් විසි ධර්ම පැවිද්දන් විසින් නො සෙවියයුතු යි; නොකලයුතු යි. එහෙයින් ම අනේසන නම් වෙයි.

අෂ්ටකුලදූෂණය ද පැවිද්දන් විසින් නො සෙවියයුතු ය. “කුලදූසකෝති කුලානි දූසෙති පුප්ඵෙන වා ඵලෙන වා චුණ්ණෙන වා මත්තිකාය වා දන්තකට්ඨෙන වා වෙළුනා වා වෙජ්ජිකාය වා ජඞ්ඝපෙසනිකෙන වා” යනුවෙන් එය පැහැදිලි කොට ඇත. අනේසනයෙහි ම වදාල ලෙස පුෂ්පාදියෙන් කුලයන් සංග්‍රහ කිරීම මෙහි දී ද කියැවෙයි.

ලජ්ජි ප්‍රියශීලී භික්ෂූන් කෙරෙහි කුලපුත්‍රයන්ගේ ශ්‍රද්ධාව දූෂණය කරන හෙයින් කුලදූෂණ නම් වෙයි. දායකාදීන්ගේ ශ්‍රද්ධාව දූෂණය කරන්නේ කෙසේ ද යි අප විසින් මෙහි දී සලකා බැලියයුතු ය. එබදු

පවිටු භික්ෂුව 'පැහැදියයුතු තැන මේ ය, නො පැහැදියයුතු තැන මේ යැ' යි දායකාදීනට කියා නො දෙයි. 'ලජ්ජී සවභාවය මේ ය, අලජ්ජී සවභාවය මේ යැ' යි කියා නො දෙයි. 'ගුණ කිවයුතු අය මේ ය, ගුණ නො කිවයුතු අය මේ යැ' යි කියා නො දෙයි. එබඳු සත්හි දායකාදීන් මුලා කොට, තමන් කෙරෙහි පමණක් පහදවා ගනු පිණිස ප්‍රත්‍යපාදියෙන් සංග්‍රහ කරමින් ඔවුන් සතුටු කරයි. භික්ෂුධර්මය කුමක් දැයි නොදත් මේ දායකාදීහු අගුවියට ලොල් වන කිලමෑස්සන් සෙයින් අගුවියක් වැනි කුල දූෂක අලජ්ජී භික්ෂුව කෙරෙහි ම පහදති. මුලාවෙන් පහදිති. ඉක්බිති ඒ අලජ්ජී භික්ෂුව තමන්ගෙන් වෙන් ව වසන ලජ්ජී ප්‍රියශීලී ශික්ෂාකාමී අවශේෂ භික්ෂූන් කෙරෙහි දායකාදීන් කලකිරවීමට උත්සාහ දරයි. 'ඔවුහු කුහකයෝ ය. සීලවන්තයෝ අහසින් යති. දුශ්ශීල අලජ්ජීන් සෙවීමට නො හැකි ය. විනය පටිච්ඡන්න ය. අර්හත් ධජයට පැහැද පරම්පරාව අදහා දන් දීමෙන් බොහෝ ආනිසංස ය' යි යනාදී වශයෙන් ලේශයක් ගෙන දායකයනට බණ කියයි. මෙසේ දායකාදීන් ශික්ෂාකාමී භික්ෂූන් කෙරෙහි අප්‍රසන්න කරවයි. කීටාගිරිකාවාස මීට සාධක යි. අලජ්ජී බන්ධනයට හසු වුණු දායකයන්ගේ ශ්‍රද්ධේන්ද්‍රියෙහි මුල් සිඳෙයි. එවිට ලජ්ජී ප්‍රියශීලී ශික්ෂාකාමීන් කෙරෙහි ආඝාත පරිද්දෙන් නොපැහැදීම ඇති වෙයි. මෙ ශ්‍රද්ධාව දූෂණය වීම යි. අලජ්ජීග්‍රහණය ගැරඩි වෙළුමක් වැනි ය. මෙයින් වෙළුණු දායකයෝ අගුණ කිව යුත්තාගේ ගුණ කියති. ගුණ කිව යුත්තාගේ අගුණ කියති. නො පැහැදියයුතු තැන පහදිති. පැහැදියයුතු තැන කලකිරෙති. මෙසේ සිටු මිථ්‍යාදෘෂ්ටියකට පැමිණීමෙන් ඔවුහු මරණින් මතු අපායභාගී වෙති

විඥප්තිය ද ආජීවය කෙලෙසන්නක් බව යට කියන ලදී. ගිලන් සමයෙහි බෙහෙත් හැර සිවුපසය පිළිබඳ ඥාති නොවූ නො පැවරූවන්ගෙන් ඉල්ලා ගැනීම විඥප්තිය යි. මෙහි ඥාතියෝ කවුරු දැයි බලමු.

"ජෙට්ඨභාතා කණිට්ඨො ච – තථා භගිණියො දුවෙ
චූළමාතා චූළපිතා – මහාමාතා මහාපිතා
පිතුච්ඡා මාතුලාචෙව – දසමෙ ඤාතයො මතා"

යි ඒ දක්වා තිබේ. මේ අනුව වැඩිමහලු සොහොයුරාත් සොහොයුරිත්, බාල සොහොයුරාත් සොහොයුරිත්, සුළුපියා සහ මහපියාත්, සුළුමව සහ මහමවත්, නැන්දා සහ මාමාත් යන දස දෙනා නෑයෝ ය. ඔවුන්ගේ සත්කුල පරම්පරාවන වූවෝ ද නෑයෝ ම ය. මේ සියල්ලන් හැර සෙසු ලෝකයා නො නෑයෝ ය.

"වද භන්තෙ, පච්චයෙන" ආදී වශයෙන් 'වහන්ස, සිවුපසය වුවමනා කල මට දන්වනු මැනවැ' යි සාමාන්‍ය ප්‍රත්‍යය නාමයෙන් හෝ, 'සිවුරෙන් ප්‍රයෝජන ඇති කල මට කියනු මැනවැ' යි විශේෂ

වශයෙන් හෝ ආරාධනය කොට කප්පියකාරක වූවෝ පැවරුවෝ ය. ඒ පැවරීම දිවිහිම් කොට හෝ දින මාස අවුරුදු වශයෙන් කාල පරිච්ඡේද කොට හෝ කළහැකි ය. මෙසේ කැපකරු නොවූවෝ නොපැවරුවෝ ය. කෙනෙක් සංඝයාට ම කැපකරුවෝ වෙති. කෙනෙක් පුද්ගලයාට කැපකරුවෝ වෙති. ගිලන් කාලයෙහි හැර, මෙබඳු නොනෑ නොපැවරුවන්ගෙන් සිවුපසය ඉල්ලිය නො හැකි ය.

කැපකරුවන් උපස්ථාන කිරීමෙහි විශේෂ ආනිශංස ද ඇත්තේ ය. ඒබව සැරියුත්සාමීන් වහන්සේට වදාළ දේශනයකින් පැහැදිලි වෙයි. මෙය වෙළෙඳුම් ආදියෙන් වස්තුසැපයීමේ දී වාසනාව මතු වන පින්කමකි. පෙර භවයන්හි සංඝයාට හෝ පුද්ගලයාට හෝ කැපකරුව උපස්ථාන කොට තිබියයුතු ය. සංඝයාට කැපකරු වීම, පුද්ගලයාට කැපකරු වීම, උපස්ථාන කිරීම හා නොකිරීම වශයෙන් සතර ආකාරයකින් දායකයනට සම්පත් සලසන නොසලසන බව මින් වදාරා ඇත.

රූපියසංවෝහාරයෙන් ද ආජීවපරිශුද්ධිශීලය අපිරිසිදු වෙයි. දුෂ්කෘතවස්තුවෙන් දුෂ්කෘතවස්තුවක් හෝ නිස්සග්ගියවස්තුවක් හෝ කැපවස්තුවක් හෝ මාරු කිරීම රූපියසංවෝහාරය යි. නිස්සග්ගිය වස්තුවෙන් නිස්සග්ගිය වස්තුවක් හෝ දුෂ්කෘතවස්තුවක් හෝ කැපවස්තුවක් හෝ මාරු කිරීම රූපියසංවෝහාරය යි. කැප වස්තුවෙන් දුෂ්කෘතවස්තුවක් හෝ නිස්සග්ගියවස්තුවක් හෝ මාරු කිරීම - පෙරළීම රූපියසංවෝහාරය යි. මුතු, මැණික්, වෛඩූර්ය, සක්, ගල්, පබළු, මැසිරිගල්, රතුකැට ඇල්ලීමෙන් පිළිගැනීමෙන් දුකුළා වෙයි. සප්තවිධ ධාන්‍ය ද එසේ ම යි. බෙර, වීණා, දවුල්, තම්මැට්ට, කඩිප්පු ආදි සියලු තූර්යභාණ්ඩ ද, කඩු, තෝමර, හීරිච්චි, තුවක්කු, දුල්, අතබඩු, කරග්ගෙඩි ආදී සත්වහිංසාව පිණිස සාදන ලද සියලු ආයුධභාණ්ඩ ද ඇල්ලීමෙන් පිළිගැනීමෙන් දුකුළා වෙයි. සියලු ස්ත්‍රීරූප හා ස්ත්‍රීආභරණ ද, ස්ත්‍රී, කුමාරිකා, දාස, දාසි, අජ, එළක, කුක්කුට, සූකර, කුක්කුර, ඇත්, අස්, ගව, මහිෂ, වතු පිටි, ගම් කුඹුරු, පල දරන ගස්, ගස්වල තිබෙන සියලු අමු ගෙඩි වර්ග යනාදී මේ සියල්ල දුෂ්කෘතවස්තු ය. රන්, රිදී, මසු, කහවණු නිස්සග්ගියගණයට වැටේ. ඛෝම කෞශේයාදී සිවුරු පිළී, පාත්‍ර, ඡත්‍ර, බත්, සහල්, ගිතෙල්, සීනි, සුකිරි, හකුරු, පැණි ආදී භික්ෂූනට කැප දේ මෙහි කැප වස්තු වශයෙන් ගැණෙයි.

ක්‍රයවික්‍රය ද ආජීවපාරිශුද්ධිශීලය කෙලෙසන්නකි. ක්‍රයවික්‍රය ඇත්තේ කැප වස්තූන් පිළිබඳ ව ය. ඒ කැප වස්තූන් වුව ද, පස් සහදම්මියන් හැර සෙස්සන් සමඟ ගනු දෙනු කළ නො හැකි ය. ගටත්පිරිසෙයින් මවු පියන් සමඟ වත් ගනු දෙනු කළ නො හැකි ය. 'මේ සිවුරු ආදිය ගෙන ඔබ සතු පාත්‍ර ආදිය මට දෙනු මැනවැ' යි

ගනු දෙනුව ක්‍රයවික්‍රය යි. රූපියසංව්‍යවහාරය ඇත්තේ දූකුලා, තිසගි සහ කැප වස්තූන් පිළිබඳ ව ය. ක්‍රයවික්‍රය කැප වස්තූන් ම පිළිබඳ ව වීම, මේ දෙකෙහි ඇති වෙනස යි. මෙසේ ලද අකැප දෙය අනුභවයෙන් භික්ෂුවගේ ආජීවපාරිශුද්ධිශීලය කෙලෙසෙයි.

(9) ආජීව විපත්තියෙහි දෝෂ කවරේ දැයි සලකා බලමු.

"පුබ්බෙ හනති අත්තානං පච්ඡා හනති සො පරෙ
සුහතං හන්ති අත්තානං විතංසෙනෙව පක්ඛිමා"

දුශ්ශීල කුහක භික්ෂුව පළමු ව තමන් (අන්ධකාරයෙන් අන්ධකාරයට විනිපාතයෙන් විනිපාතයට පමුණුවමින්) නසයි. පසු ව (තමන් ආර්යයකු බව සලකා පසය දෙන) දායකයන් (ඔවුන්ගේ අදහස නිෂ්ඵල කිරීමෙන්) නසයි. පක්ෂි මැද්ද විතංසපක්ෂියා නිසා පක්ෂීන් මරන්නාක් මෙන් කුහක වෘත්තියෙන් තමා මනා ව නසයි. මේ මුලින් සඳහන් ගාථාවෙහි අදහස යි.

(10) "තිණ්හෙන ගොවිකන්තනෙන - වරං කුච්ඡිවිදාරණං
අසඤ්ඤතෙන ලද්ධලාභෙන - නතු කුච්ඡිවිපූරණෙ"

ගෙරි මස් කපන තියුණු කැත්තෙන් බඩ පැළීම උතුම්. තමා කෙරෙහි නැති ලොවුතුරා දහම් හඟවා ලැබූ ලාභයෙන් කුස නො පුරවත්තේ ය.

(11) "යෙ පන අනෙසනාය ජීවිකං කප්පෙන්ති, තෙ ජීවිතං කප්පෙත්වා යක්ඛානං වා පෙතානං වා පතථා ධුරසොනා වා හුත්වා නිබ්බත්තිස්සන්ති, නිරයෙ වා පටිසන්ධිං ගණ්හිස්සන්ති, අනෙසනාය උප්පන්නපිණ්ඩපාතො ආදිත්තලොහගුළසදිසො හලාහලවිසූපමො. අනෙසනං හි නාම බුද්ධපච්චෙක බුද්ධඅග්ගසාවකෙහි ගරහිතං"

යම් භික්ෂු කෙනෙක් එක් වීසි අනේසනයන් දිවි පවත්වත් ද, ඔවුහු එසේ දිවි පවත්වා යක්ෂ බවට හෝ ප්‍රේත බවට හෝ පැමිණ උපදිත්. ගැල් අදින ගවයන් ව හෝ උපදිත්. අවීචි ආදී අට මහ නිරයෙහි පිළිසිඳ ගනිත්. අනේසනයෙන් උපන් පිණ්ඩපාතය ගිනි ගෙන දිලෙන ලෝගුලී සමාන ය; හලාහල විෂයට උපමා ඇත්තේ ය. අනේසනය බුදුපසේබුදුඅගසවු උතුමන් විසින් ගරහන ලද්දකි. මේ ඒ පාළියෙහි සාමාන්‍ය අදහස යි.

(12) "ජීවිතඤ්ච අධම්මෙන - ධම්මෙන මරණඤ්ච සං
මරණං ධම්මිකං සෙය්‍යො - යං චෙ ජීවෙ අධම්මිකං"

අදහමින් ජීවත් වනුවට වඩා දැහැමින් මිය යාම යෙහෙකි. අධාර්මික ජීවිතය උතුම් නො වේ.

(18) "අනගාරියො හි ඉමස්මිං සාසනෙ පබ්බජිතො දූතෙය්‍ය පහිනගමනං ගච්ඡති, වෙජ්ජකම්මං කරොති, සංඝභෙදාය චෙතියභෙදාය පරක්කමති, වෙළුදානාදීහි ජීවිතං කප්පෙති, සකලම්පි අනාචාරං අගොචරං පරිපූරෙති, අයමස්ස අනාගාරිය පටිපත්තිදුග්ගති, සො තස්සං ඨිතො කායස්ස භෙදා නිරයම්පි ගච්ඡති, තිරච්ඡානයොනිම්පි ගච්ඡති, පෙත්තිවිසයම්පි ගච්ඡති, සමණයක්ඛො නාම හොති සමණපෙතො, ආදිත්තෙහි සංඝාටිආදීහි සම්පජ්ජලිතකායො අට්ටස්සරං කරොන්තො විචරති"

මේ සර්වඥශාසනයෙහි පැවිදි වූ අනගාරික භික්ෂු තෙමේ (අභිජ්ඣා – විසමලෝභ ආදී උපක්ලේශයන් විසින්) මොනවට කෙලෙසන ලද සිත් ඇති ව (සට කී) දූතෙය්‍යපහෙනගමන් රැවි කරයි ද වෙදකම් කරයි ද චෛත්‍යභේදක් වැනි සංඝභේදය පිණිස උත්සාහ කරයිද වේළුදානාදී කුලදූෂණයෙන් ජීවිකාව කරයි ද සියලු ම අනාචාර අගෝචරයන් සම්පූර්ණ කරයි ද මේ ඔහුගේ අනගාරික ප්‍රතිපත්ති දුර්ගතිය යි. හෙතෙමේ ඒ දුර්ගති ප්‍රතිපත්තියෙහි පිහිටියේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු (පිරිවර සහිත සංජීව ආදී අට මහ) නිරයට යයි; තිරිසන් අපායට ද යයි; ප්‍රේතලෝකයට ද යයි; ශ්‍රමණ යක්ෂයෙක් හෝ වෙයි; ශ්‍රමණ මහා ප්‍රේතයෙක් හෝ වෙයි. එහි ගිනි ගෙන දිලෙන සංඝාටි ආදීයෙන් මනා කොට දැවෙන ශරීර ඇත්තේ උස් හඬින් හඬමින් හැසිරෙයි. මේ ඉතා සඳහන් පෙළෙහි තේරුම ය

මෙසේ ආජීවවිපත්තියෙහි දෝෂ දක්නා ශ්‍රද්ධාවත් කුලපුත්‍රයෝ අධර්මයෙන් උපන් ප්‍රත්‍යය නපුරු විෂයක් මෙන් සලකා දුරින් ම දුරු කරත්. පිණ්ඩපාතයෙන්, සංඝභත්ත උද්දෙසභත්ත ආදී කුඩුස් බතින්, තමන් ගුණ දැන පැහැදුනවුන් විසින් දෙන ලද බත් ආදීයෙන් දිවි පවත්වමින් ආජීවපාරිශුද්ධිශීලය මැනැවින් සම්පාදනය කරත්.

ජානාතො'වං වුත්ත'මේතං මයා යො
නිද්දෙසං ආජීවසුද්ධිප්පකාසං
මිච්ඡා'ජීවෙ භීරුකො සො ධිතීමා
සුද්ධා'ජීවො හොති අච්චන්තමෙව

පස්වැනි පරිච්ඡේදය නිමි.

# සවැනි පරිච්ඡේදය

ඊළඟට ඇත්තේ ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලය යි. එය ආජීවපාරිශුද්ධි ශීලසම්පාදනයෙන් ම රැකිය යුත්තකි.

(1) "පටිසංඛායෝනිසෝ චීවරං පටිසෙවති යාවදෙව සීතස්ස පටිඝාතායාති ආදිනා පන නයෙන වුත්තෙන පටිසංඛානපරිසුද්ධෙන චතුපච්චයපරිභොගො පච්චයසන්නිස්සිතසීලං නාම"

නුවණින් පරීක්ෂා කොට සිවුරු පලඳයි. යම් තාක් සීත පීඩා නසන පිණිස ය යි යනාදී ක්‍රමයෙන් කියන ලද ප්‍රත්‍යවේක්ෂාවෙන් පිරිසිදු වූ සිවුපසය ප්‍රයෝජන ගනියි. මේ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය නම් වේ යනු ඉහත දැක්වූ පාළියෙහි සාමාන්‍ය තේරුම ය.

මේ ශීලය රකින භික්ෂු තෙමේ ආජීවය කරුණු කොට පනවා වදාළ සික්පද සය නො ඉක්මවයි. ඉහත සඳහන් කොහොන්වතින් අපිරිසිදු නො වෙයි. විවිධාකාර තිරශ්චීන විද්‍යාවන්ගෙන් වළකියි. අනේසනාදීන්ගෙන් මිදෙයි. රූපියසංව්‍යෝහාරාදීයෙන් ද විඤ්ඤත්තියෙන් ද බැහැර වෙයි. මිථ්‍යා ආජීවයෙන් තොර ව දැහැමෙන් සෙමෙන් ලබන ලද චීවරාදී සිවු පසය ප්‍රත්‍යවේක්ෂාවෙන් ම පරිභෝග කරයි සිවුපසය සතර ආකාර ප්‍රත්‍යවේක්ෂාවෙන් ප්‍රයෝජන ගැනීමෙහි උපදනා අනවද්‍ය චේතනාව, ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය නමි වේ.

(2) සතරාකාර ප්‍රත්‍යවේක්ෂාවන් අතුරෙන් චීවර පරිභෝග ප්‍රත්‍යවේක්ෂාව සලකා බලමු. "පටිසංඛායොනිසො චීවරං පටිසෙවති,[58] යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය, ඩංසමකස වාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව හිරිකොපින පටිච්ඡාදනත්ථං" යි මෙය වදාළහ. උපන් ශීත උෂ්ණ නසන පිණිස, ඩැහැ ලේ බොන මැස්සන්ගෙන් විද ලේ බොන මදුරුවන්ගෙන් අව් සුළඟින් සර්පයන්ගෙන් ආරක්ෂා වන පිණිස, නොවැසීමෙන් ලජ්ජා ඇති වන රහස් තැන් වසන පිණිස නුවණින් සලකා සිවුරු පලඳයි. මේ එහි සාමාන්‍ය තේරුම යි. පරිභෝග කරන වාරයක් පාසා මෙසේ නුවණින් සලකා ම ඒ කළයුතු ය. අලංකාර කිරීමේ අදහසින් සිවුරු පැලඳීම කිසිසේත් නො කටයුතු ය.

(3) ඊළඟට පිණ්ඩපාත පරිභෝග ප්‍රත්‍යවේක්ෂාව යි. "පටිසංඛායොනිසො පිණ්ඩපාතං පටිසෙවති නෙව දවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, විහිංසූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච;

වේදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වේදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මේ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති." මේ එය දක්වූ හැටි යි

ගම් දරුවන් මෙන් සෙල්ලම් පිණිස නො වළඳයි. මල්ලවයන් මෙන් බලමද පුරුෂමද වඩන පිණිස නො වළඳයි. අන්තඃපුර ස්ත්‍රීන් මෙන් අඟපසඟ වඩන පිණිස නො වළඳයි. නළුවන් මෙන් සිරුර පැහැපත් කර ගනු පිණිස නො වළඳයි. ශරීරයත් ජීවිතයත් පවත්වා ගනු පිණිස ම වළඳයි. සාගිනි වේදනා නසනු පිණිස වළඳයි. සසුන් බඹසර රක්නා පිණිස වළඳයි. අධිශීල - අධිචිත්ත - අධිප්‍රඥා යන ත්‍රිශික්ෂායෙහි අනුයෝග වශයෙන් භව කාන්තාරයෙන් එතෙර වනු පිණිස වළඳයි. කාන්තාරය තරණය කරනු කැමැති අඹු සැමි දෙදෙන අනුභව කළ පුත්‍රමාංශයක් මෙන්, නදිය තරණය කරනු පිණිස නැගි පහුරක් මෙන්, සමුද්‍ර තරණය කරනු රිසින් නැගි නැවක් මෙන් සලකා රසතෘෂ්ණාවෙන් නොගිජු ව නුමුළා ව පිණ්ඩපාතය වළඳයි. මෙසේ අහර ගැනීමෙන් සාගිනි වේදනා දුරු වන බව සලකා වළඳයි. ආහාරහත්ථක, අලංසාටක, තත්‍රවට්ටක, කාකමාසක, භුත්තවමිතක බමුණන් මෙන් පමණ ඉක්මවා වැළඳීමෙන් වන වේදනා නොවනු පිණිස වළඳයි. ජීවිතය චිර කාලයක් පැවැත්විය හැකිබව සලකා වළඳයි මෙසේ අහර ගැනීම් අයුතු ලෙස අහර සෙවීමක් නොවන බැවින් නිවැරදි වැළඳීමක් වනබව සලකා වළඳයි. පමණට අහර ගැනීමෙන් සුව සේ විසිය හැකි බව සලකා වළඳයි.

මිථ්‍යා ආජීවයෙන් ප්‍රත්‍යය සෙවීමත්, පමණ නො දැන විනිපාතනය පිණිස පිළිගැනීමත්, නො පසවිකා වැළඳීමත් නුසුදුසු ය. දැහැමින් පසය සොයා, දායක - දෙය වස්තු - ප්‍රතිග්‍රාහක ප්‍රමාණයෙන් පිළිගෙන, පසවිකා ම වැළඳීම මැනැවි. සතර පස් ආලෝපයක් අඩුවෙන් වැළඳීම සතර ඉරියව් පැවැත්වීමට හිතකර ය. පමණ දැන වැළඳීම පහසු විහරණය පිණිස ම පවතින බව සැලකියයුතු.

මෙහි දක්වුණු 'නෙව දවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසනාය' යන සතර අංගයෙන් අයෝනිසෝ ප්‍රතිපත්ති සංඛ්‍යාත සියලු මිථ්‍යා ප්‍රතිපත්තීන්ගේ ප්‍රහාණය කියැවෙයි. කාම සුඛල්ලිකානුයෝගය යි කියන ලද වස්තුකාමක්ලේශ කාමයන්ගේ ප්‍රහාණය ද කියැවෙයි. 'යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, විහිංසුපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වේදනං පටිහංඛාමි, නවඤ්ච වේදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති, අනවජ්ජතා ච ඵාසුවිහාරො ච' යන මේ අට පදයෙන් භෝජනානිසංස අෂ්ටාංගය දක්වෙයි. මෙසේ ප්‍රහාතව්‍ය සතරඅංගයෙන් හා ආනිසංස අෂ්ටාංගයෙන් සමන්විත පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව මැනැවින් දතයුතු ය.

(4) සේනාසන පරිභෝග ප්‍රත්‍යවේක්ෂාව කවරේ දැයි කියමු. “පටිසංඛා යොනිසො සෙනාසනං පටිසෙවති යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව උතුපරිස්සය විනොදන පටිසල්ලානාරාමත්ථං” යි එය දක්වා ඇත. සීතල දුරු කර ගනු පිණිස සෙනසුන පරිභෝග කරයි. මැස්සන්ගෙන් මදුරුවන්ගෙන් අව්වෙන් සුළඟින් සර්පයන්ගෙන් වන පීඩා දුරු කර ගනු පිණිස පරිභෝග කරයි. සැපුරු සෘතුව නිසා වන පීඩා නැති කර ගනු පිණිස පරිභෝග කරයි. නොයෙක් අරමුණු කරා යා නොදී සිත එක් අරමුණක තබා වසනු පිණිස සෙනසුන පරිභෝග කරයි. ප්‍රයෝජන ගන්නා වාරයක් පාසා ම මෙසේ නුවණින් සලකා පරිභෝග කිරීම සේනාසන ප්‍රත්‍යවේක්ෂාව යි.

(5) ඊළඟට ඇත්තේ ගිලන්පස පරිභෝග ප්‍රත්‍යවේක්ෂාව ය. “පටිසංඛා යොනිසො ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං පටිසෙවති යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣපරමතාය” යි එය විදාළේක. උපන් රෝගයන් හා වේදනාවන් දුරු කරනු පිණිස ම භික්ෂු තෙමේ ගිලන්පස වළඳයි. නුවණින් මේ බව සලකා රෝග වේදනාවන් නසනු සඳහා වෙදුන් විසින් අනුදන්නා ලද ගිතෙල් වෙඬරු ආදී ජීවිතපරිවාර බෙහෙත් සම්භාරය ප්‍රයෝජන ගැනීම ගිලන්පස පරිභෝගප්‍රත්‍යවේක්ෂාව යි

(6) ඉහත දක්වුණු සිවුපස ප්‍රත්‍යවේක්ෂාව, වර්තමාන හා අතීත වශයෙන් දෙවැදෑරුම් වෙයි. ඒ ඒ පසය පිළිගැනීමේ දීත් පරිභෝගයේ දීත් මුලින් දක්වුණු පරිදි නුවණින් සලකා ප්‍රයෝජනයට ගැනීම වර්තමාන ප්‍රත්‍යවේක්ෂාව යි. පරිභෝගයට ගත් සිවුපසය පිළිබඳ ව ප්‍රයෝජන වශයෙන් ධාතු වශයෙන් පටික්කූල වශයෙන් නුවණින් සැලකීම අතීතප්‍රත්‍යවේක්ෂාව යි.

“මයා’පච්චවෙක්ඛිත්වා අජ්ජ යං චීවරං පරිභුත්තං තං යාවදෙව සීතස්ස පටිඝාතාය -පෙ- හිරිකොපීන පටිච්ඡාදනත්ථං. යථා පච්චයං පවත්තමානං ධාතුමත්තමෙවෙතං යදිදං චීවරං තදුපභුඤ්ජකො ච පුග්ගලො ධාතුමත්තකො, නිස්සත්තො, නිජ්ජීවො සුඤ්ඤො, සබ්බානි පන ඉමානි චීවරානි අජිගුච්ඡනීයානි ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයානි ජායන්ති” යි එය දක්වා ඇත. අද මා විසින් ප්‍රත්‍යවේක්ෂා නොකොට යම් සිවුරක් ප්‍රයෝජන ගන්නා ලද ද, එය සීත නසනු පිණිස -පෙ- ලජ්ජා කිපෙන තැන් වසනු පිණිස පරිභෝග කෙළෙමි. මා පරිභෝග කළ සිවුර ධාතුමාත්‍රයකි; ආපො, තේජො, වායො, පඨවි, වර්ණ, ගන්ධ, රස, ඕජා යන ශුද්ධාෂ්ටකමාත්‍රයකි. එය පරිභෝග කළ පුද්ගල තෙමේ ද ධාතුමාත්‍රයෙකි; ශුද්ධාෂ්ටකමාත්‍රයෙකි. එහෙයින් නිස්සත්ත ය;

නිෂ්ජීව ය; ශූන්‍ය ය. මුලින් ප්‍රණීත ද වූ මේ සියලු සිවුරු දෙතිස් කුණප මේ කයට පැමිණ අතිශයින් පිළිකුල් වෙයි. අතීත ප්‍රත්‍යවේක්‍ෂාව පිණ්ඩපාතාදීන්හි ද මේ නයින් ම දතයුතු යි. මේ අතීත ප්‍රත්‍යවේක්‍ෂාව, පෙරවරු, පස්වරු, පෙරයම්, මැදුම්යම හා පසුයම් යන පස් තැනක සැලකියයුතු වෙයි. කියන ලද දෙවැදෑරුම් ක්‍රමයෙන් ප්‍රත්‍යවේක්‍ෂා නො කොට සිවුපසය පරිභෝග කිරීමෙන් පසු දිනට අරුණු නගිනු සමග ම ඉණපරිභෝගය වනබව දතයුතු. මිථ්‍යා ආජීවයෙන් හා තෘෂ්ණාවෙන් වෙළී ප්‍රත්‍යය ප්‍රයෝජනයට ගැනීමෙන් ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලවිපත්තිය වෙයි.

(7) දැන් එහි විපත්තිදෝෂ සලකමු. යකඩින් නැගි මලය ඒ යකඩය ම කා දමයි. එසේ ම නො පස්විකා සිවුපසය වළඳන මහණ, ඒ අකුසල කර්ම විසින් ම සතර අපායාදී දුගතියට ඇද දමනු ලබයි.

“අයසාව මලං සමුට්ඨිතං – තදුට්ඨාය තමෙව ඛාදති
එවං අතිධෝනචාරිනං – සකකම්මානි නයන්ති දුග්ගතිං” යි
එසෙයින් වදාළහ.

උපාය දන්නෝ දිගුකලක් ගින්නෙන් පල ගනිත් ඉන් දුකට නො පැමිණෙත් උපාය නුවණ නැත්තෝ ගින්නෙන් වැඩ ගැනීමට නො දනිත්. දුකට ද පැමිණෙත්. චීවරාදි සිවුපසය ගිනි මෙන් තැකියයුතු ය. නුවණින් ගින්නෙන් වැඩ ගන්නාක් මෙන් නුවණින් පස්විකා ම සිවුපසය වැළඳියයුතු යි.

රසතෘෂ්ණාවෙන් බැඳී නො පස්විකා සිවුපසය නො වැළඳියයුතු යි. මෝහයෙන් මුළා ව අනුන් දෙන අහර (සිවුපසය) වළඳන්නා මිපු මිමලයක් කන්නාකු වැනි ය.

පසය සෙවීමෙහි පිළිගැනීමෙහි වැළඳීමෙහි පමණ දතයුතු ය. පමණ දැනුමෙහි අනුසස් සැලකියයුතු ය. දුරු කටයුතු නොසරුප් නොමවනා දෙය දතයුතු ය. සිවුපසය ගිනි සෙයින් සලකා නුවණින් යුතු ව සේවනය කරන්නේ ය.

“අග්ගිතං කරණීයාති – කරොන්තා සුචිරම්පිච
අග්ගිදෙසං න පප්පොන්ති – උපායො’පගතා නරා

අනුපායෙනුපගතා – අග්ගිදෙසෙන අට්ටිතා
සන්තප්පන්ති අසාධෙන්තා – දුක්ඛං පප්පොන්ති දාරුණං

අග්ගීව පච්චයා ඤෙය්‍යා – අඤ්ඤුපායොපගමෙ විය
ස්නෙහපුබ්බඞ්ගමං බාය – ආහාරාදී නිසෙවනං

ගච්ඡතො මුච්ජිතො සන්තො – භුඤ්ජන්තො පරභොජනං
සුවාචන්තංච භුඤ්ජන්තො – සමණෙහි ජිගුච්ඡිතො

මත්තං මත්තානිසංසඤ්ච – පහාතබ්බඤ්ච තං තතො
බහුසො පච්චවෙක්ඛිත්වා – භජෙ අග්ගිව පච්චයෙ" යි

එහෙයින් කීහ.

(8) සිවුපසයෙන් ලැබෙන වර්ණ (රූප), ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය යන පංචකාමතෘෂ්ණාවෙන් වෙළී, ඉන් මුලා ව, නොපත්විනා වැලඳීමෙහි දෙස් නොදත් මහණබමුණෝ විනාශයට යත්. මරු වසගයට යත්. එහෙයින් "යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙ පඤ්චකාමගුණෙ ගථිතා" යනාදිය වදළහ.

(9) පැවිද්ද විසින් ශ්‍රද්ධාදෙය චීවරාදි ප්‍රත්‍යය කාන්තාරයට වත් මවු - පියන්ට පුත්‍ර මාංශභෝජනයක් මෙන් සැලකියයුතු යි. රියසක් සිදුරෙහි තෙල් දැමීමක් මෙන් සැලකියයුතු යි; වණයට ඔසුවක් මෙන් සැලකියයුතු යි. පැවිද්ද එසේ සලකා ම සිවුපසය පරිභෝග කරන්නේ ය.

කන්තාරෙ පුත්තමංසංව – අක්ඛස්සබ්භඤ්ජනං විය
භෙසජ්ජංව වණාලෙපං – පච්චයෙ පටිසෙවයෙ" යි

එහෙයින් වදළහ.

බුජ්ඣන්ති භාවෙන්ති ච යො ඉතිමං වුත්තමිදං ජටාමණිද්දසං
පච්චය සන්නිස්සිතසීලකම්මං හොති සසඤ්ඤං ගුරුබුද්ධි ලසං .

සවැනි පරිච්ඡේදය නිමි.

# සත්වැනි පරිච්ඡේදය

---

සතර සංවරශීලය පිළිබඳ විස්තර යට සඳහන් විණ. මේ ද ඊට ම ඇතුළත් ය.

(1) සිවුපස පරිභෝගය, පිළිවෙළ අනුව සතර කොටසකට බෙදා දක්විය හැකි ය. ථෙය්‍යපරිභෝගය, ඉණපරිභෝගය, දායජ්ජපරිභෝගය හා සාමිපරිභෝගය එසේයෙනි. බුදුරජාණන් වහන්සේ දුශ්ශීලයාට සිවුපසය නො අනුදත්හ. ඔහුට දායකයෝ ද සිවුපසය නො දෙත්. සඟ මැද දුසිල් ව සිටිමින් සංඝයාට ලැබෙන සිවුපසය වැළඳීම සොරා කෑමකි. එය ථෙය්‍යපරිභෝගය යි. සිල්වත් වුව ද නො පස්විකා ප්‍රයෝජනයට ගත්තේ නම්, ඒ ඉණපරිභෝගයට වැටේ. සප්තවිධ ශෛක්ෂයන්ගේ සිවුපස පරිභෝගය දායජ්ජපරිභෝගය යි. ඔවුහු බුදුරජාණන් වහන්සේගේ පුත්‍රයෝ ය. පියාණන් සතු වස්තුව දරුවනට අයත් ය. එහෙයින් බුදුපියාණන් සතු පසය ශෛක්ෂ දරුවෝ දායජ්ජපරිභෝගයෙන් පරිභෝග කරති. රහතුන්ගේ පරිභෝගය සාමිපරිභෝගය යි. උන් වහන්සේ තෘෂ්ණාදාසත්වය ඉක්මවා සිටිනා. එහෙයින් ප්‍රත්‍යයට සාමිහු ය. සිල්වත් භික්ෂුව පස්විකා කරන සිවුපස පරිභෝගය දායජ්ජපරිභෝගයට ඇතුළත් ය. ඊට ම 'ආණණ්‍යපරිභෝගය' යි ද කියනු ලැබේ. මේ සතර පරිභෝගයන් අතුරෙන් ඉණපරිභෝගය නො මැනවි. ථෙය්‍ය-පරිභෝගය ගැන කියනු ම කිම? එහෙයින් "චත්තාරො හි පරිභොගා" යනාදිය වදාළහ.

(2) ලජ්ජිපරිභෝගය - අලජ්ජිපරිභෝගය - ධම්මියපරිභෝගය - අධම්මියපරිභෝගය යි අනෙක් පරිභෝග සතරකි. ලජ්ජි භික්ෂුව ලජ්ජි භික්ෂුව සමග ඇත්තේ ලජ්ජිපරිභෝගය යි. ලජ්ජි භික්ෂුව අලජ්ජි භික්ෂුව සමග ද, අලජ්ජි භික්ෂුව ලජ්ජි භික්ෂුව සමග ද, අලජ්ජි භික්ෂුව අලජ්ජි භික්ෂුව සමග ද ඇත්තේ අලජ්ජිපරිභෝගය යි. ලජ්ජීන් සමග කරන පරිභෝගය අලජ්ජියාට සුදුසු ය. අලජ්ජීන් සමග කරන පරිභෝගය දැන ගන්නා තාක් ලජ්ජියාට සුදුසු ය. ලජ්ජි භික්ෂුව සන්තක දැහැමි සිවුපසය වැළඳීම ධම්මියපරිභෝගය යි. ලජ්ජීන සන්තක අදැහැමි සිවුපසයත්, අලජ්ජීන සන්තක දැහැමි සිවුපසයත්, අලජ්ජීනසන්තක අදැහැමි සිවුපසයත් වැළඳීම අධම්මියපරිභෝගය යි. මින් ධම්මියපරිභෝගය ම වටී. එහෙයින් "අපරෙපි චත්තාරො පරිභොගා" යනාදිය වදාළහ.

(3) ලජ්ජිපරිග්‍රහය, අලජ්ජිපරිග්‍රහය යනුවෙන් පරිග්‍රහ දෙකකි. ධම්මපරිභෝගය හා ආමිසපරිභෝගය යනුවෙන් අනෙක් පරිභෝග දෙකකි. අලජ්ජී භික්ෂුව ලජ්ජී භික්ෂු නමක් ලවා සිවු පිරිකර බණ කියවයි; අනුමෝදනාවකි බණ දෙසවයි; කුලයන්ට හඳුන්වා දෙයි මෙසේ සංග්‍රහ කිරීම - බල දීම ලජ්ජිපරිග්‍රහය යි. එය සුදුසු ය. අලජ්ජී භික්ෂුව අලජ්ජියකු ලවා ප්‍රේමයෙන් එසේ කරවීම අලජ්ජිපරිග්‍රහය යි. ඒ නො මැනැවි; ආපත්තිකර ය. මෙසේ අලජ්ජී සංග්‍රහ කරන ලජ්ජී භික්ෂුව සර්වඥශාසනය උපුබස්වන්නෙක් වෙයි; අතුරුදහන් කරන්නෙක් වෙයි.

“තස්මා එසෝ අලජ්ජිපි - දුස්සීලෝ අසමාහිතෝ
අලජ්ජී සතසහස්සම්පි - කරෝතිති පකාසිතං” යි කියන ලදී. එසේ බල ලත් කාය වාක් සංවර රහිත දුශ්ශීල අලජ්ජී තෙමේ තමන් වැනි අලජ්ජීන් ලක්ෂයකුදු ඇති කරයි.

පොහෝපවුරුණු ඈ විනය කර්ම කිරීම, නිස ගැනීම, බණ ඉගෙනීම යනාදි සියල්ල ධම්මපරිභෝගය යි. යම් ලජ්ජී භික්ෂු නමක් සමඟ ආමිසපරිභෝගය සුදුසු නම්, ධම්මපරිභෝගයක් එහි සුදුසු ය. අලජ්ජීන්ගෙන් ධර්මය හදරන භික්ෂූහු අලජ්ජීහු ම වෙත්. සිවුපසය පිළිබඳ දේ ප්‍රයෝජන ගැනීම ආමිසපරිභෝග නම් වෙයි. එහෙයින් “අපරෙපි ද්වෙ පග්ගහාවෙව පරිභොගා ච” යි වදාළ සේක.

(4) චතුර්විධ භික්ෂුශීලය විරතීන්ගේ වශයෙන් ද දතයුතු ය. සිකපද ඉක්මීමෙන් වැළැක්ම, ඉන්ද්‍රිය අසංවරයෙන් වැළැක්ම, මිථ්‍යා ආජීවයෙන් වැළැක්ම හා නො පස්විසා වැළඳීමෙන් වැළැක්ම යන විරතීන් විසින් සිවුවැදෑරුම් වෙයි.

“සික්ඛාපදාතික්කමතො - ඉන්ද්‍රියානං අගුත්තිතො
මිච්ඡාජීවා’පභොගා ච - විරතීති චතුබ්බිධා” යි
එහෙයින් කීහ.

(5) මේ සතර සංවරශීලය, ශ්‍රද්ධා ස්මෘති වීර්ය - ප්‍රඥා යන සතර චෛතසික ධර්මයන් ප්‍රධාන ව ඉසිලියයුතු වෙයි. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙහි ඇතුළත් ශික්ෂාකොට්ඨාශය ශ්‍රද්ධාවත් පුද්ගලයා විසින් ශ්‍රද්ධාව ම ප්‍රධාන කොට ගෙන ඉසිලියයුතු යි. සතර ඉරියවුවෙහි එළඹ සිටි සිහි ඇත්තාහු විසින් ස්මෘති ධුරයෙන් ඉන්ද්‍රියසංවර ශීලය ඉසිලියයුතු යි. එක් විසි අනේසන, අන්‍ය කුලදූෂණාදියෙහි නො ඇලී වීර්යයෙන් දැහැමින් පසය සොයන්නාහු විසින් ආජීවපාරිශුද්ධිශීලය ඉසිලියයුතු යි. යට කියන ලද ක්‍රමයෙන් නුවණින් ප්‍රත්‍යය ප්‍රයෝජන සලකන්නාහු විසින් ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලය ඉසිලියයුතු යි.

"සද්ධා සති ච විරියං – පඤ්ඤා ච අනුපුබ්බතො
චතුබ්බිධමුපරෙතෙව – තං සීලං පරිරක්ඛියං" යි
එහෙයින් කීහ.

(6) භික්ෂුශීලය පිළිබඳ ප්‍රභේද වශයෙන් ශුද්ධි සතරක් වෙයි. දේශනාශුද්ධිය, අධිෂ්ඨානශුද්ධිය, පාරියෙට්ඨිශුද්ධිය, පච්චවෙක්ඛණ ශුද්ධිය වශයෙනි. පරිවාස මානත්ත අබ්භාන යන ත්‍රිවිධ විනය කර්මයෙන් උට්ඨානගාමී වශයෙන් ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය පිරිසිදු වෙයි. සිදු වූ වරද ඔවුනොවුන් ඉදිරියෙහි කියා ලජ්ජා භය උපදවා ගෙන මතු සංවරයෙහි පිහිටීමෙන් දේශනාගාමී වශයෙන් පිරිසිදු වෙයි. මේ ද්විවිධ දේශනාවෙන් පිරිසිදු වන නිසා දේශනාශුද්ධිය යි කියනු ලැබේ.

"දෙසනා සංවරෙට්ඨිති – පච්චවෙක්ඛණ භෙදතො
සුද්ධි චතුබ්බිධා පාති – මොක්ඛසංවර සම්මතං
දෙසනාය විසුද්ධත්තා – දෙසනාසුද්ධි වුච්චති" යි
එහෙයින් කීහ.

ඉන්ද්‍රියසංවරශීලය, 'න පුනෙවං කරිස්සාමි' (නැවත එසේ නො කරමි) යි දැඩි ව ඉටා මතු සංවර වීමෙන් පිරිසිදු වන නිසා අධිෂ්ඨාන ශුද්ධිය නමි.

"න පුනෙවං කරිස්සන්ති – චිත්තාධිට්ඨානා සංවරා
වුත්තත්තා සංවරසුද්ධිති – සුජ්ඣතින්ද්‍රිය සංවරො" යි
එහෙයින් කීහ.

ආජීවපාරිශුද්ධිශීලය, අනේෂණයෙන් ප්‍රත්‍යය නො සොයා වීර්යයෙන් දැහැමින් ප්‍රත්‍යය සොයන්නාට පිරිසිදු වෙයි. එහෙයින් ඊට පාරියෙට්ඨි ශුද්ධිය යි කියනු ලැබේ.

"පහායානෙසනං ධම්මං – උප්පාදෙන්තස්ස එට්ඨියා
සුද්ධත්තා එට්ඨිසුද්ධීති – වුත්තමාජීවනිස්සිතං" යි
එහෙයින් කීහ.

ප්‍රයෝජන නුවණින් සලකමින් ප්‍රත්‍යයපරිභෝගයෙන් ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලය පිරිසිදු වෙයි. ඒ නිසා ඊට පච්චවෙක්ඛණ ශුද්ධිය යි කියනු ලැබේ

"යොනිසො පටිසංඛාය – චීවරං පටිසෙවති
එවමාදි යථා වුත්තං – පච්චවෙක්ඛණ සුජ්ඣනා
පච්චවෙක්ඛණ සුද්ධීති – වුත්තං පච්චයනිස්සිතං" යි
එහෙයින් කීහ.

(7) ඊළඟට සැකෙවින් ශීලානිශංස සලකමු. චතුර්විධ ශුද්ධියෙන් විශුද්ධ කොට රක්නා චතුර්විධ භික්ෂුශීලරත්නය සිතූ පැතූ සියලු සැප සම්පත් සිද්ධ කර දෙයි. ඒ ශීලාලංකාරයෙන් සැරසුණු යෝගාවචර තෙමේ, ජාතියෙන් චණ්ඩාල වුව ද, ජාතිසම්පන්න රජුන්ගෙන් හා රජුන්ගෙන් දෙව් බඹුන්ගෙන් සත්කාර ගරුකාර ලබයි මානන පූජනාදිය ලබයි. සිල්වතුන්ගේ කලණ කිත්ඝෝෂ සතුරු කෙලවර කොට ඇති සියලු පොළෝ මඩුල්ලෙහි පැතිර සිටියි. බඹලෝ දක්වා නගියි. සුපිරිසිදු ව රක්නා තම ශීලය මෙනෙහි කරන භික්ෂුව ලබන නිරවද්‍ය, නිරාමිෂ සුවය මිනිලොව රජුනට ද නැත්තේ ම ය. නාග - අසුර - දේව - බ්‍රහ්මයනට ද නැත්තේ ම ය ඊරක් රක්නා පොහොය අට සිල් එකෙණෙහි දිව් සැප පිණිස පවතින බව සියල්ල දත් බුදු රජාණන් වහන්සේ වදාළහ ඒ එසේ නම්, සියල්ලට ජ්‍යෙෂ්ඨ ශ්‍රේෂ්ඨ භික්ෂුශීලානිශංස උන්වහන්සේ හැර අන් කවරෙක් වනා ද? එක දිනකුදු කඩ නො කොට රකින භික්ෂුශීලය, චරිමක චිත්තය යි කියන ලද අර්හත් ඵල චිත්තය උපදවනබව උන්වහන්සේ වදාළ සේක. චිත්තවිශුද්ධි ආදියට මූලික වන්නේ ශීලය බැවිනි.

(8) ශීලයෙහි මෙබඳු මහත් අනුසස් ඇතිබව දත්නා සසර බිය දුටු භික්ෂු තෙමේ, එක් ඇසක් ඇත්තකු එය රක්නාක් මෙන් මැනැවින් ශීලය රකින්නේ ය.

"එවං මහානිසංසත්ති - විදිත්වා සීලසම්පදං
නයනං එකනෙත්තොව - රක්ඛෙ සීල චතුබ්බිධං." යි
එහෙයින් කීහ.

උද්ඝටිතඥාදී විඥයෝ චතුර්විධ භික්ෂුශීලය මැනැවින් රැක ඒ අනුභාවයෙන් පංචමාරයන්[59] පරාජය කළහ; නිවන්පුරයට පැමිණුණාහ. ශීලානිශංස මෙසේ මැනැවින් දත්නා පණ්ඩිත භික්ෂු තෙමේ ජීවිතය නිසා වත් සිකපද නො කඩයි අකුශීත ව ශමථ විදර්ශනාවන්හි යෙදෙයි. එසේ වීර්ය කොට කෙලශ පරිනිර්වාණය කරයි.

"පාතිමොක්ඛසංවරො ඉන්ද්‍රියානුරක්ඛණං
පච්චයාන්වවෙක්ඛණං ජීවසුද්ධි එව ච,
තං චතුබ්බිධං බුධා සීලසුද්ධිමිද්ධියං
පූරයිත්ව පණ්ඩිතා මාරමද්දනං කතං

ඉති සීලගුණං විචින්තයන්තො
කුසලො ජීවිතහෙතුතොපි සීලං
අවිඛණ්ඩිය සාධු සොධයන්තො
අභිනිබ්බාති අනාකුලිතො සමෙනනං" යි
එහෙයින් වදාළහ.

(9) ශ්‍රද්ධාවත් කුලපුත්‍රයා ශීලයත්, ශීලවිපත්තියත්, විපත්ති දෝෂත්, ශීලානිශංසත් නුවණින් දැක මනා කොට ශීලයෙහි පිහිටයි. "සමාදින්නසීලෙන යොගිනා ධුතඞ්ගසමාදානං කාතබ්බං" යි දැක්වූයෙන් ශීලයාගේ වෝදානය (පිරිසිදු බව) පිණිස කිසි යම් ධුතාංගයක් සමාදන් වීම මැනැවි.

"පඤ්ච සෙනාසනෙ වුත්තා - පඤ්ච ආහාරනිස්සිතා
එකො වීරියසංයුත්තො - ද්වෙ ච චීවරනිස්සිතා" යි

ධුතාංග තෙළෙසක් දක්වා ඇත. ඉන් ආරඤ්ඤික, රුක්ඛමූලික, අබ්භොකාසික, සොසානික, යථාසන්ථතික යන ධුතාංග පස සේනාසනය පිළිබඳ ව ය. ඒ සෙනසුන්හි අපිස් සතොස් බැව් පිණිස යි. පිණ්ඩපාතය පිළිබඳ ව ධුතාංග පසකි. පිණ්ඩපාතික, සපදානචාරික, ඒකාසනික, පත්තපිණ්ඩික - ඛලුපච්ඡාභත්තික යනු ඒ පස යි. මින් පිණ්ඩපාතය පිළිබඳ අපිස් සතොස් ගුණ වැඩේ. වීර්යය පිළිබඳ ව එක් ධුතාංගයකි. ඒ නෙසජ්ජිකාඞ්ගය යි. සිවුරෙහි අපිස් සතොස් බැව් පිණිස තෙචීවරික හා පංසුකූලික යන ධුතාංග දෙක වදාළහ. ගිලන්පසය පිණ්ඩපාතයෙහි ම ඇතුළකි. එ හෙයින් ඒ පිළිබඳ වෙන ම ධුතාංගයක් නොමැති යි. (විස්තර විශුද්ධි මාර්ගයෙන් බලන්න.)

(10) "බහුම්පි චෙ සහිතං භාසමානො
න තක්කරො හොති නරො පමත්තො
ගොපොව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති"

යමකු තුන්පිටකය ඉගෙන බොහෝ කොට අනුනට බණ කියතත්, තමා එය නො පිළිපදී නම්, කුලියට අනුන්ගේ ගවයන් රක්නා ගොපල්ලකු මෙනි. ගොපල්ලා පස් ගෝරසයට අහිමි වෙයි. එලෙසින් පමා වන මහණ ද මහණදමේ ඵලයට හිමිකරුවෙක් නො වේ.

භික්ෂුව සිල්වත් වුව ද නිසි කමටහනක සිත නො බඳී නම්, ප්‍රමාදයෙහි ම වැටෙයි කුලියට ගෙරින් රක්නා ගොපල්ලාට හිමි වන්නේ දිනබැලය පමණ යි. ගව රසය නො ලැබෙයි. සිල්වත් භික්ෂුව පමා නම් ලබන්නේ, අතවැසි දායකාදීන්ගේ වත පිළිවෙත හා චීවරාදී ප්‍රත්‍යයන් පමණ යි. මහණකමේ ඵල වන ලොවුතුරා දහම් නො ලබයි. එහෙයින් ශීලයෙන් පමණක් සෑහීමට පත් නො වී, ධුතගුණයන්හි ද පිහිටා, ශමථ - විදර්ශනාවන්ගෙන් සිත පිරිසිදු කිරීමට උත්සුක වීම මැනැවි.

(11) "දානෙ සීලෙ ච යෙ වුත්තා - ආනිසංසා අනෙකකා
තෙ මඤ්ඤභාවනායාපි - සංසිජ්ඣන්ති අසංසයං

භාවනාබල යොගෙන - බුද්ධත්තංමෙවාපි සාධියෙ
තදඤ්ඤං කිං හි සම්පත්ති - භාවනාය අසාධියං"

දානයෙන් ශීලයෙන් ලැබෙන ආනිශංස සියල්ල භාවනාවෙන් ද ලැබියහැකි ය. බුද්ධත්වය පවා භාවනා බලයෙන් සිදු කළයුතු වෙයි. එසේ නම් අන් කවර සැපතක් භාවනාවෙන් සිදු කළ නො හැකි ද?

මේ අනුව සකල සම්පත්තිය ම භාවනාවෙන් ලැබිය හැකිබව පෙනේ. සමථ විදර්ශනා වශයෙන් භාවනා ක්‍රම දෙකකි. එයින් සමථ භාවනාවෙහි සම සතළිස් කර්මස්ථානයක් දක්නා ලැබේ.

| | |
|---|---|
| පඨවි ආදී කසිණ | 10 |
| උද්ධුමාතක ආදී අශුභ | 10 |
| බුද්ධානුස්සති ආදී අනුස්මෘති | 10 |
| කරුණා ආදී බ්‍රහ්ම විහරණ | 4 |
| ධාතු මනසිකාර | 1 |
| ආහාර ප්‍රතික්කූල සංඥ | 1 |
| ආකාසානඤ්චායතන ආදී අරූප භාවනා | 4 |
| | 40 |

මේ ඒ සතළිස් කර්මස්ථානයෝ යි. පරිකර්ම, උපචාර - අර්පණා යනුවෙන් භාවනා තුනකි. පරිකර්ම, උග්ගහ, පටිභාග යනුවෙන් නිමිති තුනකි. මෙයින් පරිකර්මභාවනාව යට කී සම සතළිස් කර්මස්ථානයෙහි ම ලැබේ. උපචාරභාවනාව බුද්ධානුස්සති ආදී අටෙහි ද, සංඥ - ව්‍යවස්ථාන දෙකෙහි ද ලැබේ. සෙසු කර්මස්ථානයන්හි අර්පණාභාවනාව ලැබේ.

(12) i ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක යන පස්මහබය අතීතයෙහි විය; අනාගතයෙහි ද වෙයි; දැනුදු ඇත්තේය. සොර, සතුරු, රජ, දිය, ගිනි යන පස්මහබියක් ද වේ. දණ්ඩ, (එක්සිය සතිසක්; අපාය,[60] රෝග, ආත්මෝපවාද, පරූපවාද යන පස්මහ බයක් ද වෙයි මෙසේ කියන ලද පස්විසිමහබයින් තැතිගෙන, සතර සංවරශීලය ශුද්ධ කොට, ආවාසාදී දසවිධ පලිබෝධයන් සිඳ, ප්‍රිය ගරුභාවනීයාදී ගුණයෙන් සමන්විත කල්‍යාණ මිත්‍රයකු සම්පයට එළඹ, තම චරිතානුකූල ව යට කී සම කර්මස්ථානයක් ගතයුතු. මහා ආවාසාදී අටළොස් වැදෑරුම් අනනුරූප විහාරයන් හැර, නාතිදූර නාච්චාසන්නාදී පංචාංග සමන්නාගත අනුරූප විහාරයෙහි වසමින් කේශ - නඛ - භරණාදී ක්‍ෂුද්‍ර පලිබෝධයන් ද දුරු කටයුතු. කසිණ භාවනාවේ දී එක් වියත් සතරඟුල් පුළුල ඇති ව සාදන ලද වට වූ

කසුණුමඬුල්ල අභිමුඛ කොට, දෙ රියන් වියත් අත්පස පමණෙහි පනවන ලද වියත් සතරඟුල් පමණ උසැති අස්නෙහි සැප සේ හිඳ, ‘අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භිය්‍යො’ යනාදීන් කාමයෙහි දෝෂ ප්‍රත්‍යවේක්ෂා කොට, සියලු දුක් දුරලීමට කාරණ වූ නෛෂ්ක්‍රම්‍යයෙහි බලවත් අභිලාෂය ඇති ව, බුද්ධ – ධර්ම – සංඝ ගුණානුස්මරණයෙන් ප්‍රීතිප්‍රමෝද්‍යය උපදවා, ප්‍රතිපත්තිය පිළිබඳ ව හටගත් ගෞරව ඇති ව සිත් පිහිටුවා, ‘ඒකාන්තයෙන් මේ ප්‍රතිපත්තියෙන් නිවන් සැපයට අයිතිකාරයෙක් වන්නෙමි’ යි උත්සාහ උපදවියයුතු. යම් අයුරින් ඇස දල්වා කසුණෙහි වර්ණය ප්‍රත්‍යවේක්ෂා නො කොට ලක්ෂණ මනසිකාරය කරමින් වර්ණය නො හැර ම උත්සාහයෙන් ප්‍රඥප්ති ධර්මයෙහි සිත් පිහිටුවියයුතු. එසේ සිතින් ‘පඨවි පඨවි’ යනාදී ඒ ඒ භාවනානුක්‍රමයෙන් පඨවි කසිණාදී ඒ ඒ අරමුණෙහි නිමිත්ත ගන්නාට ඒ අරමුණ පරිකර්ම නිමිත්ත යයි කියනුලැබේ. ඒ භාවනාව පරිකර්මභාවනා නම් වේ.

ii යම් කලෙක ඒ පරිකර්ම නිමිත්ත සිතින් මනා කොට ගන්නා ලද්දේ, ඇසින් බලන්නාක් මෙන් සිතට අරමුණු වේද, ඇස පියා හෝ අන් තැනකට ගොස් හෝ මෙනෙහි කරන කල්හි කසිණ මණ්ඩලයට සමාන ව ම මනෝද්වාරික ජවනයන්ට අරමුණු වේද මේ උග්ගහ නිමිත්ත නමි. ඒ භාවනාව උපචාර භාවනා නම් වේ.

iii මෙසේ සමාහිත යෝගාවචර තෙමේ ඉන් මත්තෙහි ඒ උග්ගහ නිමිත්ත විෂය කොට පරිකර්මසමාධියෙන් භාවනා කරයි. උග්ගහ නිමිත්තට සමාන ව, ඊට වඩා පිරිසිදු ව, මණ්ඩලගත කසිණ දෝෂයෙන් පහ ව, භාවනාවෙන් නිපන් අරමුණ යම් කලෙක සිතෙහි මනා ව පිහිටයි ද ඒ පටිභාගනිමිත්ත නමි. ඒ උපචාර භාවනා නමිද වේ. සිත කාමච්ඡන්දාදී නීවරණයන්ගෙන් විශේෂයෙන් පහ වෙයි. ඒ කාමාවචර සමාධියෙන් මත්තෙහි ඒ පටිභාග නිමිත්ත උපචාර සමාධියෙන් නැවත නැවත ආසේවනය කිරීමේ දී විතර්කාදී පංචාංගයෙන් සමන්විත ප්‍රථමධ්‍යානචිත්තය උපදී. මේ අර්පණා භාවනාව යි. ඉන් මතුයෙහි එම ප්‍රථමධ්‍යානචිත්තය ආවජ්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, උට්ඨාන, පච්චවෙක්ඛණ යන මේ පංච වසිතායෙන් වසග කළයුතු. විතර්කාදී ඖදාරික අංගයන් පහ කරමින් විචාරාදී සුඛුමාංගයන් උපදවනු පිණිස මතු මත්තෙහි භාවනා කිරීමේ දී පිළිවෙළින් ද්විතීය ධ්‍යානාදියද සුදුසු පරිද්දෙන් උපදනේ වෙයි.

(13) විදර්ශනාභාවනාවෙහි සීල, චිත්ත, දිට්ඨි, කංඛාවිතරණ, මග්ගාමග්ගඤාණදස්සන, පටිපදාඤාණදස්සන, ඤාණදස්සන, නමින් විශුද්ධි සතෙක්ද, අනිත්‍ය, දුඃඛ, අනාත්ම යනුවෙන් ත්‍රිලක්ෂණයෙක්ද අනිච්ච, දුක්ඛ, අනත්ත නමින් ත්‍රිවිධ අනුපස්සනායෙක් ද සම්මසන

උදයබ්බය, භංග, භය, ආදීනව, නිබ්බිද, මුඤ්චිතුකම්‍යතා, පටිසංඛා, සංඛාරුපෙක්ඛා, අනුලෝම යනුවෙන් විදර්ශනා ඥාන දශයෙක්ද, ශූන්‍යතා, අනිමිත්ත අප්පණිහිත යැයි ත්‍රිවිධ විමෝක්ෂයෙක්ද, ශූන්‍යතානුපස්සනා, අනිමිත්තානුපස්සනා, අප්පණිහිතානුපස්සනා නම්වූ විමෝක්ෂමුඛ ත්‍රයෙක්ද වෙති.

(14) ඉහත දක්වන ලද චතුර්විධ භික්ෂුශීලය මෙහි ශීල විශුද්ධිනම්. උපචාර හා අර්පණා සමාධි චිත්තවිශුද්ධි නම් ද, ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන වශයෙන් නාමරූපපරිග්‍රහය දිට්ඨිවිශුද්ධි නම් ද, ඒ නාමරූපයන්ගේ ප්‍රත්‍යය මේ මේ යයි නුවණින් අල්ලා ගැනීම කංඛාවිතරණවිශුද්ධි නම් ද,

“ඔභාසො පීති පස්සද්ධි - අධිමොක්ඛො ච පග්ගහො
සුඛං ඤාණමුපට්ඨානං - උපෙක්ඛා ච නිකන්ති ච” යි

දක්වෙන දශ විදර්ශනා උපක්ලේශයන් මාර්ගයට සතුරු බව නුවණින් අල්ලා ගෙන නියම මාර්ගස්වභාවය නිශ්චය කර ගැනීම මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිනම් ද, උදයබ්බයඤාණයෙහි සිට අනුලෝම ඤාණය දක්වා ඇති නව මහා විදර්ශනා ඥාන පටිපදාඤාණදස්සන විසුද්ධි නම් ද, චතුරාර්ය සත්‍යයන් අවබෝධ කරවන චතුර්විධ මාර්ග චිත්තය ඤාණදස්සන විසුද්ධි නම් ද වන්නාහ.

කියන ලද පරිදි භාවනා වඩන යෝගාවචරයාගේ විදර්ශනාව මුහුකුරා ඇත. අර්පණා සංඛ්‍යාත ලෝකෝත්තර මාර්ගය උපදී යැයි කියයුතු කල්හි භවාංගචිත්තපරම්පරාව වලන උපච්ඡේද වශයෙන් සිඳ ගෙන මනෝද්වාරාවර්ජන චිත්තය උපදියි. අනතුරු ව දෙතුන් විදර්ශනාචිත්තයක් සංඛාරුපෙක්ඛා ඤාණයෙන් ගන්නා ලද කිසියම් අනිත්‍යාදි ලක්ෂණයක් අරමුණුකොට පරිකර්ම - උපචාර - අනුලෝම නාමයෙන් පවත්නේ ය. ඒ අනුලෝමචිත්තයන් තුන්වැනි ව හෝ සතරවැනි ව හෝ මාර්ගචිත්තයට අනන්තරාදි ප්‍රත්‍යය වූ ගෝත්‍රභූ චිත්තය උපදියි. ඒ ගෝත්‍රභූ සිත පවත්නේ නිවන අරමුණු කරගෙන ය. අනතුරු ව මාර්ගචිත්තය සතරවැනි හෝ පස්වැනි ජවන ස්ථානයට බසියි. ඒ සමග ම යෝගාවචරයා අසම්මෝහයෙන් දුඃඛ සත්‍යය දකිමින්, සමුදය සත්‍යය දුරු කරමින්, නිරෝධ සත්‍යය ආලම්බන කරණයෙන් ප්‍රත්‍යක්ෂ කරමින්, සම්ප්‍රයුක්ත මාර්ගසත්‍යය තමා හා සහජාත ධර්මයන්ට සහජාතාදි ප්‍රත්‍යය වැඩීම වශයෙන් එක ම ජවනයාගේ ඒකක්ෂණයෙහි සතර කෘත්‍යය සිද්ධ කරමින් උපදියි. ඒ මාර්ග චිත්තයෙන් මත්තෙහි තදනුරූප වශයෙන් ඵල සිත් දෙකක් හෝ තුනක් හෝ ඉපද නිරුද්ධ වෙයි. පහ කළ ගිනි ඇති තැන උණුසුම නිවිනු පිණිස දිය ඉසීමක් මෙනි. ඉන් මතු සිත භවාංගයට වැටේ.

(15) දූත් දශවිදර්ශනාඥාන සලකා බලනු.

ඉපිද නැති වීම් අර්ථයෙන් අනිත්‍ය ය. උදයව්‍යය පීඩනයෙන් හෙවත් ඉපිද නැති වීම් බමට පත්වීමෙන් දුක ය. තමා කැමැති ලෙස නොපවත්නා හෙයින් අනාත්ම ය. මෙසේ ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් ත්‍රිලක්ෂණයට නගා දක්නා නුවණ සම්මසන ඥාණය යි. මින් මෙහෙරෙනුයේ ස්කන්ධයන්ගේ කලාප සම්මර්ශනය යි දතයුතු. ස්කන්ධයන් සම පතස් ආකාරයෙන් ඉපදීම හා නැසීම දක්නා නුවණ උදයබ්බය ඥාණය වශයෙන් ද සංස්කාරයන් හා උදයව්‍යය දක්නා නුවණ ද බිඳෙනා සුලු බව තේරුම් ගන්නා නුවණ භංග ඥාණය වශයෙන් ද, සියලු සංස්කාරයන්ගේ භංගය ම දකින යෝගාවචරයාට භවත්‍රය ම ගිනි ගෙන දිලෙන අඟුරු වලක් මෙන් වැටහීමෙන් බියක් දනවන නුවණ භයඥාණය වශයෙන් ද ඉන් මතුයෙහි චණ්ඩ මෘග වන ගහණයක් ලෙසින් භවත්‍රයෙහි දෙස් දැකීම ආදීනව ඥාණය වශයෙන් ද, කිසි යම් පුරුෂයෙක් මහ මසෙකැ යි සලකා අල්ලාගත් සර්පයාගේ සෝවැනි දැක ඌ වහා මුදා හරින්නාක් මෙන් තිලකුණු දැකීමෙන් ආදීනව දුටු යෝගාවචරයාගේ සංස්කාරයන් වහා මුදා හරිනු කැමැත්ත මුඤ්චිතුකම්‍යතා ඥාණය වශයෙන් ද අත් හරිනු වස් උපාය සොයනු පිණිස නැවත සංස්කාරයන් පරීක්ෂා කිරීම ස්වරූපයෙන් පවතින ඇල්ලීම පටිසංඛා ඥාණය වශයෙන් ද, අත් හල බිරිඳ කෙරෙහි මැදහත් වන පුරුෂයකු මෙන් දෝෂ දුටු සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථ වීම් නුවණ සංඛාරුපෙක්ඛා ඥාණය වශයෙන් ද භාවනා වඩන යෝගාවචරයාට ඉහත සඳහන් සම්මසනාදී නව ඥදනාගේ කෘත්‍ය නිෂ්පත්තියට ද, මතු උපදනා සත් තිස් බෝධිපාක්ෂික ධර්මයන්ට ද අනුකූල ව උපදිනුයේ අනුලෝම ඥාණය වශයෙන් ද දතයුත්තාහ.

(16) ඊලඟට අනුපස්සනා – විමෝක්ෂ – විමෝක්ෂ මුඛ සලකා බලනු.

'ත්‍රෛභූමික ධර්මයෝ අනාත්මය' යි පැවැති අනාත්මානුපස්සනාව ආත්මාභිනිවේශ දෘෂ්ටි ග්‍රහණය අත් හරියි. එය ආත්ම ශූන්‍යතාකාරය ම අනුව දක්නා හෙයින් සුඤ්ඤතානුපස්සනා විමෝක්ෂ මුඛ නම් වේ. ප්‍රතිපක්ෂයන් කෙරෙන් විමුක්ත වශයෙන් ආර්යමාර්ග සංඛ්‍යාත විමෝක්ෂයට දොරටු වෙයි. ඵල සමාපත්ති කාලයෙහි ඵල විමෝක්ෂයට දොරටු වෙයි.

'සංස්කාර ධර්මයෝ අනිත්‍යය' යි පැවැති අනුපස්සනාව අනිත්‍යයෙහි නිත්‍ය ය යි යන විපල්ලාස නිමිත්ත හරියි. ඒ අනිමිත්තානුපස්සනා විමෝක්ෂ මුඛ නම් වේ.

'සංස්කාර ධර්මයෝ දුඃඛයහ' යි පැවැති අනුපස්සනාව 'එතං මම, එතං සුඛං' යනාදීන් ප්‍රවෘත්ත තෘෂ්ණාප්‍රාර්ථනාව දුඃඛාකාර දර්ශනයෙන් අත් හරියි. ප්‍රණිධි රහිත ආකාරය දක්නා හෙයින් එය අප්පණිහිතානුපස්සනා විමෝක්ෂ මුඛ නම් වේ.

මේ ත්‍රිවිධ අනුපස්සනා විදර්ශනා වශයෙන් විමෝක්ෂමුඛ නමැයි දතයුතු.

වුට්ඨානගාමිනී නමින් කියනලද මේ සත්‍යානුලෝම විදර්ශනාව 'අනත්තා අනත්තා' යි වඩාද එයින් ලබන මාර්ගය ශූන්‍යතවිමෝක්ෂ නම් වෙයි. 'අනිච්චං අනිච්චං' යි වැඩීමෙන් ලබන මාර්ගය අනිමිත්ත විමෝක්ෂ නම් වෙයි. 'දුක්ඛං දුක්ඛං' යි භාවනා කිරීමෙන් ලබන මාර්ගය අප්පණිහිත විමෝක්ෂ නම් වේ. වුට්ඨානගාමිනී විදර්ශනා ගමන වශයෙන් මේ ත්‍රිවිධ නාමය යෙදේ. මාර්ගවිත්තවීථියෙහි ඵලචිත්තයෝද මාර්ගාගමන භාවනා වශයෙන් ඒ ත්‍රිවිධ නාමය ලබත්.

(17) යෝගාවචර තෙමේ ස්‍රෝතාපත්තිමාර්ගය භාවනා කොට දෘෂ්ටි - විචිකිච්ඡා ප්‍රහාණයෙන් අපාය ගමන් වළකයි. සත්වරක කාමසුගතියෙහි ප්‍රතිසන්ධිය පරම කොට ඇතිහෙයින් හේ සත්තක්ඛත්තුපරම සෝවාන් ආර්යශ්‍රාවක නම් වේ. සකෘදාගාමී මාර්ගයෙන් රාග - ද්වේෂයන් තුනී කිරීමෙන් මනුෂ්‍ය ලෝකයට ප්‍රතිසන්ධි වශයෙන් එක් වරක් පැමිණෙන ස්වභාව ඇත්තේ සකෘදාගාමී ආර්යශ්‍රාවක වේ. අනාගාමී මාර්ගයෙන් කාමරාග ව්‍යාපාද සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කිරීමෙන් ප්‍රතිසන්ධි වශයෙන් කාම භවයට නො පැමිණීමේ ස්වරූප ඇති අනාගාමි ආර්යශ්‍රාවක භාවයටද අර්හත් මාර්ගයෙන් අවශේෂ ක්ලේශයන් ප්‍රහීණ කරමින් අර්හත් ආර්යශ්‍රාවක භාවයටද පැමිණේ. ශූන්‍යතවිමෝක්ෂ ආදී නාමයෙන් දැක් සතර මාර්ග, සතර ඵලයෝ ප්‍රව්‍රජ්‍යාවෙහි ඵලය හෙයින් සතර ශ්‍රාමණ්‍ය ඵල යැ යි කියනු ලැබෙත්.

මිස්සකසංගහ නිද්දේසං යො පස්සති'දං සම්මසෙද්ධා සමෙකුසො,
විපස්සනාභාවනමහා ගිතො සතතවිසුද්ධි සිවතො යො හොති.

සත්වැනි පරිච්ඡේදය නිමි.

# අටවැනි පරිච්ඡේදය

---

සංඝල්ලක්ඛණය භික්ඛූනං භික්ඛුසීලෙ ඉධාගතෙ
සුත්තාගතං භික්ඛුසීලං පවක්ඛිස්ස'මිතොපරං
නිජභාසාය'හං සිද්ධං වන්දිත්වා රතනත්තයං

"තං චූල මජ්ඣිම මහා – සීලතො තිවිධං භවෙ
පිටකිකාවජ්ජපභෙදෙහි – නෙකභෙදගතං මතං"

ඒ භික්ෂුශීලය, චූලසීල – මජ්ඣිමසීල – මහාසීල වශයෙන් ත්‍රිවිධ වන්නේ ය. ඒ ඒ ශීලය පිටකි – කාවජ්ජ වශයෙන් අනේකප්‍රභේදයට ගියේ යැ යි දක්නා ලදී. මේ මෙහි භාවය යි.

(1) එහි චූලශීලය කවරේ ද?

මේ ශාසනයෙහි භික්ෂු තෙමේ ප්‍රාණඝාතයෙන් වළකියි. පරෝපඝාතය පිණිස දඬු නො ගනියි. එහෙයින් ඉවත ලූ දඬු ඇත්තෙක් වෙයි. ඉවත ලූ අවි ඇත්තෙක් වෙයි; පාපයෙහි ලජ්ජා ඇත්තෙක් වෙයි. මෙත් සිතැත්තෙක් වූයේ සව්සතුන් කෙරෙහි හිතසිතින් වෙසෙයි. මේ ඒ භික්ෂුවගේ ශීලය යි.

ඒ භික්ෂු තෙමේ නුදුන් දෙය ගැනීමෙන් වළකියි. හිමියන් දුන් දෙය ම ගනියි. දුන් දෙය ම සිතින් ඉවසයි. වංචා රහිත වෙයි. පිරිසිදු සිතින් වසයි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය වෙයි.

හෙතෙමේ අබ්‍රහ්මචර්යාව හැර ශ්‍රේෂ්ඨචර්යාවෙහි හැසිරෙයි. අනාචාරයෙන් දුරු වෙයි. ගැමිදහම් වන මෛථුන්දමින් වළකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය වෙයි

මුසාවාදයෙන් වළකී. සත්‍යය කියන සුලුවූයේ ඇත්තෙන් ඇත්ත ගළපා කියන්නේ වේ. ස්ථිරකථා ඇත්තේ ඇදහිය හැකි බස් ඇත්තෙක් වේ. ලොවහට නොවන වචන ඇත්තෙක්ද වෙයි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

හෙතෙමේ පියබව් නසන පිසුණු බසින් වැළකී උභයන් බිඳවීම පිණිස මෙතැනින් අසා කේලාම් නො කියන්නේ වෙයි. හේ බිඳුණවුන් සමගි කරවූයේ සමගියට අනුබල දෙයි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය වේ.

හෙතෙමේ රළු වදනින් වැළකී නිදොස් බස් කියන්නේ වෙයි. කණට සුව එළවන, කයට මෙත් සිසිල දනවන, සිතට සැනසිලි දෙවන බස් කියයි. වාග් ගුණෙන් පිරිපුන් බොහෝ දෙනා ප්‍රිය වන සැනසෙන බස් කියයි. අනුනට වැඩ ම වන බස් කියයි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

හිස් දෙඩුම් දුරු කරයි. කෙලෙස් වැඩෙන දෙඩුමින් වළකියි. කිවයුතු කල් බලා කියයි. ඇත්තක් ම කියයි. මෙලෝ පරලෝ වැඩ වඩන වචන කියයි. නව ලෝවුතුරු දහම් පෙරටු ම කියයි. සංවර ප්‍රහාණ විනය නිශ්‍රිත ව කියයි. උවම් සහිත ව, මහගු නිදනක් මෙන් සිතහි ලා දැරියයුතු සෙත සලසන වචන කියයි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

හෙතෙමේ තණ ගස් වැල් ආදිය කැඩීමෙන් සිඳීමෙන් වළකියි. පෙරවරු එක් වේල වළඳයි, රෑ බොජුනෙන්, විකල් බොජුනෙන් වෙන් වෙයි. නටනු නටවනු ඒ බලනු වළකියි. ගයනු ගයවනු ඒ අසනු වළකියි. වයනු වයවනු ඒ දකනු වළකියි. මලින් සුවඳින් සැරසුමෙන් වළකියි. උසසුන් මහසුන් දුරු කරයි. රන්, රිදී, මසු, කහවණු නො පිළිගනියි. නො පිළිගන්වයි. නො ඉවසයි. ඇල් වී ආදී සත්තවිධ ධාන්‍ය නො පිළිගනියි. අමු මස් මාළු නො පිළිගනියි. ඉස්තිරීන්, කුමරියන්, දැසිදසුන් නො පිළිගනියි. එළුවන්, නිඳළුවන්, කුකුළන්, හූරන්, ඇතුන්, ගෙරින්, අසුන්, වෙළඹුන් නො පිළිගනියි. කෙත්වත්, අරම් නො පිළිගනියි. ගිහියන්ගේ පත් හසුන් මුව හසුන් ගෙන නො යයි. ගෙන් ගෙට යවන පඬුරු ආදිය ගෙන යාමෙන් ගිහි දූත මෙහෙවරෙහි නො යෙදෙයි. කයවික්කයයෙන් (ගනුදෙනුවෙන්) වළකියි. කිරීමෙන් මැනීමෙන් වංචා නො කරයි. අල්ලස් ගැනීමෙන්, උපායෙන් මෙරමා වංචා කිරීමෙන්, සමාන දෙයින් වංචා කිරීමෙන් කුටිල ප්‍රයෝග නො කරයි. අත් පා ආදිය කැපීමෙන්, මැරීමෙන්, රජ්ජු බන්ධන අන්දු බන්ධනාදී බන්ධනයෙන්, සැඟවී සිට වස්තු පැහැර ගැනීමෙන්, ගම් නියම්ගම් පැහැරීමෙන්, උමං බිඳ වස්තු පැහැර ගැනීමෙන් වළකියි. මේ සියලු අකටයුතුවලින් ඒ භික්ෂුව වැළකුණේ වෙයි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

පිටසී භේදයෙන් අට වැදෑරුම් ද, කුවම් භේදයෙන් ස විසි වැදෑරුම් ද වූ චුල්ලසීලය ඒ භික්ෂුව මෙසේ සම්පූර්ණ කරයි.

(2) එහි මජ්ඣිමසීලය කවරේ ද?

කම්පල අදහා සැදැහැයෙන් දෙන පසය වළඳන ඇතැම් මහණ බමුණු කෙනෙක් බීජගාම භූතගාම විකෝපනයෙහි යෙදී වසත්. කතා; හිඟුරු, වදකහ, ඉඹද, කුලුරැන, සුවඳහොට, වඹමුතු ආදිය මූලබීජ යි. ඇසතු, නුග, පුලිල, දිඹුල්, කසට, කෙළකිඳි ආදිය ඛන්ධබීජ යි. උක්, හුණ, බට, රඹුක් ආදිය ඵලුබීජ යි. අඳු, තලා, දම්නු, හිරිමෙරිය ආදිය අග්ගබීජ යි. පුච්ඡිණ්ණ අපරණ්ණ ආදිය බීජබීජ යි. භික්ෂු තෙමේ මෙබඳු බීජගාම භූතගාමයන් ඡේදන භේදනාදියෙන් වළකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

සැදැහැයෙන් දුන් බොජුන් වළඳන ඇතැම් මහණබමුණු කෙනෙක් සන්නිධිකාරපරිභෝගයෙහි ද යෙදෙත්. ඔවුහු එ දවස ලද ඛජ්ජ, භොජ්ජ, ලෙය්‍ය, පෙය්‍ය ආදි වශයෙන් සිවුවැදෑරුම් වන ආහාර පසු දිනට තබා ප්‍රයෝජන ගනිත්. (අන්නසන්නිධි) අඹපැන්, දඹපැන් ආදි අෂ්ට පානය ද එසේ ප්‍රයෝජන ගනිත්. (පානසන්නිධි) 'මේ තුන් සිවුරු දිරා ගිය කල පසුව වළඳිමි' යි ලද සිවුරුපිළි සඟවා තබත්. (වත්ථසන්නිධි). ගවුන් යෙදූ රිය, මිනිසුන් ඔසවන සිවිකා වැනි යාන ලැබ පරිහරණය කරත්. (යානසන්නිධි). දළහැද, වෙව්ල්හැද ආදිය ලැබ ප්‍රයෝජන ගනිත්. (සයනසන්නිධි) කැසිලි ඇති රෝගයන් නිසා පරිභෝග කළ සඳුන් සුවඳ කසා ආදිය රෝග සන්හුන් කල පසුවට තබා ප්‍රයෝජන ගනිත් (ගන්ධසන්නිධි). ඉතිරි වූ සහල්, තල, උඳු, මුං, පොල්, ලුණු, මස්, මාළු, ගිතෙල් ආදිය පසුවට තබා පිසවා ප්‍රයෝජන ගනිත් (ආමිසසන්නිධි). භික්ෂුතෙමේ මෙබඳු සන්නිධිකාර පරිභෝගයෙන් වළකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

ඇතැම් මහණබමුණුකෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා විසුළු දසුනෙන් සතුටු ව වසත්. නැටුම් (නච්ච), ගැයුම් (ගීත), වැයුම් (වාදිත), රඟ මඬුලු සැරසීම (පෙක්ඛ), ආදියෙහි යෙදෙත්. රාමායන ශීතාහරණ ආදී කථා ඇසීමෙන් (අක්ඛාන) සතුටු වෙත්. කසුතාලම් (වෙතාල) හා අත් තල (පාණිස්සර) ලෑමෙන් සතුටු වෙත්. මන්ත්‍ර පිරිමසා මළමිනී නංවා කථා කරවත්. සිවුරැස් බෙර හෝ කල බෙර හෝ ගැසීමෙන් සතුටු වෙත්. ස්ත්‍රී පුරුෂ සංගම් කොට රාගජනක ප්‍රතිභාන චිත්‍ර විචිත්‍ර කිරීමෙන් (සොභනකරක) සතුටු වෙත්. යමට ගෙන ලෝලි කෙළීමෙන් (ධෝව ක්‍රීඩාවෙන්) සතුටු වෙත්. චණ්ඩාල යන්ගේ යණ්ඩෙදවුත් කෙළීමෙන් (චණ්ඩාල) සතුටු වෙත් හුණගස් ඔසවා ක්‍රීඩා කිරීමෙන් (වංස) සතුටු වෙත්. මළවුන්ගේ ඇට සෝද රැස් කොට තබා ගඩා වැලප රා බී මස් ආදිය බුදිත්. ඉන්ද්‍රජාලයෙන් මිනීඇට සෝද බලත්. ඇත් පොර (හත්ථියුද්ධ) බලත්. අස් පොර (අස්සයුද්ධ) බලත්. මීහු පොර (මහිංසයුද්ධ) බලත්. ගොන් පොර (උසභයුද්ධ) බලත්. එළු පොර (අජයුද්ධ) බලත්. බැටළු පොර (මෙණ්ඩකයුද්ධ) බලත්. කුකුළු පොර (කුක්කුටයුද්ධ) බලත්. වටු පොර (වට්ටකයුද්ධ) බලත්. පොලු හරඹ (දණ්ඩයුද්ධ) බලත්. මිටි යුද (මුට්ඨියුද්ධ) බලත්. මල්ල පොර (නිබ්බුද්ධ) බලත්. යුද වදිනු (උය්‍යොධික) දක්නට යත් බල සෙන් ගණින තැන් (බලග්ග) දක්නට යත්. යුද සෙන් බෙදන තැන් (සේනාබ්‍යූහ) දක්නට යත්. ඇත් අස් බල ඇණි (අණීකදස්සන) දක්නට යත්. එහෙත් භික්ෂු තෙමේ සසුන් පිළිවෙතට පටහැණි මෙබඳු විසුළු දසුනෙන් වළකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

ඇතැම් මහණබමුණුකෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා ප්‍රමාදයට කාරණ වන දූ කෙළියෙහි යෙදෙත්. සූ සැට ගැබින් යුත්

දූපෝරුවෙහි ක්‍රීඩා කරත්. (අට්ඨපද) අසූ ගැබින් යුත් දූ පෝරුවෙහි ක්‍රීඩා කරත් (දසපද). අහසෙහි දූපෝරු මෙන් සලකා සෙල්ලම් කරත් (ආකාස). නෙරෙංචි, කෙළියෙන් සතුටු වෙත්. එක් කොට තබන ලද දූකැට හෝ අකුරු හෝ නො සැලෙනසේ නියෙන් ම ඉවත් කොට හෝ ගනා හෝ කරන ක්‍රීඩාවෙන් (සන්තික) සතුටු වෙත්. දූපෝරුවෙහි පසඇට පමණක් ලා පැනැපිත් ක්‍රීඩා කරත් (ඛලික). ගුඩු කෙළියෙන් සතුටු වෙත්. ඉරට මිරියෙන් ගසා බිම කිත්ති මැති තන්හි ඇත් අස් රූ අඳින කෙළියෙන් (සලාකහත්ථ) සතුටු වෙත්. කැට හැසීම හෝ පත්දූ ක්‍රීඩාව හෝ කරත් (අක්ඛ). කොළ නළා පිඹ කෙළිත් (පඞ්ගචීර). ගම්දරුවන් කෙළනා නගුල් ගෙන සෙල්ලම් කරත් (වඞ්කක). කරණම් පනිත් (මොක්ඛචික). තල්පත් බඹර කෙළිත් (චිඞ්ගුලක). කොළ නැළියෙන් වැලි ඇදිය හැක සෙල්ලම් කරත් (පත්තාළ්හක). සෙල්ලම් රියෙන් ක්‍රීඩා කරත් (රථක). සෙල්ලම් දුන්නෙන් ක්‍රීඩා කරත් (ධනුක). අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ පා, ඇඳි අකුරු දක්වා සෙල්ලම් කරත් (අක්ඛරික). සිතූ දෙය කීමෙන් ක්‍රීඩා කරත් (මනේසික). කණ කොර පිළු ඇඳීන් මෙන් ක්‍රීඩා කරත් (යථාවජ්ජ). එහෙත් ඒ භික්ෂු තෙමේ ප්‍රමාදයට හේතු වන මෙබඳු දූ කෙළියෙන් ගෑ කරුණෙන් වළකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

ඇතැම් මහණබමුණුකෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා උසසුත් මහසුත් පරිභෝග කරත් ඔවුහු පමණ ඉකුත් දික්සගලා පුටුව (ආසන්දි), වියාල රූප ඇති පලඟ (පල්ලඞ්ක), සතරඟුලෙන් දික් ලොම් ඇති ඇතිරිය (ගොනක), වියමනෙන් විසිතුරු එළු ලොම්මුවා ඇතිරිය (චිත්තක), මුදු සුදු එළු ලොම් ඇතිරිය (පටික), එළු ලොම්මුවා ඝන පුප් ඇතිරිය (පටලික), තිළිය - පුළුන් මෙට්ටය (තූලිකා), සිංහ ආදී රූපයෙන් විසිතුරු කළ එළුලොම් ඇතිරිය (විකතිකා), එක් පිටක ලොම් සහිත එළුලොම් ඇතිරිය (එකන්තලෝමි), දෙපිට ලොම් සහිත එළුලොම් ඇතිරිය (උද්දලෝමී), රන් කසුකම් කොට කිහිරි හුයින් කළ පසතුරුණ (කට්ටිස්ස), රන් කසුකම් කොට කැටී කිහිරි හුයින් කළ පසතුරුණ (කොසෙය්‍ය), නිළියන් සොළොසකට නැටිය හැකි එළු ලොම්මුවා මහඇතිරිය (කුත්තක), ඇතු පිට අතුරන ඇතිරිය (හත්ථත්ථර), අසුපිට අතුරන ඇතිරිය (අස්සත්ථර), රියෙහි අතුරන ඇතිරිය (රථත්ථර) ඇඳට සරිලන සේ අඳුන්දිවි සමින් කළ ඇතිරිය (අජිනප්පවෙණි), කෙහෙල්මුව සමින් කළ මහඟු පසතුරුණ (කාදලිමිගපවරපච්චත්ථරණ) රතු උඩු වියන් සහිත රතු ඇතිරිය (සඋත්තරච්ඡද), හිස්දෙර පා මුල රතු කොට්ට සහිත ආසනය (උභතෝලොහිතකූපධාන) ආදී උසසුත් මහසුත් පරිභෝග කරත්. එහෙත් ඒ භික්ෂුතෙමේ මෙබඳු උසසුත් මහසුත් පරිභෝගයෙන් වළකියි මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

ඇතැම් මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා මණ්ඩනවිභූෂණයෙහි යෙදෙත්. (සුවඳ සුණුයෙන් ඇඟ උලත්. (උච්ඡාදන). අවයව වඩන පිණිස පිරිමදිත් (පරිමද්දන). බාල දරුවන් මෙන් සුවඳ දියෙන් නහත් (නහාපන). මල්ලවයන් මෙන් මුගුරින් අත් පා තළා මස් වඩත් (සම්බාහන). කැඩපතින් බලත් (ආදාස). අලංකාරයට අඳුන් තෙල් පරිහරණය කරත් (අඤ්ජන) ගෙතු නොගෙතු සුවඳ මල් පලඳිත්. ගෝරද, කොකුම්, රත්සඳුන් ආදී විලවුන් දරත් (මාලාවිලෙපන). මුහුණ තල කැලැල් කුරුලෑ ආදිය හරන පිණිස මැටි, අබ, තල, කසා කල්ක උලා සම් පැහැපත් කරත් (මුඛචුණ්ණක). මූවිසුණුයෙන් මුහුණ පැහැපත් කරත් (මුඛාලෙපන). අත්ආබරණ පලඳිත් (හත්ථබන්ධ). හිස කෙස් අලංකාර කරත් (සිඛාබන්ධ). විසිතුරු දඬු ගෙන ඇවිදිත් (දණ්ඩක). දසරුමෙහි ස්ත්‍රී පුරුෂ රූපයෙන් විසිතුරු කළ බෙහෙත් නළ එල්ලා ගෙන ඇවිදිත් (නාළික). කඩු දරත් (ඛග්ග) සිතුවම් කළ කුඩ දරත් (ඡත්ත). රතින් රිදියෙන් විසිතුරු වහන් දරත් (චිත්‍රූපාහන). නළල්පට බඳිත් (උණ්හීස). සිළුමිණි පලඳිත් (මණි). විසිතුරු සෙමෙර වල්විදුනා දරත් (වාලවීජනී). දික් දහ ඇති සුදු වත් හැඳ පෙරව ඇවිදිත් (ඔදාතානි වත්ථානි දීඝදසානි). මෙබඳු අලංකරණයන්ගෙන් ඒ භික්ෂු තෙමේ වළකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

ඇතැම් මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා ස්වර්ගමෝක්ෂයට බාධක තිරර්ථක කථාවන්හි යෙදී වසත්. රාජකථා - චෞරකථා - මහාමාත්‍යකථා (මහාමත්තකථා), සේනාකථා - භයකථා - යුද්ධකථා, ආහාරකථා (අන්නකථා), පානකථා, වස්ත්‍රකථා (වත්ථකථා), සයනකථා, මාලාකථා, ගන්ධකථා, ඥාතිකථා (ඤාතිකථා), යානකථා, ග්‍රාමකථා (ගාමකථා), නිගමකථා, නගරකථා, ජනපදකථා, ස්ත්‍රීකථා (ඉත්ථිකථා), පුරුෂකථා (පුරිසකථා), සූරකථා, වීථිකථා (විසිඛාකථා), දසිකථා (කුම්භට්ඨානකථා), මළ නෑයන් පිළිබඳ කථා පුබ්බපෙතකථා), සර්ගය පිළිබඳ ලෝකාඛ්‍යායික කථා (ලොකක්ඛායිකා), සමුද්‍රය පිළිබඳ තිරර්ථක සමුද්දක්ඛායික කථා (සමුද්දක්ඛායිකා), ලෝකය පිළිබඳ දියුණු පරිහානි කථා (ඉතිභවාභවකථා), අන් නිසරු කථා (නානත්තකථා) ආදියෙහි යෙදෙත්. එහෙත් ඒ භික්ෂු තෙමේ ස්වර්ග මෝක්ෂයට බාධක එබඳු තිරර්ථක කථායෙන් වළකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

සැදැහැයෙන් දුන් බොජුන් වළඳන ඇතැම් මහණ බමුණු කෙනෙක් මෙබඳු දෝෂාරෝපණ කථායෙහි යෙදෙත්. භවතා ධර්ම විනය නො දනියි, මම ධම්මවිනය දනිමි. භවතා වරදවා පිළිපදියි මම මනාකොට පිළිපදිමි. මගේ වචනය අර්ථසහිත ය. ඔබගේ වචනය අර්ථ රහිත ය. මුලින් කියයුත්ත පසුව කියයි; පසුව කියයුත්ත මුලින් කියයි. ඔබ කලක් පුහුණු කළ දෙය මගේ එක් වචනයෙන් බිඳී ගියේ ය.

ඔබට දෙස් නැගිණ. ඉන් මිදෙනු පිණිස හැරුණු ඉගෙනුමට පණ්ඩිත මහණුන් වෙත යනු මැනැව්' යනාදීන් දෝෂාරෝපණය කරත්. එහෙත් ඒ භික්ෂු තෙමේ එබඳු දෝෂාරෝපණයෙන් වැළකී වසයි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

සැදැහැයෙන් දුන් බොජුන් වළඳනා ඇතැම් මහණ බමුණු කෙනෙක් දූතපණිවුඩ හුවමාරුවෙහි යෙදී වසත්. රජ ඇමැති ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති කුමාරයන්ගේ පත් හසුන් පඬුරු ගෙන දූතමෙහෙවරෙහි යෙදෙත්. එහෙත් ඒ භික්ෂු තෙමේ ඉන් වළකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

ඇතැම් මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා නොපිරිදි කොහොත්වතින් ලෝකයා විස්මිත කරත්. ලාභසත්කාර කැමැත් ව ව්‍යාජකථා කියත්. ලාභ පතා මෙරමා ගුණ කියත් ඕද දෙයක් දී මහත් ලාභ සොයත්. එහෙත් ඒ භික්ෂු තෙමේ එබඳු කුහනලපනාදියෙන් වළකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

පිටසිභේදයෙන් දසවැදෑරුම් ද කුච්ඡිභේදයෙන් එක්සියසත්සාළිස් වැදෑරුම් ද වූ මෙය, ඒ භික්ෂුවගේ මජ්ඣිමශීලය යි.

(3) එහි මහාසීලය කවරේ ද?

ඇතැම් මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා තිරශ්චීන විද්‍යාවන් හේතු කොට මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත්. ඔවුහු සාමුද්‍රිකාලක්ෂණය යි කියනා ලද අංග ශාස්ත්‍රයෙන් (අඞ්ග) දිවි පවත්වත්. නිමිත්තශාස්ත්‍රයෙන් [62] (නිමිත්ත) දිවි පවත්වත්. අසනිපාතයන් පිළිබඳ ශුභාශුභ කියනා උත්පාත ශාස්ත්‍රයෙන් (උප්පාද) දිවි ගෙවත්. ස්වප්න ශාස්ත්‍රයෙන් (සුපිණ) දිවි ගෙවත්. ලක්ෂණශාස්ත්‍රයෙන් (ලක්ඛණ) දිවි ගෙවත් මීයන් කෑමෙහි පලාපල කියනා මූෂික ශාස්ත්‍රයෙන් (මූසිකච්ඡින්න) දිවි ගෙවත් අග්නි හෝමයෙන් (අග්ගිහොම) දිවි ගෙවත් දබ්බිහෝමයෙන් (දබ්බිහොම) දිවි ගෙවත්. ථුෂහෝමයෙන් (ථුසහොම) දිවි ගෙවත්. කණහෝමයෙන් (කණහොම) දිවි ගෙවත්. තණ්ඩුලහෝමයෙන් (තණ්ඩුලහොම) දිවි ගෙවත්. සප්පිහෝමයෙන් (සප්පිහොම) දිවි ගෙවත්. තෙලහෝමයෙන් (තෙලහොම) දිවි ගෙවත්. මුවෙන් අබ ආදිය ගෙන ගින්නෙහි ලීමෙන් හෝ මන්ත්‍ර පිරිවහා යාග කිරීමෙන් හෝ කරන මුඛහෝමයෙන් (මුඛහොම) දිවි ගෙවත්. දකුණු දනරැවෙහි ලේ ගෙන කරන ලෝහිතහෝමයෙන් (ලොහිතහොම) දිවි ගෙවත්. සිරුරු හැඩහුරුව බලා අනාගතය කියනා අංග විද්‍යාවෙන් (අඞ්ගවිජ්ජා) දිවි ගෙවත්. ආරාම උද්‍යාන ආදී වස්තු පිළිබඳ පලාපල කියනා වාස්තුවිද්‍යාවෙන් (වත්ථුවිජ්ජා) දිවි ගෙවත්. අංගෙයන මාසුරකාදි නීතිශාස්ත්‍රයෙන් (ඛත්තවිජ්ජා) දිවි ගෙවත්. සොහොන්හි වැස යාග කිරීමෙන් (සිවවිජ්ජා) දිවි ගෙවත්. භූත විද්‍යාවෙන් (භූතවිජ්ජා) දිවි ගෙවත්.

බිම්ගෙයි වසමින් උගතයුතු මන්ත්‍රයෙන් (භූරිවිජ්ජා) දිවි ගෙවත්. සර්ප විෂ බාන මන්ත්‍රවලින් (අහිවිජ්ජා) දිවි ගෙවත්. සර්ප විෂ පිළිබඳ විෂවිද්‍යාවෙන් (විසවිජ්ජා) දිවි ගෙවත්. ගෝනුසු විෂ බස්වන මන්ත්‍රයෙන් (විච්ඡිකවිජ්ජා) දිවි ගෙවත්. මී විෂ බාන මන්ත්‍රයෙන් (මූසිකවිජ්ජා) දිවි ගෙවත්. පියා ඇති නැති දෙපා සිවුපා සතුන් හඬ අසා ගුණාගුණ කියන ශකුන විද්‍යාවෙන් (සකුණවිජ්ජා) දිවි ගෙවත්. කවුඩු හඬ අසා ගුණාගුණ කියන කපුටුරූතයෙන් (වායසවිජ්ජා) දිවි ගෙවත්. ආයුෂය පිළිබඳ කියන ජරාරිෂ්ටවිද්‍යාවෙන් (පක්කජ්ඣාන) දිවි ගෙවත්. යුද්ධයෙහි විපත් නොවනු පිණිස පිරිවනන මන්ත්‍රයෙන් (සරපරිත්තාන) දිවි ගෙවත්. සිඟලු කුරුලු සිවුපා සතුන්ගේ හඬ දැනීම් විෂයෙන් පැවැති මන්ත්‍රයෙන් (මිගචක්ක) දිවි ගෙවත්. එහෙත් ඒ භික්ෂු තෙමේ මෙබඳු තිරශ්චීනවිද්‍යාවන් හේතු කොට දිවි පැවැත් වීමෙන් දුරු වෙයි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

ඇතැම් මහණබමුණු කෙනෙක් මිණිලකුණු (මණිලක්ඛණ) කීමෙන් දිවි රකිත්. මෙබඳු දණ්ඩක් ගෙන ඇවිදීමෙන් මෙවැනි පල ලැබෙතැයි කියන දඬුලකුණු (දණ්ඩලක්ඛණ) දක්වා දිවි රකිත්. මෙබඳු වස්ත්‍රයෙන් මෙවැනි පලාපල ලැබෙතැයි කියන වත්ලකුණු (වත්ථලක්ඛණ) දක්වා දිවි රකිත්. මෙබඳු කඩුවක් ඇල්ලීමෙන් මෙවැනි පලාපල ලැබෙතැයි කියන කඩුලකුණු (අසිලක්ඛණ) දක්වා දිවි රකිත්. මෙබඳු හියක් ඇල්ලීමෙන් මෙවැනි දෙයක් වෙතැයි කියන හිලකුණු (උසුලක්ඛණ) දක්වා දිවි රකිත්. මෙබඳු දුන්නක් ඇල්ලීමෙන් මෙවැනි ගුණාගුණ ලැබෙතැයි කියන දුනුලකුණු (ධනුලක්ඛණ) දක්වා දිවි රකිත් සෙසු අවි ඇල්ලීමෙන් මෙබඳු මෙබඳු පලාපල ලැබෙතැයි කියන අවි ලකුණු (ආවුධලක්ඛණ) දක්වා දිවි රකිත්. මෙබඳු ස්ත්‍රියකගෙන් මෙබඳු පුරුෂයකුගෙන් මෙවැනි මෙවැනි වැඩ අවැඩ වෙතැයි කියන ස්ත්‍රී පුරුෂ ලක්ෂණය (ඉත්ථිලක්ඛණ – පුරිසලක්ඛණ) දක්වා දිවි රකිත්. කුමාරයකුගෙන් (කුමාරලක්ඛණ), කුමාරියකගෙන් (කුමාරිලක්ඛණ), දාසයකුගෙන් (දාසලක්ඛණ), දාසියකගෙන් (දාසිලක්ඛණ), ඇතකුගෙන් (හත්ථිලක්ඛණ), අසකුගෙන් (අස්සලක්ඛණ), ගොනකුගෙන් (උසභලක්ඛණ), දෙනකගෙන් (ගොලක්ඛණ), මීමකුගෙන් (මහිසලක්ඛණ), මීදෙනකගෙන් මෙබඳු වැඩ අවැඩ වෙතැයි කියන ඒ ඒ ලකුණු දක්වා දිවි රකිත්. මෙබඳු එළු (අජලක්ඛණ), බැටළු (මෙණ්ඩකලක්ඛණ), කුකුළු (කුක්කුටලක්ඛණ), වටු (වට්ටකලක්ඛණ), මස් කීදීමෙන් මෙවැනි දේ වෙතැයි කියන ලකුණු දක්වා දිවි රකිත්. සිතුවම්හි මෙබඳු ගොයි රූ ඇ කල කල මෙවැනි දේ වෙතැයි කියන ගොයි ලකුණු[63] (ගොධාලක්ඛණ) දක්වා දිවි රකිත්. මෙබඳු කැණිමඬලෙන් මේ මේ ගුණාගුණ වේතැයි කියන කැණි ලකුණු (කණ්ණිකාලක්ඛණ) දක්වා දිවි රකිත්. සිතුවම් අතර කැසුබු රූවක් තිබීමෙන් මෙබඳු දෙයක් වෙතැයි කියන කැසුබු ලකුණු (කච්ඡපලක්ඛණ) දක්වා

දිවි රකිත්. සිවුපාවුන් අතුරෙන් මේ මේ සත්වයා සිතුවමනා හෝ පලදනාවක හෝ ඇති කල මෙබඳු දෙයක් වේනැයි කියන මුවලකුණු (මිගලක්ඛණ) දක්වා, දිවි රකිත්. එහෙත් ඒ භික්ෂු තෙමේ මෙබඳු තිරශ්චීනවිද්‍යාවෙන් හේතු කොට දිවි පැවැත්මෙන් වලකියි. මෙබඳු මිථ්‍යාආජීවය දුරු කරයි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

එසේ ම ඇතැම් බාහිර මහණබමුණු කෙනෙක් යුද පිණිස රජු නුවරින් නික්මෙන නැකත කියත්. සිය නුවරට එන නැකත කියත්. ඇතුළුනුවර රජුන් පිටතින් වන් සතුරු රජුන් වෙත පෙරගමන් යන නැකත කියත්. පිටතින් වන් රජදරුවන් එනුවර රජු වෙත එන නැකත කියත්. පිටතින් වන් රජදරුවන් වෙත ඇතුළුනුවර රජුන් එන නැකත කියත්. ඇතුළුනුවර රජුන් දිනන බව කියත් පිටතින් වන් සතුරු රජුන් පරදින බව කියත්. පිටතින් වන් රජුන් දිනන බව කියත් ඇතුළුනුවර රජුන් පරදින බව කියත් මෙබඳු තිරශ්චීන විද්‍යාවෙන් හේතු කොට දිවි පවත්වත්. එහෙත් ඒ භික්ෂු තෙමේ එබඳු මිථ්‍යාජීවිකාවෙන් වලකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි

ඇතැම් බාහිර මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා චන්ද්‍රග්‍රහණය වන දින කියත්. සූර්යග්‍රහණය වන දින කියත්. ග්‍රහයුද්ධ වන දින කියත්. සඳ හිරු මඟ නොමඟ ගමන් වන දින කියත්. ග්‍රහයන් මඟ නොමඟ ගමන් වන දින කියත්. උල්කාපතනය වන දින කියත්. ලැව්ගිනි පලාපල කියත්. භූමිකම්පා වන දින කියත්. අකුණු පුපුරන බව කියත්. සඳ හිරු නකත් තරු නැග්ම බැස්ම කියත් එහි පිරිසිදු අපිරිසිදු බව කියත්. ලොවට ඒ ඒ සුව දුක් දෙන චන්ද්‍රග්‍රහණ සිදු වන බව කියත්. සූර්යග්‍රහණ සිදු වන බව කියත්. ග්‍රහයන් එක් වන බව කියත්. සඳ හිරු මඟින් නොමඟින් ගමන් ගැනීමෙන් වන වැඩ අවැඩ කියත්. නකත් තරු මඟින් නොමඟින් ගමන් ගැනීමෙන් වනවැඩ අවැඩ කියත්. මෙවැනි තිරශ්චීනවිද්‍යාවන් ගෙන දිවි පවත්වත්. එහෙත් ඒ භික්ෂු තෙමේ එබඳු ලාමක ජීවිකාවෙන් වලකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

ඇතැම් බාහිර මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා මනා වැසි වස්නා කල් කියත්. වැසි නොවස්නා කල් කියත්. රට සුභික්ෂ වන කල් කියත්. දුර්භික්ෂ වන කල් කියත්. රටට උවදුරු නැති කල් කියත්. රටට උවදුරු ඇති කල් කියත්. රට රෝගී වන කල් කියත්. නීරෝග වන කල් කියත්. මුද්‍රා, ගණනා - සංඛ්‍යා ශාස්ත්‍රයෙන් දිවි ගෙවත්. කාව්‍යකරණයෙහි යෙදෙත්. තර්කශාස්ත්‍රය උගනිත්. මෙවැනි තිරශ්චීනවිද්‍යාවන් හේතු කොට දිවි පවත්වත්. එහෙත් ඒ භික්ෂු තෙමේ එබඳු ලාමකජීවිකාවෙන් වලකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

ඇතැම් බාහිර මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා මනා නැකත් බලා කුමරුවන් ආවාහ කරවත්; කුමරියන් විවාහ කරවත්. මනා නැකත් බලා වෙන් වූ අඹුසැමියන් සමගි කරවත්.

වෙන් වූ හැමැත්තන් වෙන් කරවත්. දූත් යන ගෙනත් බලා නැවත එක් කරවත්. ණයට පොලියට දීමට නැකත් කියත්. ශස්ත්‍ර කොට දී ප්‍රිය සිරි ගෙන එඩවත්. භූතියමින් යන සිරි හුබ ගෙන හසවත්. ගැබ නොහැගෙන බෙහෙත් දෙත්. මන්ත්‍රයෙන් දිව ගුළු බඳිත්; මුව බඳිත්; අත් පෙරළවත්; බිහිරි කරවත්; මන්ත්‍ර පිරිවහා කැඩපත්හි දෙවියන් නංවා ප්‍රශ්න විචාරත්. කුමරියන් ලවා ජේන කියවත්; දෙවි දූත්යන ලවා ජේන කියවත්. දිවි රකිනු පිණිස හිරු පුදත්; මහබඹු පුදත්. මන්ත්‍ර බලයෙන් මුවින් ගිනිදල් විහිදුවත්. සිරිකත හිසට කැඳවත්. ඔවුහු මෙබඳු ලාමක දිවි පැවැත්මක යෙදෙත්. එහෙත් ඒ භික්ෂු තෙමේ එබඳු මිථ්‍යාජීවිකාවෙන් වළකියි. මෙ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

එසේ ම ඇතැම් බාහිර මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා සිය සැතුම මුදුන්පත් කර ගනු වස් දෙගොලට ගොස් දෙවියනට බාරහාර වෙත්. සිතු පැතුම් ඉටු වුණු පසු ඉන් නිදහස් වෙත්. බිම්ගෙහි වැස උගත් මන්ත්‍රයෙන් වැඩ ගනිත්. පණ්ඩකයන් පුරුෂයන් කරත්. පුරුෂයන් පණ්ඩකයන් කරත්. මුලින් ගෙවල් නොතිබූ බිම්හි ඒ කරවත්. දේව පූජා භාණ්ඩ ගෙන්වා ග්‍රහපූජා කරත්. ශාන්තිය පිණිස මුව දෙවවත්; අනුක් නහවත්. ඇතුරයන් මෙනුමෙන් ගිනි පුදත්. බෙහෙත් දී වමනය කරවත්; විරේචන කරවත්. ලඝ විරේක කරවත් නාශ්‍යකොට ශිර්ෂ විරේචන කරවත්. කන් ලෙඩට බෙහෙත් තෙල් දෙත්. ඇස් ලෙඩට බෙහෙත් යොදා නාශ්‍ය කරත්. ඇස් ශල්‍යවන කරඅඳුන් සදත්. ඇසට සිසිල දෙන මුදු අඳුන් කරත්. සැත් කටු ලා වෙදකම් කරත්. සැත්කම් කරත්. ළදරුවනට වෙදකම් කරත් හිරලු වෙදකම් කරත්. දෙස් සමනය කරත්. මෙබඳු තිරශ්චීන විද්‍යාවන්ගෙන් දිවි පවත්වත්. එහෙත් ඒ භික්ෂු තෙමේ එබඳු ලාමක ජීවිකාවෙන් වළකියි. මේ ද ඒ භික්ෂුවගේ ශීලය යි.

පිටසිභේදයෙන් සත්වැදෑරුම් ද කුවපිභේදයෙන් එක්සිය අටසාලිස් වැදෑරුම් ද වන මෙය, ඒ භික්ෂුවගේ මහාශීලය යි.

මෙසේ ත්‍රිවිධශීලයෙන් සම්පූර්ණ භික්ෂු තෙමේ චක්ෂුරාදී ඉන්ද්‍රියයන් ස්මෘති ආරක්ෂයෙන් සංවර කරයි. අභික්කන්තාදී සත් තැන සාත්ථක, සප්පාය, ගෝචර, අසම්මෝහ යන චතු සම්පජඤ්ඤයෙන් යුක්ත වෙයි. යථාලාභ, යථාබල, යථාසාරුප්ප යන ත්‍රිවිධ සන්තෝෂයෙන් යුක්ත වෙයි. (මේ ත්‍රිවිධ සන්තෝෂය සිව්පසය පිළිබඳ ව දොළොස්වැදෑරුම් ය ) බැහැර යන විට කෙහෙසෙමේ අටපිරිකර ඇති ව යයි තුන් සිවුරෙන් සැනසෙමින් සැහැල්ලු පැවැත්ම පුරයි. ශමථ විදර්ශනා වඩමින් සතර මග පල අත්පත් කරයි.

චූලසීලාදි භේදදසං – යො'මං පස්සති සාදරං,
සො චූල මජ්ඣිම මහා – සීලෙසු බුහබුද්ධිකො

අටවැනි පරිච්ඡේදය නිමි.

# නවවැනි පරිච්ඡේදය

---

සිල් හඳුනන සැදැහැවත්තු දුසිල් දෙස් දැක සිල්හි පිහිටත්. එසේ ම සිල් අනුසස් දැක සිල්හි පිහිටත්. එහෙයින් දුසිල්දෙස් හා සිල්අනුසස් දත් සලකමු.

(1) භික්ෂුශීලයට පිටුපා මහණ වෙස් ගෙන එසස, කාය වාක් සංවර රහිත වූ මෝ ප්‍රකට ශ්‍රමණ දුශ්ශීලයෝ ය. ඔවුහු සිය සගමොක් මග අවුරා ගනු පමණක් නොව, තමන් ඇසුරු කරන්නවුනට ද ඒ මග අවුරත්. ඔවුහු සිය ශිෂ්‍ය දායකාදීන්ගේ සවර්ග - මෝක්ෂ මාර්ගයන් දූෂණය කරත්. එහෙයින් ඔවුහු 'මාර්ග දූෂකයෝ' වෙත් "යො පුග්ගලො අත්තනො ලොකුත්තරමග්ගස්ස පරෙසං සුගතිමග්ගස්ස ච දූසනතො මග්ගදූසීති වෙදිතබ්බො" යන්නෙන් එය දක්වා ඇත.

(2) "සෙය්‍යථාපි භික්ඛවෙ, ඡවාලාතං උභතොපදිත්තං මජ්ඣෙ ගූථගතං නෙව ගාමෙ කට්ඨත්ථං ඵරති, න අරඤ්ඤෙ දරුත්තං. තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි. යථායං පුග්ගලො නෙවත්තහිතාය පටිපන්නො නො පරහිතාය" යි බුදුරජාණන් වහන්සේ වදාළසේක. 'මහණෙනි, දෙකොණ ගිනි ගෙන දිලෙන මැද අශුචි තැවරුණු සොහොන් පෙනෙල්ල ගමෙහි දර පිණිස නො ගනියි; අරණෙහි දැව පිණිස නො ගනියි. මහණෙනි, ශ්‍රමණ දුශ්ශීලයාත් එවැනි යැ යි මම කියමි. මේ පුද්ගලයා තමාට හිත පිණිස නො පවතියි; අනුනට හිත පිණිස නො පවතියි.' මේ එහි තේරුම යි. මේ ශ්‍රමණ දුශ්ශීලයෝ ගිහිභෝගයෙන් ද පිරිහුණහ; මහණකමින් ද පිරිහුණහ. එහෙයින් උභය භ්‍රෂ්ටයන් බව කියැවෙයි.

(3) බහුස්සුතොපි චෙ හොති - සීලෙසු අසමාහිතො
සීලතො නං ගරහන්ති - තස්ස සම්පජ්ජතෙ සුතං" යි

වදාළේත් දුශ්ශීලයා පිළිබඳ ව ය. බහුශ්‍රැත වුව ද සිල් නැත් නම් 'දුශ්ශීලයා' යි ඔහුට ගරහත්. ශ්‍රැත කෘත්‍යයක් ඔහුට නො ලැබෙයි. 'සුතාදි ගුණයුත්තොපි අපූජාරහො සුතාකුම්භි විය බ්‍රාහ්මණානං' යි විශුද්ධිමාර්ගයෙහි ද දක්වා ඇත. උසස් නමුත් දුසිල් නම් ගැරහිය යුතු බවත්, ඔවුනට සිවුපසය නො පිදිය යුතු බවත් පැහැදිලි ව පළ වෙයි. නුගත් දුසිලුන් ගැන කියනු ම කිම? මංගල සූත්‍රයෙහි ද 'පූජා ච පූජනීයානං' යනාදිය වදාළේත් නො පිදියයුතු ඒ මහණ දුසිලුනට පසයෙන් පිදීම අවමඟුලකි.

(4) "යො නින්දියං පසංසති – තං වා නින්දති යො පසංසියො
විචිනාති මුඛෙන සො කලිං – කලිනා තෙන සුඛං න වින්දති"
ගැරහුම් නින්දා කටයුතු දුශ්ශීලයාට පසසයි ද, හේ මුවින් පව් රැස් කරයි. පැසසියයුතු සිල්වතාට ගරහයි ද එසේ ම පව් රැස් කරයි. එයින් පරලොව සැපක් නො විඳියි. මේ වදාළේත් බුදු රජාණන් වහන්සේ විසින් ය. ඇතැම්හු සිකපද කඩමින් නොයෙක් නොපණත් කම් කරමින් වසන ශ්‍රමණ දුශ්ශීලයනට පසසත්. 'ආර්ය පරම්පරාවෙන් පැමිණෙන අර්හත්ධ්වජය දරන උතුමෝ ය' යි ඔවුන් ගුණ වණති. සැබෑ සිල්වත්නට 'කුහකයෝ' ය යි පරිහව බණිති. මෙබඳුවන් ද මුවින් පව් පුරා අපායගත වෙති. ප්‍රේතවස්තු ප්‍රකරණයේ ගූථඛාදක ප්‍රේත වස්තුව මීට සාධක ය. 'පරමත්ථදීපනී' නම් එහි අටුවාහි මේ කථාව දක්වෙයි.

සැවැත් නුවර එක්තරා උපාසක කෙනෙක් තම කුලූපග භික්ෂු නමකට විහාරයක් කරවා දුන්නේ ය. උපාසක තැන තම හිතවත් භික්ෂූන් වහන්සේට උවටැන් කරමින් ඒ අවවාදයෙහි පිහිටා විසීය. ඒ භික්ෂුව පාපියෙකි. මෙතෙමේ සිල්වත්නට ගරහමින් සිට ඉන් මියගොස් එම විහාරයෙහි ම වැසිකිළියෙහි ප්‍රේතයෙක් විය. දායක තෙමේ ද ඒ පාපි භික්ෂුවගේ අවවාදයෙහි හැසුරුණේ බොහෝ පව් රැස් කෙළේ ය. හේ ද මිය ගොස් ඒ වැසිකිළියෙහි ම ප්‍රේතයකු ව උපන්නේ ය. ඔහු උපන්නේ ඒ ශ්‍රමණ මහාප්‍රේතයාගේ හිසපිට ය. මෙසේ ඒ දෙදෙනා ම දුක් විඳිති.

(5) "චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ" යන ශ්‍රී මුඛපාළියෙන් මෙය වඩාත් ප්‍රකට වෙයි. ගුණය නුවණින් සලකා ගත නොහැකි ව, ගැරහියයුතු තැන පැසසීමෙන් මරණින් මතු අපායෙහි උපදින බව බුදුරජාණන් වහන්සේ ඊට පෙන්වා දුන් සේක. පැසසියයුතු තැන නොගැරහීමෙන් ද ඇතිවන පලය එය ම ය. නො පැහැදියයුතු තැන පැහැදීමෙන් ද, පැහැදියයුතු තැන නො පැහැදීමෙන් ද වන්නේ එය ම ය. මේ සතර කරුණින් යුතු වූවහු ගෙන යන බරක් බහා තබන්නාක් මෙන් මරණින් මතු අපායගත වනබව පැහැදිලි කරුණකි. එහෙයින් ශ්‍රමණ දුශ්ශීලයන්ගේ ගුණ වණමින් ඔවුන්ගේ දුෂ්ප්‍රතිපත්තියෙහි මිථ්‍යානුලෝම ප්‍රතිපදාවෙහි පැහැදී වසන දායකාදීන් විශේෂයෙන් කල්පනාකාරී විය යුතු ය.

(6) "යෙ ඛො පනස්ස සෙවන්ති භජන්ති පයිරුපාසන්ති දිට්ඨානුගතිං ආපජ්ජන්ති තෙසං තං හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය" යි සඳහන් වෙයි. "ඡ සත්ථාරෙ සෙවන්තානං මිච්ඡාදිට්ඨිකානං විය දෙවදත්තං සෙවන්තානං කොකාලිකාදීනං විය ච සෙවනා දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති" යි අටුවාහි

දුක්වෙයි. මෝහයෙන් මූලා වූ ශ්‍රමණදුශ්ශීලයන් සේවනය කරමින් උපස්ථාන කරන දායකාදීන්ට, දිගුකලක් අහිත පිණිස - සතර අපා දුක් පිණිස එය හේතු වන බව මින් පැහැදිලි ව ම ප්‍රකාශ වෙයි.

(7) **“යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ දුස්සීලා පාපධම්මා - පෙ - කසම්බුජාතා, දස්සනම්පහං භික්ඛවෙ, තෙසං භික්ඛූනං අනත්ථාවහං වදාමි. සවනං - අනුස්සතිං - අනුපබ්බජ්ජං - උපසංකමනං - පයිරුපාසනම්පහං භික්ඛවෙ, තෙසං භික්ඛූනං අනත්ථාවහං වදාමි”** යි නැවත වදාළහ. මේ දේශනය අනුව දුශ්ශීලභික්ෂූන් දැකීම ද අනර්ථය පිණිස පවතියි. ඔවුන්ගේ වචන ඇසීමෙන්, ඔවුන් සිහි කිරීමෙන්, අනුව පැවිදි වීමෙන්, සේවනයෙන්, භජනයෙන් අනර්ථය ම එළවන බව ප්‍රකාශ වෙයි.

(8) **“එවරූපො භික්ඛවෙ, පුග්ගලො ජිගුච්ඡිතබ්බො, න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො”** යි වදාළෙන් ශ්‍රමණ දුශ්ශීලයා අශුචියක් මෙන් කුණපයක් මෙන් කුණුම්ය දියැත්තක් මෙන් පිළිකුල් කටයුතු; සමීපයට නො එළඹියයුතු; ඔහුගේ ක්‍රියාවන්ට ඇලුම් නො කළයුතු; ඔහු වෙත නැවත නැවත නො පැමිණියයුතු. මේ නිසා ශ්‍රමණදුශ්ශීලයා දුරින් ම දුරු කළයුතු පුද්ගලයෙකි. ගිහි දුසිලුන් සේවන භජන පයිරුපාසන නොකටයුතු බව වදාළ නමුත් පිළිකුල් කටයුතු බවක් නො වදාළහ. ගෘහස්ථ දුශ්ශීලයාට වඩා ශ්‍රමණදුශ්ශීලයා උතුම් යි සලකන භවත්හු මෙය ද විමසත් වා.

(9) මේ අනුව ශ්‍රමණදුශ්ශීලයා සිය සඟමොක්මග අවුරා ගනියි; දූෂණය කරයි. ඇසුරු කරන්නවුන්ගේ සඟමොක්මග අවුරා දමයි; දූෂණය කරයි. හෙතෙමේ සොහොන් පෙනෙල්ලක් සේ නිෂ්ඵල යි; ගැරහියයුතු ය; නො පැසසියයුතු ය; නො පැහැදියයුතු ය. නො සෙවියයුතු ය; එහෙයින් නො පිදියයුතු ය;¹ පිළිකුල් කටයුතු ය. ඔහු දක්ම පවා අවැඩක් ම සලසයි. නුවණින් ගුණ නො හැඳින ඔවුනට පැහැදීම මූලාවකි. දුසිලුනට අනුදැන නො වදාළ සිවුපසයෙන් ඔවුනට උවටැන් කරන දායකාදීහු විමසා බලත් වා.

අජාසත් රජ තෙමේ, ‘මහානුභාව සම්පන්න උත්තමයෙකැ’යි දෙව්දත් තෙරුන් කෙරෙහි අත්‍යාශයෙන් පැහැදිණ. දෙව්දත් තෙරුන් ඇසුරෙන් අජාසත්රජ තෙමේ අපායගත විය. ඒ නිසා වදාළ ශ්‍රී මුඛ පාඨයකි මේ.

**“අසන්තං යො පග්ගණ්හාති - අසන්තං උපසෙවති**
**තමෙව ඝාසං කුරුතෙ - ව්‍යග්ඝො සඤ්ජීවකං යථා”**

යට සඳහන් කරුණ මෙයින් ද වඩාත් පැහැදිලි වෙයි. ‘යමෙක් අසත්පුරුෂයාට අනුබල දෙයි ද, ඔහු සේවනය කරයි ද, හේ ඔහුගෙන් වැනසෙයි. සංජීවකයා ව්‍යාඝ්‍රයාගෙන් නැසුණාක් මෙනි.’

(10) පූරණකාශ්‍යපාදීහු ද, දේවදත්තාදී ශ්‍රමණදුශ්ශීලයෝ ද, කකුසඳ බුදුන් කල දීඝවිපස්සී සොහොයුරා ද තමනුත් වැනසී අනුනුත් විනාශ කළහ. ශ්‍රමණ දුශ්ශීලයෝ දිලෙන ගිනිඅඟුරු මෙන් තමනුත් අනුනුත් වනසත්. "සො අග්ගිපදිත්තමිව අඞ්ගාරං අත්තානං දුග්ගමගිනෙන අත්තානඤ්ච අත්තනො වචනකාරෙ ච විනාසෙන්ති" යනුවෙන් දැක්වූයේ ද මෙයයි. ශ්‍රමණදුශ්ශීලයනට අවනත වූ ඔවුන් අනුව යන දායකාදීන් නිරයගාමී වනබව මින් පෙනේ. දීඝවිපස්සී සොහොයුරු තම උපස්ථායක කුලපන්සියයත් සමග මහනිරයෙහි පැසෙන බැව් කියා තිබේ.

(11) අජාසත්රජු දෙව්දත් තෙරුනට උවටැන් කෙළේ පින් සලකා නොවන බවත්, පින් තකා නොව උවටැන් කළත් කාගෙත් බණ ඇසුවක් වරද නොවන බවත් ඇතැම්හු කියති. එහෙත් මේ සලකා බලමු "අථ ඛො අජාතසත්තු කුමාරො දෙවදත්තස්ස ඉමිනා ඉද්ධිපාටිහාරියෙන අභිප්පසන්නො පඤ්චහි රථසතෙහි සායං පාතං උපට්ඨානං ගච්ඡති. පඤ්ච ච ථාලිපාකසතානි භත්තාභිහාරං අභිහරියති." මේ දැක්වෙනුයේ චූලවග්ගපාළියෙහි ය. 'ඉක්බිත්තෙන් අජාසත්රජ තෙමේ දෙව්දතුගේ මේ සෘද්ධි ප්‍රාතිහාර්යයෙන් මැනැවින් පැහැදුණේ, රථ පන්සියයකින් උදය සවස උවටැනට යයි. පන්සියය තලියකින් භක්තාභිහාරය පමුණුවනු ලබයි' මේ එහි සිංහල යි. "රාජා මහාජනස්ස කථං සුත්වා පඤ්චථාලිපාකසතානි නිහරාපෙත්වා න පුන තස්සු'පට්ඨානං අගමාසි. නාගරාපිස්ස කුලං උපගතස්ස භික්ඛාමත්තම්පි න අදංසු." මේ දැක්වෙනුයේ දම්පියා අටුවාහි ය (අජාසත්) රජ තෙමේ 'දෙව්දතු පාපියෙකැ' යි යන මහාජනයාගේ කථාව අසා, බත් වසුන් පන්සියය නවත්වා, නැවත ඔහුට උපස්ථානයට නො ගියේ ය. නුවර වැස්සෝ ද පිඬු පිණිස ආ ඔහුට පිණ්ඩපාත පමණකුදු නුදුන්හ.' මේ එහි සිංහල යි දෙව්දතුගේ ඉද්ධි පෙළහරින් පැහැදුණු රජු, පින් තකා ම ඔහුට උවටැන් කළ බව පින් පෙනේ. දෙස් දුටු තැන පින් තකා හෝ කිසි උවටැනක් නො කෙළේ ය. නුවර වැස්සෝ පින් සලකා ම දෙන පිණ්ඩපාතය පමණ වත් නුදුන්හ. මේ අනුව ඒ කියුම බැහැර වෙයි.

(12) මේ අතර තවත් මතයක් ඉදිරිපත් වෙයි. 'දුසිල් බව දැන දැන පින් තකා සිවුපසයෙන් උවටැන් කිරීමෙන් දහම් ඇසීමෙන් දායකයෝ අපායගත නො වෙත්.' මේ ඒ අදහස යි. දැන් ඒ සලකා බලමු. දුශ්ශීලඋපස්ථානයෙන් උපදනා දානචේතනාව කුසල් ය. ඔවුන්ගෙන් දහම් ඇසීමේ දී උපදනා ශ්‍රවණචේතනාව ද කුසල් ය මේ ඇත්තකි. කුසල හේතුවෙන් අපායගත නොවන බව ඔවුහු කියති. දැන් මේ සලකන්න.

දායකයෝ දන් දෙනු පිණිස ශ්‍රමණදුශ්ශීලයන් වෙත යති. ඔවුන්ගේ බණින් ලැදියාව පහදති. ඔවුන් කෙරෙහි බැඳෙති. එය ම අපායට මඟයි. ඉන්පසු සෙසෙමේ ඔවුන් පිළිකුල් නො කරති; සේවනය කරති; භජනය පයිරුපාසනය කරති. ඔවුන්ගේ අවවාද ගෙන දෘෂ්ට්‍යානුගතියට වැටෙති. නො පිදියයුතු තැන පුදති; ඔවුන් ආයු කයති. මේ ඇප්‍රේව මහාසාවද්‍ය අකුසල යි. මේ කර්ම ඔහු වෙත වැඩේ ද නො වැඩේ ද යි බලන්න.

(14) "දසසනම්පහං භිකඛවෙ, තෙසං භිකඛූනං අනුසාවකං වදමි" යි ශ්‍රමණදුශ්ශීලයා දැකීම් පටන් කොට ඇති සියල්ල අනර්ථ එලවන බව වදාළහ. දුසිලුන් වෙත යාමෙන් ඔවුනට දන් දෙන්නටත් බණ අසන්නටත් සිදු විය. ඒ හේතුවෙන් යට සඳහන් අට වැදෑරුම් අකුසල් වැඩිණ. පළමු පළමු කුසල චේතනා පසු පසු අකුසල චේතනාවන්ට ප්‍රත්‍යය වෙයි. "පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං කෙසඤ්චි උපනිස්සය පච්චයෙන පච්චයෝ" යි අනන්ත නය සමන්ත මහාපට්ඨාන ප්‍රකරණයේ නිද්දේස වාරයෙහි වදාළේ එය යි. පළමු පළමු කුසල චේතනා පසු පසු ඇතැම් අකුසල චේතනාවන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වනබව ඉන් කියැවෙයි. අකුසලයට හේතු වන කුසලයක් ඇත් නම්, කුසලයට හේතු වන අකුසලයක් ද විය යුතු ය. කුසලාකුසල මිශ්‍රිත කර්ම කටයුතු බව බුද්ධරජාණන් වහන්සේ නො වදාළසේක "න තෙ පසංසනති පරිතාපසෙඤ්ඤ" යනාදින් එබඳු කර්ම නො කළයුතුබවට ද උපදෙස් දුන් සේක.

(15) "චත්තාරිමානි භිකඛවෙ, කම්මානි, කතමානි චත්තාරි? කණ්හං කණ්හවිපාකං, සුක්කං සුක්කවිපාකං, කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං, අකණ්හංසුක්කං අකණ්හංසුක්කවිපාකං" යි කර්ම සිවු කොටසකට බෙදා වදාළහ.

i අකුසල විපාක වූ අකුසලකර්මය
ii කුසල විපාක වූ කුසලකර්මය
iii කුසලාකුසල විපාක වූ කුසලාකුසල මිශ්‍රකර්මය
iv කුසලාකුසල විපාක නො වූ කුසලාකුසල නොවිනකර්මය

මේ ඒ කර්ම සතර කොටස යි. මේ අනුව ශ්‍රමණ දුශ්ශීල ඇශ්‍රයෙන් ඇති වන්නේ සාවද්‍ය කණ්හසුක්ක මිශ්‍රිත කර්ම යි

(16) "චතූහි භිකඛවෙ, - පෙ - එවං නිරයෙ, කතමෙහි චතූහි? සාවජ්ජෙන කායකම්මෙන සාවජ්ජෙන වචීකම්මෙන සාවජ්ජෙන මනොකම්මෙන සාවජ්ජාය දිට්ඨියා" යනාදීන් වදාළ දේශනය අනුව සාවද්‍ය කාය වචී මනඃ කර්මයෙන් සාවද්‍ය දෘෂ්ටියෙන් අපායගාමී වනබව සැලකියයුතු ය. පින් තනා කරන දුසිල් උවටැනින් මේ සතර කරුණ ම සිදුවෙයි. එහෙයින් මෙය නුවණින් සලකත් වී.

(17) දන් දෙන පිණිස සතුන් මරා පින් තකා මස් දන් දීමෙහි මද අනුසස් නැත්තේ නො වේ. දන් දෙන පිණිස හොරකමින්, බොරුවෙන්, රහමෙර වෙළඳාමෙන් ධන උපයා පින් තකා දන් දීමෙන් මද අනුසස් නැත්තේ නො වේ. එහෙයින් ඒ කළයුතු යයි කිවයුතු නො වේ ද?

(18) ඔක්කාක රජ සමයේ බ්‍රාහ්මණයෝ අස්සමේධ පුරිසමේධාදී යාග කළහ; සබ්බසතක සබ්බසහස්සාදී දන දුන්හ. මෙයින් ද මද කුසල් නැත්තේ නො වේ. එහෙයින් බුදුනු සැදැහැතියනට ද එවැනි යාගයන් කරන ලෙස කිව යුතු නො වේ ද?

(19) "සෙය්‍යො අයොගුළො භුත්තො – තත්තො අග්ගිසිඛූපමො
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො – රට්ඨපිණ්ඩං අසඤ්ඤතො"

සැදැහැයෙන් දෙන පසය අයිති සිල්වතුනට ය. එවැනි පසය දුසිල් ව පරිභෝග කොට පරලොව අපා දුක් විඳිත්. සිල්වතුනට අයත් පසය පින් සලකා දුසිලුනට දීමෙන් පිනක් ම වේ නම්, සැදැහැ සිතින් පින් සලකා සුරා සොඬුනට මද්‍යදානයෙන් පින් සිදු විය යුතු නො වේ ද? ලෝකයේ මද්‍යදානය පුණ්‍ය සම්මත වුවක් නො වේ ද? [64]

(20) සතුන් මැරීම් ආදී පව් කම් කොට පින් සලකා දන් දෙන දායකයෝ අපායගාමී වන බැව් සැලකියයුතු ය. එසේ ම පින් සලකා දුසිල් මහණුන් පුදන දායකයෝ ද අපායගාමී වන බැව් ද සැලකිය යුතු ය.

(21) පෙර බමුණෝ ගවමසට ලොල් වූහ. "මහාරාජ ගොමෙධයඤ්ඤං යජස්සු. එවං තෙ බ්‍රහ්මලොකස්ස මග්ගො විසුද්ධො භවිස්සති..... එවං හි තෙ යජතො ඤාතකුලපරිවට්ටා සග්ගෙ උප්පජ්ජිස්සන්ති" යි රජු යාගයට පෙළඹවූහ. ගවයන් මරා යාග යැදීමෙන් බඹලොව මග එළිවන බවත්, ඔහුගේ සත් කුල පරපුර දක්වා දෙව්ලොව උපදින බවත් රජුට දන්වූහ. ඔක්කාක රජ බමුණු වදන් ඇදහී ය. ඔහු සැප ලබනු පිණිස සිය දහස් ගණන් ගවයන් මරා යාග යැදී ය. පින් සලකා බමුණන්ට ගව මස් දන් දුන්නේ ය. අවසානයේ දී හෙතෙමේ අපායගාමී වූයේ ය. පසයට ලොල් ව දුසිල් මහණුන් කියන බසට පැහැද ඔවුන් පුදන දායකයන් අපායගාමී වන බව මේ අනුව ද සැලකියයුතු ය.

(22) සුරා සොඬුනට මත්පැන් දී දායක ප්‍රතිග්‍රාහකයෝ අපායගත වෙත්. පසය අනුදන වදළේ සිල්වතුනට ය. දුසිලුනට සිවුපසය අයත් නැත. ඒ ඔවුනට දුක පිණිස පවතියි. පින් පතා දුසිලුනට පසය පුදන දායකයෝ ඉන් දුකට වැටෙත්. තමනට අයත් නැති පසය ලබන ප්‍රතිග්‍රාහකයෝ ඉන් අපායගත වෙත්.

(23) දෘෂ්ටානුගතියට යෑම බැදි දුශ්ශීලසේවනය කිරීමෙන් පමණක් නැතැ යි තවත් මතයෙකි. පින් තකා දුසිලුන් සේවිය යුතු ය යි බුදුරජාණන් වහන්සේ නො වදාළසේක. දුශ්ශීල අලජ්ජී සේවනයෙන් භජනයෙන් දෘෂ්ටානුගතියට පැමිණෙන බව ම වදාළ සේක. "න එවරූපස්සාහං කස්සප, ථෙරස්ස භික්ඛුනො වණ්ණං භණාමි. තං කිස්ස හෙතු? සත්ථා පිස්ස වණ්ණං භණතීති අඤ්ඤෙ නං භික්ඛූ භජෙය්‍යුං, යෙ නං භජෙය්‍යුං, ත්‍යාස්ස දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං, තෙසං තං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛාය, තස්මාහං කස්සප, එවරූපස්ස ථෙරස්ස භික්ඛුනො න වණ්ණං භණාමි." මේ අංගුත්තර තිකනිපාතයෙහි ශ්‍රමණවර්ගයෙහි. කාශ්‍යපය, (ශික්ෂාවෙහි නොකැමැති වන, අලුත් ශික්ෂාවෙහි, නොපිහිටුවන, ශික්ෂා පුරන්නවුන්ගේ ගුණ නොකියන) මෙබඳු ස්ථවිර භික්ෂුවගේ ගුණ මම නො කියමි. කවර හෙයින් ද? ශාස්තෲන් වහන්සේ ඔහුගේ ගුණ වණන සේකැ යි අනෙක් භික්ෂූහු ද ඒ භික්ෂුව භජනය කරන්නාහු ය. යම් කෙනෙක් ඒ අලජ්ජී භික්ෂුව සේවනය භජනය කරත් ද, ඔවුහු ඔහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙන්නෝ ය. යම් කෙනෙක් ඒ අලජ්ජී භික්ෂුවගේ දෘෂ්ටානුගතියට පැමිණෙත් ද, ඔවුනට එය දිගු කලක් අහිත පිණිස අපාය දුක් පිණිස පවතින්නේ ය. කාශ්‍යපය, එහෙයින් මම මෙබඳු අලජ්ජියාගේ ගුණ නො කියමි.' මේ එහි සිංහල යි.

(24) බුදුරජාණන් වහන්සේ දුශ්ශීලසමාගමයෙහි ආදීනව නොයෙක් ලෙසින් දක්වා වදාළ සේක. ගෙට සිඟා පැමිණි දුසිලුන්ට වුව ද හිඟමින් දියයුතුබව එසේ ම වදාළ සේක. සීහ සේනාපති උපාලි ගෘහපති ආදීන්ට මේ බැව් වදාළසේක. අටුවාචාරීන් වහන්සේ ද "දානං නාම න කස්සචි නිවාරිතං" යි කවරකුට වුව ද දන් දීම නො වැළැක්වූහ. සාරත්ථප්පකාසිනී නම් සංයුත්තනි අටුවාහි යාචකයන් වශයෙන් පැමිණි දුශ්ශීලයනට ද පිඬු දියයුතුබව දක්වා ඇත.

(25) සිල්වත් ගුණසම්පන්න භික්ෂූන් වහන්සේ භික්ෂුශීලය මැනැවින් රකිත්. එමගින් තමන් වහන්සේටත් සදේවක ලෝකයා-ටත් හිත වැඩ සලසත්. සබ්‍රහ්මචාරීනටත් ශිෂ්‍ය උපස්ථායකාදීනටත් වැඩ කැමැති භික්ෂූන් වහන්සේ ශීලයෙහි ම සම්පූර්ණකාරී වන සේක. මෙහි දී ආකංඛෙය්‍ය සූත්‍රය ද සවිස්තර ව සලකත් වා.

"වුත්තං හෙතං භගවතා යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ සීලසම්පන්නා සමාධි - පඤ්ඤා - විමුත්ති - විමුත්තිඤාණදස්සන සම්පන්නා දස්සනම්පහං භික්ඛවෙ, තෙසං භික්ඛූනං බහුකාරං වදාමි. සවනං අනුස්සතිං - අනුපබ්බජ්ජං - උපසංකමනං - පයිරූපාසනම්පහං භික්ඛවෙ, තෙසං භික්ඛූනං බහුකාරං වදාමි."

(ආකංඛෙය්‍ය සූත්‍ර අටුවා)

මේ දේශනය අනුව සිල්වතුන් දැක්ම ද හිත සුව පිණිස ම හේතු වන්නකි. සිල්වතුන් වහන්සේගේ වචන ඇසීම හිත සුව පිණිස වෙයි. එතුමන් ගුණ සිහිකිරීම හිතසුව පිණිස වෙයි. අනුව පැවිදි වීම හිතසුව පිණිස වෙයි. සමීපයට එළඹීම හිත සුව පිණිස වෙයි. එතුමන්ගේ සත් ක්‍රියාවන්ට ඇලුම් කිරීම සග මොක්සුව පිණිස ම වෙයි.

"තෙසං තං හොතීති තෙසං සම්මා සම්බුද්ධාදයො සෙවනානං විය තං සෙවනං දීඝරත්තං හිතාය සුඛාය හොති" යි පුග්ගල පඤ්ඤත්තිප්‍රකරණ නිකමර්ණනාවෙහි එයි. බුදුරජාණන් වහන්සේත්, අගසවු මහසවු උතුමෝත් ඇසුරු කළ අපමණ පිරිසට සෙත වැඩ සැලසුන එසේ ම සිල්වත් භික්ෂූන් වහන්සේගේ ඇසුර ද බොහෝ කලක් හිතසුව පිණිස ම වෙයි.

යො හි ඉමං දුස්සීලාදීනව නිද්දෙසං සතතං සුණාති සො
දුස්සීලු'පායභයදස්සී ගූථාදිං'ව ජිගුච්ඡති සීලෙ

නවවැනි පරිච්ඡේදය නිමි.

# දසවැනි පරිච්ඡේදය

---

පබ්බජ්ජා සා ච කො තස්සා දායකො කො ච ගාහකො
දානාකාරො ච කො තීසා තස්සීලක්ඛණ කථං ඉති
ඉදං පඤ්චවිධං පඤ්හං ඤාතබ්බං ඉධ විඤ්ඤුනා.

මේ සාමණේර ශීලනිර්දේශයෙහි පැවිද්ද කවරේ ද? ඒ දෙන්නේ කවරෙක් ද? ඒ ගන්නේ කවරෙක් ද? ඒ දෙන අයුරු කෙසේ ද? ඒ පැවිද්ද පිළිබඳ ශීලය කුමක් ද? මේ පස් වැදෑරුම් පැනය නුවණැත්තන් විසින් දතයුතු ය.

සාමණේරශීලය පිළිබඳ කුසලතාව සඳහා මෙහි විස්තර දතයුතු ය.

(1) එහි පැවිද්ද කවරේ ද?

"අනුජානාමි භික්ඛවෙ, තීහි සරණගමනෙහි සාමණේර පබ්බජ්ජං" යනුමෙන් මහණෙනි, ත්‍රිවිධ සරණාගමනයෙන් සාමණේර පැවිද්ද අනුදනිමි' යි වදාළසේක. ඒ සරණාගමනසමාදානයෙහි උපදනා ශ්‍රද්ධාපූර්වංගම කාමාවචර කුසලචේතනාව පැවිද්ද යි. එ හෙයින් "පබ්බජ්ජා හි සරණගමනෙනෙව සිද්ධා" යි පැවිද්ද සරණගමනයෙන් ම සිද්ධ වන බව දක්වෙයි. සාමණේර පැවිද්ද මැනැවින් පිරිමට ඒ පිළිබඳ සිකපද හොඳින් දතයුතු ය. පෙළ පරිදි උගත නොහැකි නම්, පහසු අන් බසකින් හෝ ඒ හොඳින් උගතයුතු ය.

---

(2) ඒ දෙන්නේ කවරෙක් ද?

"අනුජානාමි භික්ඛවෙ, ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන දසවස්සෙන වා අතිරෙකදසවස්සෙන වා උපසම්පාදෙතුං නිස්සයං දාතුං" යි එය වදාළහ. උපාධ්‍යායග්‍රහණය දී උපසපන් කරවන්නාවූත් නිස දෙන්නාවූ අවසර දී වදාළේ ව්‍යක්ත ප්‍රතිබල ස්ථවිර භික්ෂූන් වහන්සේට ම ය. මේ අනුව පැවිද්ද දෙන්නේ ද ව්‍යක්ත ප්‍රතිබල ස්ථවිර භික්ෂූන් වහන්සේ ම ය. ඒ ස්ථවිර භික්ෂූන් වහන්සේ උද්දේශ පරිපුච්ඡායෙහි යෙදී ඊට අවකාශ නො ලබා නම්, 'ඇවැත්නි, මොහු පැවිදි කළ මැනැවැ' යි නවක භික්ෂු නමකට නියම කළයුතු ය ඒ ස්ථවිරයන්ගේ අණ ලත් නවක භික්ෂු නම ද පැවිද්ද දීමට සුදුසු ය. එසේ අණ නොලත් කල සිය උපාධ්‍යායන් උදෙසා පැවිද්ද දීමට ද නවක භික්ෂුවට හැකි ය. නවක භික්ෂුවක් නැති කල 'මොහු සිමාවට ගෙන ගොස් පැවිදි කළ මැනවැ' යි සාමණේර තෙමේද කියන්නට වේ. සරණ දානය ආචාර්යයන් විසින් ම කටයුතු ය. එසේ කල භික්ෂුව

විසින් ම පැවිදි කරන ලද්දේ වෙයි. මේ අනුව සරණදානය භික්ෂුව විසින් ම කළයුතු ය. සිවුරු පෙරවීම භික්ෂුව විසින් හෝ අණ ලද සාමණේර කෙනකුන් විසින් හෝ කළයුතු ය. කෙස් රැවුල් හැරවීම කිසිවකු විසින් කළයුතු ය.

(3) එහි පැවිද්ද ලබන්නේ කවරෙක් ද?

"න භික්ඛවෙ, පඤ්චහි ආබාධෙහි ඵුට්ඨො පබ්බාජෙතබ්බො" යි කුට්ඨිකාදි[65] යන පසස් පුද්ගලයන් පැවිදි නොකළ යුතු බව වදරා තිබේ. පැවිදි දෙස් රහිත, මවු-පියන් විසින් අනුදන්නා ලද කුලපුත්‍රයා ම පැවිද්දට සුදුසු ය. "අනුජානාමි භික්ඛවෙ, ඌන පණ්ණරසවස්සං දාරකං කාකුඩ්ඩෙපකං පබ්බාජෙතුං" යි වදාළෙන් ආහාරපාත්‍රයෙහි කවුඩන් එළවීමට දත් උනු පසළොස් වයස් ළදරු පවා පැවිද්දට සුදුසු ය "පණ්ඩකො භික්ඛවෙ, අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො" යි පණ්ඩකයා උපසපන් නොකළයුතු බවත්, උපසපන් ව සිටි නම් ලිංගනාශනයෙන් නැසියයුතු බවත් වදාළහ. පණ්ඩකයා පමණක් නො ව, සෙසු උභතොබ්‍යඤ්ජනකාදී දශ දෙන ද මෙසේ ම අභව්‍ය වෙත්. උනු විසි වස් පුද්ගලයාත් (ඌන වීසතිවස්ස), පාරාජිකා වූවහුත් (අන්තිමවත්ථුඅජ්ඣාපන්න) උපසපන් කිරීමට ඉඩක් නැත. පැවිදි නොකළ යුතු ය යි වදාළ කුට්ඨිකාදී දෙසාළිස් දෙනා පැවිදි කොට උපසපන් කළ හොත් ඔවුනට උපසම්පදාව මැනැවින් පිහිටයි. එහෙයින් ඔවුහු සුමෝසාරිතයෝ ය. පණ්ඩකාදී අභව්‍ය එකොළොස් දෙනා දුමෝසාරිතයෝ ය. "සබ්බෙ සංඝො උපසම්පාදෙති සූපසම්පන්නො" යි සංඝයා සුමෝසාරිතයා උපසපන් කළ හොත් ඔහුට උපසම්පදාව පිහිටන බව වදාළ සේක.[66]

(4) එහි පැවිද්ද දෙන අයුරු කෙ සේ ද?

"එකොපි කුලපුත්තො සාසනෙ පබ්බජිත්වා සකලං සාසනං සොභෙස්සති" යි එක් ම කුලපුත්‍රයෙක් ශාසනයෙහි පැවිදි ව පංච වර්ග සංඝයා ලැබ සකල සර්වඥශාසනය අහස්ගත පුන්සඳ මෙන් බබලවන බව කියැවෙයි. "සොධෙත්වා පබ්බාජෙතබ්බො, සොධෙත්වා උපසම්පාදෙතබ්බො" යි ශුද්ධ කොට පැවිදි උපසපන් කළයුතු බව මුලින් ම වදාළහ. එහෙයින් පැවිදි වනු කැමැති කුලදරුවා පැවිදි දෙස් විරහිත, මවු-පියන් අනුදත් කෙනකු බව මුලින් ම දතයුතු ය. "අනුජානාමි භික්ඛවෙ, සංඝං අපලොකෙතුං භණ්ඩුකම්මාය" යි කෙස් රැවුල් හරවනු වස් සීමස්ථ සංඝයා විචාරන්නට අනුදත් හෙයින් ඒ පණ්ඩුපලාශයා සීමාවට පැමිණවියයුතු ය. සීමස්ථ සංඝයා වෙත උත්කුටුක ව ඇඳිලි බැඳ, "සංඝං භන්තෙ, ඉමස්ස දාරකස්ස භණ්ඩුකම්මං ආපුච්ඡාමි" යි තුන් යලක් විචාරා අවසර ගත යුතු ය. ඉක්බිති කෙස්

රැවුල් හරවා, කසා ගඳසුණු ඈ කිසිවක් උලා ගිහිගඳ පහ කොට නා එනු මිණිස පැත්තෙකට යවනු ලැබේ. නා පිරිසිදු ව පැමිණි පණ්ඩුපලාශ තෙමේ, මහ තෙරුන් ඉදිරියෙහි උත්කුටු ව ඇඳිලි බැඳ සිවුරු ද තබා ගෙන මෙසේ කියයි.

“සබ්බදුක්ඛ නිස්සරණනිබ්බානසච්ඡිකරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජේථ මං භන්තෙ, අනුකම්පං උපාදාය”

(ස්වාමීනි, සියලු දුක් නිවන නිර්වාණය සාක්ෂාත් කරනු පිණිස අනුකම්පාවෙන් මේ සිවුරු ගෙන මා පැවිදි කළ මැනැවි.)

මෙසේ තෙවරක් කියා මහතෙරුන් වහන්සේට සිවුරු පිළිගන්වයි. නැවත ඇඳිලි බැඳ පණ්ඩුපලාශ තෙමේ මෙසේ කියයි.

“සබ්බදුක්ඛ නිස්සරණනිබ්බාන සච්ඡිකරණත්ථාය එතං කාසාවං දත්වා පබ්බාජේථ මං භන්තෙ, අනුකම්පං උපාදාය.”

(ස්වාමීනි, සියලු දුක් නිවන නිර්වාණය සාක්ෂාත් කරනු පිණිස තෙල සිවුරු දී අනුකම්පාවෙන් මා පැවිදි කළ මැනැවි.)

තෙවරක් කියා පැවිද්ද ඉල්ලූ පසු තෙරුන් වහන්සේ ප්‍රව්‍රජ්‍යා-පේක්ෂකයාට සිවුරු දෙත්. උන්වහන්සේ හෝ සිවුරු හඳවත්. සිවුරු හඳවන ලෙස අන් භික්ෂුවකට හෝ අණ කරත්. සිවුරු හැඳ ගන්නා ලෙස ඔහුට ම හෝ කියත්. මේ තුන් ක්‍රමයෙන් කවර ආකාරයකින් සිවුරු දුන ද, ඒ තෙරුන් වහන්සේගේ දීමක් ම වන්නේ ය.

මෙසේ සිවුරු ලබා ගත් පසු අඳනය හැඳ, තනිපට සිවුර ඒකාංස කොට පොරවා, රැස් ව සිටි භික්ෂූන්ගේ පා වැඳ, ගුරුවරයා ඉදිරියේ උත්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තිසරණ සහිත පැවිදි දස සීලය සමාදන් වීමට සූදානම් විය යුතු ය.

වාක්‍යය කියා තිසරණ සහිත පැවිදි දස සීලය ඉල්ලා සිටිනු ලැබේ. ගුරුවරයා “යමහං වදාමි තං වදෙහි” යි කී කල පැවිදි වන තැනැත්තා “ආම භන්තෙ” යි පිළිතුරු දෙයි. ඉන් පසු නමස්කාර පාඨය කියයි. ඉක්බිති “බුද්ධං සරණං ගච්ඡාමි” යනාදී සරණාගමන පාඨය සිථිල ධනිතාදී [67] දසවිධ ව්‍යඤ්ජන සම්පත්තිය හා ස්ථාන කරණ සම්පත්තිය [68] නො පිරිහෙළා ඒ හා සම්බන්ධය ඇති ව අනුනාසිකාන්ත කොට ආචාර්යයන් විසින් කිවයුතු ය. නැතහොත් “බුද්ධම් - සරණම් - ගච්ඡාමි” යි විච්ඡේද කොට මකාරාන්ත ව හෝ කිවයුතු ය. අතවැස්සා ලවාත් එසේ ම කියවිය යුතු ය. මකාරාන්ත සරණාගමන පාඨය කියවන කලත් කියන කලත් වචන වෙන් වෙන් කොට කීම වැදගති. නො නවත්වා ඒකාබද්ධ කොට නො කියයුතු ය. නිග්ගහීතාන්ත සරණාගමන පාඨය ඒකාබද්ධ කොට කිවයුතු ය. මෙසේ උභතො ශුද්ධික තිසරණ සමාදානයෙන් [69] පණ්ඩුපලාශ තෙමේ සාමණේරභූමියෙහි පිහිටයි.

“සික්ඛාපදානි පන සරණාගමනෙනෙව ඉජ්ඣන්ති” යනුවෙන් ශික්ෂාපද සරණාගමනයෙන් ම සිද්ධ වනබව දක්වන ලදී. කී පරිදි කෙස් රැවුල් හැරවීම, සිවුරු දීම හා සරණ සමාදානය යන තුන් පියවර සම්පූර්ණ වීමෙන් පැවිද්ද සිදු වෙයි. මින් එක් පියවරක ද පැවිදි කිරීම යනුවෙන් වහර වෙයි.

දෑගුලකට අඩු දිගු කෙස් ඇති පණ්ඩුපලාසයන්ට හිස කෙස් කැපීම කිසක් නැත ද වරදක් නො වේ. එහෙයින් එබන්දන් භණ්ඩුකර්මය පිණිස අපලෝකනය නො කොට වුව ද පැවිදි කළ හැකි ය. භණ්ඩුකර්මය කළ ද, සම්පූර්ණ පා සිවුරු ඇත්තහු ම පැවිදි කළයුතු ය. පා සිවුරු නැත්තේ නම්, ඉල්ලා ගැනීමට හෝ විශ්වාසයෙන් ගැනීමට හෝ සුදුසු ය.

පැවිදි වනු වස් පා සිවුරු සපයමින් වෙහෙර සිටින පණ්ඩුපලාස තෙමේ අනාමිෂ විය ප්‍රණීතය ලබන්නට ද සුදුසු ය. තලු තැටියෙහි අනුභව කරන්නට ද සුදුසු ය. පෙරබතෙහි අනෙක් සාමණේරයනට ලැබෙන කොටසට සම අහර කොටසක් ලබන්නට සුදුසු ය පසුබතෙහි ගිතෙල් මීපැණි ඈ බෙහෙත් කොටස ලබන්නට ද සුදුසු ය.

පැවිදි වනු කැමැති කුලදරුවෝ මුලදී මහත් උනන්දුවක් දක්වත්. පසු ව කසාවත් දැක, හිස රැවුල් කරන පිහිය දැක බිය වෙත්. ඇතැම්විට එපමණකින් ම පැන යත්. එහෙයින් ඇදුරු තුමන් මේ අවස්ථාවේ දී ඉතා කාරුණික වීම ඉතා වැදගති. කෙස් රැවුල් හැරවීමෙන් පසු පැත්තොටට කැඳවා ගෙන ගොස් ‘ස්නානය කරනු මැනවැ’ යි කිවයුතු ය. ඇදුරු තුමන් ම ඔහු හිස කල්ක උලා සේදීම මැනැවි. ඉදින් ළදරු කුමරකු නම්, ඇදුරු තුමන් දියට බැස නහා සුණු ඔහු ඇඟ උලා මැනැවින් නැහැවීම සුදුසු ය. ඉදින් ළදරු ඇඟ කැසිලි පිලකාදිය ඇත් නම්, ඒ සියල්ල පිළිකුල් නො කොට කරුණාබර මවක සේ මැනැවින් නැහැවියයුතු ය. කවර හෙයින් ද? එබඳු උපකාරයෙන් කුලදරුවෝ ආචාර්ය උපාධ්‍යායයන් කෙරෙහි බලවත් ස්නේහ උපදවත්. බලවත් ගෞරව ඇත්තාහු මැනැවින් සසුන්හි ඇලෙත්. උපන් උකටලී දුරලා තෙර බවට පැමිණෙත්. කලගුණ දන්නෝ කෘතවේදී ගුණය මැනවින් පුරත්.

කෙස් රැවුල් කරවන කලත්, නහවන කලත්, කෙලෙස් වැඩෙන අමිහිරි අශාතික කථා නො කළයුතු ය. හිසකෙස් රොදක් ගෙන ඔහු අත තබා, “කෙසා - ලෝමා - නඛා - දන්තා - තචො” යන වපඤ්චක කර්මස්ථානය කරුණාවෙන් කියා දියයුතු යි. එහි නාව සිහි එළවන ලෙස කාරුණිකව කිවයුතු යි. මේ එහි ළිවෙළ යි.

යට සඳහන් පරිදි පණ්ඩුපලාශ තැනට සිවුරු දුන් පසු, ඒ ඔහුට හඳවන ලෙස අන් භික්ෂු නමකට හෝ සාමණේර කෙනෙකුට හෝ පැවරීම සාමාන්‍ය සිරිත යි. 'මේ සිවුරු හැද ගනු මැනැවි' යි ඔහුට ම පවරන්නට ද පුළුවනැ. මේ කවරක් වුව ද සුදුසු ය. එහෙත් ඇදුරු තුමන් අවසර නුදුන් කල ම කිසි යම් අදනයක් ඇත්තෙන් සිවුරක් පෙරවූව හොත්, ඒ ඉවත් කරවියයුතු යි ඒ සිවුරු පිළිගෙන හැඳවා ඔහුට දියයුතු යි.

සරණදානයෙහි ද සැලකිලිමත් විය මැනැවි. ඇදුරු තුමා ව්‍යඤ්ජනාදී සම්පත්තිය නො පිරිහෙළා කියයි. අතවැසි තෙමේ නො කියයි ඒ නො මැනැවි. ඉදින් අතවැසි තෙමේ මැනැවින් කියයි. ඇදුරු තුමා එසේ නො කියයි. එ ද නො මැනැවි. ඇදුරු අතවැසි දෙදෙන ම අක්ෂර සම්පත්තිය ඇති ව නො කියත්. එයත් නුසුදුසු ය. දෙදෙන ම මැනැවින් කීම මෙහි ඉතා වැදගත්. එක් අකුරකුදු පිරිහීමෙන් පැවිද්ද නො පිහිටන හෙයිනි. උපසම්පදාවෙහි කර්මවාක්‍යය මෙන් පැවිද්දෙහි සරණාගමන පාඨය ඉතා පිරිසිදු වියයුතු ය

(5) එහි ඒ පැවිද්ද පිළිබඳ ශීලය කුමක් ද ?

“අනුජානාමි භික්ඛවෙ, සාමණේරානං දසසික්ඛාපදානි. තෙසු ච සාමණේරෙහි සික්ඛිතුං. පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, අබ්‍රහ්මචරියා වෙරමණී, මුසාවාදා වෙරමණී, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී, විකාලභොජනා වෙරමණී, නච්චගීතවාදිත විසූක දස්සනා වෙරමණී, මාලාගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී, උච්චාසයන මහාසයනා වෙරමණී, ජාතරූප රජත පටිග්ගහණා වෙරමණී.”

සාමණේරයනට මෙසේ දසශික්ෂාවක් පනවා එහි හික්මීමට අනුදන්සේක. එහෙයින් මේ දසශීලය පැවිදිශීලය යි සාමණේර ශීලය යි. එහි “දසසික්ඛාපදානි”, “තෙසු ච සාමණේරෙහි සික්ඛිතුං” යි දශක දෙසක් වදළහ. ඒ දශශීලය හා දසසිඛ යි. “අනුජානාමි භික්ඛවෙ, දසහඞ්ගෙහි සමන්නාගතං සාමණේරං නාසෙතුං” යැ යි නැවත වදළහ.

i දූස දූස සතුන් මැරීම.
ii නුදුන් දෙය සොර සිතින් ගැනීම
iii තිරිසන්ගත මාගමක් හා ද මෙවුන් දම් සෙවීම
iv සිනාසෙන වචනයෙන් ද බොරු කීම
v පිණි බිඳක් පමණ ද රහමෙර පීම
vi බුදුන්ගේ නුගුණ කීම
vii දහම්හි නුගුණ කීම
viii සඟුන්ගේ නුගුණ කීම
ix මිසදිටු ගැනීම
x අෂ්ටවාචිකා උපසම්පදාව ලත් භික්ෂුණියක දූෂණය කිරීම

මේ දස අංගයෙන් යුත් සාමණේරයන් නසන්නට අවසර දුන්සේක. එහි "දසහඞ්ගහි" යැ යි දක්වා "නාසෙතුං" යැ යි වදළෙන් දසක දෙනක් පෙනේ. ඒ දසපාරාජිකා නම් දසනාසනා යි.

"අනුජානාමි භික්ඛවෙ, පඤ්චහඞ්ගහි සමන්නාගතස්ස සාමණේරස්ස දණ්ඩකම්මං කාතුං" යැ යි නැවත වදළහ.

i භික්ෂූනට අලාභ කරනු පිණිස උත්සාහ දැරීම
ii භික්ෂූනට අනර්ථය පිණිස උත්සාහ දැරීම
iii භික්ෂූන් සිටින ආවාසයෙන් නෙරපීමට උත්සාහ කිරීම
iv භික්ෂූනට ආක්‍රෝශ කිරීම
v භික්ෂූන් ඔවුනොවුන් බිඳවීම

මේ කරුණු පසෙන් යුත් සාමණේරයනට ආවරණදණ්ඩකර්මය කරන්නට අවසර දුන්හ. විකාලභෝජනාදී පංච අංගයෙන් යුත් සාමණේරයන ට ධර්මසංග්‍රාහක මහතෙරවරු අපරාධානුරූප පරිද්දෙන් වැලි, දිය, දර ඇදීමේ නියම කළහ. ආවරණදණ්ඩකර්මයට ඇතුළත් පංච අංගයත් සමග දස් දස දඬුවමක් පෙනේ. මෙසේ පංච දශකයන්ගේ වශයෙන් සාමණේරශීලය සම්පතේ ප්‍රභේද වේයි. එහෙයින් සාමණේර සිකාහි

"දසසීලා දසසික්ඛා - දසපාරාජිකාපි ච
නාසනා දණ්ඩකම්ම ච - පඤ්ඤාසා හොන්ති භෙදතො"
යි කීහ.

"පාණාතිපාතා වෙරමණී" යනාදී සිකපද දසය සමාදරයෙන් ගැනීමෙහි උපදනා කාමාවචර කුශලචිත්තසම්ප්‍රයුක්ත විරති චේතනා සහ තත් සම්ප්‍රයුක්ත ඵස්සාදී ධර්ම දසසීලය යි හික්මිය යුතු ධර්ම බැවින් එම දසශීලය ම දසසිඛ නම් වෙයි. නාසනාංග දසයේ දී උපදනා චේතනා සාමණේරභාවයෙන් පරදවන හෙයින් පාරාජික නම් වෙයි. එයින් ප්‍රාණඝාතාදී පළමු අංග පස ලිංගය (මහණ වෙස) නසා හැරෙන සත්වන හෙයින් 'ලිඞ්ගනාසනං' නමින් හැඳින්වෙයි. බුදුන්ගේ නුගුණ කීමාදී දෙවැනි අංග පස මහණ වෙස නසා ඉන් බැහැර කරවන හෙයින් 'සබ්බනාසනං' නමින් හැඳින්වෙයි. භික්ෂූනට අලාභය පිණිස උත්සාහ දැරීමාදී අංග පස, තමන් නිතර ලගින සෙනසුන හා ආචාර්ය උපාධ්‍යාය මෙහෙවර අවුරන හෙයින් 'ආවරණාඞ්ග' නමින් හැඳින්වෙයි. ඒ දෙතැනින් බැහැර කරවන හෙයින් සඟරමින් නෙරනාවන් යැයි ද කියනු ලැබේ.

i. විකාල් භෝජන
ii නැටුම් ගැයුම් වැයුම් විසුළු දැකුම
iii මල් ගඳ විලවුන් දැරීම, උනු තැන් පිරීම් වශයෙන් සැරසීම
iv උසසුන් මහසුන් දැරීම
v රන් රිදී මසු කහවණු පිළිගැනීම

යන මේ පංච අංගය වැලි ආදිය ගෙන්වා නැ මිළ ආදියෙහි දමවන හෙයින් වැලිදඬුවම් නමින් හැඳින්වෙයි. නැටීම් ආ පිළිබඳ විස්තර දෙවැනි පරිච්ඡේදයෙහි දක්වා ඇත.

ප්‍රාණඝාතාදී දශ පාරාජිකයන් අතුරෙන් එක්කුදු කරන සාමණේර තම ලිංගනාශනයෙන් නැසියයුතු ය. "සාමණේරො හි අනාමට්ඨො කුන්ථකිපිල්ලිකම්පි මාරෙන්තො මංකුණණ්ඩම්පි භින්දන්තො නාසෙතබ්බතංයෙව පාපුණාති. තාවදෙවස්ස සරණාගමනානි ච උපජ්ඣායග්ගහණඤ්ච සෙනාසනග්ගාහො ච පටිප්පස්සම්භන්ති, සංඝලාභම්පි න ලභති, ලිංගමත්තමෙව එකං අවසිට්ඨං හොති" මේ එය දක්වූ තැනි යි. හෙරණ තෙමේ යටත්පිරිසෙයින් කුරුකුහුඹු-වකු ද මරා, මකුණු බිජුවටකුදු බිඳ, ලිංගනාශනයෙන් නැසියයුතු බවට පැමිණෙයි. එකෙණෙහි ඔහුගේ සරණාගමනය බිඳෙයි. උපාධ්‍යායග්‍රහණය බිඳෙයි. වස් සමයක නම් වස් එළඹීම[70] ද සන්සිඳෙයි. සාංඝිකලාභය නො ලබයි. එක ම ලිංගය (මහණ වෙස) පමණක් ඉතිරි වෙයි[71]. ඉදින් ඒ හෙරණ තම දෙසින් ඔහුල නම්, මතු සංවරයෙහි නො පිහිටා නම් බැහැර කළයුතු වෙයි. ඉදින් ඔහු යළි සංවර වනු කැමැති නම්, එහි ලිංගනාශන කාර්‍යයක් නැත. හඳින ලද අඳනය පොරවන ලද පොරෝනය ඇති ඒ සාමණේරයන් හට ම සරණය දියයුතු ය. උපාධ්‍යාය ග්‍රහණය කරවියයුතු ය. ශික්ෂාපද වනාහි සරණාගමනයෙන් ම සිද්ධ වෙයි. භික්ෂුවට උපසම්පදා මාලකයේ දී චතුපාරිසුද්ධිශීලය පිහිටියාක් මෙන් සාමණේර නමට සරණසමාදානයෙන් දශශීලය ද පිහිටියේ වෙයි. එහෙත් දඬු කරනු පිණිසත් මතු සංවර කරනු සඳහාත් නැවත දශ සිල් දියයුතු ය. ඉදින් පෙරවසෙහි නැවත සරණ සමාදානය ලද නම්, හේ පසුවස වස්සාවාසිකය ලබයි. පසුවස සරණ සමාදානය ලද නම්, සංඝයා විසින් අපලෝකන කර්මයෙන් (ඔවුනොවුන්ගේ කැමැත්තෙන්) ලාභය දියයුතු යි.

තණක් පමණකුදු නුදුන් දෙය සොර සිතින් ගැනීමෙන් හෙරණ තෙමේ පරිජි වෙයි: තුන් මගින් කිසියම් මෙහෙන වරදවා පිළිපැදීමෙන් පරිජි වෙයි. සිතාසෙන අඳහසින් හෝ බොරුවක් කීමෙන් පරිජි වෙයි: බිඳක් පමණකුදු රහමෙර පීමෙන් පරිජි වෙයි, අශ්‍රමණ වෙයි. ලිංගනාශනයෙන් නැසිය යුත්තෙක් වෙයි. විකාලභෝජනාදී අවශේෂ පංච ශික්ෂාපදයන් අතුරෙන් යමක් බිඳුණු කල ලිංගනාශනයෙන් නැසියයුතු නො වේ. වරදට සුදුසු දඬුවම් පමුණුවා මතු සංවර පිණිස නැවත සිකපද දියයුතු ය.

හෙරණ තෙමේ නව අරහාදී ගුණයන්ට ප්‍රතිපක්ෂ ව බුදු රදුන්ගේ නුගුණ කියයි. ස්වාක්ඛාතාදී ගුණයන්ට ප්‍රතිපක්ෂ ම ධර්මයේ නුගුණ කියයි. සුපටිපන්නාදී නව ගුණයන්ට ප්‍රතිපක්ෂ ව සංඝයාගේ නුගුණ

කියයි. මෙසේ තෙරුවන් ගරහන භෙරණ තැන ආචාර්ය උපාධ්‍යාය යන් විසින් 'එසේ නො කියව' යි වැළැක්වියයුතු යි. ඉදින් තුන්වැනි වර දක්වා අවවාද දුන් කල ලබ්ධිය හරී නම්, දඬුවම් පමුණුවා, ගණ මැදට ගෙන "අච්චයො මං භන්තෙ අච්චගමා" යනාදින් වරද දෙසවියයුතු යි. අවවාදයට නො නැමේ නම්, ලිංගනාශනයෙන් නැසියයුතු යි. සිවුරු කඩවා, සුදුවතින් නෙරපියයුතු යි. ශාශ්වත උච්ඡේද දෘෂ්ටික සාමණේරයන් කෙරෙහි ද මේ ක්‍රමයෙන් ම පිළිපැදිය යුතු යි.

භික්ෂුණී දූෂක භෙරණ නියමයෙන් අබ්‍රහ්මචාරී ග්‍රහණයෙන් ම ගනියි. එහෙත් මතු සංවරයෙහි පිහිටනු කැමැති අබ්‍රහ්මචාරික භෙරණ සරණ සමාදන් කරවා උපසම්පදා කරන්නට සුදුසු ය. භික්ෂුණී දූෂක භෙරණ මතු සංවරයෙහි පිහිටනු කැමැති වුව ද, හේ පැවිද්ද නො ලබයි. උපසම්පදාව කියනුම කිම? මේ දක්වනු පිණිස 'භික්ඛුණී දූසකො' යන දස වැනි අංගය වෙන් කොට වදරන ලද යි දතයුතු.

"අංගිසමාචාරිකෙසුපි විනෙතබ්බොති ඉමිනා සෙඛියවත්තඛන්ධකවත්තෙසු අනෙකේසු ච සුක්කවිස්සට්ඨිආදි ලෝකවජ්ජසික්ඛාපදෙසු ච සාමණෙරෙහි වත්තිතබ්බං" යනු සමන්තපාසාදිකා අටුවා වචන යි. සේඛියා හා ඛන්ධ වත්හි මෙන් ම අනෙකුදු සුක්කවිස්සට්ඨිකාදි ලෝකාවද්‍යශික්ෂාවන්හි සාමණේරයන් හික්මිය යුතු බව ඉන් පෙනේ. එහෙයින් දුෂ්කෘතාපත්ති සකන්ධය සම්බන්ධ ව උද්දේශාගත නයින් කියන ලද ලෝකාවද්‍ය පණ්ණත්ති සේඛියා ශික්ෂාවන්හි හික්මියයුතු ය ක්ෂුද්‍රවත්හි හික්මියයුතු ය. සුක්කවිස්සට්ඨිකා, කායසංසග්ග, දුට්ඨුල්ලවාචා, අත්තකාමපාරිචරිය, අමූලකචෝදනා, කිඤ්චිදෙසලෙස, සංඝභේද, භේදානුවත්තක, දුබ්බච, කුලදූසක යන සංඝාදිසේසයන්හි හික්මියයුතු ය. අඤ්ඤවාදක, අත්තපරිණාමන නිසගි දෙක්හි හික්මියයුතු ය. මුසාවාද,[72] ඕමසවාද, උජ්ඣාපනක, ඛීයනක, අනුපඛජ්ජනිසජ්ජ, නික්කඩ්ඪනක, ආමිසහෙතු, අභිහට්ඨුංපවාරණ, උය්‍යෝජන, සභෝජනකුල, රහෝනිසජ්ජ, දුතියරහෝනිසජ්ජ, උය්‍යුත්තදස්සන, උය්‍යෝධික, සුරාපාන,[73] අඞ්ගුලිපතෝදක, උදකහසධම්ම, අනාදර, භිංසාපන, අපනිධාන, පාණජීවිතාවෝරෝපණ[74], උක්කොටන, දුට්ඨුල්ලපටිච්ඡාදන, දිට්ඨිඅප්පටිනිස්සජ්ජන, උපලාලන, සික්ඛාපදවිවණ්ණක, මෝහනක, පහාරදාන, තලසත්තික, අමූලක, කුක්කුච්චුප්පාදන, උපස්සුති, කම්මපටිබාහන, ඡන්දඅදාන, ඛීයනක, ලාභපරිණාම යනාදී ශුද්ධ පචිති සිකපදයන්හි හික්මියයුතු ය. සුත්තවිභංගාගත ද සිත් මෙහි විස්තර කොට ඇති සම සතළිස් දුර්භාෂිත ශික්ෂාවන් ඛන්ධකාදියෙහි ම ඇතුළත් හෙයින් සාමණේරයන් විසින් ඒ සියල්ල ද රැකියයුතු ය. "කාමං පන අචිත්තකානං අලජ්ජී දණ්ඩකම්මාරහොව හොතීති දස්සෙති" යි දැක්වූ පරිදි එහි නොපවතින භෙරණ අලජ්ජියෙක් වෙයි දඬුවමට නිසියෙක් වෙයි. මෙසේ දැක්වුණු

එක් සිය හව හැත්තෑ ශික්ෂාවන් [75] රකින සාමණේර තැන වැලි, දිශ, දශ දඬුවමට සුදුසු ය.

සාමණේරසීලය, ආදිබ්‍රහ්මචරියක - අභිසමාචාරික යනුවෙන් දෙවැදෑරුම් වෙයි. නැවත චාරිත්‍ර, වාරිත්‍ර යැ යි දෙවැදෑරුම් වේ. සම්පූර්ණ ප්‍රභේද දශශීලය, මාර්ග බ්‍රහ්මචර්යාවට ආදි හෙයින් ආදිබ්‍රහ්මචරියක නම් වෙයි. ඉතිරි සියලු ශික්ෂා කොටස අභිසමාචාරික ශීලය යි. මේ කළ යුතු යැ යි වදාළ දෙය කිරීම චාරිත්‍රශීලය යි. මෙය නොකළයුතු යැ යි වදාළ දෙයින් වැළකීම වාරිත්‍රශීලය යි. ඒ කළ යුත්ත නොකිරීමෙනුත් නොකළ යුත්තෙහි නොවැළකීමෙනුත් වත්තභේදක දෝෂය වෙයි. ශික්ෂාභේදයෙන් එක්සිය සවාසූ ප්‍රභේදයට පැමිණි මේ ශීලය, සාමණේර ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය යි. ඉන්ද්‍රියසංවරය, ආජීවපාරිශුද්ධිය හා ප්‍රත්‍යය සන්නිශ්‍රිතය වදාළේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙහි ම චිරස්ථිතිය පිණිස ය. එහෙයින් ඒ තුන් සිල්හි පිහිටි මහණහු පැවිද්දන්ගේ ප්‍රාතිමෝක්ෂසංවරය චිරස්ථායී වෙයි. එහි විස්තර 4 – 5 – 6 වැනි පරිච්ඡේදයන්හි කී සෙයින් දත යුතු.

සර්වඥශාසනයෙහි පැවිදි වනු කැමැති කුලදරුවකු ලත් තෙරුන් වහන්සේ යට සඳහන් පරිදි පැවිදි කරත්. උපාධ්‍යායග්‍රහණය කරවත්. දයාබර පියාණ කෙනකුත් සිය පුතු ඇති දැඩි කරන්නාක් මෙන් තමන් සමීපයෙහි හැසිරෙන්නකු කොට මැනැවින් හික්මවත්. හික්මිය යුතු දේ දැන ගන්නා තුරු, පා සහළ සිවුරු දැරීම හිඳීම් ආදියෙහි දක්ෂයකු වන තුරු, භෝජනශාලාවකට නො යවත්. සලාක බෙදන තැනකට නො යවත්. අනෙකුත් එබඳු තැනකට දේ නො යවත්. සමීපයෙහි ම හැසිරෙන්නකු කොට හික්මවත්.

මෙසේ ඒ සාමණේර නමට පරාමාස අපරාමාසාදි සියලු නැප නොනැප දෙය කියා දියයුතු ය. ඇඳීම් පෙරවීම් ආ කුඩා අනුකුඩා වත්හි හික්මවියයුතුය. සත් වැනි පරිච්ඡේදයෙහි සඳහන් කළ සියලු මිශ්‍රක සංග්‍රහය ද මෙහි ලා සැලකියයුතු.

මේ දක්වා සාමණේර ශීලයත් ඒ පිළිබඳ විපත්තිත් දක්වන ලදී. දැන් එහි විපත්තිදෝෂ සලකා බලමු. හෙරණසිඛ විනිශ්චයෙහි මෙසේ දක්වෙයි.

“මෙසේ දක්වන ලද මේ දශ පරිච්ඡේදයන් එකකුදු වත්නේ දුස්සීල වූවා හට සැදෑහැයෙන් දත් පස වළඳනු වරා ගිනි ගෙන දිලියෙන ලෝහ ගුළා වළඳනු මැනැවැ යි දු; සැදෑහැයෙන් දත් සිවුරු හඳනා පොරෝනා වරා ගිනි ගෙන දිලියෙන යකඩපට හඳනේ මැනැවැ යි දු; සැදෑහැයෙන් කරවා දත් සෙනසුන්හි ලගිනා වරා ගිනි ගෙන, දිලියෙන ලෝහගෙයි ලග්නේ මැනැවැ යි දු; සැදෑහැයෙන් දත් ඇඳ

පුටු ආදියෙහි හොත්තා හිඳිනා මරා ගිනි ගෙන දිලියෙන ඇඳ පුටු ආදියෙහි හෝත්තේ හිඳින්නේ මැනැවැයි දූ; සැදැහැයෙන් දෙනවුන්ගේ මැදුම් ඉවසනු වරා ගිනිසදල මරක් එව පොලු ලා අඹරනු මැනැවැයි දූ; තියුණු සැතින් උරෙහි විදුනේ මැනැවැයි දූ මදල බැවින්, පරිජ් ජත්නට තිසි විකුම කොට බුන් සිල් ඇත්තහු විසින් ගින ගිනි ඇවිලියාන්හු ඒ ගිනි තිවත්නට එන වෙලෙවිනක් නෙසිත් වහා සංවරයෙහි පිහිටිය යුත්තේ ය. නො එසේ වූවහු විසින් සගුන් වළඳ එවන සතර පසයෙහි විධාන නො කොටයුත්තේ ය. නො ද පිරිගසුත්තේ ය. නො ද සිය අතින් සැපවියයුත්තේ ය. සචිත්පිරිනෙසිත් වළඳන සඟනට අවුලට තිසි කොලත්තකුදු සැප කොට නො දියයුත්තේ ය. සගුන් ඔහු ලවා සැප කරවා නො ගතයුත්තේ ය. මේ අර්ථය අවුවාවෙහි ආ බැවිනුද, "එකොංපි අලජ්ජි අලජ්ජිකතමපි අලජ්ජි සඟහතමපි කරොති" යු බැවිනුදු, මේ මෙසේ වන බැවින් තම හට උපත් සතර පසය සඟනට දියදිහුවිසිනුදු, සඟනට වළඳ එවන සතර පසයෙහි විධාන කරනු කැමැත්තහු විසිනුදු, ආයතිසංවරයෙහි නො පිහිටත් හොත් මහණ වෙස් හැර ගිහි භාවයට යායුත්තේ ය .. මේ දන පරිජ්ජෙත් එකකුදු අවත්නහු සැදැහැයෙන් දුන් සතර පසය පරිභෝග කරන්නට නොයිසි වන බැවිනුදු, මෙයින් සිද්ධ වන ආදීනව නො දැන ද පරිභෝග කළ අපාය සිද්ධ වන බැවිනුදු, (ඕ හට) මහණ ලිගු විනා පැවිදි නැති බැවිනුදු, සගුන් හා සම්භෝගයට නොතිසි වන බැවිනුදු, ලිංග නාසනා විසින් සම්බ නාසනා විසින් නසන කල්හි මේ දස පරිජ් අවත්නත් ම නැසියයුතු බැවින් ද දන නාසනා කම් වෙයි කී හු."

දූත් ශීලානිශංස සලකානු. මනා කොට රැකි මෙම ශීලය, මෙලොව පරලොව ඇති කැක් උතුම් අනුසස් ගෙන දෙයි. අවසන නාණෙහි නිවීම ය යි කියන ලද නිවන් සැපත ද පමුණුවයි. එහෙයින් සද්ධම්මොපායනයෙහි,

"ඉමම්හි සීලරතනං ඉධ චෙව පරත්ථ ච,
ආනිසංස වරෙ දත්වා පවජං පාපෙති නිබ්බුතිං"

යැ යි කීහ. සත් වැනි පරිච්ඡේදයෙහි සඳහන් ශීලානිසංසයන් ද මෙහි ලා දතයුතු.

කුඩා අනුකුඩා වත් නොපුරන්නේ ශීලය නො පුරයි. අපිරිසිදු සිල් ඇති දුෂ්ප්‍රාඥයා සිත එකඟකම නො ලබයි. නොයෙක් අරමුණෙහි ලාගුණු විසිරුණු සිත් ඇති පුද්ගලයා (පිළිවෙත්) දහම් මැනැවින් නුවණින් නො දකියි. දහම් නුදුටු පුද්ගලයා දුකින් නො මිදෙයි. එහෙයින් මහාවග්ගයෙහි,

"වත්තං අපරිපූරෙන්තො න සීලං පරිපූරති
අසුද්ධසීලො දුප්පඤ්ඤො චිත්තෙකග්ගං න වින්දති,
වික්ඛිත්තචිත්තො නෙකග්ගො සම්මා ධම්මං න පස්සති
අපස්සමානො සද්ධම්මං දුක්ඛා න පරිමුච්චති."

යි වදාළහ.

වත් පුරන්නේ සිල් ද පුරයි. පවිත්‍ර ශීලය ඇති ප්‍රාඥ පුද්ගලයා චිත්තෛකාග්‍රතාව ලබයි. එක් කම්ටහන් අරමුණෙහි පිහිටි නොවිසුරුණු සිතැති හෙතෙමේ දහම නුවණින් දකියි. පිළිවෙත් දහම් දකින යේ දුකින් මිදෙයි. එහෙයින් මහාවග්ගයෙහි ම,

"යං වත්තං පරිපූරෙන්තො සීලම්පි පරිපූරති
විසුද්ධසීලො සප්පඤ්ඤො චිත්තෙකග්ගම්පි වින්දති
අවික්ඛිත්තචිත්තො එකග්ගො සම්මා ධම්මං විපස්සති
සම්පස්සමානො සද්ධම්මං දුක්ඛා සො පරිමුච්චති."

යි වදාළහ.

එහෙයින් නැණැති බුදුපුතණු තෙමේ කුඩා, අනුකුඩා සිකපදයන් පුරන්නේ ය. උතුම් බුදුරදුන්ගේ අවවාදය කරන්නේ ය. එයින් තෘෂ්ණායෙහි මිදීම වන නිවන්පුරට පැමිණෙන්නේය එහෙයින් එහි ම,

"තස්මා හි වත්තං පූරෙන්තො ජිනපුත්තො විචක්ඛණො
ඔවාදං බුද්ධසෙට්ඨස්ස තතො නිබ්බානමෙහිති."

යි වදාළහ.

ශික්ෂායෙහි ගෞරව ඇති සාමණේර තෙමේ මෙසේ ශීලය දූත, බිජු රකින කිකිළියක මෙන්, වලග රකින සෙමර දෙනක මෙන්, ප්‍රියපුතු රකින මවක මෙන්, එක ඇස රකින පුරුෂයකු මෙන් ඒ මැනැවින් රකින්නේ ය. එහෙයින් සද්ධම්මපායනයෙහි,

"කිකීව අණ්ඩං චමරීව වාලධිං පියංව පුත්තං නයනංව එකකං
තථෙව සීලං අනුරක්ඛමානකා සුපෙසලා හොථ සදා සගාරවං"

යි කීහ.

පරිච්ඡෙදි'මං පඤ්ඤකම්මප්පපඤ්චං
විජානාති නිච්චං විභාවෙති යො යො,
පවුත්තා පයාති සපඤ්ඤා දයාලු
ධුවං සාමණෙරානසීලම්හි සො සො.

දසවැනි පරිච්ඡේදය නිමි.

විනයසමයපුණ්ණං තිප්පෙටකෙසුවහි සුඤ්ඤං
කාපුරිස අමනුඤ්ඤං රම්මිකානං මනුඤ්ඤං,
ඉති හි දසපරිච්ඡෙදං ඉමං භික්ඛුසීලං
සකලසුරනරානං අත්ථසිද්ධිං කරොතං

---

1 බුද්ධස්ස ධම්මරාජස්ස සාසනස්ස චිරට්ඨිතිං,
සුවණ්ණපොත්ථකාරෙන ඉච්ඡන්තා ධුවං මයං,

2 ආධුනිකානං සබ්භිනං හිතත්ථාය කතං ඉදං,
භික්ඛුසීලං විභාවිනං කිං සාරෙති මහොදයං,

3 එතෙනචෙදං බුද්ධසන්ති සො ධීමා අවමඤ්ඤති,
ධීරා පාමොජ්ජමනසා හොන්තු එත්ථ පරක්කමෙ.

4 සුතෙන උපපන්නබහුස්සුතානං නිදස්සනංසාව සමාණවති
සුතෙන නුපපන්නබහුස්සුතානං නිදස්සනං හි නිරත්ථකා ච.

5 විජ්ජන්ති එත්ථ දෙසා පමාදජා චෙව භමජා ච
ගණ්හන්තු තත්ථ ධීරා සමාහිතා යුත්තමෙවත්ථං.

# පරිකථාසංග්‍රහය.

---

(1) සිස්මග:- මනුෂ්‍ය - අමනුෂ්‍ය - තිරශ්චීන ස්ත්‍රීන්ගේ මාර්ග 9
උභතොබ්‍යඤ්ජනක යන්ගේ මාර්ග 9
මනුෂ්‍ය - අමනුෂ්‍ය - තිරශ්චීන පුරුෂයන්ගේ මාර්ග 6
පණ්ඩක හෙවත් නපුංසකයන්ගේ මාර්ග 6
30

(2) පාදය:- පුරාණ නීලකාර්ෂාපණයෙන් සතරෙන් කොටසක වටිනාකම යි. නීලකාර්ෂාපණය යනු ද රන්පවුමකි. ඒ රන්පවුමේ වටිනාකම කලින් කලට අඩුවැඩි වෙයි. දහනවවැනි සියවසෙහි ඊට රිදීපහ යයිද ව්‍යවහාර කර තිබේ.

(3) පස්විසි අවහාරය:- 1. නානාභණ්ඩ පඤ්චකය
2. එකභණ්ඩ ,,
3. සාහත්ථික ,,
4. පුබ්බපයොග ,,
5. ථෙය්‍යාවහාර ,,
යනුවෙන් පඤ්චක පසෙකි.

1. නානාභණ්ඩ පඤ්චකය:-
i ආදියන, ii හරණ, iii අවහරණ
iv ඉරියාපථවිකොපන, v ඨානාචාවන

2. එකභණ්ඩ පඤ්චකය:-
i ආදියන ii හරණ iii අවහරණ
iv ඉරියාපථ විකොපන v ඨානාචාවන

3. සාහත්ථික පඤ්චකය:-
i සාහත්ථික ii ආණත්තික iii නිස්සග්ගිය
iv අත්ථසාධක v ධුරනික්ඛෙප

4. පුබ්බපයොග පඤ්චකය:-
i පුබ්බපයොග ii සහපයොග iii සංවිදාවහාර
iv සංකෙතකම්ම v නිමිත්තකම්ම

5. ථෙය්‍යාවහාර පඤ්චකය -
i ථෙය්‍යාවහාර ii පසය්හාවහාර
iii පරිකප්පාවහාර iv පටිච්ඡන්නාවහාර
v කුසාවහාර

(4) උත්තරි මනුෂ්‍යධර්ම:- ධ්‍යාන, විමෝක්ෂ, සමාධි, සමාපත්ති, ඥානදර්ශන, මාර්ග, ඵල යනුයි.

(5) "කිලෙසාරීහි පරාජීයතෙ පරාජිතස්සාති වා පාරාජිකො" යනු නිර්වචන යි. කෙලෙස් සතුරන් විසින් පරදවනු ලැබේ පරදවන ලද්දහුගේ යන අර්ථයෙන් පාරාජික නම් වේ, යනු එහි තේරුම යි.

පාරාජිකන්ති යං වුත්තං – තං සුණෝහි යථාතථං
චුතො පරද්ධො භට්ඨො ච – සද්ධම්මා හි නිරංකතො
සංවාසොපි තහිං නත්ථි – තෙනෙතං ඉතිවුච්චති.
(පරිවාරපාළි)

තේරුම:-

පාරාජික යයි යම් වචනයක් කියන ලද්දේද, එය තත් වූ පරිදි මෙසේ අසව. ශාසනයෙන් චුත වූයේය. පැරදුණේය. විනාශ වූයේය. සද්ධර්මයෙන් විරහිත වූයේය. සමගි සංඝයා කෙරෙහි එක්ව විසීමක් නැත්තේය. එබැවින් පාරාජික යයි කියනු ලැබේ.

පාරාජික හෙවත් පරාජය නම් එම ජාතියෙහි නැවත උපසම්පන්න බවට අභව්‍ය වීම යි. ඒ පාරාජික වූ භික්ෂු නම නැවත ගිහියකු හෝ සාමණේරයකු හෝ වියයුතු ය. පරිජි වීමෙන් තිසරණයත් අහිමිවෙයි. එබැවින් සරණාගමනයේ පටන් නැවත තමා අයත් සිල් රැකීමෙන් පිළිවෙත් පිරීමෙන් මාර්ගඵලයනට බාධාවක් නැත. අනාගාමි මගපල තෙක් ලැබිය හැකියි. අරහත් මාර්ගඵල ලැබියහැකි බව ගැන නො කියවෙයි.

(6) ආස්වාද එකොළොසකි:

i මෝචනාස්වාදය ii මුච්චනාස්වාදය iii මුත්තාස්වාදය iv මෛථුනාස්වාදය v කණ්ඩුවණාස්වාදය vi ස්පර්ශාස්වාදය vii දර්ශනාස්වාදය viii හිඳීමෙහි ආස්වාදය ix කථාකිරීමෙහි ආස්වාදය x ගෙහසිතාස්වාදය xi වණභඞ්ගාස්වාදය යනුවෙති. මොවුනතුරෙන් මෝචනාස්වාදය පමණක් මෙහිදී ගැනේ.

(7) සුගත් වියත:-

සුගත් වියතක් යනු වඩුවියත් තුනෙකි. එවිට දිග පලල සුගත් වියත් 12 – 7 යනු වඩුවියත් 36 × 21 කි. රියන් 18 × 10½ කි.

(8) පඨමාපත්තික:-

මේ ප්‍රථම ආපත්තිනම්ය බුදුඅණ තබ කළ කෙණෙහි ම සිදුවේ. එබැවින් 'නවපඨමාපත්තිකා' යයි නම් ලබයි.

(9) සංඝභේද:-

සමනුභාෂණ විනයකර්මය අවසානයේදී සංඝාදිසේස ආපත්තිය සිදුවන අතර එතෙකින් නොනැවතී ගිය පිරිසෙන් ධර්මවාදී පක්ෂයට සතරනමක් හා අධර්මවාදී පක්ෂයට සතරනමක්ද ඇතිව එක් සීමාවක් තුළ පෝය කිරීමාදී විනයකර්මයක් කරවීමෙන් මුදුනට සංඝභේද නම් වූ ආනන්තර්ය අකුශලය සිදුවීමත් පාරාජිකා වීමත් යන අනතුරු දෙකම සිද්ධ වේ.

(10) සමනුභාෂණය:-

ඤත්තිය (දන්වීම) හා කර්මවාක්‍ය තුන්විටක් කීමෙන් අනතුරුව සිදුවන මේ ආපත්ති සතර යාවතතියක නමද සමනුභාෂණ නමද වේ.

(11) උද්දේසයෝ:- මෙහි උද්දේස පසකි.

1. නිදානුද්දේසය 2. පාරාජිකුද්දේසය 3 සංඝාදිසෙසුද්දේසය
4. අනියතුද්දේසය 5. විත්ථාරුද්දේසය යනුය.

(12) සංඝාදිසෙස:-

"සංඝො ආදිම්හි චෙව, සෙසෙසු ච ඉච්ඡිතබ්බො අස්සා' ති සංඝාදිසෙසො" ආදිය යි කියන ලද පරිවාසයද ශෙෂය යි කියන ලද මූලායපටිකස්සන, මානත්ත, අබ්භාන යන කර්මයන්ට ද සංඝයාම (සතරනමක් හෝ ඊට වැඩියෙන්) අවශ්‍යවන බැවින් මේ ආපත්ති කොට්ඨාසයට සංඝාදිසෙස යන නම යෙදෙයි

සංඝාදිසෙසොති යං වුත්තං - තං සුණාහි යථාතථං
සංඝොව දෙති පරිවාසං - මූලාය පටිකස්සති
මානත්තං දෙති අබ්භෙති - තෙන තං ඉති වුච්චති

මේ පරිවාරපාළි ගාථාවෙන්ද ඒ අදහසම තහවුරු කෙරෙයි.

(13) සඟසතු භාණ්ඩ:- කොටස් පසකි.

1 පුෂ්පාරාම, ඵලාරාම ආදී ආරාමද ආරාමවත්තුද
2. විහාර ද, විහාරවත්තුද (යන ථාවර දේ.)
3. ඇඳ පුටු කොට්ට, මෙට්ට (ආදී හිඳිනා, හොවිනා දේ)
4. ලෝහ සැළි, ලෝහ කටාරම්, මහ ලෝහ සැළි ලෝහ කළගෙඩි, කෙටේරි, මහ වෑ පොරෝ, උදලු, කියත්.
5. වේවැල් ආදි වැල් - හුණබට ආදී බට ද ඉලුක් ආදී තෙවෙණි තෘණද තල්කොළ පලකොළ ආදී කොළද මුදු බබුස් ආදී තෘණද. මැටිද මැටිබඩු හා ලීබඩුද, යන මේවා සංඝික ම යි. (අවිභජ්ජිය) හෙවත් බෙදිය නො හැකිය.

ඉති පඤ්චහි රාසීහි - පඤ්ච නිම්මලලොචනො
පඤ්චවීසවිධං නාථො - ගරුභණ්ඩං පකාසයි

පසඳුව වණීවූ නිමල නෙත්‍රයුග්මයක් ඇති ලෝකනාථයාණන් වහන්සේ මෙසේ පස්විසි වැදෑරුම් වූ ශරැබඩු රාශි පැකිළ දේශනා කළසේක.

(14) චුල්ලවග්ගය:- "චුල්ලංච යං වග්ගං යෙවති චුල්ලවග්ගයො" භගවත්වූසේද එළම ය. වරද වූයේ ද එය ම නුයි චුල්ලවග්ග නම්.

චුල්ලවග්ගන්ති යං වුත්තං - තං සුණෝහි යථා තථං
එකස්ස මූලෙ යො දෙසෙති - යො ච තං පතිගණ්හති
අච්චයො තෙන සමො නත්ථි - තෙනෙතං ඉති චුල්ලවත්

(පරිවාර පාළි)

චුල්ලවග්ග යයි කියන ලද්ද තතු ලෙස මෙසේ අසව්. එක භික්ෂුවක් ළඟ දෙසයි ද එය පිළිගනී ද ඒ දෙසීම හා සමඳ දෙශනාගාමී ඇවැතක් නැත්තේ ය. එහෙයින් චුල්ලවග්ගයැ යි කියනු ලැබේ යනු එහි තේරුම යි.

පාරාජික වූ භික්ෂුවට ගිහි හෝ සාමණේර හෝ වීමෙන් මගඵල ලැබීමට බාධා නො වන්නේ ය එත මානත අබ්භාන නම් කිරීමෙන් සංඝාදිශෙස වූ භික්ෂුවට ද මග ඵලවලට හානි නො වන්නේ ය ඒ දෙයාකාර වූම උපායෙන ශුද්ධිය මෙහි ගණන් නොගැනේ. දේශනා ශුද්ධියෙන සහපත් දෙනා ගැනීමෙන් ශුද්ධ වන ඇවැත් අතුරෙන් චුල්ලවග්ග විභාග ම ඇපතති කොට්ඨාශය බැවින් මේ නම යොදන ලද බැව් පැහැදිලි වේ

(15) පටපිළි ආදියෙන්:- මෙහි සිවුරැ සඳහා කැප වස්ත්‍ර සයෙකි.

i ඛොම = රැක් වැහැරින් කළ වස්ත්‍ර ii කොසෙය්‍ය = කෘමි කෝෂ හුයින් කළ වස්ත්‍ර iii කප්පාසි = කපු වස්ත iv සාණ = හණ වස්ත්‍ර v භඞ්ග = මේ ම ආදී මිශ්‍ර නූලින් කළ වස්ත්‍ර iv කම්බල = සිංහ ව්‍යාඝ්‍ර දී ව්‍යාල ලෝම් හැර සෙසු ලොම්වලින් කළ වස්ත්‍ර යනුයි.

මෙම්වාට අනුලෝම වස්ත්‍රාගීද සයෙකි. i දුහුල් නම් රැක් වැහැරින් කළ වස්ත්‍ර ii පත්තුන්න දෙශයෙහි වස්ත්‍ර iii සොමාර දේශයෙහි වස්ත්‍ර iv චීන දේශයෙහි වස්ත්‍ර v පුණ්‍ය සාද්ධියෙන් පහළවූ වස්ත්‍ර vi දෙවියන් විසින් දෙන ලද වස්ත්‍ර යනුයි.

(16) සක්මංසගතුළ:-

කඨිනය හො අතුලේ නම් ඉල්මාසය පමණක් ද අතුලේනම් ඉල් - උඳුවප් - දුරුතු - නවම් - මැදින් යන පස්මාසය ම ද සිවුරැ ලැබීමට කාලය යි. සෙසු සත්මස අකාලය යි.

(17) ප්‍රමාණවත්:-

වඩුරියනක් හා වඩුවියතක් දිගපළල ඇති සිවුරැ (රෙදි) ද අධිෂ්ඨානයට ප්‍රමාණවත් ය.

(18) අච්චෙකචීවර:- හදිසි කරුණකින් පූජා කරන සිවුර යි.

(19) නිසගි:-

“නිස්සජ්ජිතබ්බං නිස්සග්ගියං” යනු නිර්වචනයි. අකැප වස්තුව බැහැර කොට නිශ්‍රදෙසීමෙන් ශුද්ධ ඇවැත් නිසගිපචිති නමි. රූපියපටිග්ගහණ - රූපියසංවෝහාර - ඌනපඤ්චබන්ධන සිකපද තුනින් නියමිත ඇවැත් සඟ මැද ම නිශ්‍රදෙසිය යුතු අතර ඉතිරි සත්විස්ස සංඝ - ගණ - පුද්ගල යන තුන් තැනින් කැමැති තැනෙක නිශ්‍රදෙසියයුතු වෙයි. “ලිංගසංඝගණපුග්ගලේසු චතුධාපත්ති වුට්ඨිති” යි ලිංගපරිවර්තනයෙහි ය සංඝයා කෙරෙහි ය ගණයා කෙරෙහි ය පුද්ගලයා කෙරෙහි යන සතර තැන්හි ආපත්තියෙන් නැගිටීම වේ. “එකාංගි දුතියං පත්තං සංඝෙසෙසානි ලබ්භරෙ” රූපිය පටිග්ගහණ රූපියසංවෝහාර දෙක හා දුතියපත්ත නම්වූ ඌනපඤ්චබන්ධන ඇවැතද සංඝයා කෙරෙහි ම නැගීම වේ. ඉතිරි සත්විස්ස සංඝගණ පුද්ගල යන තුන් තැනින් එක් තැනක නැගීම වේ. එනම් විනිසවිනිසා බලනු

20) සහසෙය්‍යය:-

සහසෙය්‍යට නැසෙන සෙවණ නම් සියල්ල නෙවිලිකල වූද සියල්ල වටකරන ලද්දවූ ද සේනාසනය යි, සියල්ල නෙව්ලිකල වැඩියක් වටකළ සෙවණ ද, සියල්ල නෙව්ලිකල අඩක් වටකළ සෙවණ ද, වැඩියක් නෙව්ලිකල සියල්ල වටකළ සෙවණ ද, වැඩියක් නෙව්ලිකල, වැඩියක් වටකළ සෙවණ ද, නෙව්ලිකල අඩක් වට කරන ලද සෙවණ ද අඩක් වසනලද සියල්ල වටකළ සෙවණ ද, අඩක් වසන ලද වැඩියක් වටකළ සෙවණ ද යන මේ සේනාසන අට දෙන සහසෙය්‍යට නැසෙන සේනාසනයෝ වෙති.

(21) සහසෙය්‍යාපත්ති:-

ප්‍රථම සහසෙය්‍ය ආපත්තිය වන්නේ සතරවැනි දින හිරු බැසගිය තැන් පටන්ය. දෙවැනි සහසෙය්‍ය ආපත්තිය වන්නේ ප්‍රථම දිනයෙහි ම හිරු බැසගියතැන් සිට ය.

(22) ජාතපඨවි:-

හුදුමැටි, හුදුපස්, බොහෝ මැටි බොහෝ පස් ද, ඇත්තාවූ නොදැවුණු පොළොව ද, පස්කප සිවුමසකට වැඩිකලක් වැසිදියෙන් තෙමුණු මැටිරැස ද ජාතපඨවි නමි.

(23) විකෝපන.-

සැපීම, කෙටීම, ඉරිඇදීම, දැවීම යනාදියෙන් වෙනස්කිරීම, විකෝපනය නම් වෙයි.

**(24) භූතගාම:-**

දියෙහි ද ගොඩ ද, හටගත්තාවූ ද වැඩුණාවූ ද තිල්බමට පැමිණ වැඩෙන්නාවූ ද, තෘණ වෘක්ෂලතාදිය භූතගාම නම්. පැලවෙන මුල්, පුරුක්, අතු, ගෙඩි, ඇට යන පස් වැදෑරුම් බීජයන්ගේ මුල් හා තිල්කොල හටගත් තැන් පටන් භූතගාම නමි. කැපීම, කැඩීම, බිඳීම, පැලීම, ඉගිලීම තමන් හෝ අනුන්ලවා හෝ කිරීමෙන් භූතගාම පාතව්‍යතා ආපත්තිය වේ.

**(25) සඞ්ඝසම්මුති 13:-**

1. භත්තුද්දේසක සම්මුති 2 සේනාසනගාහාපක 3 භණ්ඩාගාරික 4 චීවරපටිග්ගාහක 5 චීවරභාජක 6 යාගුභාජක 7 ඵලභාජක 8 ඛජ්ජභාජක 9 අප්පමත්තක විස්සජ්ජක 10 වස්සිකසාටියගාහාපක 11 පත්තගාහාපක 12 ආරාමිකපෙසක 13 සාමණේරපෙසක යන මොහු යි.

**(26) අෂ්ට උපසම්පදා:-**

1 එහි භික්ඛු 2 සරණගමන, 3 ඕවාදපටිග්ගහණ 4 පඤ්හ ව්‍යාකරණ 5 ගරුධම්මපටිග්ගහණ 6 දූතෙන 7 අට්ඨවාචික 8 ඤත්තිචතුත්ථකම්ම යැයි උපසම්පදාව අටවැදෑරුම් වේ. උභතොසඞ්ඝයාගෙන් ලැබියයුතු භික්ෂුණී උපසම්පදාව, උභය සංඝයා විසින් ඤත්තිය දෙවරක් සහ අනුශ්‍රාවණය ද සයක් ඇස්වියයුතුහෙයින් “අට්ඨ වාචාසු වාචා අස්ස අත්ථි” යන නෛරුක්තික නයින් ‘අට්ඨවාචික’ නම් වේ. අෂ්ටවාචික උපසම්පදාව භික්ෂුණී ශාසනයේ අභාවයෙන් නැති විය. ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව ශාසනය පවත්නා තාක් පවතින බව කියැවෙයි. සියලු උපසම්පදාවන් බුද්ධකාලයෙහි ම පැවැති බව පෙනේ.

**(27) ගරුධම් අට:-**

ගරුධර්ම අටකි. ඒවා භික්ෂුණීන් විසින් දිවිහිමියෙන් රැකිය යුතු ය. ඒවා මෙසේ ය:- i භික්ෂුණිය තම උපසම්පදාවෙන් සියක් වස් ඉක්මවා සිටියා ද, එදවස් උපසපන් භික්ෂුවට වැන්ද යුතු ය; ගරුබුහුමන් දැක්විය යුතු ය. ii භික්ෂු ආරාමයකට ආසන්න මෙහෙණ-වාසක විසියයුතු ය. iii අඩමසක් පාසා භික්ෂූන් කරා එළඹ පොහොය විචාළයුතු ය. අවවාද ලබා ගතයුතු ය. iv වස් විසූ භික්ෂුණිය උභතො සංඝයා කෙරෙහි පවාරණය කළ යුතු ය v සඟවෙසෙස් ඇවැතින් පිරිසිදු වනු කැමැති භික්ෂුණිය උභය සංඝයා වෙත අඩමසක් මානත පිරියයුතු ය. vi දෑවුරුද්දක් මුළුල්ලෙහි ප්‍රාණඝාත, අදත්තාදාන, අබ්‍රහ්මචරියා, මුසාවාද, සුරාපාන, විකාලභෝජන යන සයාකාර ශික්ෂාවන්හි හික්මීමෙන් අනතුරුව උභතො සංඝයා වෙතින් උපසම්පදාව ලැබියයුතු ය. vii කවර කරුණක් නිසා හෝ භික්ෂුවට නින්ද පරිභව නොකළයුතු ය. viii භික්ෂුණීන් විසින් භික්ෂූන්ට අවවාද නොකළයුතු අතර භික්ෂූන්ගෙන් අවවාද ලබා ගතයුතු ය. යන අට යි.

**(28) සත්වැදෑරුම් සමය:-**

ගිලානකාලය, සිවුරු දෙන කාලය, සිවුරු කරන කාලය, දීර්ඝ මාර්ගයෙහි යන කාලය, නැව් නගින කාලය, බොහෝ භික්ෂූන් ගම හැසිරෙන කාලය හා ශ්‍රමණයකු විසින් බතින් ආරාධනය කළ කාලය.

**(29) පඤ්චවිධභෝජන:-**

බත්, අග්ගලා, කොමුපිඩු. ගොඩමස්, දියමස් යනුයි.

**(30) අත්පස:-**

අත්පස නම් දෙරියන් හමාරකි. හිඳින භික්ෂුවගේ අසුන් කෙළවර සිටත්, සිටින භික්ෂුවගේ විලුඹ කෙළවර සිටත්, සයනය කරන්නහුගේ ඇලය පිටුපස සිටත් ඉදිරියට මේ අත්පස ගණන් ගැනෙයි.

**(31) පවාරණය:-**

වළඳන කල්හි මැතු පිළිගත් අත්පසට ගෙන ලද පංචභෝජන යෙන් යමක් පිළිකෙව් කිරීම මෙහි පවාරණය නම්.

**(32) යාවකාලිකාදිය:-**

පිළිගන්නා ලද පිණ්ඩපාත ගිලන්පස පිළිබඳ කාල වශයෙන් ප්‍රභේද සතරක් වෙයි. යාවකාලික, යාමකාලික, සත්තාහකාලික හා යාවජ්ජීවික වශයෙනි. ඉර හැරෙන තුරු පරිභෝග කළ හැක්කේ යාවකාලික යි. පසු දා අරුණට පළමු පරිභෝග කළ හැක්කේ යාමකාලික යි ගිතෙල් වෙඬරු ආදී සත් දිනක් තබා වැළඳිය හැක්කේ සත්තාහකාලික යි බෙහෙත් වශයෙන් පිළිගෙන ජීවිතාන්තය දක්වා තබා වැළඳිය හැක්කේ යාවජ්ජීවික යි

**(33) සිවුරඟසෙන්:-**

එක ඇතකු සහිත පුරුෂයන් දෙළොස් දෙනකුන් ඇත්තේ හස්තිබ්‍යූහ නම්. එක අසකු සහිත පුරුෂයන් තිදෙනකුන් ඇත්තේ හයබ්‍යූහ නම්. එක් රථයක් සහිත පුරුෂයන් සිවු දෙනකුන් ඇත්තේ රථබ්‍යූහ නම් මේ ත්‍රිවිධ බ්‍යූහයම සේනාබ්‍යූහ නම්. මේ නයින් පත්තිපිරිසෙහිත් පුරුෂයන් සතිස් දෙනකුන් සහිත ඇතුන් තිදෙනකුන් ඇත්තේ හස්ත්‍යානීක නම්. පුරුෂයන් නව දෙනකුන් සහිත අසුන් තිදෙනකුන් ඇත්තේ අශ්වානීක නම්. පුරුෂයන් දෙළොස් දෙනකුන් සහිත රථ තුනක් ඇත්තේ රථානීක නම්. කඩු ගත් පුරුෂයන් සිවු දෙනකුන් ඇත්තේ පත්‍යානීක නම්.

**(34) නානකාලය:-**

ග්‍රීෂ්ම ඍතුවේ අවසාන මාස එක හමාර හා වස්සාන ඍතුවේ පළමු වැනි මාසය වශයෙන් පැවැති දෙමස පසළොස් දවස ද, දශය

ඇති කාලය, ශීතල කාලය, දිග් මගකට යායුතු කාලය, මළ පෙත්මං හැමදීම ආදී කර්මාන්ත කරන කාලය හා දූවිලි සහිත වාතය ඇති කාලය ද ස්නානය කළයුතු කාලය යි.

**(35) විකල්පනය:-**

උපසම්පන්න භික්ෂුවකගේ අත්පස උක්කුටිකව හිඳ "ඉමං චීවරං තුය්හං විකප්පෙමි" යි තුන් වරක් කියා දීම යි. තේචීවරික ධුතාංගධරයාට චීවර පරිභෝගයේ දී පහසුව සැලසීම මෙහි ප්‍රයෝජනය යි.

**(36) පච්චුද්ධරණය:-**

විකල්පනය ලද භික්ෂුව විසින් විකල්පනය කළ භික්ෂුවට පරිභෝගාදිය සඳහා විනය නයින් අවසර දීම පච්චුද්ධරණය නමි.

**(37) ඌනවීසති:-**

දස දස අඩු විසි වස් සාමණේර නමක් උපසපන් කිරීමෙන් සීමස්ථ භික්ෂූහු නින්දා කට යුත්තෝ වෙත්. සාමණේර නමට ද උපසම්පදාව නොපිහිටයි කාරක භික්ෂූනට දුකුලා වේ. වස් විස්ස බැලීමේ දී පිළිසිඳීමේ පටන් ගණන් ගත හැකි ය.

(38) එබඳු නමක් ලද භික්ෂුව විසින් 'අයිතිකාරු මෙය ගෙන යේවා' යි ආරක්ෂා කර තැබිය යුතු යි. මේ ඒ පිළිබඳ පිළිවෙත යි.

**(39) සුගත් අඟල:-**

සුගත් අඟල මැදුම් පිරිමියකුගේ අතින් තුන් අඟලකට සමාන යි. එබඳු සුගත් අඟලෙන් අඟල් අටක් වඩුරියනකි. මැදුම් පිරිමියකුගේ රියන සුගත් අඟලට සමාන බව කවත් තැනක සඳහන් වෙයි.

**(40) සුගත් සිවුර:-**

සුගත් සිවුර නම් සුගතයන් වහන්සේගේ සිවුර යි. එය දිගින් සුගත් වියතින් වියත් නවයක් ද, පළලින් වියත් සයක් ද වෙයි. මැදුම් පිරිමියකුගේ තුන් වියතක් සුගත් වියතකි.

**(41) පාචිත්තිය:-**

"පාතෙති කුසලං චිත්තනති = පාචිත්තියං" යනු නිර්වචන හෙයින් 'කුසල් සිත හෙළානු' යි පචිති නම් වේ

**(42) සේඛසම්මතකුල:-**

භික්ෂූන් විසින් කර්මවාක්‍යයකින් සම්මත කරන ලද කුල 'සේඛසම්මත කුල' නමින් හැඳින්වෙයි. යම් කුලයක් සැදැහැයෙන් දියුණු ව ධනයෙන් පිරිහෙන විට, එබඳු කුලයට සංඝයා මේ සම්මුතිය දෙයි. එසේ සේඛසම්මුතිය ලත් කුලයකින් කල් ඇති ව ආරාධනයක් නොලැබ යමක් පිළිගැනීමට හෝ වැළඳීමට හෝ නුසුදුසු ය.

(43) පාටිදෙසනීය:-

"පටිදෙසෙතබ්බං - පාටිදෙසනීයං" යනු නිර්වචන හෙයින් ගැවිත දෙසිය යුතු ඇවැත පාටිදේසනීය නමින් හැඳින්වෙයි.

(44) දුක්කට:-

"දුට්ඨු කතං = දුක්කටං" යනු නිර්වචන හෙයින් නපුරු කොට කරන ලද්ද දුක්කට නම් වෙයි.

(45) සමනුභාෂණ කම්:-

භික්ෂුප්‍රාතිමෝක්ෂයෙහි යාවතතියක සඟාදිසෙස් සතර ද දිට්ඨි-අප්පටිනිස්සජ්ජන පචිත්තිය ද, භික්ෂුණීප්‍රාතිමෝක්ෂයෙහි උක්ඛිත්තානුවත්තිකා පාරාජිකාව ද, යාවතතියක සඟාදිසෙස් සතර ද චණ්ඩකාලි පචිත්තිය ද යන මේ ආපත්තීන් ආරෝපණය කරනු පිණිස කරන ලද සමනුභාෂණ කර්ම එකොළොසකි.

(46) දුර්භාෂිත:-

දුරාභට්ඨං (භාසිතං) = දුබ්භාසිතං" යනු නිර්වචන හෙයින් නපුරු කොට කියන ලද වචනයෙන් හැඟි ඇවැත දුර්භාෂිත නම් වෙයි.

(47) අට පිරිකර:-

තිචීවරානි (තුන් සිවුර)
පත්තො (පාත්‍රය)
දන්තකට්ඨච්ඡේදන වාසි (දැහැටි කපන පිහිය)
එකා සූචි (ඉඳිකටුව)
කායබන්ධනං (පටිය)
පරිස්සාවනං (පෙරහන)

තුන් සිවුර යනු අඳනය, තනිපට සිවුර හා දෙපට සිවුර යි. වර්තමානයෙහි අටපිරිකරට දැලිපිහියක් ද ව්‍යවහාරයට පැමිණ ඇත. මෙකල ව්‍යවහාර වන ලොකු දුනුපිහිය වුවත් මේ ගණයට වැටෙන බව කෙනෙක් සලකති.

(48) මස්මාළු වැළඳීම:-

මස් මාළු වැළඳීම බුදුමතින් ම අකැප කොට වදාළේ නම් වඩා මැනැවැ යි ඇතැම් කෙනෙක් කියති. අනුන් අයත් දිවි පැවැතුම් ඇති ගෙපිළිවෙළින් සිඟා දිවි රක්නා භික්ෂුවට මස් රස නොඹුනු අහර නො ලැබෙයි. එසේ වුවිට දිවි රැක්ම ප්‍රශ්නයක් වෙයි. දූරදර්ශී බුදුරජාණන් වහන්සේ මෙය දැක වදාළ නිසා නිරවද්‍ය මාංසරස භෝජනය අනුදත් සේක.

(49) පස් සහදම්:-

භික්ඛු, භික්ඛුණී, සාමණේර, සාමණේරි, සික්ඛමානා යන පස් දෙනා යි.

(50) තුදුස් මහ වත්:-

1 ආගන්තුක
2 ආවාසික
3 ගමික
4 අනුමෝදන
5 භත්තග්ග
6 පිණ්ඩචාරික
7 ආරඤ්ඤක
8 සේනාසන
9 ජන්තාඝර
10 වච්චකුටි
11 උපජ්ඣාය
12 සද්ධිවිහාරික
13 ආචරිය
14 අන්තේවාසික යනුයි.

(51) බුද්ධාන්තරය:-

පොළොව සත් ගවුවක් වැඩෙන තුරු කාලය යි. එක් අන්තඃකල්පයක කාලය යි

(52) ගතානුගතික:-

දුශ්ශීල භික්ෂුවගේ අනුශාසනය පරිදි කටයුතු කිරීම ලබ්ධි අනුව යාම (ගතානුගතිකත්වය) බව මංගලසූත්‍ර අටුවාහි දක්වෙයි.

(53) මිලින්ද ප්‍රශ්නයෙහි "ජිනසාසන ධනපරිපාලනතොපි" යනාදී දුශ්ශීල වර්ණනාව "පබ්බජිතො දුස්සීලො පමාදකාරණං" යනාදී සුමංගල විලාසිනී දික්සඟි අටුවා පාඨයට කෙසේ ගැලපේ ද?

(54) මෙය ද මිලින්ද ප්‍රශ්නයෙහි "බුද්ධෙ සගාරවො" යනාදියට හා "බුද්ධ ධම්ම සංඝ සරණගතායපි" යනාදියටත් කෙසේ ගැලපේ ද? මනෝරථපූරණී නම් අංගුත්තර අටුවාහි "ඡහි සත්ථාරෙහි සද්ධිං දෙවදත්තො චෙව අඤ්ඤෙ ච එවරූපා" යි ශාස්තෘන් ස දෙනත් පාරාජිකව දුශ්ශීල වූ දෙවදත්තත්, පරිජි ම ඉත් නො නැගිට ශ්‍රමණ භාවය හඟවමින් සිටින එබඳු අනෙකුත් ශ්‍රමණ දුශ්ශීලයනුත් විපර්යාස දැකුම් ඇති මිථ්‍යාදෘෂ්ටීන් බව කියා තිබේ. එහෙයින් ශ්‍රමණ දුශ්ශීලයා ත්‍රිසරණගත උපාසකයකු පමණ වත් ගුණවතෙකැ යි කවර පෙළ අටුවාදියක පෙනේ ද?

(55) නවමහාවිතර්ක:-

i කාම iv ඥාති vii පරානුද්දයතා ප්‍රතිසංයුක්ත
ii ව්‍යාපාද v ජනපද viii ලාභ සත්කාර ශ්ලෝක ප්‍රතිසංයුක්ත
iii විහිංසා vi අමර ix අනවඥප්ති ප්‍රතිසංයුක්ත

විතර්කයෝ ය. පරමත්ථජෝතිකා අටුවා බලන්න.

(56) මෙහි පාටිදේසනීය ආපත්තිය භික්ෂුණීන් පිළිබඳ හෙයින් ආපත්තිස්කන්ධ පිළිවෙළ හැර අන්තිමට යෙදූ බව දතයුතු.

(57) මෙහි දක්වා ඇත්තේ කුහන ආදී පදයන් පිළිබඳ සැකෙවිනි. විස්තර කැමැත්තවුන් විසින් විශුද්ධිමාර්ගය බැලිය යුතු.

(58) ප්‍රත්‍යවේක්‍ෂා කරන භික්‍ෂුව විසින් "පටිසෙවාමි" යි කිය යුතු. මතු එන "පිණ්ඩපාතං පටිසෙවති" යනාදිය ද මෙලෙස යි.

(59) පඤ්චමාර:-
ස්කන්ධ, ක්ලේශ, අභිසංස්කාර, මෘත්‍යු, දේවපුත්‍රමාර විසිති.

(60) අපාය:- නරක, තිරිසන්, ප්‍රේත, අසුර, ලෝකාන්තරික සමග 140 කි.

(61) පස්විසිමහ බිය:-
ජාති ජරා ව්‍යාධි චුති ච සොකො - තෙකාලිකා පඤ්චදසෙව හොන්ති
වෙරාරි රාජූදක පාවකො ච - දණ්ඩා භයං දුග්ගති ඝොර රොගා,
අත්තානුවාදෙ ච පරානුවාදෙ - වදෙ බුධො වීසති පඤ්චිමෙ භයා

(62) නිමිත්තශාස්ත්‍රය:-
පඬි රජ තෙමේ මුතු තුනක් මිට මොලොවා 'මා අත කුමක් දැ' යි නිමිත්ත පාඨක බ්‍රාහමණයාගෙන් විචාළේ ය. හෙතෙම ඇත මෑත බලනුයේ, සුණකු මැස්සකු ඩැහැගනු පිණිස පැන්න විට මැස්සා ඉගිලී ගිය බව දිටී ය. මැස්සා මිදුණු හෙයින් 'මුතු' වියයුතුබව සලකා 'මහරජ මුතු ය' යි කීය රජ තෙමේ 'කීය ද' යි නැවත විචාළේ ය. බමුණා ඇත මෑත බැලී ය. එවිට ම කුකුළෙක් තුන් විටක් හැඬී ය. ඒ අසා බමුණා 'තුනෙකැ' යි කීය. මේ ආකාරයෙන් කරුණු කියන ශාස්ත්‍රය නිමිත්තශාස්ත්‍රය යි.

(63) ශොභාලක්‍ෂණ:-
එක්තරා විහාරයක අඳින ලද සිතුවමක ගොයකු ගිනී පිඹින ආකාරයක් දක්වා තිබිණ. එතැන් පටන් එහි භික්‍ෂූන් අතර විවාද බහුල විය. එක්තරා ආගන්තුක භික්‍ෂු කෙනෙක් ඒ ගොයි රූව මැකූ ය. එතැන් පටන් එහි විවාද සන්සිඳිණ.

(64) මද්‍යදානය:-
"පඤ්චදානානි අපුඤ්ඤානි පුඤ්ඤසම්මතානි ලොකස්මිං මජ්ජදානං, සමජ්ජදානං, ඉත්ථිදානං, උසභදානං, චිත්තකම්මදානන්ති පරිවාරෙ වුත්තං." මේ අනුව පුණ්‍ය සම්මත අපුණ්‍ය දානයෝ පස්දෙනෙක් වෙත් මද්‍යදානය පුණ්‍යසම්මත අපුණ්‍ය වූවකි. ආර්යයනට සුරාව දුලබබව හගිමින් පින් සලකා සාගත තෙරුන් වහන්සේට කාපෝතිකා නම් සුරාව දන් දුන් බව පෙනේ. මේ නිසා එය පුණ්‍ය සම්මත බැව් පැහැදිලි ය.

(65) තෙපනස් අභව්‍ය පුද්ගලයෝ:-

| | | |
|---|---|---|
| 1 කුට්ඨික | 5 අපමාරික | 9 කසාහතක |
| 2 ගණ්ඩික | 6 රාජභටක | 10 ලක්ඛණහතක |
| 3 කිලාසික | 7 කාරභෙදක | 11 ඉණායික |
| 4 සොසික | 8 ලිඛිතක | 12 දාස |

13 අනනුඤ්ඤාතක
14 පණ්ඩක
15 උභතොබ්‍යඤ්ජනක
16 ථෙය්‍යසංවාසක
17 තිත්ථියපක්කන්තක
18 තිරච්ඡානගත
19 මාතුඝාතක
20 පිතුඝාතක
21 අරහන්තඝාතක
22 ලොහිතුප්පාදක
23 සංඝභෙදක
24 භික්ඛුණීදූසක
25 හත්ථච්ඡින්නක
26 පාදච්ඡින්නක
27 හත්ථපාදච්ඡින්නක
28 කණ්ණච්ඡින්නක
29 නාසච්ඡින්නක
30 කණ්ණනාසච්ඡින්නක
31 අඞ්ගුලිච්ඡින්නක
32 අලච්ඡින්නක
33 කණ්ඩරච්ඡින්නක
34 ඵණහත්ථක
35 ඛුජ්ජක
36 වාමනක
37 ගලගණ්ඩික
38 සීපදික
39 පාපරෝගික
40 පරිසදූසක
41 කාණ
42 කුණී
43 ඛඤ්ජක
44 පක්ඛහතක
45 ඡින්නිරියාපථක
46 ජරාදුබ්බල
47 අන්ධ
48 මූග
49 බධිර
50 අන්ධමූග
51 අන්ධබධිර
52 මූගබධිර
53 අන්ධමූගබධිර

යන මොහු වෙති

(66) සුවෝසංගිත:-

පැවිදි නොකළ යුතු පුද්ගලයා උපසම්පදා කරන්නේ නොවේ ද? නොදැනීමෙන් පැවිදි කොට උපසම්පදා කරවියහැකි ය. ඇතැම් විට ඔහුගෙන් අනාගත සසුනට වියහැකි මහත් අර්ථය තලකා විනයධරයෝ සුවෝසාරිතයා පැවිදි කරත්. උපසපත් කරත්. මේ නිසා ම උපාධ්‍යාය මහ තෙරුනට වන දුකුලාව ද නො සැලකෙන බව පෙනේ. පා මාපටඇගිල්ල නොමැති ඡප්පට නම් මහතෙර නමක් සිටි බව ශාසනවංශාදී පොත්වල සඳහන් වෙයි එතුමා ලංකා - රාමඤ්ඤ දෙ රට ඉර සඳ මෙන් ප්‍රකට ගත් කතුවරයෙකි.

(67) ව්‍යඤ්ජන සම්පත්තිය:-

දීඝ, රස්ස, ගරුක, ලහුක, නිග්ගහීත, සම්බන්ධ, වවත්ථිත, විමුත්ත යන ව්‍යඤ්ජන අට ආදී ශබ්දයෙන් ගන්නා ලදී. එහි ස්ථාන කරණාදිය ලිහිල් කොට කියයුතු ක, ග යනාදිය සිථිල නම්. ඒ ස්ථානාදිය ම බර කොට කියයුතු ඛ, ඝ යනාදිය ධනිත නම්.

දීර්ඝ ව කියයුතු 'ආ', යනාදිය දීඝ යි. කෙටි ව කිව යුතු 'අ' යනාදිය රස්ස යි. දීර්ඝ හා සංයෝග පර කොට ඇති අක්ෂර ගරුක යි. සංයෝග පර කොට නැති හ්‍රස්ව අක්ෂර ලහුක යි. අක්ෂරෝත්පත්තියට උපකාර වන කරණය පෙළා අවිවර මුඛයෙන් අනුනාසික කොට කියන්නේ නිග්ගහීත යි. පරපදය හා එක් කොට කියන්නේ සම්බන්ධ යි. පරපදය හා එක් නො කොට කියන්නේ වවත්ථිත යි. කරණ ස්ථානය නො පෙළා විවෘත මුඛයෙන් අනුනාසික නො කොට කියන්නේ විමුත්ත යි.

"සිථිලධනිතඤ්ච දීඝරස්සං - ගරුකලහුකඤ්ච නිග්ගහීතං.
සම්බන්ධං වවත්ථිතං විමුත්තං - දසධා බ්‍යඤ්ජන බුද්ධියා පභේදෝ"
ඉති පරිවාර අට්ඨකථායෙහි කීය.

(68) ස්ථානකරණ:-

ස්ථාන නම් අක්ෂරෝත්පත්ති වන බොටුව, තල්ල, මුදුන, දත්, තොල, නැහැය යන සය තැන යි. කරණ නම් අක්ෂරෝත්පත්තියට උපකාර වන තැන් ය. එනම්, දිවමැද, දිවඅග ලඟ ඈඳිය යි.

(69) සරණගාම:-

මෙහි බුදුන් සරණ යන්නේ අසාධාරණ ගුණයන් සරණ යයි. දහම් සරණ යන්නේ නිවන සරණ යයි. සඟුන් සරණ යන්නේ ශෛක්ෂ අශෛක්ෂ ධර්මයන් සරණ යයි. නැත් නම් සරණ සංකර වෙයි.

(70) සාමණේර තැන් විසින් ද වත් එලඹිය යුතු බව මින් පෙනේ.

(71) "උපසම්පන්නානම්පි පාරාජිකසමාපත්තියා සරණගමනාදි සාමණේරභාවස්සාපි විනාසනතො සෙනාසනග්ගාහො පටිප්පස්සම්භති, සංඝලාභම්පි තෙ න ලභන්තීති වෙදිතබ්බං."

උපසම්පන්න භික්ෂූන් පාරාජිකාපත්තියට පැමිණීමෙන් ඔවුන්ගේ සරණගමනාදී සාමණේර භාවය ද වැනසෙන බව මින් පෙනේ. වත් එලඹීම ද සිඳෙයි. ඒ ශ්‍රමණ දුශ්ශීලයෝ සාංඝික ලාභය ද නො ලබත්. 'පරමත්ථමඤ්ජුසා', විමතිවිනෝදනී' ආදී ටීකාවන්හි මේ දක්වා ඇත.

(72)
(73) මේ ශික්ෂා දසශීලයෙන් ම ප්‍රතික්ෂේප නමුදු ලෝකාවද්‍ය හෙයින්
(74) කියනු ලදී.

(75) මෙසේ ගණන් වශයෙන් කියනු ලද නමුදු, ඉන් ඉතිරි වූ උපසම්පන්න භික්ෂූනට තුලස් - දුකුලා යි පනවා, වදාළ ශික්ෂාවන් අතුරෙන් ලෝකාවද්‍ය සියලු ශික්ෂාවන්හි හෙරණ පැවිදි තැන් විසින් හික්මිය යුතු ය. එහෙයින් සහධාර්මිකයන් (භික්ෂු, භික්ෂුණී සාමණේර සාමණේරී සහ ශික්ෂමානා) විසින් හික්මිය යුතු බැවින් භික්ෂූන් අරභයා පනවා වදාළ සියලු විනය ප්‍රඥප්ති ශික්ෂා 'සහධම්මිකා' ය යි කියනු ලැබේ.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු